
# සමාජ විග්‍රහ

## Samaja Viggraha

පළමුවන කාණ්ඩය - නවවන වෙළුම



සමාජ විද්‍යා අධ්‍යයනාංශය

කොළඹ විශ්වවිද්‍යාලය

# සමාජ විග්‍රහ

2022

**(REFEREED JOURNAL - විමර්ශිත සංග්‍රහය)**

**ISSN 2756-925X (e-ISSN)**

**ISSN 2362-0978 (Print ISSN)**

**පළමුවන කාණ්ඩය නවවන වෙළුම**

ප්‍රධාන සංස්කාරක

**ප්‍රේමකුමාර ද සිල්වා**

සහය සංස්කාරක

**හිරුනි කළුආරච්චි**

සංස්කාරක උපදේශක මණ්ඩලය

එස්.ටී.හෙට්ටිගේ (සම්මානිත මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය

කාලිංග ටියුඩර් සිල්වා (සම්මානිත මහාචාර්ය) පේරාදෙණිය විශ්වවිද්‍යාලය

කේ.කරුණාතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) කැලණි විශ්වවිද්‍යාලය

සරත් අමරසිංහ (සම්මානිත මහාචාර්ය) රුහුණ විශ්වවිද්‍යාලය

යසාංජලී ජයතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

චන්ද්‍රසිරි නිරිඇල්ල (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය

සුභාංගි හේරත් (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය

නිශාර ප්‍රනාන්දු (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය

ෆර්සානා හනීෆා (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය

ඉරේෂා ලක්ෂ්මන් (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය

භාෂා සංස්කරණය
**නාලක ජයසේන**

පිරිසැකසුම් නිර්මාණය
**ප්‍රභාත් ගලගමගේ**
**හිරුනි කළුආරච්චි**

ප්‍රකාශනය
**සමාජ විද්‍යා අධ්‍යයනාංශය**
**කොළඹ විශ්වවිද්‍යාලය**
**දුරකථන/ෆැක්ස් 011-2500452**

# ප්‍රධාන සංස්කාරක සටහන

'සමාජ විග්‍රහ' සඟරාවේ නවවැනි වෙළුම මාර්ගගතව පළ කිරීමට සහයෝගය දැක්වූ සැමට පළමුව කෘතවේදී වෙමු. මෙවර සඟරාවෙන් පුළුල් තේමා යටතේ රචිත ලිපි කිහිපයක් පළ කරන අතර, ශාස්ත්‍රීය පරිවර්තන දෙකක් ද ඊට ඇතුළත් කොට ඇත.

සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ වත්මනේ ප්‍රබලව මතුවෙමින් පවතින උපවිෂය ක්ෂේත්‍රයක් වන 'ඩිජිටල් සමාජ විද්‍යාව' පිළිබඳ යම් අවධානයක් අපගේ පාඨක සමාජයේ ඇති කිරීම මෙන්ම ඩිජිටල් පර්යේෂණ සඳහා සමාජ විද්‍යාව පිළිබඳ උනන්දුව දක්වන පාඨකයන්ට මෙම සඟරාවේ පළ කොට ඇති එම තේමාවට අදාළ ලිපිය ප්‍රයෝජනවත් වේ යැයි සිතමු. එසේම ලාංකේය සමාජ විද්‍යාව මෙන්ම මානව විද්‍යාව ජාත්‍යන්තර තලයට රැගෙන ගිය කෘතහස්ත මානව විද්‍යා පර්යේෂකයන් දෙදෙනෙකු වන මහාචාර්ය ස්ටැන්ලි ජෙයරාජ් තම්බයියා (1929-2014) හා මහාචාර්ය ගනනාත් ඔබේසේකර (1930) පිළිබඳ සකසන ලද ලිපි දෙකක් ද මෙහි අන්තර්ගතය.

ප්‍රජාතන්ත්‍රවාදය පුළුල් කිරීමේදී ජනමාධ්‍යයේ කාර්යභාරය, විවාහය හා කුල ක්‍රමය අතර ඇති සම්බන්ධතාව මෙන්ම පශ්චාත් යුද සමයේ ආබාධිත සෙබළුන්ගේ ජීවිත පිළිබඳ සමාජ විද්‍යාත්මක පර්යාවලෝකය අරබයා ලියන ලද ලිපි තුනක් ද මෙහි ඉදිරිපත් කොට ඇත.

දසවැනි වෙළුමේ සිට මෙම ශාස්ත්‍රීය සඟරාවට ද්විභාෂා එනම් සිංහල මෙන්ම ඉංග්‍රීසි භාෂාවෙන් රචනා කරනු ලබන පර්යේෂණ ලිපි සහ ග්‍රන්ථ විමර්ශනද පළ කරන බව සතුටෙන් දන්වා සිටිමු.

මෙම සඟරාවට ලිපි සැපයීමෙන් පර්යේෂකයන් මෙන්ම එහි පාඨක සමාජයේ සාමාජිකයකු ලෙස ඔබත් සිංහල සමාජ විද්‍යා කතිකාව පුළුල් කිරීමට දක්වන දායකත්වයට අපි කෘතවේදී වෙමු !


**ප්‍රධාන සංස්කාරක**

සමාජ විද්‍යා අධ්‍යයනාංශය,
කොළඹ විශ්වවිද්‍යාලය,
කොළඹ-03.
දුරකථනය/ෆැක්ස්: 011-2500452
විද්‍යුත් තැපැල: samajaviggraha@soc.cmb.ac.lk
වෙබ් අඩවිය: cmb.ac.lk/arts/socio/journal.ht

## ලිපි විමර්ශක මණ්ඩලය


- මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා
  සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය

- මහාචාර්ය ෆර්සානා හනීෆා
  සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය

- මහාචාර්ය එම්.ටී.එම් මහීස්
  සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය

- මහාචාර්ය සමන්ත හේරත්
  සන්නිවේදන සහ නිර්මාණාත්මක කලා අධ්‍යනංශය , කොළඹ විශ්වවිද්‍යාලය

- කථිකාචාර්ය චමත්කා පද්මසිරි කාරියවසම්
  සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය

- කථිකාචාර්ය ක්‍රිෂාන් සිරිවර්ධන
  සන්නිවේදන සහ නිර්මාණාත්මක කලා අධ්‍යනංශය, කොළඹ විශ්වවිද්‍යාලය

**පටුන**

**නවවන වෙළුම** **පිටු අංකය**

1. ඩිජිටල් සමාජ විද්‍යාව- Digital Sociology
**ඩෙබොරා ලුප්ටන්**
**පරිවර්තනය - හිරුනි කළුආරච්චි** **06**

2. පශ්චාත් යුදකාලීන ශ්‍රී ලංකාවේ සමාජ කතිකා සහ ආබාධිත සෙබළුන්ගේ අනන්‍යතා ගොඩනැගීමේ ගතිකත්වය
**මහේෂ් ප්‍රේමරත්න** **26**

3. ශ්‍රී ලාංකේය මහජන අවකාශයේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ කතිකාව නිර්මාණය වීම කෙරෙහි ජනමාධ්‍යයේ භූමිකාව : සමාජ විද්‍යාත්මක කියවීමක්
**කේ.කේ.එච් පවිත්‍රා** **38**

4. විවාහය සහ කුල ක්‍රමය; දික්වැල්ල ප්‍රදේශයේ තෝරා ගත් නෙලුම්වැව ග්‍රාමය ඇසුරෙන් අධ්‍යයනයක්
**ඩී.ජී.සී.එච්.යාපා** **53**

5. මහාචාර්ය එස්.ජේ තම්බයියා (1929-2013) සමග පැවති සාකච්ඡාවක්.
**මරිසා පෙයිරානෝ**
**පරිවර්තනය - එල්. කේ. බමුණු ආරච්චි සහ ආර්. එම්. ආර්. එස්. රාජපක්ෂ** **68**

6. මහාචාර්ය ගනනාත් ඔබේසේකර (1930) පිළිබඳ පෞද්ගලික සටහනක්
**ප්‍රේමකුමාර ද සිල්වා** **94**

# සමාජ විග්‍රහ

**විමර්ශිත සංග්‍රහය**
**REFEREED JOURNAL**
**පළමු කාණ්ඩය, නවවන වෙළුම - 2022**
**ISSN 2362-0978 (print ISSN)**
**ISSN 2756-925X (e-ISSN)**

ලිපි අංක 01

## ඩිජිටල් සමාජ විද්‍යාව- Digital Sociology

**ඩෙබොරා ලුප්ටන්**

**පරිවර්තනය-** හිරුනි කළුආරච්චි[1]
https://orcid.org/0000-0003-3148-600X

***ප්‍රධාන සංස්කාරක***
ප්‍රේමකුමාර ද සිල්වා

***සහය සංස්කාරක***
හිරුනි කළුආරච්චි

***සංස්කාරක උපදේශක මණ්ඩලය***

එස්.ටී.හෙට්ටිගේ (සම්මානිත මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
කාලිංග ටියුඩර් සිල්වා (සම්මානිත මහාචාර්ය) පේරාදෙණිය විශ්වවිද්‍යාලය
කේ.කරුණාතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) කැලණිය විශ්වවිද්‍යාලය
සරත් අමරසිංහ (සම්මානිත මහාචාර්ය) රුහුණ විශ්වවිද්‍යාලය
යසාංජලී ජයතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
චන්ද්‍රසිරි නිරිඇල්ල (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
සුභාංගි හේරත් (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
නිශාර ප්‍රනාන්දු (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
ෆර්සානා හනීෆා (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
ඉරේෂා ලක්ෂ්මන් (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය

***භාෂා සංස්කරණය***
නාලක ජයසේන
***පරිසැලසුම් නිර්මාණය***
ප්‍රභාත් ගලගමගේ
හිරුනි කළුආරච්චි

[1] බී.ඒ. (කොළඹ), සහකාර කථිකාචාර්ය, සමාජ විද්‍යා අධ්‍යනාංශය, කොළඹ විශ්ව විද්‍යාලය

# සමාජ විග්‍රහ

**විමර්ශිත සංග්‍රහය**

**REFEREED JOURNAL**
**පළමු කාණ්ඩය, නවවන වෙළුම - 2022**
**ISSN 2756-925X (e-ISSN)**
**ISSN 2362-0978 (print ISSN)**

This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License.

දැනුම වෙත ප්‍රවේශ වීමේ සීමා අතික්‍රමණය සඳහා ලොව බොහෝ ශාස්ත්‍රාලයීය ප්‍රකාශන සම්ප්‍රදායික ප්‍රකාශන අයිතිය පිළිබඳ නෛතික ආකෘතියෙන් විකල්ප ආකෘතියක් වන පොදු නිර්මාණ බලපත්‍ර ක්‍රමයට සංක්‍රමණය වී / වෙමින් ඇත. මේ අනුව විචාරාත්මක දැනුමට විවෘත ප්‍රවේශයක් ලබා දීමේ අරමුණින් "සමාජ විග්‍රහ" විමර්ශිත සංග්‍රහය, නිකුත් වන්නේ ඉහත පොදු නිර්මාණ බලපත්‍රය යටතේය.

## ලිපි විමර්ශක මණ්ඩලය

*මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*
*මහාචාර්ය ෆර්සානා හනීෆා, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*
*මහාචාර්ය එම්.ටී.එම් මහීස්, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*
*මහාචාර්ය සමන්ත හේරත්, සන්නිවේදන සහ නිර්මාණාත්මක කලා අධ්‍යනංශය, කොළඹ විශ්වවිද්‍යාලය*
*කථිකාචාර්ය චමත්කා පද්මසිරි කාරියවසම්, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*
*කථිකාචාර්ය ක්‍රිෂාන් සිරිවර්ධන, සන්නිවේදන සහ නිර්මාණාත්මක කලා අධ්‍යනංශය, කොළඹ විශ්වවිද්‍යාලය*

## ප්‍රකාශනය

සමාජ විද්‍යා අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ-03
දුරකථනය/ෆැක්ස්: 011-2500452
විද්‍යුත් තැපැල: samajaviggraha@soc.cmb.ac.lk
වෙබ් අඩවිය: https://arts.cmb.ac.lk/sociology/

**ඩිජිටල් මාධ්‍ය සහ විශ්වවිද්‍යාල ශිෂ්‍යයා**[2]

1990 දී විශ්වවිද්‍යාල සිසුන් ඩිජිටල් මාධ්‍ය තාක්ෂණය භාවිත කිරීම සම්බන්ධව අවධානය යොමු කරන විට බොහෝ දෙනකුට තම පැවරුම් සකස් කිරීම සඳහා පෞද්ගලික පරිගණක වෙත ප්‍රවේශ වීමට හැකියාව ලැබිණ. එම නිසා (1980 දශකයේ මැද භාගයේ දී පරිගණක බහුලව ලබා ගත හැකි විය) සාම්ප්‍රදායික යතුරු ලියන මගින් හෝ අතින් ලියූ පැවරුම් භාවිත කිරීම අත්හැරීමට හැකි විය. පෞද්ගලිකව පරිගණක මිල දී ගැනීම නොකළ හැකි වූයේ ඒවායේ මිල අධික වූ බැවිනි. එහි දී බොහෝ සිසුන්ට තමන්ගේම පරිගණකයක් මිලට ගැනීමට නොහැකි වූ බැවින් විශ්වවිද්‍යාල පුස්තකාල වෙතින් ලබා ගත හැකි පරිගණක ඒ සඳහා භාවිත කෙරිණි. මෙම පරිගණක භාවිත කිරීමට ලැබෙන කාලය සාමාන්‍යයෙන් සීමා වූ අතර සිසුන්ට ඒ සඳහා සැසි වෙන් කරවා ගැනීමට ද සිදු විය.

මෙම පෞද්ගලික පරිගණක මේස මත රඳවා තබන විශාල, නොසෙල්වෙන වස්තු විය. මේ අතරතුර ලැප්ටොප් පරිගණක හඳුන්වා දීම ආරම්භ වූ අතර, එම ලැප්ටොප් පරිගණක ද තරමක් බරින් වැඩි විය. එම කාලය වන විට අන්තර්ජාලය සහ ලෝක ව්‍යාප්ත වෙබ් අඩවිය ඔවුන්ගේ සංවර්ධනයේ මුල් අවදියේ සිටි අතර අන්තර්ජාලය (1990 දශකයේ මැද භාගයේ දී පමණ) වේගවත් වී පුළුල් ලෙස භාවිත කිරීම වසර කිහිපයක් ඇතුළත සිදු විය. එම කාලයේ වෙබ් අඩවි සහ සෙවුම් යන්ත්‍ර පිළිබඳ උනන්දුවක් නොතිබූ අතර විද්‍යුත් තැපැල ද බහුල ව භාවිත නොවිණ. පළමු වෙබ් පිටුව 1991 දී නිර්මාණය කෙරුණු අතර Google සෙවුම් යන්ත්‍රය 1998 වන තෙක්ම සොයා ගෙන තිබුණේ ද නැත.

වර්තමානය දක්වා තාක්ෂණයේ වේගවත් ඉදිරි ගමන දෙස බලන විට, අද වන විට සිසුන්ට ප්‍රවේශ විය හැකි ඩිජිටල් තාක්ෂණය සම්බන්ධයෙන් සිදු වී ඇති දැවැන්ත වෙනස්කම් පිළිබඳ සලකා බැලිය යුතු ය. වර්තමානය වන විට සිසුන්ට විවිධාකාරයේ ඩිජිටල් මාධ්‍ය උපාංග සහ වේදිකා (platforms) වෙත ප්‍රවේශ විය හැකි අතර ඔවුන් තම සාක්කුවල සුහුරු දුරකථන (smart phones) හෝ ගමන්මලුවල ජංගම පරිගණක (tablet computers or notebooks) රැගෙන යයි.

ඒ නිසා ඔවුන්ට ඕනෑම ස්ථානයක දී හා දිවා හෝ රාත්‍රියේ ඕනෑම වේලාවක අන්තර්ජාලයට සම්බන්ධ විය හැකියාව ඇත. ඔවුන්ට විවිධ සඟරා ලිපි සහ වැඩි වැඩියෙන් ශාස්ත්‍රීය පොතපත් සෙවීමට සහ බාගත කර ගැනීමට පරිගණක යොදා ගත හැකිය. එමපණක් නොව ආශ්‍රිත ග්‍රන්ථ පිළිබඳ තොරතුරු (reference details) ඍජුවම Endnote හෝ Mendeley වැනි විමර්ශන යොමු වෙත ඇතුළු කළ හැකි අතර එමගින් පැවරුම් උදෙසා ආශ්‍රිත ග්‍රන්ථ ලැයිස්තු ස්වයංක්‍රීයව හැඩගස්වනු ඇත. අන්තර්ජාලයෙන් ලැබෙන තොරතුරු වෙත ශීඝ්‍රයෙන් ප්‍රවේශ වීමට ඔවුන්ට Google හෝ වෙනත් සෙවුම් යන්ත්‍ර භාවිත කළ හැකිය. සිසුන්ට විද්‍යුත් තැපැල සහ Skype මාර්ගයෙන් ඔවුන්ගේ කථිකාචාර්යවරුන් සමග සම්බන්ධ වීමට, Facebook පිටු, බ්ලොග් සහ Twitter සමාජ ජාල වේදිකාවලට ලියාපදිංචි වීමට, YouTube හි වීඩියෝ සඳහා ප්‍රවේශ වීමට සහ තොරතුරු බෙදා ගැනීමට මෙන්ම ඔවුන්ගේ අධ්‍යයනවලට අදාළ ගැටලු සාකච්ඡා කිරීමට මෙවැනි සමාජ මාධ්‍ය අඩවි හා වේදිකා භාවිත කිරීමට හැකිය.

[2] Original Article - Pre-print of chapter published in *Public Sociology: An Introduction to Australian Society*, 4th edition (2019). Edited by John Germov and Marilyn Poole. Sydney: Allen & Unwin, pp. 475-492.

**හැඳින්වීම: ඩිජිටල් යුගය**

සංවර්ධිත රටවල වෙසෙන බොහෝ ජනයාගේ ජීවිතවලට ඩිජිටල් මාධ්‍ය තාක්ෂණය කේන්ද්‍රීය වී ඇති අතර එය සංවර්ධනය වෙමින් පවතින රටවල ද එම තත්ත්වය පවතී. 1980 දශකයේ මුල් භාගය වන විට පෞද්ගලික පරිගණක සහ 1990 දශකයේ මුල් භාගය වන විට අන්තර්ජාලය හඳුන්වා දීමෙන් පසු, එම තාක්ෂණය 'තොරතුරු සන්නිවේදන තාක්ෂණය' (ICTs) හෝ 'සයිබර් තාක්ෂණය' ලෙස හැඳින්වූ අතර වර්තමානය වන විට එයට නිරන්තරව භාවිත වන්නේ 'ඩිජිටල් තාක්ෂණය' හෝ 'නව ඩිජිටල් මාධ්‍ය' යන්න ය.

වර්තමානය වන විට ඩිජිටල් මාධ්‍ය එදිනෙදා ජීවිතයේ බොහෝ මානයන් කරා ළඟා වී ඇති අතර, පවුල සහ සමීප සබඳතා, විවේක හා විනෝදාස්වාදන ක්‍රියාකාරකම්, වැටුප් සහිත වැඩ, අධ්‍යාපනය, වාණිජ සහ ජන මාධ්‍ය ඉදිරිපත් කිරීම් සහ පරිභෝජනය කරන ආකාරය කෙරෙහි ද බලපායි. නව ඩිජිටල් මාධ්‍ය තාක්ෂණය සංවර්ධිත සමාජවල සහ වැඩි වැඩියෙන් සංවර්ධනය වන සමාජවල බොහෝ පුද්ගලයන්ගේ එදිනෙදා ජීවිතයට සහ සමාජ සම්බන්ධතාවලට ප්‍රබල බලපෑමක් සිදු කර ඇත. ලොව පුරා සිටින පුද්ගලින් ඩිජිටල් මාධ්‍ය සහ ජාල මඟින් පෙර නොවූ විරූ ආකාරයෙන් එකිනෙකට සම්බන්ධ වී ඇති අතර, මෙම ජාල හරහා වේගවත්ව හා කාර්යක්ෂම තොරතුරු ගලා යාමට ද ඉඩ සැලසෙයි.

විසිඑක් වන ශත වර්ෂයේ ආරම්භයේ සිට මතු වී ඇති වැදගත් ඩිජිටල් මාධ්‍ය තාක්ෂණය පිළිබඳ කාල රාමුවක් පහත පළමු වගුව මඟින් සපයයි. විකිපීඩියා (Wikipedia), අයි ටියුන්ස් (iTunes), ෆේස්බුක් (Facebook) සහ ට්විටර් (Twitter) වැනි මෘදිලි සහ සුහුරු දුරකථන (smartphones) සහ ටැබ්ලට් පරිගණක වැනි උපාංගවලට සාපේක්ෂව කෙටි කාලයක දී සිදු වූ නව්‍යකරණයේ පරිමාණය සහ ශීඝ්‍රයෙන් භාවිත කිරීමට යොමු වීම මෙයින් පෙන්නුම් කරයි.

**වගුව 01 : 2000 සිට නව ඩිජිටල් මාධ්‍ය තාක්ෂණ කාල රාමුව**

| Year | Technology name | Function |
|---|---|---|
| 2001 | Wikipedia | මාර්ගගත විවෘත-සංස්කරණය කළ විශ්වකෝෂය |
| | iTunes | සංගීතය, පොඩ්කාස්ට්, රූපවාහිනී කතා මාලා සහ චිත්‍රපට බාගත කිරීම |
| 2003 | LinkedIn | වෘත්තීමය ජාලකරණය |
| | Delicious | සමාජ පොත් සලකුණු කිරීම |
| 2004 | Facebook | සමාජ ජාලකරණය |
| 2005 | Reddit | සමාජ පොත් සලකුණු කිරීම |
| | YouTube | වීඩියෝ බෙදාගැනීම |
| | Flickr | ඡායාරූප බෙදාගැනීම සහ සත්කාරකත්වය |
| 2006 | Twitter | ක්ෂුද්‍ර බ්ලොග්කරණය |
| 2007 | Smartphones | දුරකථන ඇමතුම් සහ අන්තර්ජාලයට සම්බන්ධ වීම, යෙදුම් |


| | | |
|---|---|---|
| | Tumblr | ක්ෂුද්‍ර බ්ලොග්කරණය |
| **2008** | Spotify | සංගීත ප්‍රවාහය |
| **2010** | tablet computers | අන්තර්ජාලයට සම්බන්ධ වීම, යෙදුම් |
| | Instagram | ඡායාරූප/වීඩියෝ බෙදාගැනීම |
| **2011** | Google+ | සමාජ ජාලකරණය |
| | Pinterest | රූප සැකසීම |

**වෙබ් අඩවි පරිණාමයː වෙබ් 1.0 සිට වෙබ් 2.0 දක්වා**

අන්තර්ජාලය එහි පළමු අනුවාදය - Web 1.0 - සිට Web 3.0 දක්වා පරිණාමය වූ අතර එමඟින් වෙබ් හි පරිණාමය පිළිබඳ සොයා ගත හැකිය (රූපය 1 බලන්න). පසුගිය සියවසේ Web 1.0 තාක්ෂණය වෙබ් අඩවි, ඩෙස්ක්ටොප් හෝ ලැප්ටොප් පරිගණක වැනි උපාංග මත පදනම් වූ අතර එහි පරිශීලකයන්ට අන්තර්ජාලය හරහා තොරතුරු සෙවීමට, අන්තර්ජාල බැංකුකරණය සහ සාප්පු සවාරි වැනි පහසුකම් භාවිත කළ හැකි නමුත් මාර්ගගත අන්තර්ගත (online content) නිර්මාණය කිරීමේ දී ඉටු කිරීමට කුඩා කාර්යභාරයක් තිබිණි. ස්ථාවර දුරකථන සම්බන්ධතාවකින් බැහැර වූ විට මෙන්ම මෘදුකාංග යෙදුම් (Software Applications) වැඩි වශයෙන් පෞද්ගලික ඩෙස්ක්ටොප් හෝ ලැප්ටොප් පරිගණකවලට ඇතුළත් කළ විට අන්තර්ජාලයට ප්‍රවේශ වීම දුෂ්කර විය.

විසිඑක් වන ශතවර්ෂයේ මුල් කාලයේ සිට, පෞද්ගලික ඩෙස්ක්ටොප් පරිගණකයට වෙන් වෙන් වශයෙන් මෘදුකාංග ස්ථාපනයට (Software Installation) වඩා අන්තර්ජාලය හරහා මාර්ගගතව ප්‍රවේශ විය හැකි Web 2.0 වෙබ් අඩවි බිහි වූ අතර, රැහැන් රහිත, බ්‍රෝඩ්බෑන්ඩ් අන්තර්ජාල ප්‍රවේශය සහ ඒ ආශ්‍රිත උපාංග පදනම් කරගත් තාක්ෂණික දියුණුව තාක්ෂණයේ ප්‍රගණනයට හේතු වී තිබේ. සෑම තැනකම පවතින රැහැන් රහිත පරිගණක අන්තර්ජාල තාක්ෂණය (Ubiquitous wireless computing technologies) මඟින් පරිශීලකයන්ට, ඔවුන් සමග පහසුවෙන් රැගෙන යා හැකි ජංගම උපාංග භාවිතයෙන් දවසේ ඕනෑම වේලාවක ඕනෑම ස්ථානයක සිට පහසුවෙන් අන්තර්ජාලයට සම්බන්ධ වීමට ඉඩ සලසා දෙයි. ඇතැම් ඩිජිටල් උපාංග පහසුවෙන් සාක්කුවක හෝ බෑගයක (උදාහරණයක් ලෙස, සුහුරු දුරකථන (smartphones), MP3 ධාවක සහ රැගෙන යාමට පමණක් නොව, ජීවමිතික දත්ත (biometric data) රැස් කිරීමට භාවිත කරන අතේ බඳින ස්වයංක්‍රීය සෙවුම් පළඳනා (self-tracking wristbands) හෝ හිස පළඳනා (headbands) වැනි උපාංග ද ශරීරයේ පැළඳිය හැකිය (Lupton, 2013a).

වෙබ් 1.0 සිට වෙබ් 3.0 දක්වා විකාශනය පහත රූපයෙහි දක්වා ඇත.




අප වෙනත් පුද්ගලයන් සමග සන්නිවේදනය කරන ආකාරය, ප්‍රවෘත්ති, සංගීතය සහ වෙනත් මාධ්‍ය වෙත ප්‍රවේශ වීම සහ අපගේ සේවා ජීවිතය මෙහෙයවන ආකාරය චමත්කාරජනක ලෙස වෙනස් වී ඇත. Web 1.0 වර්ගයේ වෙබ් අඩවි තවමත් ඇතැම් අරමුණු සඳහා භාවිත කරන අතර, ඒවා මාර්ගගත ජාල රාශියකින් පරිපූරණය කර ඇත. ඒවායෙහි අන්තර්ගතයට දායක වීමට මෙන්ම වෙනත් පරිශීලකයන් සමග බෙදා ගැනීමට ද පරිශීලකයන්ට ඉඩ සලසා දී ඇත.

මෙම ක්‍රියාකාරකම් ඇතැම් අන්තර්ජාල පර්යේෂකයන් නිෂ්පාදන ක්‍රියාවලිය වෙනුවට පාරිභෝගිකයා මැදිහත් වන අවස්ථාවක් ලෙස නම් කර ඇත. එමගින් ඩිජිටල් තාක්ෂණය සමග එවැනි අන්තර්ක්‍රියාවල ද්විත්ව ස්වභාවය ප්‍රකාශ කරයි. (Beer & Burrows 2010; Ritzer et al., 2012). ප්‍රජාතන්ත්‍රවාදී පරමාදර්ශයට අනුකූල වන පරිදි, සමකාලීන ඩිජිටල් මාධ්‍ය භාවිතය මගින්, විශේෂයෙන්ම සමාජ මාධ්‍ය වේදිකාව පිළිබඳ කතිකාවල කේන්ද්‍රීය ලක්ෂණ වන පුරවැසි සහභාගීත්වය සහ බෙදාගැනීම මගින්, පරිශීලකයන් ඩිජිටල් තාක්ෂණය සමග අන්තර්ක්‍රියා කරන ආකාරය සහ ඒවා භාවිත කරන ආකාරයෙහි සැලකිය යුතු වෙනසක් නියෝජනය කරයි (John,2013) .

නව ඩිජිටල් මාධ්‍ය විස්තර කිරීමට 'මාධ්‍ය අභිසාරීතාව (media convergence)' යන යෙදුම වර්තමානය වන විට නිරන්තරව භාවිත වේ (Meikle & Young, 2012). දත්ත පටිගත කිරීමේ සහ සම්ප්‍රේෂණය කිරීමේ විවිධ ක්‍රම භාවිත කරන පැරණි මාධ්‍ය (ස්ථාවර දුරකථන, වීඩියෝ, රූපවාහිනිය, මුද්‍රිත මාධ්‍ය, ඇනලොග් ඡායාරූපකරණය, ශ්‍රව්‍ය පටි සහ වාර්තා) මෙන් නොව, ඩිජිටල් මාධ්‍ය එකම ආකාරයේ කේත භාවිත කරන අතර එම හේතුවෙන් එක් මාධ්‍යයකින් තවත් මාධ්‍යයකට දත්ත පහසුවෙන් මාරු කළ හැකි ය. එම මාධ්‍යවලට බොහෝ කාර්ය ද කළ හැකි ය. සුහුරු දුරකථන (smartphones) මගින් දුරකථන ඇමතුම් පමණක් නොව වෙබ් අඩවි සඳහා සම්බන්ධ කිරීම, ඩිජිටල් ඡායාරූප සහ වීඩියෝ ගැනීම, හඬ දත්ත පටිගත කිරීම සහ සංගීතය වාදනය, රූපවාහිනී වැඩසටහන් සහ චිත්‍රපට ප්‍රදර්ශනය වැනි ක්‍රියාකාරකම් සිදු කරයි. Wiis වැනි

ක්‍රීඩා කොන්සෝලයන්ට දැන් අන්තර්ජාලය පිරික්සීමට සහ සමාජ මාධ්‍ය වේදිකා වෙත සම්බන්ධ වීමට ද හැකි ය.

සෑම දිනකම භාවිත කරන විවිධ උපාංග එනම් - සුහුරු දුරකථන (smartphones), කැමරා, MP3 ධාවක, ඩෙස්ක්ටොප්, ලැප්ටොප්, ටැබ්ලට්, පැළඳිය හැකි පරිගණක අතර පොදු අතුරු මුහුණත් සහ ක්ලවුඩ් පරිගණකකරණය මඟින් ඔවුනොවුන් අතර තොරතුරු බෙදා ගත හැකි ය.

සමහර ලේඛකයන් යෝජනා කරන්නේ වර්තමානය වන විට අප Web 3.0 හෝ 'The Internet of Things' හෝ 'Semantic Web' (Halford et al, 2013) ලෙස නම් කර ඇති දේ කරා ගමන් කරන බව ය. මෙම නියම මඟින් 'ස්මාර්ට් වස්තු' හෝ වෙනත් ඩිජිටල්කරණය වූ වස්තු සමඟ රැහැන් රහිත ව සන්නිවේදනය කළ හැකි ක්ෂුද්‍ර පිරිසකසන (micro processors) තැන්පත් කර ඇති වස්තු ක්‍රමානුකූලව එකිනෙකට සම්බන්ධ කිරීමකට යොමු කරයි.

ඩිජිටල් මාධ්‍ය වේදිකා (digital media platforms) සහ වස්තු අතර අන්තර්සම්බන්ධතා, එක් වෙබ් අඩවියක තොරතුරු වෙනත් යෙදුමක් මඟින් භාවිත කිරීම, මානව මැදිහත්වීමකින් තොරව එකිනෙකා සමඟ ඍජුවම සන්නිවේදනය කිරීම සහ සම්බන්ධතා ඇති කර ගැනීම ආදී විශේෂාංග Web 3.0 මඟින් නියෝජනය කරයි. මෙම සබැඳි අවසානයේ ස්ථාන සහ වස්තු ඇතුළු අනන්‍ය හඳුනාගැනීම් සහිත 'දත්ත ආයතන (data entities)' නිපදවනු ඇතැයි පුරෝකථනය කර ඇත (Halford et al. 2013, පි. 176). මිනිස් සිරුරට ඇතුළත් කළ හැකි සංවේදක මත පදනම් වූ උපාංග පැමිණීමත් සමඟ මිනිසුන් තමන් 'දත්ත ආයතන' හෝ 'ද ඉන්ටර්නෙට් ඔෆ් තින්ග්ස්' (Brewster ,2013) හි එක් පුරුකක් බවට පත්කරගනු ඇතැයි පවා තර්ක කර ඇත.

**ඩිජිටල් සමාජ විද්‍යාව නිර්වචනය කිරීම**

ඩිජිටල් සමාජ විද්‍යාව මඟින් පරිගණකගත තාක්ෂණයට බලපෑම, සංවර්ධනය, භාවිතය, ඒවා සමාජ ලෝකවලට ඇතුළත් කිරීම සහ ආත්මභාවය පිළිබඳ සංකල්ප විමර්ශනය කිරීමට, විශ්ලේෂණය කිරීමට සහ අවබෝධ කර ගැනීමට අවැසි මාධ්‍යයක් සපයා දෙයි. 1980 දශකයේ මැද භාගයේ දී පරිගණක තාක්ෂණය පුළුල් වූ දා සිට සමාජ විද්‍යාඥයන් සිය පර්යේෂණ සිදු කර ඇත. ඔවුන් මාර්ගගත ප්‍රජාවන්ට, සයිබර් අවකාශයට සහ සයිබර් අනන්‍යතාවලට අදාළ විවිධ සමාජ ගැටලු රාශියක් ආමන්ත්‍රණය කර ඇති අතර එවැනි පර්යේෂණ, සයිබර් සමාජ විද්‍යාව, අන්තර්ජාලයේ සමාජ විද්‍යාව, මාර්ගගත ප්‍රජාවන්ගේ සමාජ විද්‍යාව, සමාජ මාධ්‍ය පිළිබඳ සමාජ විද්‍යාව සහ සයිබර් සංස්කෘතියේ සමාජ විද්‍යාව යන මාතෘකා යටතේ ආකර්ෂණය කර ගෙන ඇත.

1990 සහ 2000 දශකවල මුල් භාගයේ 'සයිබර්' යන යෙදුම ප්‍රචලිත ව තිබුණ ද, අන්තර්ජාලය වඩාත් ව්‍යාප්තව විය. එය සෑම තැනක ම ව්‍යාප්ත වී ඇති බැවින් එහි භාවිතය බොහෝ දුරට "ඩිජිටල්" මඟින් ප්‍රතිස්ථාපනය වී ඇති බව පෙනේ. 'ඩිජිටල් සමාජ විද්‍යාව' යන යෙදුම 'සයිබර් සමාජ විද්‍යාව' විසින් පෙර ආමන්ත්‍රණය කරන ලද උත්සුක නියෝජනය කරන අතර එය ජංගම ඩිජිටල් පරිගණක භාවිතයේ මෙම නව යුගය දක්වා විහිදේ. එය ඩිජිටල් සංස්කෘතික අධ්‍යයනය, ඩිජිටල් මානව ශාස්ත්‍ර සහ ඩිජිටල් මානව විද්‍යාව වැනි වෙනත් විෂය සහ ඒවායේ 'ඩිජිටල්' යන යෙදුමෙහි භාවිතය පිළිබඳ සඳහන් කරන විස්තරාත්මක යෙදුමකි. මෙම විෂය බොහොමයක් ඩිජිටල් සමාජ විද්‍යාව සමඟ ක්‍රමවේදීය සහ න්‍යායයික ප්‍රවේශ බෙදා ගනියි. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවල විෂය අතර පර්යේෂණ මාතෘකා, ක්‍රම සහ න්‍යායයික ප්‍රවේශ බොහෝ විට අතිච්ඡාදනය වන සමාජ පර්යේෂණ පරිසරයක මෙය නොවැළැක්විය හැකිය. කෙසේ වෙතත්, ඩිජිටල් මාධ්‍ය පිළිබඳ සමකාලීන සමාජ විද්‍යාත්මක ශිෂ්ටත්වය තුළ, විශේෂයෙන්ම ඩිජිටල් තාක්ෂණ අධ්‍යයන කටයුතුවලට සහ වඩාත්

නිශ්චිතව, සමාජ විද්‍යාත්මක භාවිතයට බලපාන ආකාරය පිළිබඳ සාකච්ඡාවට අදාළව හඳුනාගත හැකි සුවිශේෂ වෙනස්කම් කිහිපයක් තිබේ.

මෙහිදී මා ඩිජිටල් සමාජ විද්‍යාවට අයත් විවිධ අංශ හතරක් හඳුනාගෙන ඇත.

■ *වෘත්තීමය ඩිජිටල් භාවිතය* - සමාජ විද්‍යාත්මක භාවිතයේ කොටසක් ලෙස ඩිජිටල් මාධ්‍ය මෙවලම් භාවිත කිරීමඃ ජාල ගොඩනැගීම සඳහා, මාර්ගගත ප්‍රතිරූපයක් ගොඩනැගීම සඳහා, පර්යේෂණ පිළිබඳ ප්‍රචාරණයට, බෙදා ගැනීමට සහ සිසුන්ට උපදෙස් දීම සඳහා.

■ *ඩිජිටල් මාධ්‍ය භාවිතය පිළිබඳ සමාජ විද්‍යාත්මක විශ්ලේෂණය* - මිනිසුන් ඩිජිටල් මාධ්‍ය තාක්ෂණය භාවිත කිරීමෙන් ඔවුන්ගේ ආත්මභාවය, ඔවුන්ගේ ප්‍රතිමූර්තිය, ඔවුන්ගේ සමාජ සම්බන්ධතා, සමාජ සංස්ථා සහ සමාජ ව්‍යුහ නිර්මාණය කිරීම හෝ ප්‍රතිනිෂ්පාදනය කිරීමේ දී ඩිජිටල් මාධ්‍යවල කාර්යභාරය පිළිබඳ පර්යේෂණ කිරීම.

■ *ඩිජිටල් දත්ත විශ්ලේෂණය* - සමාජ පර්යේෂණ සඳහා ප්‍රමාණාත්මක හෝ ගුණාත්මක ඩිජිටල් දත්ත භාවිත කිරීම.

■ *විවේචනාත්මක ඩිජිටල් සමාජ විද්‍යාව* - සමාජ හා සංස්කෘතික න්‍යාය මඟින් දැනුම් දෙන ඩිජිටල් මාධ්‍ය තාක්ෂණය පිළිබඳ ප්‍රත්‍යාවර්තී සහ විවේචනාත්මක විශ්ලේෂණයක් සිදු කිරීම.

මෙම සෑම අංශයක්ම වඩාත් විස්තරාත්මකව පහත විස්තර කෙරේ.

**වෘත්තීමය ඩිජිටල් භාවිතය**

සමාජ විද්‍යාඥයින්, මහජන සමාජ විද්‍යාඥයින් වශයෙන් සමාජගත වීමට ඩිජිටල් මාධ්‍ය භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ. එමෙන්ම මහජන සමාජ විද්‍යාවේ වැදගත් මානයක් වන්නේ සමාජ විද්‍යාත්මක පර්යේෂණ සොයාගැනීම් සහ අදහස් මහජනතාව වෙත ගෙන යාම ය. සමාජ විද්‍යාඥයන් ඔවුනොවුන් සමඟ කථා කිරීම පමණක් නොව, තමන් පර්යේෂණ කරන සහ සිතන දේ අධ්‍යයන ආයතනයෙන් පිටත සිටින අයට ද දැන ගැනීමට සැලැස්විය යුතු ය. මහජන සමාජ විද්‍යාව පිළිබඳ මයිකල් බුරාවෝයි (Michael Burawoy) ගේ සුප්‍රසිද්ධ දේශනයේ දී, ඔහු (2005, පි. 4) සඳහන් කරන්නේ, මහජන සමාජ විද්‍යාවට සමාජ විද්‍යාත්මක තීක්ෂණ බුද්ධිය සහ පර්යේෂණ සොයාගැනීම් සමඟ බහුවිධ මහජනතාව විවිධ ආකාරවලින් සම්බන්ධ කර ගැනීම සිදු විය යුතු බව ය. මෙම තීක්ෂණ බුද්ධිය සහ සොයාගැනීම් ප්‍රකාශ කිරීම සඳහා ඩිජිටල් මාධ්‍ය භාවිතයට වඩා පොදු විය හැකි සහ ඩිජිටල් මාධ්‍ය එවැනි මහජන සහභාගීත්වය පහසුවෙන් සිදු කළ හැකි කදිම මාර්ග සපයයි. බුරාවෝයි සාම්ප්‍රදායික මාධ්‍ය, පොදු සමාජ විද්‍යාව සඳහා වේදිකාවක් ලෙස හැඳින්වුව ද ඔහු ඩිජිටල් මාධ්‍ය පිළිබඳ සඳහනක් නොකරයි. කෙසේ වෙතත්, ඔහු සිය ලිවීම් සිදු කරමින් සිටියේ Web 2.0 තාක්ෂණය බිහි වූ කාලයේ දී වන අතර ඇතැම් විට මහජන සමාජ විද්‍යාව සඳහා මෙම මාධ්‍යවල විභවය අවබෝධ කරගෙන නොතිබුණි.

| Platform or tool | Purpose |
|---|---|
| **Blogs** | පර්යේෂණ පිළිබඳ ලියන්න |
| **Twitter** | සම්බන්ධතා ඇති කර ගැනීම, පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම,සබැඳි බෙදාගන්න |
| **SlideShare** | PowerPoint හෝ Prezi ස්ලයිඩ් බෙදා ගන්න |
| **Facebook** | පෞද්ගලික පිටු සාදන්න |
| **Wikipedia** | ප්‍රවේශ සකසන්න හෝ සංස්කරණය කරන්න |
| **YouTube** | වීඩියෝ ද්‍රව්‍ය බෙදාගන්න |
| **Google Scholar** | වෙනත් පර්යේෂකයන්ගේ වැඩ සොයන්න, පර්යේෂණ පැතිකඩක් සාදන්න |
| **Pinterest** | පර්යේෂණ සහ ඉගැන්වීම සඳහා දෘශ්‍ය ද්‍රව්‍ය එකතු කරන්න |
| **Storify** | මාර්ගගත ද්‍රව්‍ය භාවිතයෙන් ආඛ්‍යානයක් සාදන්න |
| **Curating tools for online content (e.g. Bundlr, Scoop.it, Delicious)** | මාතෘකා තුළ මාර්ගගත තොරතුරු එකතු කර සුරකින්න |
| **Online referencing tools (e.g. Mendeley, EndNote Web, Zotero)** | යොමු කිරීම් එකතු කර බෙදා ගැනීමට |
| **Academia.edu** | සම්බන්ධතා ඇති කර ගැනීමට මෙන්ම, පර්යේෂණ බෙදා ගන්න |
| **LinkedIn** | සම්බන්ධතා ඇති කර ගැනීමට මෙන්ම, පර්යේෂණ බෙදා ගන්න |
| **E-repositories** | පර්යේෂණ පත්‍රිකා සඳහා විවෘත ප්‍රවේශය ලබා දීම |

ඉහත වගුවෙහි පෙන්වා ඇති පරිදි, මහජන සමාජ විද්‍යාඥයන් ලෙස සම්බන්ධ වීම හේතුවෙන් සමාජයේ කොටසක් ලෙස එවැනි තාක්ෂණ භාවිත කිරීමේදී ඔවුන් විද්‍යාව සහ මාධ්‍ය අධ්‍යයනය වැනි විෂයවලින් බෙහෙවින් පසුගාමී වුව ද, ඕස්ට්‍රේලියාවේ සහ වෙනත් රටවල වැඩෙන සමාජ විද්‍යාඥයන් විශාල සංඛ්‍යාවක් මහජන සහභාගීත්වයට සහ විවෘත කිරීමට ඇති කැපවීමේ කොටසක් ලෙසත් අධ්‍යයන පර්යේෂණ සහ ඔවුන්ගේ ඉගැන්වීම් සඳහා ප්‍රවේශයන් වශයෙනුත් මෙම මෙවලම් යොදා ගනියි.

මා එවැනි සමාජ විද්‍යාඥයෙක් වන අතර, සමාජ විද්‍යාත්මක පර්යේෂණ සහ ඉගැන්වීම් සඳහා සමාජ සහ අනෙකුත් ඩිජිටල් මාධ්‍ය භාවිත කිරීම පිළිබඳව සමාජ මාධ්‍ය සංසදවල පුළුල් ලෙස අදහස් දක්වා ඇත. මෙම මෙවලම් භාවිතයෙන් මා උනන්දුවක් දක්වන ක්ෂේත්‍රවල සේවය කරන අනෙකුත් විද්වතුන් මෙන්ම මහජනතාව සහ මගේ පර්යේෂණයට අදාළ වෘත්තීන්හි යෙදී සිටින පිරිස් අතර සම්බන්ධතා ප්‍රවර්ධනය කරන බව මම සොයා ගතිමි (Lupton, 2012). පර්යේෂණ මගින් පෙන්නුම් කර ඇත්තේ එවැනි දේ හි නියැළීම ශාස්ත්‍රාලයීයකුගේ පොදු සහ විද්වත් පැතිකඩ කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන බවයි (Eysenbach 2011 & Shuai *et al.*, 2012). නමුත් එවැනි දේ වැදගත් වීමට තවත් බොහෝ හේතු තිබේ. ඩිජිටල් මාධ්‍ය පිළිබඳ අනෙකුත් සමාජ පර්යේෂකයන්ගේ ක්‍රියාකාරකම් අනුගමනය කිරීම මාගේ ක්ෂේත්‍රය සමඟ යාවත්කාලීනව සිටීමට මාර්ගයක් බව මා හට පෙනී යයි. පර්යේෂණ සොයාගැනීම් බොහෝ විට සාකච්ඡා කර ප්‍රකාශයට පත් කරන්නේ සාම්ප්‍රදායික ශාස්ත්‍රීය අලෙවිසල්වලට වඩා බ්ලොග් සටහන් හෝ ලිපි හරහා වන අතර ඒවා Twitter, Academia.edu වැනි ඩිජිටල් ජාලවල හෝ විවෘත ප්‍රවේශ ඇති සඟරාවල විය හැකි ය.

මෙම සංසද වෙත ප්‍රවේශ වීම සහ තමන්ගේම පර්යේෂණ සඳහා දායක වීම යනු අති නවීන පර්යේෂණවල නිරත වීමේ සහ ප්‍රවේශ වීමේ ක්‍රමයකි. සමාජ විද්‍යාත්මක අරමුණු සඳහා මා භාවිත කරන ඩිජිටල් මාධ්‍යවල මෙවලම් සහ වේදිකා ගණනාවක් ඇතුළත් වන අතර, ඒ සියල්ල එකිනෙකට සම්බන්ධ වේ. මා හට අයත් බ්ලොගයක් ඇති අතරම (මම නිරන්තරව සමාජ මාධ්‍ය සහ ශාස්ත්‍රීය දෑ පිළිබඳ සාකච්ඡා කරන අවස්ථා හි දී) අධ්‍යයන අරමුණු සඳහා Twitter, LinkedIn සහ Facebook ජාලවල නිත්‍ය පරිශීලකයෙකි. පර්යේෂණ ද්‍රව්‍ය එකතු කිරීම සඳහා මම Pinterest, Bundlr, Scoop.it සහ Storify වැනි වෙබ් තොරතුරු සෙවීමේ මෙවලම් ද භාවිත කරමි. මාගේ පර්යේෂණ ලේඛන උඩුගත කිරීමට Academia.edu වෙබ් අඩවිය සහ PowerPoint ඉදිරිපත් කිරීම් සඳහා SlideShare භාවිත කරයි, එම අන්තර්ගතය සඳහා පරිගණකයක් සහ මාර්ගගත සම්බන්ධතාවක් ඇති ඕනෑම අයෙකුට ප්‍රවේශ විය හැකි ය. මෙම මෙවලම් සහ වේදිකා බොහොමයක් එකිනෙකට අන්තර්සම්බන්ධිත වේ. මම බ්ලොග් සටහනක් පළ කරන විට, උදාහරණයක් ලෙස, මම එය Twitter, Facebook, LinkedIn සහ Academia.edu හි ප්‍රසිද්ධ කරමි. මගේ බ්ලොග් සටහන්, බොහෝ විට ශාස්ත්‍රීය ලිවීමේ කොටසක් වන අතර පසුව මම සඟරා ලිපි, පොත් පරිච්ඡේද සහ පොත් වැනි සාම්ප්‍රදායික ශාස්ත්‍රීය සංසදවල ප්‍රකාශයට පත් කරමි. මා විකිපීඩියාව සඳහා ඩිජිටල් සමාජ විද්‍යාව පිළිබඳ ප්‍රවේශයක් පවා ලියා ඇත (Digital Sociology, 2013). (ඩිජිටල් සමාජ විද්‍යාව ඩිජිටල් වේදිකාවක ලිවීමෙන්, ඩිජිටල් සමාජ විද්‍යාඥයෙකු ලෙස සම්බන්ධ වීමෙන් යම් ප්‍රත්‍යාවර්තක තෘප්තියක් ලැබිය යුතුය).

**ඩිජිටල් මාධ්‍ය භාවිතය පිළිබඳ සමාජ විද්‍යාත්මක විශ්ලේෂණය**

සමාජ විද්‍යාවේ පමණක් නොව මාධ්‍ය හා සංස්කෘතික අධ්‍යයනය, සංස්කෘතික භූගෝල විද්‍යාව සහ මානව විද්‍යාව යන ක්ෂේත්‍රවල ද පරිශීලකයන් ඩිජිටල් මාධ්‍ය සමඟ අන්තර්ක්‍රියා කරන ආකාරය පිළිබඳ පර්යේෂණ කිරීමේ දීර්ඝ සම්ප්‍රදායක් පවතී. සමහර පර්යේෂකයන් එසේ කිරීමට ප්‍රමාණාත්මක සමීක්ෂණ භාවිත කර ඇති අතර, තවත් බොහෝ දෙනෙක් ජනවාර්ගික පර්යේෂණ, නාභිගත කණ්ඩායම් සහ අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා වැනි ගුණාත්මක, ගැඹුරු ක්‍රම භාවිත කරති.

සමාජ සංස්ථා (උදාහරණයක් ලෙස, ආර්ථිකය, ජන මාධ්‍ය, පවුල සහ අධ්‍යාපන පද්ධතිය) සහ සමාජ ව්‍යුහ (වයස, ස්ත්‍රී පුරුෂභාවය, සමාජ පන්තිය, ජාතිය/වාර්ගිකත්වය) නිර්මාණය කිරීමේ දී හෝ ප්‍රතිනිෂ්පාදනය කිරීමේදී ඩිජිටල් මාධ්‍යවල බලපෑම කෙරෙහි අවධානය යොමු කිරීම ඩිජිටල් සමාජ විද්‍යාඥයන් බොහෝ විට භාවිත කරන විවේචනාත්මක ප්‍රවේශයේ ලක්ෂණයකි. මෙහි දී නැවතත් බුරාවෝයිගේ (2005) පොදු සමාජ විද්‍යාව පිළිබඳ නිර්වචනය අදාළ වේ, මන්ද ඔහු සමාජ විද්‍යාඥයන් තම පර්යේෂණන් 'පෞද්ගලික ගැටලු පොදු ගැටලු බවට පත් කිරීමට' භාවිත කිරීමේ වැදගත්කම අවධාරණය කරන අතර එය මුල් කාලවකවානුවල සිට පැවත එන සමාජ විද්‍යාත්මක ලිවීමේ අංගයකි.

නිදසුනක් වශයෙන්, ඩිජිටල් මාධ්‍ය කෙරෙහි උනන්දුවක් දක්වන සමාජ විද්‍යාඥයන් කිහිප දෙනෙකුගේ අවධානය යොමු වී ඇත්තේ දුප්පතුන්, සංවර්ධනය වෙමින් පවතින රටවල හෝ දුර බැහැර ප්‍රදේශවල ජීවත් වන පුද්ගලයන්, ආබාධිත හෝ නිදන්ගත රෝගාබාධ සහිත පුද්ගලයන් සහ දුර්වල භාෂා කුසලතා සහිත පුද්ගලයන් වැනි අවාසි සහගත සමාජ කණ්ඩායම්වල ඇතැම් සාමාජිකයන් බොහෝ විට අත්විඳින ඩිජිටල් තාක්ෂණය සඳහා ප්‍රවේශය නොමැතිකම පිළිබඳවය. (ඕස්ට්‍රේලියානු පර්යේෂණ සඳහා උදාහරණ, Blanchard *et al.* 2008; Broadbent & Papadopoulos 2013; Smith *et al.*2013).

මෙම ප්‍රවේශය නොමැතිකම පර්යේෂකයන් "ඩිජිටල් බෙදීම (the digital divide)" ලෙස හඳුන්වයි. කෙසේ වෙතත්, Susan Halford සහ Mike Savage (2010) පෙන්වා දී ඇති පරිදි, මෙම යෙදුම තරමක් සරල ය.

මන්ද යත් එය සම්බන්ධ සංකීර්ණතා හඳුනා ගැනීමට අපොහොසත් වන අතර 'තාක්ෂණය' සහ 'සමාජ අවාසි' වෙනස් සහ ස්වාධීන සංසිද්ධි දෙකක් ලෙස ස්ථානගත කිරීමට නැඹුරු වේ. සමාජ අසමානතාව සහ ඩිජිටල් මාධ්‍ය තාක්ෂණයට ඇති ප්‍රවේශය යන දෙකෙහිම අර්ථය අනුව ඔවුන් එකිනෙකට අන්තර්සම්බන්ධිත බව සහ ඒවායේ ගතික ස්වභාවය පිළිගත යුතු බව ඔවුහු තර්ක කරති. සෑම එකක්ම අනෙකා මත පිහිටුවීමට ක්‍රියා කරන නමුත් මෙය තරල, අස්ථායී ක්‍රියාවලියකි. Halford සහ Savage සමාජ අවාසි සහ ඩිජිටල් තාක්ෂණයට ප්‍රවේශය නොමැතිකම අතර අන්තර්සම්බන්ධිත බව දැක්වීම සඳහා 'ඩිජිටල් සමාජ අසමානතාවය' යන සංකල්පය යෝජනා කරයි.

Halford සහ Savage ද සටහන් කරන්නේ "ඩිජිටල් බෙදීම්" සාහිත්‍යය මගින් ඩිජිටල් තාක්ෂණයන්ට වැඩි හෝ වඩා හොඳ ප්‍රවේශයක් ලබා දීමෙන් සමාජයට අවාසි සහගත ගැටලු විසඳනු ඇතැයි උපකල්පනය කිරීමට නැඹුරු වන බව ය. එහෙත් ඩිජිටල්කරණයෙන් සමාජයට සිදුවන අවාසි සහගත තත්වයන්ට සම්බන්ධ එකම ගැටලුව ප්‍රවේශය ලබා දීම පමණක් නොවේ. මිනිසුන් නිරත වන විවිධ භාවිතයන් සම්බන්ධව හඳුනා ගැනීම ද වැදගත් වේ (Hargittai, Hinnant 2008; Robinson, 2009). විවිධ සමාජ කණ්ඩායම්වල පුද්ගලයන් ඩිජිටල් තාක්ෂණයට ප්‍රවේශය ඇති විට ඒවා භාවිත කරන්නේ කෙසේ ද? ඒවා ඵලදායී ලෙස භාවිත කිරීමට ඔවුන් සතුව තිබිය යුතු හැකියා සහ අවබෝධය කෙබඳු ද සහ ඔවුන්ගේ සමාජ ස්ථානගත කිරීම් මේවාට බලපාන්නේ කෙසේ ද? ස්ත්‍රී පුරුෂභාවය, වයස, අධ්‍යාපනය, සමාජ තරාතිරම, වාර්ගිකත්වය/වර්ගය සහ ඩිජිටල් මාධ්‍ය භාවිත කිරීමට මිනිසුන්ට ඇති හැකියාව පිළිබඳ පූර්ව-ස්ථාපිත උපකල්පන ඔවුන්ගේ භාවිතයට බලපාන්නේ කෙසේ ද? ඇතැම් ඩිජිටල් මාධ්‍ය භාවිතය කෙතරම් දුරට සමාජ අවාසි සහගත තත්ත්වයන් උග්‍ර කිරීමට හෝ සමනය කිරීමට සමත් ද? උසස් අධ්‍යාපන මට්ටම්වල සිටින අයට වඩා අඩු අධ්‍යාපන මට්ටමේ පුද්ගලයන්ට ඔවුන්ගේ නිදහස් කාලය තුළ අන්තර්ජාලයේ වැඩි කාලයක් ගත කළ හැකි බව පර්යේෂණවලින් පෙන්වා දී ඇත, නමුත් එය විවිධ ආකාරවලින් සිදු කරයි. බොහෝ විට සමාජ අන්තර්ක්‍රියාවල යෙදීම සහ ක්‍රීඩා කිරීම, උදාහරණයක් ලෙස, අධ්‍යාපනය සඳහා නොව, රැකියා ආශ්‍රිත හේතු මත තොරතුරු සෙවීම (van Deursen & van Dijk, 2013), හෝ 'ප්‍රාග්ධන වැඩි දියුණු කිරීමේ ක්‍රියාකාරකම්' දැක්විය හැකිය (Hargittai & Hinnant 2008).

නව ඩිජිටල් මාධ්‍ය මගින් පිරිනමන අවස්ථා පිළිබඳ ප්‍රධාන ධාරාවේ ගිණුම්වල බොහෝ විට සංසරණය වන ප්‍රජාතන්ත්‍රවාදී සහභාගීත්වය, ප්‍රජාව ගොඩනැගීම, බෙදාගැනීම සහ අනුමාන පිළිබඳ මනෝරාජික කතිකා බොහෝ විට මෙම තාක්ෂණයේ දේශපාලන පැතිකඩ හඳුනා ගැනීමට අපොහොසත් වන බව පිළිගැනීම වැදගත් ය. අවාසි සහගත සමාජ කණ්ඩායම්වල පුද්ගලයන් බොහෝ විට ඩිජිටල් මාධ්‍ය වෙත ප්‍රවේශ වීමේ සහ භාවිතයේ සීමා අත්විඳිනවා පමණක් නොව, සියලුම පරිශීලකයන් මෙම තාක්ෂණයන් ඔවුන්ට ලබා දෙන දෙයින් සීමා වී ඇත. ඩිජිටල් තාක්ෂණයන් හුදෙක් මධ්‍යස්ථ කෞතුක වස්තු නොවේ: ඒවායේ මිල (ඒවා භාවිත කළ හැකි ක්‍රම) බොහෝ විට වාණිජමය අවශ්‍යතා සහ ආයතනික ලෝක දර්ශන මත පදනම් වන ඒවායේ සංවර්ධකයන්ගේ තීරණවලට අනුව හැඩගැසී ඇත.

ඩිජිටල් මාධ්‍ය භාවිතය ඩිජිටල් ආර්ථිකයක කොටසක් ලෙස සිදු වේ. එනම් පරිශීලකයන් නොව, සංවර්ධකයන් ජනනය කළ සහ ව්‍යුහගත කළ ආකෘතිවලිනි (Bird, 2011). ඇත්ත වශයෙන්ම පරිශීලකයන්ගේ Web 2.0 වේදිකා මත අන්තර්ගතය සෑදීමට සහ බෙදා ගැනීමට ඇති ආශාව සහ ඔවුන් උඩුගත කරන දත්ත ධනය උත්පාදනය කිරීමේ ප්‍රභවය ලෙස ආයතනික සමාගම් විසින් වැඩි වැඩියෙන් ඉලක්ක කර ඇත (Fuchs & Dyer- Witheford 2012; Jenkins, 2013; Lupton, 2013b). නිෂ්පාදන ක්‍රියාවලියට නිෂ්පාදකයා වෙනුවට සහභාගී වන පාරිභෝගිකයන් (Prosumers) වැටුප් නොගෙවන ඩිජිටල් ශ්‍රමය ලබාදීමේ යෙදී සිටින අතර

Amazonzs Mechanical Turk සහ Freelancer.com වැනි අන්තර්ජාල වේදිකාවල නිදහස් රැකියා කටයුතු සඳහා ලංසු තබන වෙනත් බොහෝ වැටුප් ලබන සේවකයන්ට ඔවුන්ගේ ශ්‍රමය සඳහා ඉතා අඩු ප්‍රතිලාභයක් ලබා දී ඇති අතර රැකියා අනාරක්ෂිත බව ද අත්විඳියි. ඔවුන්ට ප්‍රතිලාභ කිසිවක් ද ලබා නොදෙන අතර අනෙකුත් බොහෝ සේවා ස්ථාන පිරිනමන ප්‍රතිලාභ ද ලබා නොදේ. (Scholz,2013). එබැවින්, විභේදනාත්මක බල සම්බන්ධතා සහ සූරාකෑම, අන්තර්ජාලයේ ප්‍රජාතන්ත්‍රවාදී ස්වභාවය පිළිබඳ පිළිගත් උපකල්පනවලට අභියෝග කරමින්, වෙනත් සමාජ වෙබ් අඩවිවල මෙන් අන්තර්ජාලයේ ද ප්‍රතිනිෂ්පාදනය වේ.

**ඩිජිටල් දත්ත විශ්ලේෂණය**

ඩිජිටල් දත්ත විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය වන්නේ භාවිතයේ අතුරු ප්‍රතිඵලයක් ලෙස (උදාහරණයක් ලෙස වෙබ් අඩවිවල 'කුකීස්' මගින් රැස් කරන ගනුදෙනු දත්ත) හෝ භාවිත කරන්නන් අන්තර්ජාලය සමඟ අන්තර්ක්‍රියා කරන විට හෝ පරිශීලකයන් හිතාමතාම දායකත්වය දීම (බ්ලොග් සටහන්, අඩවිවල අදහස්, පාරිභෝගික ශ්‍රේණිගත කිරීම්, tweets, ෆේස්බුක් යාවත්කාලීන කිරීම්, YouTube වෙත උඩුගත කළ ගෘහයේ නිර්මිත වීඩියෝ සහ යනාදිය) මගිනි.

සමූහ මූලාශ්‍රය (crowdsourcing) හෝ නිෂ්පාදන ක්‍රියාවලියට නිෂ්පාදකයා වෙනුවට සහභාගී වන පාරිභෝගිකයන් ගෙන් යම් තොරතුරු අවශ්‍යතාවක් ඉටු කිරීම සඳහා දත්තවල දායකත්වය ලබා ගැනීම ද මෙම දත්ත එකතු කිරීමේ කොටසකි. ඇල්ගොරිදම (Algorithms) දත්ත උත්පාදනය කිරීමට පමණක් නොව, පරිශීලකයන්ගේ පරිභෝජන පුරුදු පුරෝකථනය කිරීමට හෝ හැඩගැස්වීමට ද භාවිත කරයි. නිදසුනක් ලෙස, Amazon පරිශීලකයන්ට ඔවුන්ගේ පෙර සෙවීම් බැලීමේ හෝ මිල දී ගැනීමේ පුරුදු මත පදනම් ව ලැබෙන පොත් නිර්දේශ, හෝ Google සපයන ස්වයංක්‍රීය සෙවුම් පද සම්පූර්ණ කිරීම් (Auto Fill) දැක්විය හැකි ය.

ඩිජිටල් මාධ්‍ය නියැළීම හරහා නිපදවා ඩිජිටල් ලෙස සංරක්ෂණය කළ 'විශාල දත්ත'වල හැකියාවන්, වාණිජ ව්‍යවසාය සහ සමාජ පර්යේෂණ සඳහා භාවිත කිරීමට ඇති හැකියාව පිළිබඳව මෑත කාලයේ වැඩි අවධානයක් යොමු වී ඇත. ඩිජිටල් දත්ත හඳුනා ාගැනීම, හැසිරවීම සහ විශ්ලේෂණය කිරීම සඳහා 'වෙබ් සූරා දැමීම්' හෝ 'එකතු කිරිමේ ක්‍රියාවලියක් (harvesting)' වැනි ශිල්පීය ක්‍රම භාවිත කරන ඩිජිටල් දත්ත කර්මාන්තයක් වර්ධනය වී ඇත. මෙම දත්ත භාවිත කරමින් ඩිජිටල් දත්ත නිර්මාණය කිරීම සහ සමාජ පර්යේෂණ, සාම්ප්‍රදායික ශාස්ත්‍රීය සමාජ විද්‍යාවෙන් පිටත විවිධ ක්‍රියාකාරීන් අතර දැන් නැවත බෙදා හැර ඇත (Marres, 2012).

මෙය සිදු කිරීම සඳහා භාවිත කරන බොහෝ මෙවලම් දත්ත ප්‍රමාණිගත කිරීම සඳහා ඇතුළත් වේ. අන්තර්ජාලයේ ගුණාත්මක දත්ත විශ්ලේෂණය කරන ප්‍රවේශ ද ඇති අතර ඇතැම් ඒවා ස්වාභාවික භාෂා සැකසුම් මාර්ගෝපදේශ භාවිතා කරයි. මෙම මෙවලම් සමාජ ජාල විශ්ලේෂණය, විශේෂිත පුද්ගලයන්ගේ සහ මාතෘකාවල සමාජ මාධ්‍යවල බලපෑම මැනීම (කවුද, කුමක් ද 'ප්‍රවණතාව' සහ ඇයි) සහ ප්‍රකාශිත 'හැඟීම්' ඇතුළු පුළුල් පරාසයක සමාජ පර්යේෂණ අරමුණු සඳහා භාවිත කළ හැකි ය. මෙම පුද්ගලයන් සහ මාතෘකා (අනෙක් අය ඔවුන්ට චිත්තවේගීය ලෙස ප්‍රතිචාර දක්වන ආකාරය) මෙන්ම භූගෝලීය පිහිටීම, වයස, ස්ත්‍රී පුරුෂභාවය, සමාජ පන්තිය සහ ජාතිය සහ වාර්ගිකත්වය අනුව වෙනස් විය හැකි ආකාරය කෙසේ ද යන්න සොයා බැලිය හැකිය. මිනිසුන්ගේ පරිභෝජන රටා මත ද විශාල ඩිජිටල් දත්ත ප්‍රමාණයක් ජනනය වේ. ඔවුන් මිල දී ගන්නා භාණ්ඩ සහ සේවා මොනවා ද, ඔවුන් බාගත කරන්නේ කුමන සංගීතය ද, ඔවුන් විදුලිය සහ වෙනත් උපයෝගිතා භාවිත කරන ආකාරය, ඔවුන් නිවාඩු ගත කිරීමට කැමති ස්ථාන සහ ඔවුන් එහි සංචාරය කිරීමට තෝරා ගන්නා ආකාරය, ඔවුන් පිවිසෙන වෙබ් අඩවි මොනවා ද සෙවුම් යන්ත්‍ර භාවිත කිරීම සහ යනාදිය වේ.

සමාජ විද්‍යාඥයන් සහ අනෙකුත් සමාජ පර්යේෂකයන් සමාජ පර්යේෂණ ව්‍යාපෘති සඳහා මෙම ඩිජිටල් දත්ත භාවිත කිරීමේ හැකියාව දැකීමට පටන් ගෙන තිබේ. මෙහි දී සමාජ මාධ්‍යවලට එම මාතෘකාව ලබා දී ඇත්තේ ඒවා සමාජ සම්බන්ධතා, ප්‍රජාව සහ හැසිරීම් සමඟ සම්බන්ධ වන බැවිනි. Noortje Marres (2012, p.142) සඳහන් කරන පරිදි, ඩිජිටල් මාධ්‍ය සහ උපාංග පිළිබඳව සමාජ විද්‍යාඥයන්ගේ විශේෂයෙන් සිත්ගන්නා කරුණ නම්, 'එමගින් සමාජ ජීවිතයේ කොටසක් ලෙස සමාජ ජීවිතය පිළිබඳ දත්ත උත්පාදනය සක්‍රීය කරයි' යනුවෙනි. මෙම ප්‍රකාශය බුරාවෝයිගේ (2005, පි. 7) මහජන සමාජ විද්‍යාවේ විභවය පිළිබඳ නිරීක්ෂණය ප්‍රතිරාවය කරන අතරම සමාජ විද්‍යාව සමඟ මහජනතාව සමඟ සංවාදයකට ගෙන ඒම තුළ තමන් සංවාදයකට සම්බන්ධවූවන් ලෙස වටහා ගනී.

අන්තර්ජාලයෙන් දත්ත රැස් කිරීම සඳහා ඩිජිටල් මෙවලම් ගණනාවක් භාවිත කිරීමට සමාජ පර්යේෂකයන්ට හැකි වේ. ඒ මඟින් සමාජ පර්යේෂණ සඳහා නව ක්‍රම උත්පාදනය කිරීමටත් ඒවා මෙම ව්‍යාපෘති සඳහා භාවිත කිරීමටත් හැකි ය. එහි දී ෆේස්බුක් සහ ට්විටර් පළ කිරීම්, සෙවුම් යන්ත්‍ර විමසීම් (search engine enquiries), කෙටි පණිවුඩ, යූ ටියුබ් වීඩියෝ, බ්ලොග්, මාර්ගගත රූප, ශ්‍රව්‍ය දත්ත සහ ගෝලීය ස්ථානගත දත්ත පවා විශ්ලේෂණය සඳහා භාවිත කළ හැකිය.

වෙබ් පාදක සමීක්ෂණ භාවිත කිරීම ඇතුළුව, පර්යේෂකයන්ට ඔවුන්ගේම ගැටලු සඳහා අවශ්‍ය දත්ත ද ලබා ගත හැකිය. ඇතැම් ඩිජිටල් දත්ත විශ්ලේෂණයට මිල අධික මෘදුකාංග සහ ක්‍රමලේඛන කුසලතා හෝ මෘදුකාංග භාවිත කරන ආකාරය පිළිබඳ පුහුණුව ඇතුළත් වන අතර, එහි දී නොමිලේ ('විවෘත') web harvesting සහ දෘශ්‍යකරණ මෙවලම් කිහිපයක් භාවිත කිරීමට පහසු වී ඇත. Google සතුව Blogsearch Scraper, Image Scraper, News Scraper සහ එහි Ngram viewer, a phrase-usinggraphing මෙවලම ඇතුළු මෙවලම් කිහිපයක් ඇත. NVivo සමාජ දත්ත විශ්ලේෂණ මෙවලමෙහි නවතම අනුවාදය ඇතුළුව ඩිජිටල් දත්ත විශ්ලේෂණය සඳහා තවත් බොහෝ සංකීර්ණ දත්ත විශ්ලේෂණ මෙවලම් භාවිත කළ හැකි ය. වර්තමානය වන විට ගුණාත්මක සහ ප්‍රමාණාත්මක විශ්ලේෂණය සඳහා මාර්ගගත අඩවිවලින් ද්‍රව්‍ය ආනයනය කළ හැකිය.

**විවේචනාත්මක ඩිජිටල් සමාජ විද්‍යාව**

ඩිජිටල් මාධ්‍ය පර්යේෂණ සඳහා විවේචනාත්මක සමාජ විද්‍යාත්මක ප්‍රවේශයක් මඟින් එවැනි පර්යේෂණවල ස්වභාවය සහ එහි ඇඟවුම් කෙරෙහි අවධානය යොමු කරයි. සමාජ විද්‍යාඥයන් මෙම ව්‍යවසායයේ වෙනත් බොහෝ සමාජ පර්යේෂකයන්ට වඩා වෙනස් වන්නේ මෙම දත්තවල 'සජීවී බව' පිළිබඳව ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුගේ (සියලුදෙනාම නොවේ) දැනුම්වත් වීම හේතුවෙනි. වෙනත් ඕනෑම දත්ත වර්ගයක් මෙන් ඩිජිටල් දත්ත ද සඳහා ද සමාජීය වශයෙන් නිර්මාණය කර ඇති ඔවුන්ගේම සමාජ ජීවිතයක් ඇත. ඒවා ස්වයංක්‍රීය ගණනය කිරීම සඳහා වන මධ්‍යස්ථ නිෂ්පාදන නොවේ. මෙම දත්ත එකතු කර, හසුරුවන පරිගණක ඇල්ගොරිදම සකසන අය හිතාමතා තීරණ නියෝජනය කරයි (Boyd & Crawford, 2012).

'විවෘත දත්ත'වල ප්‍රජාතන්ත්‍රවාදී හැකියාව හෝ ඕනෑම කෙනකුට භාවිත කිරීමට ලබා ගත හැකි ඩිජිටල් දත්ත ගැන බොහෝ දේ ලියා ඇතත්, ඔවුන් රැස් කරන දත්ත සත්‍ය වශයෙන්ම මහජනයාට ලබා දීමට සංස්ථා හෝ ආයතන දක්වන කැමැත්ත පිළිබඳව ප්‍රශ්න පවතී (Halford et al, 2013). පාරිභෝගිකයන් ජනනය කළ දත්ත ඩිජිටල් වේදිකාවකට උඩුගත කළ පසු ඔවුන්ට ප්‍රවේශ වීම බොහෝ විට දුෂ්කර වන අතර, ඉහත සඳහන් කළ පරිදි, ඔවුන් මූල්‍යමය වශයෙන් ප්‍රතිලාභ නොලබන වාණිජ ව්‍යවසායක පදනම බවට පත්විය හැකිය.

ඩිජිටල් සමාජ විද්‍යා පර්යේෂණයේ තවත් මාතෘකාවක් වන්නේ සමාජ විද්‍යාඥයන් සහ අනෙකුත් විද්වතුන් ම ඩිජිටල් මාධ්‍ය භාවිත කරන ආකාරය පිළිබඳව විවේචනාත්මක අවධානය යොමු කිරීමයි. මෙය වෘත්තීය පරිචයේ කොටසක් ලෙස ඩිජිටල් තාක්ෂණ භාවිතය හරහා වින්‍යාස කර ඇති විෂය ආස්ථාන විශ්ලේෂණය කිරීමට සහ ප්‍රශ්න කිරීමට සමකාලීන සමාජ හා සංස්කෘතික න්‍යාය උකහා ගන්නා ප්‍රත්‍යාවර්ති ප්‍රවේශයකි. එවැනි විවේචනාත්මක ප්‍රවේශයක් හරහා වෘත්තීය ඩිජිටල් භාවිතය හෝ සමාජ පර්යේෂණ සඳහා ඩිජිටල් දත්ත විශ්ලේෂණය කිරීම වැළැක්විය නොහැකි අතර, එය එවැනි භාවිතයන්ගේ ඇඟවුම් සහ අනපේක්ෂිත ප්‍රතිවිපාක පිළිබඳ පරාවර්තනය සඳහා අවකාශයක් විවර කරයි (මේ පිළිබඳ සාරාංශයක් සඳහා වගුව 3 බලන්න).

**වගුව 3: නව ඩිජිටල් මාධ්‍ය මගින් සමාජ විද්‍යාඥයන් කෙරෙහ මතු කර ඇති අභියෝග**

| | |
|---|---|
| ඩිජිටල් දත්ත ආර්ථිකය | • ආනුභවික සමාජ පර්යේෂණ විශේෂඥයන් ලෙස සමාජ විද්‍යාඥයන්ගේ තත්ත්වය |
| ඩිජිටල් දත්ත සහ වෙබ් 3.0 | • සමාජ විද්‍යාඥයන්ගේ පරිගණක හා දත්ත විශ්ලේෂණ විශේෂඥතාව |
| සංසරණයේ දේශපාලනය | • සමාජ විද්‍යාඥයන් ඔවුන්ගේ පර්යේෂණවල නිෂ්පාදන පාලනය කිරීම |
| MOOÐ, විවෘත ප්‍රවේශ ප්‍රකාශනය, උපුටා දැක්වීම් දර්ශක | • සමාජ විද්‍යාඥයන්ගේ රැකියා කොන්දේසි |
| සමාජ සහ අනෙකුත් ඩිජිටල් මාධ්‍ය විශේෂඥතාව | • සමාජ විද්‍යාඥයන්ගේ වෘත්තීය සහ පොදු පැතිකඩ |

සමාජ විද්‍යාඥයන් අනතුරු අඟවා ඇත්තේ ඩිජිටල් දත්ත සහ ඒවා එකතු කිරීමට, විශ්ලේෂණය කිරීමට භාවිත කරන මෙවලම් යන ද්විත්වයම තවත් බොහෝ දේ අතර පර්යේෂණ හැඩගැස්වීමේ විශේෂිත ක්‍රම වන අතර, ඒවා විවේචනාත්මකව පිළිගැනීමට එරෙහිව ප්‍රවේශම් විය යුතු බවටය (Beer 2012;Savage 2013). ඇතැම් සමාජ විද්‍යාඥයන් අනෙකුත් සමාජ විද්‍යාඥයන්ගේ නව මාධ්‍ය භාවිතය ඔවුන්ගේ රැකියා කොන්දේසි සහ ඔවුන්ගේ වෘත්තීය ස්වයං ඉදිරිපත් කිරීම් සඳහා බලපාන ආකාරය පිළිබඳව ද ප්‍රශ්න කර ඇත. (Savage & Burrows 2007; Burrows 2012; Savage,2013). Google Scholar මෙට්‍රික්ස්, විවෘත ප්‍රවේශ ප්‍රකාශනය (open access publishing), සමාජ ක්‍රියාකාරකම් පිළිබඳ ඩිජිටල් දත්ත නිරන්තරයෙන් උත්පාදනය කිරීම සහ දැවැන්ත විවෘත මාර්ගගත පාඨමාලා (MOOÐ) හඳුන්වා දීම වැනි තාක්ෂණය විශ්වවිද්‍යාලවල සේවය කරන සමාජ විද්‍යාඥයන් මත ඇති කරන බලපෑම කුමක් ද? ඩිජිටල් මාධ්‍ය සමග සක්‍රීය ව සම්බන්ධ වී ශක්තිමත් අන්තර්ජාල පැවැත්මක් ඇති කර ගැනීමට හැකි විද්වතුන් අනෙකුත් විද්වතුන්ට වඩා ප්‍රමුඛත්වය ලබා ගනීවි ද?

ඇතැම් සමාජ විද්‍යාඥයන් තර්ක කර ඇත්තේ ඩිජිටල් මාධ්‍ය තාක්ෂණයෙන් නිපදවන දත්ත ප්‍රමාණ සහ වාණිජ සමාගම් මෙම දත්ත විශ්ලේෂණය කිරීමට ඇති හැකියාව සමාජ විද්‍යාත්මක භාවිතයට විශාල අභියෝගයක් විය හැකි බවයි. වෙනත් සමාජ පර්යේෂකයන්ට සහ වාණිජ සමාගම්වලට මෙම දත්ත වෙත ප්‍රවේශ වී විශ්ලේෂණය කළ හැකි නම්, සමාජ විද්‍යාඥයන්ට ඉටු කළ හැකි කාර්යභාරය කුමක් ද ? (Savage

& Burrows, 2007). Web 3.0 දෙසට ගමන් කරන විට අන්තර්ජාලයේ වැඩිවන සංකීර්ණත්වය මෙම නව තාක්ෂණයේ සමාජ හා දේශපාලන අංශ පිළිබඳව පර්යේෂණ කිරීමේ දී සමාජ විද්‍යාඥයන්ට අභියෝග ඉදිරිපත් කරන බවත්, ඒ සඳහා ඔවුන් වඩාත් සංකීර්ණ පරිගණක විශේෂඥතාවක් ලබා ගැනීමට අවශ්‍ය විය හැකි බවත් තර්ක කර ඇත. එසේත් නැතිනම් පරිගණක විද්‍යාඥයන් සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතුය (Halford et al, 2013). තවත් අය අනතුරු අඟවා ඇත්තේ සමාජ විද්‍යාඥයන් ඩිජිටල් මාධ්‍ය සංස්කෘතිවල සංසරණ දේශපාලනය (politics of circulation) පිළිබඳව දැනුවත් විය යුතු බවයි (Beer,2013). නව මාධ්‍ය තාක්ෂණය භාවිත කිරීම හේතුවෙන් සමාජ විද්‍යාඥයන්ගේ සහ අනෙකුත් විද්වතුන්ගේ ශ්‍රමයේ නිෂ්පාදනය පෙර නොවූ විරූ ආකාරයෙන් නැවත ලබාගෙන පරිවර්තනය කළ හැකි අතර ශාස්ත්‍රීය පර්යේෂණ සහ ප්‍රකාශනයේ සාම්ප්‍රදායික සංකල්පවලට අභියෝගයක් විය හැකි ය.

**නිගමනය**

නව ඩිජිටල් මාධ්‍ය මඟින් සමාජ ජීවිතය, සමාජ සංස්ථා සහ සමාජ විද්‍යාව ඇතුළු සමාජ ව්‍යුහවල බොහෝ අංශ කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කර ඇත. බොහෝ සමාජ විද්‍යාඥයන්ට ඉහත දක්වා ඇති ඩිජිටල් සමාජ විද්‍යාවේ පැති හතරම ඉදිරිපත් කරන විභවයන් දැකිය හැකිය. සමාජ විද්‍යාව සඳහා ඩිජිටල් තාක්ෂණයේ සහ ඩිජිටල් දත්තවල විභවය පිළිබඳ විවේචනාත්මක මනෝරාජික ප්‍රවේශයක් හෝ ඕනෑවට වඩා අශුභවාදී ඉදිරි දර්ශනයක් අනුගමනය කිරීමට අවශ්‍ය නැත (Marres, 2012). Halford සහ සගයන් (Halford et al, 2013, පි. 186) තර්ක කර ඇති පරිදි, සමාජ විද්‍යාඥයින් ගවේෂණ සඳහා නව මංපෙත් විමර්ශනය කරන බැවින් මේවා 'උද්වේගජනක කාලයන් (exciting times)' වේ.

එදිනෙදා ජීවිතය, සමාජ සම්බන්ධතා, සමාජ අසමානතා, සමාජ සංස්ථා, ආත්මභාවය සහ ශරීරය කෙරෙහි මාධ්‍ය සහ තාක්ෂණය ඉටු කළ කාර්යභාරය හඳුනා ගැනීමට මෙන්ම අදහස් දැක්වීමේ දී ශාස්ත්‍රීය ශික්ෂණයක් වශයෙන්, සමාජ විද්‍යාව සාම්ප්‍රදායිකව වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත. මෙම අර්ථයෙන් බලන කළ ඩිජිටල් තාක්ෂණය වෙනත් බොහෝ ක්ෂේත්‍රවල මෙන් අධ්‍යයන ලෝකයේ ද වැඩි වැඩියෙන් භාවිත වන කොටසක් බවට පත් වන හෙයින්, මෙම තාක්ෂණය අඛණ්ඩව විවේචනාත්මක හා ප්‍රත්‍යාවර්තී පරීක්ෂා කිරීම, අධ්‍යයන පරිචය සහ ආත්මභාවය සඳහා ඒවායේ ඇඟවුම් කිරීම සමාජ විද්‍යාත්මක පර්යේෂණවල වඩාත් නිශ්චිත වූ පොදු සමාජ විද්‍යාව තුළ අනිවාර්ය මානයක් විය යුතුය.

**සමාජ විද්‍යාත්මක කේන්ද්‍රීය දිශානතිය: වෙබ් මාධ්‍යයෙහි නොපෙනෙන පැතිකඩ**

ජනප්‍රිය සංසදවල ඩිජිටල් මාධ්‍ය ඉදිරිපත් කළ හැකියා කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇති අතර, ඒවායේ සෘණාත්මක ලක්ෂණ පිළිබඳ සමගාමී දෙගිඩියාවක් ද පැහැදිලි වේ. ඕස්ට්‍රේලියාවේ සහ අනෙකුත් සංවර්ධිත රටවල 'සයිබර් අවදානම්' සම්බන්ධයෙන් මෙය ප්‍රධාන ගැටලුවක් වන අතර මේ සඳහා විශේෂයෙන්ම ළමයින් සහ යෞවනයන් නිරාවරණය විය හැකි ය. ජනප්‍රිය මාධ්‍ය ආවරණය සහ රජයේ නීති සම්පාදනය සහ මාර්ගෝපදේශ සයිබර් හිරිහැර කිරීම් වැනි ගැටලු කෙරෙහි අවධානය යොමු කර ඇත, උදාහරණයක් ලෙස, වෙනත් අය පිළිබඳ සෘණාත්මක අදහස් බෙදා හැරීම සඳහා තරුණයන් මාර්ගගත සාකච්ඡා (Online forum) භාවිත කිරීම, විභව වින්දිතභාවයට පත් විය හැකි අය හඳුනා ගැනීමට සහ ළමා කාමුක දර්ශන බෙදා හැරීමට තරුණයන් 'ලිංගික චැට්' කිරීමට හෝ ලිංගිකව ප්‍රකෝපකාරී හෝ පැහැදිලි ඉරියව්වලින් තමන්ගේම පින්තූර බෙදා හැරීමට සමාජ මාධ්‍ය භාවිත කිරීම සහ අසභ්‍ය පින්තූර සඳහා ප්‍රවේශ වීමට අන්තර්ජාලය භාවිත කිරීම ගැන ද සැලකිලිමත් වේ. (Vromen, 2011).

පුළුල් සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින්, මෙම සැලකිල්ලට භාජනය කළ යුතු කරුණු මඟින් පෙන්නුම් කරන්නේ මෙම අවදානම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු වන්නේ ළමයින්ට සහ තරුණයන්ට බලපාන නිසා පමණක් නොව, මෙම වයස් කාණ්ඩවල දැකිය හැකි ප්‍රමුඛ සංකල්පයක් වන මාර්ගගත කොල්ලකාරී හැසිරීම් සහ සූරාකෑමට ගොදුරු විය හැකි බවත්, එය නව තාක්ෂණය පිළිබඳ කල් පවතින භයානක හා විනාශකාරී පරිවර්තනීය සංකල්පයක් වීමත් හේතුවෙනි. ළමයින් සහ තරුණයන් මෙම කථිකාව තුළ ස්ථානගත කර ඇත්තේ අහිංසක, අසරණ සහ නිෂ්ක්‍රීය වින්දිතයන් හෝ ප්‍රහාරාත්මක හෝ සූරාකෑමේ ක්‍රියා හේතුවෙන් හානියට පත් අපරාධකරුවන් ලෙස ය. මහජන සාකච්ඡාවල නිරන්තරයෙන් විශාල ආවරණයක් ලබා ගන්නා මෙම සදාචාරාත්මක භීතිකාව, ළමයින්ගේ සහ තරුණයන්ගේ අන්තර්ජාල මාධ්‍ය භාවිතයේ සංකීර්ණත්වය පිළිගැනීමට අපොහොසත් වෙමින්, එම ගැටලු සරල ස්ථාවරයන් දක්වා අවම කරයි.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, ළමා ලිංගික අපයෝජන (නිවස) බහුල ව සිදුවන ස්ථානයන් සහ වාණිජ වෙළෙඳ ප්‍රචාරණ වැනි වෙනත් ජනප්‍රිය මාධ්‍යවල ළමයින් ලිංගිකත්වයට පත් කිරීම කෙරෙහි (Jewkes & Wykes, 2012) අවධානය යොමු වී ඇත. cyber panic පිළිබඳ මෙම කතිකා sexting (Albury & Crawford 2012; Salter et al. 2013) වැනි ක්‍රියාවල යෙදෙන තරුණ තරුණියන්ගේ කතෘත්වය හඳුනා ගැනීමට ද අසමත් වේ.

ප්‍රධාන කරුණු සාරාංශය

■ ඩිජිටල් මාධ්‍ය තාක්ෂණය එදිනෙදා ජීවිතයට කේන්ද්‍රීය වී ඇත.

■ ඩිජිටල් මාධ්‍ය සමාජ ජීවිතයේ කොටසක් ලෙස සමාජය සහ සමාජ සම්බන්ධතා පිළිබඳ දත්ත ජනනය කරයි.

■ ඩිජිටල් සමාජ විද්‍යාව යනු මෙම තාක්ෂණය භාවිත කිරීම සහ විශ්ලේෂණය කිරීමේ සමාජ විද්‍යාත්මක ප්‍රවේශයකි.

■ ඩිජිටල් සමාජ විද්‍යාවට ප්‍රධාන අංශ හතරක් ඇත: වෘත්තීය ඩිජිටල් භාවිතය, ඩිජිටල් මාධ්‍ය භාවිතය පිළිබඳ සමාජ විද්‍යාත්මක විශ්ලේෂණය, ඩිජිටල් දත්ත විශ්ලේෂණය සහ විවේචනාත්මක ඩිජිටල් සමාජ විද්‍යාව.

■ සමාජ විද්‍යාඥයන්ට ඩිජිටල් තාක්ෂණික භාවිතයේ කොටසක් විය හැකි සමාජ අසමානතා සහ ඒවායේ නිෂ්පාදනයට, භාවිතයට බලපෑම් කරන සහ හැඩගස්වන සමාජ සංස්ථා සහ සමාජ ව්‍යුහය පිළිබඳ දැනුම්වත්භාවය ඇතුළත් ඩිජිටල් තාක්ෂණයන් විශ්ලේෂණය කිරීමට සුවිශේෂී ප්‍රවේශයක් ඉදිරිපත් කිරීමට හැකි වේ.

■ සමාජ විද්‍යාඥයන් ඩිජිටල් මාධ්‍ය (Digital Media) පිළිබඳ ප්‍රත්‍යාවර්තක වේ. එනම්, ඔවුන් නිෂ්පාදනය කරන දත්ත සහ මෙම දත්ත විශ්ලේෂණය කිරීමේ දී සහ සමාජ විද්‍යාත්මක භාවිතයේ කොටසක් ලෙස ඩිජිටල් තාක්ෂණය භාවිත කිරීමේ දී ඔවුන් ඉටු කරන කාර්යභාරය සඳහා තීරණාත්මක ප්‍රවේශයක් අනුගමනය කරනු ලබයි.

**සමාජ විද්‍යාත්මක පරාවර්තනය: තමාගේම ඩිජිටල් මාධ්‍ය භාවිතය පිළිබඳ සිතීම**

ඔබේම ඩිජිටල් මාධ්‍ය තාක්ෂණය භාවිත කිරීම පිළිබඳ අවධානය යොමු කළ යුතු ය.

(අ) ඔබ නිතරම භාවිත කරන ඩිජිටල් උපාංග සහ වේදිකා වර්ග මොනවා ද? ඔවුන් එකිනෙකා සමඟ කටයුතු කරන්නේ කෙසේ ද? එක් එක් පුද්ගලයා ඉටු කරන අරමුණ කුමක් ද?

(ආ) කාලයත් සමඟ ඔබේ භාවිතය වෙනස් වී තිබේ ද? එසේ නම් කුමන ආකාරවලින් ද?

(ඇ) ඔබේ මාර්ගගත සබඳතා මුහුණට මුහුණ සබඳතාවලට වඩා වෙනස් ද? ඔව් නම්, කුමන ආකාරවලින් ද? එසේ නොවේ නම්, ඔවුන් බෙදා හදා ගන්නා සමානකම් මොනවා ද?

(ා) ඔබ ඩිජිටල් මාධ්‍ය තාක්ෂණය භාවිතයෙන් ස්වේච්ඡාවෙන් හෝ බලහත්කාරයෙන් බිඳීමක් අත්විඳ තිබේ ද? ඔව් නම්, එය කෙබඳු ද? එසේ නොවේ නම්, ඔබ කවදා හෝ මෙය සලකා බලනවා ද? ඔබේ පිළිතුරු පැහැදිලි කරන්න.

**සාකච්ඡා ප්‍රශ්න**

1. ඩිජිටල් මාධ්‍ය තාක්ෂණය විශ්වවිද්‍යාල පසුබිමට හඳුන්වා දීම (පරිච්ඡේදයේ ආරම්භක විග්‍රහයේ දක්වා ඇති පරිදි) විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකුගේ අත්දැකීම් සහ අනන්‍යතාව කෙරෙහි බලපෑවේ කෙසේදැයි ඔබ සිතන්නේ කෙසේ ද?

2. ඇතැම් සමාජ මාධ්‍ය වේදිකා (ට්විටර්, ෆේස්බුක් සහ ඉන්ස්ටග්‍රෑම් වැනි) අනෙක් ඒවාට වඩා ජනප්‍රිය වී ඇත්තේ ඇයි? පරිශීලකයන්ට එතරම් ආකර්ෂණීය වන පරිදි ඔවුන් ලබා දෙන්නේ කුමක් ද? අනාගතයේ දී ඔවුන් ජනප්‍රියත්වය නැති කර ගැනීමට ඉඩ තිබේ ද? පැහැදිලි කරන්න.

3. ඩිජිටල් උපාංග, වේදිකා සහ යෙදුම්වල සැලසුම මිනිසුන්ගේ භාවිතය හැඩගස්වා සීමා කරන්නේ කෙසේ ද? ඒ සඳහා උදාහරණ කිහිපයක් දෙන්න.

4. ඩෙස්ක්ටොප් පුද්ගලික පරිගණක වැනි පෙර පරිගණක තාක්ෂණය සමඟ සසඳන විට සමකාලීන ඩිජිටල් උපාංගවල ජංගම ස්වභාවය ඒවායේ භාවිතයට බලපාන්නේ කෙසේ ද? එදිනෙදා ජීවිතයට සහ සමාජ සම්බන්ධතාවලට ඇති ඇඟවුම් මොනවා ද?

5. සමාජ විද්‍යාත්මක පර්යේෂණ සඳහා සමාජ මාධ්‍ය දත්ත භාවිත කිරීමේ සදාචාරාත්මක ගැටලු තිබේ ද? මේවා සමඟ කටයුතු කළ හැක්කේ කෙසේ ද?

6. ඩිජිටල් සමාජ අසමානතාව සමනය කළ හැක්කේ කෙසේ ද? ඔබට සිතිය හැකි විසඳුම් මොනවා ද?

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

Beer, D. 2013, *Popular Culture and New Media: the Politið of Circulation*, Palgrave Macmillan, Houndmills.

Davis, J., 2012, 'Social media and experiential ambivalence', *Future Internet*, vol. 4, no, 4,pp. 955-70.

Ess, C. & Dutton, W. 2013, 'Internet studies: perspectives on a rapidly developing field', *New Media & Society*, online first, doi: 10.1177/14614448124628485.

*Journal of Technology in Human Services* 2012, Special Issue: Methods for Analyzing Social Media, volume 30, no. 3—4.

Lupton, D. 2013, 'Social media for academia: some things I have learnt', *This Sociological Life*, <http://simplysociology.wordpress.com/2013/02/04/social-media-for-academia-some- things-i-have-learnt > (accessed 11 July 2013).

Orton-Johnson, K. & Prior, N. (eds) 2013, *Digital Sociology: Critical Perspectives*, Palgrave Macmillan, Houndmills.

Ritzer, G., Dean, P. & Jurgenson, N. 2012, 'The coming age of the prosumer', *American Behavioral Scientist*, vol. 56, no. 4, pp. 379-98.

**වෙබ් අඩවි**

-  Culture Digitally: < http://culturedigitally.org>. A multi-authored blog on the social and cultural aspects of digital technologies.
-  Cyborgology: < http://thesocietypages.org/cyborgology>. A multi-authored blog oncyborg society.
-  Mapping Online Publið: < http://mappingonlinepublið.net>. An Australian online platform for a number of interlinked research projects that critically examine the use of a number of social media platforms in Australia and beyond.
-  The Sociology of the Digital: < http://bundlr.com/b/the-sociology-of-the-digital>. ABundlr collection of relevant online material I have collected.
-  The Digital Self: < http://www.scoop.it/t/the-digital-self>. A Scoop.it collection of relevant online material I have collected.
-  This Sociological Life: < http://simplysociology.wordpress.com>. My blog, including many posts on digital sociology topið.

**චිත්‍රපට සහ වාර්තාමය චිත්‍රපට**

- *We Live in Public*, 2009, documentary, directed by Ondi Timoner, Interloper Films in association with Cobra Music, Diamond Doð and Passion Pictures. This documentary looks at the computer technology boom of the early 1990s in Silicon Valley, USA, and one of its early pioneers, Josh Harris.

- *The Social Network*, 2010, motion picture, directed by David Fincher, Relativity Media and Trigger Street Productions. A dramatised biography of Mark Zuckerberg, the Harvard university student who invented Facebook.

- *Networked Society: On the Brink*, 2011, documentary, no director details given, Eriðson Multimedia. This documentary includes interviews with digital technology experts, including the founder of Flickr, the chief editor of *Wired UK* and the co- founder of Soundcloud, about the future of the 'networked society'
  Available at <http://www.youtube.com/watch?v=R7cuatm_bqw>.

- *Networks of Outrage and Hope*: *Social Movements in the Internet Age*, 2012, documentary, no director details given, Library of Congress. Sociologist Manuel Castells is interviewed about the Arab Spring, Occupy Wall Street and other social movements that have used internet networking. Available at <http://www.youtube.com/watch?v=0lfPg_5iaGQ>.

- *Web 3.0*, no date given, documentary, directed by Kate Ray, no distributor details given. A short discussion of Web 3.0 and how it works and what the future holds, including an interview with the inventor of the World Wide Web, Tim Berners-Lee. Available at <http://topdocumentaryfilms.com/web-3-0>.

- *The Internship*, 2013, motion picture, directed by Shawn Levy, Regency Enterprises, Wild West Picture Show Productions, 21 Laps Entertainment and Dune Entertainment. A comedy with Vince Vaughn and Owen Wilson as forty-something unemployed salesmen who talk their way into internships at Google, where they compete with younger computer nerds for the chance of a paid job offer.


Albury, K. & Crawford, K. 2012, 'Sexting, consent and young people's ethið: Beyond Megan's story', *Continuum*, vol. 26, no. 3, pp. 463-73.

Beer, D. 2012, 'Using social media aggregators to do social research', *Sociological ResearchOnline*, vol. 17, no. 3, *Sociological Research Online*, http://www.socresonline.org.uk/17/3/10.html (accessed 2 July 2013).

------- 2013, 'Public geography and the politið of circulation', *Dialogues in HumanGeograph*, vol. 3, no. 1, pp. 92-5.

Beer, D. & Burrows, R. 2010, 'Consumption, prosumption and participatory web cultures: An introduction', *Journal of Consumer Culture*, vol. 10, no. 1, pp. 3-12.
Bird, S.E. 2011, 'Are we all produsers now?', *Cultural Studies*, vol. 25, nos 4-5, pp. 502-16.

Blanchard, M., Metcalf, A., Degney, J., Herrman, H. & Burns, J. 2008, 'Rethinking the digital divide: Findings from a study of marginalised young people's ICT use', *YouthStudies Australia*, vol. 27, no. 4, pp. 35-42.

Boyd, D. & Crawford, K. 2012, 'Critical questions for big data: Provocations for a cultural, technological, and scholarly phenomenon', *Information, Communication & Society*, vol. 15, no. 5, pp. 662-79.

Brewster, S. 2013, 'The internet of you: How wireless medical implants will change medicine', *Gigaom*, http://gigaom.com/2013/06/27/the-internet-of-you-how-wireless- medical-implants-will-change-medicine (accessed 2 July 2013).

Broadbent, R. & Papadopoulos, T. 2013, 'Bridging the digital divide – an Australian story', *Behaviour & Information Technology*, vol. 32, no. 1, pp. 4-13.

Burawoy, M. 2005, 'For public sociology', *American Sociological Review*, vol. 70, no. 1, pp. 4-28.

Burrows, R. 2012, 'Living with the h-index? Metric assemblages in the contemporary academy', *The Sociological Review*, vol. 60, no. 2, pp. 355-72.

Digital sociology. 2013, *Wikipedia*, http://en.wikipedia.org/wiki/Digital_sociology (accessed 6 July 2013).

Eysenbach, G. 2011, 'Can tweets predict citations? Metrið of social impact based on Twitter and correlation with traditional metrið of scientific impact', *Journal of Medical Internet Research*, vol. 13, no. 4, http://www.jmir.org/2011/4/e123 (accessed 28 June 2013).

Fuchs, C. & Dyer-Witheford, N. 2012, Karl Marx @ Internet Studies, *New Media & Society*,online first, doi: 10.1177/1461444812462854.

Halford, S., Pope, C. & Weal, M. 2013, 'Digital futures? Sociological challenges and opportunities in the emergent Semantic Web', *Sociology*, vol. 47, no. 1, pp. 173-89.

Halford, S. & Savage, M. 2010, 'Reconceptualizing digital social inequality', *Information, Communication & Society*, vol. 13, no. 7, pp. 937-55.

Hargittai, E. & Hinnant, A. 2008, 'Digital inequality: Differences in young adults' use of the internet', *Communication Research*, vol. 35, no. 5, pp. 602-21.

Jewkes, Y. & Wykes, M. 2012, 'Reconstructing the sexual abuse of children: 'Cyber-paeds',panic and power', *Sexualities*, vol 15, no. 8, pp. 934-52.

John, N.A. 2013, 'Sharing and Web 2.0: The emergence of a keyword', *New Media &Society*, vol. 15, no. 2, pp. 167-82.

Lupton, D. 2012, Digital Sociology: An Introduction. Sydney: University of Sydney, http://hdl.handle.net/2123/8621 (accessed 15 June 2013).

------- 2013a, 'Quantifying the body: Monitoring, performing and configuring health in the age of mHealth technologies', *Critical Public Health*, online first, doi:10.1080/09581596.2013.794

මෙම ලිපිය සිංහල භාෂාවට පරිවර්තනය කිරීම උදෙසා අවස්ථාව ලබා දුන් කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයනංශයේ ජ්‍යෙෂ්ඨ විනේතෘ මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා හට මාගේ හෘදයාගම ස්තූතිය පිරිනමමි.

# සමාජ විග්‍රහ

**විමර්ශිත සංග්‍රහය**
**REFEREED JOURNAL**
**පළමු කාණ්ඩය, නවවන වෙළුම - 2022**
**ISSN 2362-0978 (print ISSN)**
**ISSN 2756-925X (e-ISSN)**

ලිපි අංක 02

## පශ්චාත් යුදකාලීන ශ්‍රී ලංකාවේ සමාජ කතිකා සහ ආබාධිත සෙබළුන්ගේ අනන්‍යතා ගොඩනැගීමේ ගතිකත්වය

මහේෂ් ප්‍රේමරත්න[3]

https://orcid.org/0009-0003-3195-9222

***ප්‍රධාන සංස්කාරක***
ප්‍රේමකුමාර ද සිල්වා

***සහය සංස්කාරක***
හිරුනි කළුආරච්චි

***සංස්කාරක උපදේශක මණ්ඩලය***

එස්.ටී.හෙට්ටිගේ (සම්මානිත මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
කාලිංග ටියුඩර් සිල්වා (සම්මානිත මහාචාර්ය) පේරාදෙණිය විශ්වවිද්‍යාලය
කේ.කරුණාතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) කැලණිය විශ්වවිද්‍යාලය
සරත් අමරසිංහ (සම්මානිත මහාචාර්ය) රුහුණ විශ්වවිද්‍යාලය
යසාංජලී ජයතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
චන්ද්‍රසිරි නිරිඇල්ල (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
සුභාංගි හේරත් (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
නිශාර ප්‍රනාන්දු (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
ෆර්සානා හනීෆා (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
ඉරේෂා ලක්ෂ්මන් (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය

***භාෂා සංස්කරණය***
නාලක ජයසේන

***පරිසැලසුම් නිර්මාණය***
ප්‍රභාත් ගලගමගේ
හිරුනි කළුආරච්චි

[3] පී.එච්.ඩී. (ඩීකින් විශ්වවිද්‍යාලය, ඔස්ට්‍රේලියාව), කථිකාචාර්ය, සමාජවිද්‍යා අධ්‍යයනාංශය, ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය.

# සමාජ විග්‍රහ

**විමර්ශිත සංග්‍රහය**

**REFEREED JOURNAL**

**පළමු කාණ්ඩය, නවවන වෙළුම - 2022**

**ISSN 2756-925X (e-ISSN)**

**ISSN 2362-0978 (print ISSN)**

This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License.

දැනුම වෙත ප්‍රවේශ වීමේ සීමා අතික්‍රමණය සඳහා ලොව බොහෝ ශාස්ත්‍රාලයීය ප්‍රකාශන සම්ප්‍රදායික ප්‍රකාශන අයිතිය පිළිබඳ නෛතික ආකෘතියෙන් විකල්ප ආකෘතියක් වන පොදු නිර්මාණ බලපත්‍ර ක්‍රමයට සංක්‍රමණය වී / වෙමින් ඇත. මේ අනුව විවාරාත්මක දැනුමට විවෘත ප්‍රවේශයක් ලබා දීමේ අරමුණින් "සමාජ විග්‍රහ" විමර්ශිත සංග්‍රහය, නිකුත් වන්නේ ඉහත පොදු නිර්මාණ බලපත්‍රය යටතේය.

## ලිපි විමර්ශක මණ්ඩලය

*මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*මහාචාර්ය ෆර්සානා හනීෆා, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*මහාචාර්ය එම්.ටී.එම් මහීස්, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*මහාචාර්ය සමන්ත හේරත්, සන්නිවේදන සහ නිර්මාණාත්මක කලා අධ්‍යනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය*

*කථිකාචාර්ය චමත්කා පද්මසිරි කාරියවසම්, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*කථිකාචාර්ය ක්‍රිෂාන් සිරිවර්ධන, සන්නිවේදන සහ නිර්මාණාත්මක කලා අධ්‍යනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය*

## ප්‍රකාශනය

සමාජ විද්‍යා අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ-03
දුරකථනය/ෆැක්ස්: 011-2500452
විද්‍යුත් තැපැල: samajaviggraha@soc.cmb.ac.lk
වෙබ් අඩවිය: https://arts.cmb.ac.lk/sociology/

**සාරසංක්ෂේපය**

මෙම පර්යේෂණාත්මක ලිපියේ මූලික අරමුණ වන්නේ පශ්චාත් යුදකාලීන ශ්‍රී ලාංකේය සමාජ සන්දර්භය තුළ ආබාධිත සෙබළුන්ගේ අනන්‍යතාවය ගොඩනැගීම පිළිබඳව විශ්ලේෂණය කිරීමයි. මෙම ලිපිය මගින් තර්ක කරනු ලබන්නේ ආබාධිත සෙබළුන්ගේ අනන්‍යතාවය ස්ථිතික නොවන අතර, එය සමාජයේ පවතින සමාජ කතිකා සහ සමාජ ප්‍රතිචාර මත ගතිකත්වයට පත්වන්නකි. සමාජයේ පවතින සමාජ කතිකා සහ එමගින් ගොඩනැගෙන ධනාත්මක හෝ සෘණාත්මක සමාජ ප්‍රතිචාර මගින් ආබාධිත සෙබළුන්ගේ අනන්‍යතාවය වෙනස් කිරීම කෙරෙහි බලපෑම් ඇති වේ. මෙම පර්යේෂණාත්මක ලිපිය 2014 වර්ෂයේ මැයි මස සිට එම වර්ෂයේ ජූලි මස දක්වාත්, 2015 වර්ෂයේ දෙසැම්බර් මස සිට 2016 ජනවාරි මස දක්වා සිදු කරන ලද ගුණාත්මක පර්යේෂණයක් මත පදනම් වේ. කොළඹ දිස්ත්‍රික්කයේ රණවිරු ගම්මාන සහ සමාන්‍ය ගම්මානවල ජීවත්වන විවිධ ආබාධවලට ලක් වූ ආබාධිත රණවිරුවන් දහතුන්දෙනෙකු මෙම පර්යේෂණයට සම්බන්ධ කර ගන්නා ලදී. මෙම පර්යේෂණ සඳහා ගැඹුරු සම්මුඛ සාකච්ඡා ක්‍රමය සහ සහභාගි නොවන නිරීක්ෂණ ක්‍රමය උපයෝගී කරගනිමින් ප්‍රාථමික දත්ත රැස්කරන ලදී. මෙම ලිපිය තුළ මූලිකවම අවධාරණය කරනු ලබන්නේ ආබාධිත රණවිරුන්ගේ අනන්‍යතාවය ගොඩගැනීම පිළිබඳව සිදු කරන විශ්ලේෂණ හුදෙක් ආබාධිත සෙබළුන්ගේ භෞතික ශරීරයේ පවතින විහීනතා පිළිබඳව පමණක් අවධානය යොමු කිරීම ප්‍රමාණවත් නොවන අතර, සමාජයේ පවතින සමාජ කතිකා සහ එම සමාජ කතිකා මගින් ආබාධිත සෙබළුන්ගේ අනන්‍යතාවයට සිදුවන බලපෑම පිළිබඳව ද අවධානය යොමු කළ යුතුයි.

**හැඳින්වීම**

පුද්ගල සංජානනය සහ හැසිරීම් සමාජයේ පවතින කතිකා සමඟ සම්බන්ධ වේ. මිචෙල් ෆූකොල්ට් (1972) ට අනුව සමාජ කතිකා මගින් පුද්ගලයන් යම් කිසි වස්තු විෂයක් සම්බන්ධයෙන් සිතන ආකාරය, කථා කරන ආකාරය හෝ නියෝජනය කරන ආකාරය හෝ දැනගන්නා ආකාරය සකස් කරනු ලැබේ. සමාජ කතිකා පුද්ගල අනන්‍යතාවය ගොඩනැගීම සහ සකස් කිරීම සම්බන්ධයෙන් ද අදාළ කරගත හැකිය. පුද්ගල අනන්‍යතාවය ගොඩනැගීම සහ සකස් කිරීම සිදු කරනු ලබන්නේ පුද්ගලයන් අයත් වන සහ සම්බන්ධ වන කතිකා ඇතුළතය. එබැවින් සමාජ කතිකා පුද්ගල සංජානනය සහ අනන්‍යතාවය කෙරෙහි ද බලපානු ලබයි. මෙම ලිපිය මගින් මූලික වශයෙන් උත්සාහ කරනු ලබන්නේ සමාජ කතිකා මගින් ආබාධිත රණවිරුවන්ගේ අනන්‍යතාවය ගොඩනැගීම කෙරෙහි බලපාන ආකාරය පිළිබඳව විශ්ලේෂණය කිරීමයි. මෙම ලිපිය මගින් මා තර්ක කරනු ලබන්නේ ආබාධිත රණවිරුවන් ගේ අනන්‍යතාවය හුදෙක් ඔවුන්ගේ භෞතික ශරීරයේ ආබාධිත තත්ත්වය මතම තීරණය නොවන අතර, එම ආබාධිත තත්ත්වයට බාහිර පුද්ගලයන් ලබාදෙන ප්‍රතිචාර මෙන්ම සමාජයේ පවතින යුද්ධය, යුද ජයග්‍රහණය සහ රණවිරුවන් පිළිබඳව පවතින අධිපති කතිකා මත ද තීරණය වන බවයි. එබැවින් ආබාධිත රණවිරුවන් ගේ අනන්‍යතාවය පිළිබඳව විශ්ලේෂණය කිරීමේ දී ශරීරයේ පවතින ආබාධිතත්වය මෙන්ම සමාජයේ පවතින අධිපති කතිකා පිළිබඳ ද අවධානය යොමු කළ යුතුය. මෙම පර්යේෂණාත්මක ලිපිය 2014 වර්ෂයේ මැයි මස සිට එම වර්ෂයේ ජූලි මස දක්වාත්, 2015 වර්ෂයේ දෙසැම්බර් මස සිට 2016 ජනවාරි මස දක්වාත් සිදු කරන ලද ගුණාත්මක පර්යේෂණයක් මත පදනම් වේ. කොළඹ දිස්ත්‍රික්කයේ රණවිරු ගම්මාන සහ සමාන්‍ය ගම්මානවල ජීවත්වන විවිධ ආබාධයන්ට ලක් වූ ආබාධිත රණවිරුවන් දහතුන් දෙනෙකු මෙම පර්ෂණයට සම්බන්ධ කර ගන්නා ලදී. ගැඹුරු සම්මුඛ සාකච්ඡා ක්‍රමය සහ සහභාගි නොවන නිරීක්ෂණ ක්‍රමය උපයෝගී කරගනිමින් මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික දත්ත රැස්කරන ලදී. මෙම ලිපියෙහි මූලික වශයෙන් ආබාධිත රණවිරුන්ගේ අනන්‍යතාවය ගොඩගැනීමට අදාළව පවතින ගතිකත්වය කෙරෙහි සමාජ කතිකාවලින් සිදු වන බලපෑම පිළිබඳව සාකච්ඡා කරනු ලැබේ.

**ආබාධිතභාවය සහ සමාජ සංජානනය**

ආබාධිතභාවය පිළිබඳ මෑත කාලීනව දැකිය හැකි විශේෂ ලක්ෂණයක් වන්නේ එම කතිකා ආබාධිභාවය හුදෙක් සෞඛ්‍ය සහ පුද්ගල ශරීරයේ පවතින විහීනතාවයකට පමණක් ලඝු නොකිරීමයි. ආබාධිතභාවය යන්නට සෞඛ්‍ය සහ පුද්ගල ශරීරයේ පවතින විහීනතාවලට අමතරව, අවස්ථා සහ ක්‍රියාකාරකම් සඳහා පවතින සීමා සහිත බව සහ සාමාන්‍ය පුද්ගලයෙකු මෙන් එදිනෙදා ජීවිතයේ කටයුතු සිදු කිරීමට පවතින භෞතික සහ සමාජ බාධා ද අන්තර්ගත වේ (Ginsburg & Rapp 2013; WHO 2014). මේ අනුව පෙනී යන්නේ ආබාධිතභාවය පිළිබඳව සිදු කරනු ලබන සාකච්ඡාවල බහුවිධ සාධක පිළිබඳව අවධානය යොමු කරන බවයි. එහි දී ආබාධිත රණවිරුවන් සම්බන්ධයෙන් නම් ඔවුන්ගේ ශරීරයේ ආබාධිත තත්ත්වය මෙන්ම ඔවුන්ගේ තනි පුද්ගල ශරීරයන් ගෙන් පරිබාහිරව සමාජයේ පවතින සමාජ තත්ත්වය සහ කතිකා පිළිබඳව අවධානය යොමු කළ යුතුයි. Fiona Kumari Campbell (2008) දක්වන්නේ ආබාධිතභාවය යනු සැබෑ හෝ උපකල්පනය කරන ලද ආබාධිතභාවය හේතුවෙන් පුද්ගලයන්ට වෙනස් හෝ අසමාන ලෙස සැලකීම ප්‍රවර්ධනය කරන සවිඥානිකව හෝ අවිඥානිකව සිදු කරනු ලබන උපකල්පන සහ භාවිත සමූහයක් ලෙසයි. මෙහි දී ප්‍රශ්න කළ යුත්තේ මෙම සවිඥානික හෝ අවිඥානික උපකල්පනයන් සහ භාවිත ගොඩනැගීම සිදු වන්නේ කුමන ආකාරයට ද යන්නයි. පර්යේෂකයාගේ අදහස වන්නේ මෙම සවිඥානික හෝ අවිඥානික අදහස් ගොඩනැගෙන්නේ මහා සමාජයේ පවතින විවිධ කතිකාවල බලපෑම මත බවයි. Jayne Clapton සහ Jennifer Fitzgerld (2014) අනුව ආබාධිත පුද්ගලයන්ව පුළුල් සමාජය තුළ සාමාන්‍ය පුද්ගලයන් ලෙසට නොසලකා ඔවුන් වෙනත් පුද්ගල කොට්ඨාශයක් ලෙසට සලකා ආන්තීකරණයට ලක්කරන බවයි. ආන්තීකරණය සහ බහිෂ්කරණය මගින් සමාජ අවකාශයේ වැදගත්කම Rob Kitchin (2010) විසින් දක්වනු ලැබ ඇත. Kitchin (2010: 354) ට අනුව සමාජ අවකාශය මගින් ආබාධිත පුද්ගලයන් වෙත සිදු කරනු ලබන ප්‍රතිචාර සහ භාවිත ප්‍රතිනිෂ්පාදනය සහ ඒවා පෝෂණය කිරීම සිදු කරනු ලබයි. මෙහි දී හුදෙක් සමාජ අවකාශය දෙසට පමණක් අවධානය යොමු කිරීම ප්‍රමාණවත් නොවේ. සමාජ අවකාශයේ යම් කිසි රාමුගත හැසිරීමක් ගොඩනැගෙන ආකාරය සහ ඒ සඳහා බලපාන සාධක පිළිඳව ද අවධානය යොමු කළ යුතුයි.

සමාජය තුළ බොහෝ විට ආබාධිත පුද්ගලයන් පිළිබඳව ගොඩනගා ඇත්තේ සෘණාත්මක සමාජ අනන්‍යතාවයකි. ආබාධිත පුද්ගලයන්ව සමාජ අපගාමීන්, සමාජ විරෝධීන්, ඵලදායී නොවන පුද්ගලයන්, ආකර්ෂණීය නොවන පුද්ගලයන්, අනෙක් පුද්ගලයන් මත යැපෙන්නන් සහ අර්ධමානුෂීය පුද්ගලයන් ලෙසට බොහෝ විට සලකනු ලබයි (Cocks & Cockman 1995; Hussain 2005; Chen & Shu 2012; Anderson & Whitfield 2013). ආබාධිත පුද්ගලයන් දෙස මෙලෙස සෘණාත්මක සමාජ අර්ථකථන ගොඩනැගීම බොහෝ සමාජවල දක්නට ලැබෙන තත්ත්වයකි. මෙලෙස සිදු කරන අර්ථකථනවල අන්තර්ගතව ඇත්තේ සමාජයේ ආබාධිත නොවන පුද්ගල ශරීර පිළිබඳව ගොඩනගාගෙන ඇති පරමාදර්ශී අර්ථකථනය. නමුත් මෙහි ඇති ගැටලුකාරී තත්ත්වය නම් සමාජයක සෑම පුද්ගලයෙකුම එක හා සමානවම ආබාධිත නොවන ශරීර පිළිබඳව ගොඩනගා ඇති අර්ථකනයට අදාළ කළ හැකිය යන්නයි. එබැවින් එම අර්ථකථන මගින් සමාජය තුළ පුද්ගලයන් අතර පවතින විවිධත්වය බැහැර කිරීමක් සිදු වේ.

ආබාධිතභාවය පිළිබඳව පවතින ප්‍රවේශ මගින් විවිධ වූ සාධක පිළිබඳව අවධානය යොමු කරමින් ආබාධිතභාවය පිළිබඳව පැහැදිලි කිරීම් සිදු කර ඇත. ආබාධිතභාවය පිළිබඳ ආගමික ආකෘතිය (the religious model of disability) ආබාධිතභාවය අර්ථකථනය කරනු ලබන්නේ පුද්ගලයෙකුගේ ආබාධිතභාවය හුදෙක් වර්තමාන ආත්මය සමඟ පමණක් නිශ්චය කළ නොහැකි දෙයක් බවයි. මෙම එළඹුමෙන් පෙන්වා දෙන්නේ දෙවියන් සහ අමනුෂ්‍ය ආත්මවල බලපෑම, කර්මය සහ පෙර ආත්ම සහ එම ආත්මවල සිදු කරන ලද හොඳ සහ නරක හැසිරීම් පුද්ගලයෙකු ආබාධිතවීම සඳහා බලපාන බවයි (Dalal 2002; Clapton & Fitzgeral 2014).

ආබාධිතභාවය පිළිබඳ වෛද්‍ය ආකෘතිය (the medical model of disability) මගින් ආබාධිතභාවය පිළිබඳ වගකීම තනි පුද්ගල ශරීර මත කේන්ද්‍රගත කරනු ලබයි. මෙම ආකෘතිය මගින් පෙන්වා දෙනු ලබන්නේ ආබාධිතභාවය යනු පුද්ගල ශරීරයේ ඇතිවන විහීනතාවයක් වන බවයි (Hussain 2005; Giddens 2009; Chen & Shu 2012; Clapton & Fitzgeral 2014). Anthony Giddens (2009) විසින් ආබාධිතභාවය පිළිබඳ වෛද්‍ය ආකෘතිය 'ආබාධිතභාවය පිළිබඳව තනි පුද්ගල ආකෘතිය' (the individual model of disability) ලෙසට ද හඳුන්වනු ලබයි. Giddens (2009: 416) ට අනුව මෙම ආකෘතිය ඔස්සේ වෛද්‍ය විශේෂඥයන් විසින් ප්‍රධාන කාර්යයභාරයක් ඉටු කරනු ලබයි. ආබාධිත පුද්ගලයාගේ ගැටලුකාරී තත්ත්වය හඳුනා ගෙන ඔවුන්ට අවශ්‍ය කරන ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය සැපයීම වෛද්‍ය වෘත්තිකයන්ගේ කාර්යයකි. ගිඩින්ස් පෙන්වා දෙනු ලබන්නේ ආබාධිතභාවය පිළිබඳව මෙම වෛද්‍ය ආකෘතිය මගින් ආබාධිතභාවය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ බලය සහ වගකීම වෛද්‍ය වෘත්තිකයන් වෙතට ලඝු කරගන්නා බවත්, එමගින් ආබාධිතභාවය පිළිබඳව පවතින වෛද්‍යමය නොවන වෙනත් අර්ථකථන සහ භාවිත බැහැර කිරීම සිදු වන බවයි. වෛද්‍ය ආකෘතියේ පවතින ආධිපත්‍ය සහ එහි පවතින සීමා සහිත බව ආබාධිතභාවය පිළිබඳ සමාජ ආකෘතිය (the social model of disability) මගින් විවේචනයට ලක් කර ඇත. මෙම ආකෘතිය මගින් පෙන්වා දෙන්නේ ආබාධිතභාවය යනු හුදෙක් පුද්ගල ශරීරයේ පවතින විහීනතාවයක් නොවන අතර, ආබාධිතභාවය යනු සමාජමය ගොඩනැගීමක් බවයි (Oliver 1996; Barnes & Mercer 2005, Hussain 2005; Giddens 2009; Chen & Shu 2012; Chakravarti 2013). Mark Priestly (1999) ට අනුව පුද්ගලයන්ට තමන් එදිනෙදා ජිවිතයට සම්බන්ධ වන වන විවිධ කතිකා හෝ පොදු වෘත්තාන්ත මගින් ඔවුන්ගේ අස්මිතාවය කෙරෙහි බලපෑම් ඇති වන අතර, එමගින් ආබාධිතභාවය සමාජ නිර්මිතයක් බව අවබෝධ කර දෙනු ලැබේ (Priestly 1999). උපුටා ගනු ලැබුවේ (Bunning & Steel 2006: 44). එබැවින් ආබාධිතභාවය පිළිබඳව සමාජ ආකෘතිය මගින් සමාජමය කතිකා සහ සමාජමය සාධක පිළිබඳව අවධානය යොමු කර ඇත. ආබාධිතභාවය පිළිබඳව අයිතිවාසිකම් පදනම් කරගත් එළඹුම (the rights-based model of disability) මගින් ආබාධිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කර තිබේ. මෙහි දී ආබාධිතභාවය යනු හුදෙක් වෛද්‍යමය ගැටලුවක් ලෙසට අර්ථකථනය නොකරන අතර, ආබාධිත පුද්ගලයන්නේ ප්‍රජා සාමාජිකත්වය, ප්‍රජා සහභාගීත්වය, සමාජ ක්‍රියාකාරකම් සඳහා ඇති ප්‍රවේශය වර්ධනය කිරීම සහ ආබාධිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් දිනා ගැනීම කෙරෙහි අවධානය යොමු කර තිබේ (Clapton & Fitzgeral 2014). මෙම විවිධ ආකෘති මගින් පෙන්නුම් කරනු ලබන්නේ ආබාධිතභාවය පිළිබඳව සමාජය තුළ විවිධ කතිකා සහ අර්ථකථන පවතින බවයි. එහි දී ආගමික සාධක, භෞතික සාධක, සමාජමය සාධක සහ අයිතිවාසිකම් පිළිබඳව අවධානය යොමු කර තිබේ.

**සමාජ කතිකා සහ ආබාධිත සෙබළුන්ගේ අනන්‍යතාවය**

පුද්ගලයෙකුගේ සමාජ අනන්‍යතාවය ගොඩනැගීමේ දී බාහිර සමාජය විසින් පුද්ගලයා සමඟ පවත්වන සමාජ අන්තර්ක්‍රියා මෙන්ම සමාජය තුළ පුද්ගලයාව අර්ථකථනය කරන ආකාරය ද වැදගත් වේ. පුද්ගලයෙකුගේ අනන්‍යතාවය යනු යම් සමාජයක තනි පුද්ගලයන් සහ සමූහයන් අනිත් පුද්ගලයන් සහ සමූහ සමඟ තමන්ගේ කාර්යභාරය සහ සම්බන්ධතා අවබෝධ කරගන්නා ආකාරයි (Sherry 2006; Jenkins 2008). මෙම අර්ථකථනවලට අනුව සමාජ අනන්‍යතාව ගොඩනැගීමේ දී සමාජය තුළ බාහිර පුද්ගලයන් සමඟ පවත්වන අන්තර්ක්‍රියා වැදගත් වේ. මෙහි දී සමාජ අන්තර්ක්‍රියා ගොඩනගන ආකාරය සහ පුද්ගලයන් අතර සමාජ අන්තර්ක්‍රියා සිදු වීම තීරණය කරන සාධක පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වේ.

යම් සමාජයක පවතින සමාජ කතිකා පුද්ගල අනන්‍යතාව ගොඩනැගීමේ දී වැදගත් වේ. මිචෙල් ෆූකොල්ට් (1972) ට අනුව සමාජ කතිකා මගින් පුද්ගලයන් යම් කිසි වස්තු විෂයක් සම්බන්ධයෙන් සිතන ආකාරය, කථා කරන ආකාරය හෝ නියෝජනය කරන ආකාරය හෝ දැන ගන්නා ආකාරය සකස් කරනු ලැබේ. පුද්ගල අනන්‍යතාවය ගොඩනැගීම සහ සකස් කිරීම සිදු කරනු ලබන්නේ පුද්ගලයන් අයත් වන සහ සම්බන්ධ වන කතිකා ඇතුළත්ය. Scott සහ Marshall (2009: 332) ට අනුව අනන්‍යතාවය සහ පුද්ගල නියෝජ්‍යත්වය පිළිබඳව විවිධ කතිකා මගින් විශේෂිත සහ බොහෝ විට එකිනෙකට වෙනස් වූ තත්ත්ව ගොඩනගනු ලබයි. ආගම, රාජ්‍යය, ක්‍රීඩා හෝ පරිභෝජනය පිළිබඳ කතිකා මගින් අස්මිතාවය පිළිබඳව එකිනෙකාට වෙනස් වූ අර්ථ දැක්වීම් ගොඩනගනු ලබයි. Scott සහ Marshall (2009: 332) තවදුරටත් සඳහන් කරනු ලබන්නේ සමාජ පන්තිය, ජාතිකත්වය, වර්ගය, ලිංගික අනන්‍යතාවය වැනි පුළුල් සමාජ ව්‍යුහාත්මක සාධක හේතුවෙන් පුද්ගලයාට විවිධ වූ අනන්‍යතා ගොඩනැගී පවතින බවයි. මෙම අනන්‍යතා එකිනෙක සමඟ අන්තර්ක්‍රියා සිදු කරන බව ද ඔවුන් විසින් තවදුරටත් සඳහන් කර ඇත. ආබාධිත පුද්ගලයන්ගේ අනන්‍යතා ගොඩනැගීම පිළිබඳව Mark Sherry (2006: 906) සඳහන් කරනු ලබන්නේ ආබාධිත පුද්ගලයන්ගේ අනන්‍යතාව බොහෝ විට නියෝජනය සහ ඒකාකෘති ගොඩනැගීම සංස්කෘතික ක්‍රියාවලියේ බලපෑමට ලක්වන බවයි. එබැවින් බොහෝ ආබාධිත පුද්ගලයන්ගේ අනන්‍යතාව ගොඩනැගීම කෙරෙහි සමාජයේ පවතින බොහෝ ඒකාකෘති මගින් බලපෑම් එල්ල වී ඇත. මෙලෙස විවිධ කතෘවරුන් විසින් අනන්‍යතාව සහ අස්මිතාවය ගොඩනැගීම කෙරෙහි බලපාන ඉහත සඳහන් කළ සාධකවලට අමතරව විශේෂයෙන්ම පශ්චාත් යුද කාලීන සමාජය තුළ ආබාධිත සෙබළුන්ගේ අනන්‍යතාව ගොඩනැගීම පිළිබඳව විශ්ලේෂණය කිරීමේ දී සමාජයේ පවතින සමාජ කතිකා සහ එම සමාජ කතිකා සිදු වී තිබෙන වෙනස්වීම් පිළිබඳව ද අවධානය යොමු කිරීම වැදගත් වේ. ශ්‍රී ලාංකීය සමාජ සන්දර්භයෙහි සෙබළුන් පිළිබඳව පවතින කතිකා ද ඒ ඒ සමාජ සන්දර්භය සහ කාලය අනුව වෙනස්වීමට ලක් වී ඇත. ශ්‍රී ලංකාවේ ආරක්ෂක සෙබළුන්ව රණවිරුවන් ලෙසට සැලකීම සිදු කිරීම ආරම්භ කර ඇත්තේ 1980 දශකයේ සිටයි. පෙරේරා (2011: 19) ට අනුව රණවිරුවන් හෝ යුද විරුවන් යන පරමාදර්ශය ශ්‍රී ලංකාවේ ආරක්ෂ අංශ වෙත යොදා ගැනීම 1980 ගණන්වලින් පසුව සිදුවන ආරක්ෂක අංශවල භෞතික සහ මානව සම්පත් වර්ධනය සහ යුද ගැටුම් සමඟ සිදු විය. එබැවින් මෙම කාලයේ සිට පුරුෂත්වයේ සහ වීරත්වයේ පරමාදර්ශී ආකෘති සෙබළුන් වෙත යොදා ගැනීම සිදු විය.

ඉහත සඳහන් කරන ලද සාකච්ඡා පදනම් කරගෙන මෙතැන් සිට මා උත්සාහ ගනු ලබන්නේ සමාජ කතිකාවල වෙනස් වීම මගින් ආබාධිත සෙබළුන්ගේ අනන්‍යතාවට සිදු වන බලපෑම පිළිබඳව විශ්ලේෂණය කිරීම යි. එහි දී සමාජ කතිකා වෙනස් වීම ප්‍රධාන වශයෙන් යුද්ධය පැවති සමයේ සහ යුද්ධය අවසන් වී ගත වූ මුල් අවුරුදු කිහිපයේ පැවති ධනාත්මක සමාජ කතිකා සහ යුද්ධය අවසන් වී වසර කිහිපයක් ගත වීමෙන් පසු පශ්චාත් යුද කාලීන සමාජයේ ගොඩනැගුණු සෘණාත්මක සමාජ කතිකා ලෙසට වර්ගකර විශ්ලේෂණය කරනු ලැබේ. මෙම ධනාත්මක සහ සෘණාත්මක සමාජ කතිකා මගින් ආබාධිත සෙබළුන්ගේ අනන්‍යතායේ ගතිකත්වයක් ගොඩනගා ඇත. එබැවින් පුළුල් සමාජයේ පවතින කතිකා මගින් ඇති කරන බලපෑම් පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ දශක තුනකට ආසන්නව පැවති සිවිල් යුද්ධය 2009 වර්ෂයේ දී අවසන් විය. යුද්ධයේ අවසාන වර්ෂ කිහිපය මෙන්ම, යුද ජයග්‍රහණයෙන් පසු ආසන්න වසර කිහිපයක් යන තුරු සෙබළුන් පිළිබඳව සහ ඔවුන්ගේ සේවය පිළිබඳව අගය කරන සමාජ කතිකා ගොඩනැගී පැවතුණි. සාමාන්‍ය සෙබළුන් මෙන්ම ආබාධිත සෙබළුන්ව ද සලකනු ලැබුවේ යුද වීරයන් සහ මුරදේවතාවන් ලෙසට ය. එවිට සාමාන්‍ය පුද්ගලයෙකු සෙබළෙකු වූ විට දේවත්වයෙන් ආමන්ත්‍රණය කරන ලදී. 'සොල්දාදුවෙක්' යන ලේබලය 'රණවිරුවෙක්' යන ආමන්ත්‍රණයට වෙනස් විය. සමස්ත සමාජයේ සාර්ව මට්ටමින් මෙන්ම ක්ෂුද්‍ර මට්ටමින් ද රණවිරුවන්ට ඉතා ඉහළ පිළිගැනීමක් සහ සමාජ ගෞරවයක් ලබා දෙන ලදී. එවකට පැවති

දේශපාලනාධිකාරිය විසින් සෙබළුන්ව රණවිරුවන්, යුද වීරයන් සහ මුරදේවතාවුන් ලෙස සමාජගත කිරීම සඳහා රාජ්‍ය මැදිහත්වීම් යටතේ විවිධ වැඩසටහන් ක්‍රියාවට නංවන ලදී. රණවිරුවන් ගේ සේවය අගයමින් විවිධ සින්දු, මාධ්‍ය සාකච්ඡා, රණවිරු නිවාස ගම්මාන ඉදිකිරීම, විවිධ ආගමික සහ ආශිර්වාද වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, යුද ජයග්‍රහණය ජාතික මට්ටමෙන් සැමරීම යනාදිය ඇතුළත් තවත් බොහෝ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ජාතික මට්ටමින් මෙලෙස ක්‍රියාත්මක වන විට, ක්ෂුද්‍ර මට්ටමින් මිනිසුන් ඔවුන් ජීවත්වන නාගරික, උපනාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල විවිධ සමාජ සේවා සහ ආගමික කටයුතු සංවිධානය කරමින් රණවිරුන්ව ඇගයීම සිදු කරන ලදී. මෙලෙස සමස්ත සමාජයම ජාතික සහ ක්ෂුද්‍ර මට්ටමින් රණවිරුන් පිළිබඳව දක්වන ලද ප්‍රතිචාර මගින් ආබාධිත සෙබළුන් ද තමන් ආබාධිත පුද්ගලයෙකු යන අර්ථකථනය යටපත් කර තමන් ද සමාජයට විශාල සේවයක් කරන ලද ඉතා වැදගත් සහ ගෞරවාන්විත පුද්ගලයෙකු යන අර්ථකථනය ගොඩනගාගෙන ඇත. මෙම සමාජ සන්දර්භය සහ එම කාලයේ ආබාධිත සෙබළුන් ද ඇතුළත්ව පොදුවේ සෙබළුන් පිළිබඳව ගොඩනැගී පැවතුණු සමාජ කතිකා මගින් ආබාධිත සෙබළුන් තමන්ගේ ශරීර ආබාධිතභාවය යටපත් කරගෙන, තමන් යුද වීරයෙක් යන ධනාත්මක ආකල්පයක් සහ අනන්‍යතාවක් ගොඩනගාගෙන ඇත. කෙසේ වෙතත්, යුද්ධය අවසන් වී වසර කිහිපයක් ගත වන විට සහ දේශපාලන බලාධිකාරයේ සිදුවන වෙනස් වීම සමග පුළුල් සමාජය තුළ යුද ජයග්‍රහණය, සෙබළුන් පිළිබඳව සහ ආබාධිත සෙබළුන් පිළිබඳව පැවති ගෞරවාන්විත සහ ධනාත්මක සමාජ කතිකාවල තීව්‍රභාවය ක්‍රමයෙන් අඩු වී ගියේය. මෙලෙස සමාජයේ සිදුවන සමාජ කතිකාවල වෙනස්වීම සාර්ව සහ ක්ෂුද්‍ර මට්ටමෙන් සමාජයේ වෙනස්කම් ඇති කිරීමට බලපාන ලදී. මෙලෙස ඇති වූ වෙනස්කම් හේතුවෙන් සහ පුද්ගලයන් ගේ සමාජ ප්‍රතිචාර වෙනස් වීම හේතුවෙන් ආබාධිත සෙබළුන් තමන්ගේ අනන්‍යතාවය පිළිබඳව ගොඩනගාගෙන සිටි රණවිරුවා යන අනන්‍යතාවය සහ ධනාත්මක අනන්‍යතාවය වෙනස් වීම සහ තමන් ආබාධිත පුද්ගලයෙකු යන අනන්‍යතාව මතු වීම සිදු වී ඇත.

සාමාන්‍ය ගම්මානයක ජීවත්වන චමින්ද[4] වයස අවුරුදු 39 වන යුද්ධයෙන් දෑස් දෙකම අහිමි වූ සෙබළෙකි. ඔහුගේ ජීවන වෘත්තාන්තය මගින් යුද්ධය පැවැති සමයේ සහ පශ්චාත් යුද සමයේ දී සමාජ කතිකාවල සිදු වූ වෙනස්කම් මගින් ඔහුගේ අනන්‍යතාවට සිදු වූ බලපෑම් අවබෝධ කරගත හැකිය. ඔහුගේ ජීවන වෘත්තාන්තයෙන් උපුටා ගත් කොටසක් පහත සඳහන් කර ඇත.

> 'මම ජීවත්වෙන්නේ රණවිරු ගම්මානයක නෙවෙයි. ඉතිං මගේ අසල්වාසීන් සාමාන්‍ය මිනිස්සු. දැන් මේ මිනිස්සු ඉස්සර වගේ නෙවෙයි. යුද්ධ කාලේ අපිව හොඳට බලාගත්තා. දැන් හැමෝම මාව අයින් කරලා දාලා ඉන්නේ. යුද්ධය ඉවරවෙන්න ළං වෙන කාලේ වෙඩි වැදිලා මගේ ඇස් දෙක පෙන්නේ නැතිව ගියා. ඒ කාලේ මං ගෙදර ගෙනාවම ගමේ හැමෝම වගේ ආවා මාව බලන්න. මං වෙනුවෙන් බෝධි පූජා තිබ්බා. මාවත් ගමේ අය ඇවිල්ලා ඒවට එක්කගෙන ගියා. ගමේ විශේෂ උත්සවයක් තිබ්බත් මාවත් විශේෂ අමුත්තෙක් විදියට එක්කගෙන ගියා. ගමේ අලුත් අවුරුදු උත්සවයේ තෑගි බෙදන්නත් මාව එක්කගෙන ගිහින් තියෙනවා. මිනිස්සු මේ කාලේ අපේ ගෙවල්වල අඩුපාඩු හොයලා බැලුවා. ගෙදර මොනවා හරි දෙයක් කරගන්න ඕනේ වුණාම කාට හරි පණිවිඩයක් දුන්නාම මිනිස්සු සල්ලි ගන්නේ නැතිව ඇවිල්ලා වැඩ කරලා දුන්නා. ඒ කාලේ ඒ තිබුණ පිළිගැනීම, ගෞරවය නිසා මට මං ආබාධිත කෙනෙක් කියන හැඟීම තිබුණේ නෑ. මට දැනුණේ මං සමාජයට විශාල සේවයක් කළ වටිනා කෙනෙක් කියලා. මාත් රණවිරුවෙක් කියන හැඟීම මටත් තිබුණා. හැබැයි මේ හැමදෙයක්ම ටික කාලයයි තිබුණේ. යුද්දේ ඉවරවෙලා අවුරුදු කිහිපයක් යන කොට මිනිස්සුන්ට හැම

[4] ප්‍රතිග්‍රාහකයන්ගේ අනන්‍යතාවය ආරක්ෂා කිරීම සඳහා ඔවුන්ගේ සැබෑ නම් වෙනුවට වෙනත් නම් මෙම ලිපියේ භාවිත කර ඇත.

දෙයක්ම අමතක වෙලා. දැන් ගමේ කාටවත් මාව මතක නෑ. ඉස්සර වගේ මං වෙනුවෙන් ගමේ මිනිස්සු බෝධි පූජා තියන්නේ නෑ. කවුරුත් මාව ඉස්සර වගේ බලන්න එන්නෑ. ගෙදර වැඩකට උණත් දැන් මිනිස්සුන්ට කතා කරාම සල්ලි කීයක් දෙනවා ද කියලා අහනවා. ඉස්සර වගේ සල්ලි ගන්නේ නැතිව වැඩ කරන්නේ නෑ. දැන් මං ගෙදරටම කොටු වෙලා ඉන්න කෙනෙක් වෙලා. දැන් ඉස්සර වගේ අපි ගැන ටීවී, රේඩියෝවල සින්දු යන්නේ නෑ. මිනිස්සුන්ගේ මේ වෙනස් වීම ගැන හිතන කොට කලකිරෙනවා. හැමෝම අපිව රැවැට්ටුවා කියලා හිතෙනවා. මට තවදුරටත් මං රණවිරුවෙක් කියලා දැනේන්නේ නෑ. දැන් මං සමාජයට වැඩක් නැති ආබාධිතයෙක් කියලා දැනෙනවා' (චමින්ද 2015/12/16).

චමින්ද ගේ මෙම ජීවන වෘත්තාන්තය මගින් පෙන්නුම් කරනු ලබන්නේ චමින්ද විසින් අවධි දෙකක දී අත්විඳින ලද සමාජ ප්‍රතිචාර මගින් ඔහුගේ අනන්‍යතාව වෙත වෙනස් ආකාරයේ බලපෑම් ඇති කර තිබෙන බවයි. මිචෙල් ෆූකෝල්ට් (1972) ට අනුව සමාජ කතිකා මගින් පුද්ගලයන් යම් කිසි වස්තු විෂයයක් සම්බන්ධයෙන් සිතන ආකාරය, කථා කරන ආකාරය හෝ නියෝජනය කරන ආකාරය හෝ දැනගන්නා ආකාරය සකස් කරනු ලැබේ. පුද්ගල අනන්‍යතාවය ගොඩනැගීම සහ සකස් කිරීම සිදු කරනු ලබන්නේ පුද්ගලයන් අයත් වන සහ සම්බන්ධ වන කතිකා ඇතුළතය. මෙම අදහස චමින්දගේ ජීවන අත්දැකීම් සඳහා ද අදාළ කරගත හැකිය. එනම් යුද්ධය පැවැති සමයේ දී ආබාධිත සෙබළෙකුට පවා සමාජයේ ඉහළ පිළිගැනීමක් ලබා දී තිබේ. ඔවුන්ගේ ආබාධිතභාවය නොසලකා සමාජය තුළ ගෞරවාන්විත පුද්ගලයෙකු ලෙසට සලකා ඇත. මෙම සමාජ ප්‍රතිචාර හේතුවෙන් ආබාධිත සෙබළුන්ගේ ප්‍රමුඛ අනන්‍යතාව රණවිරුවෙක් යන අනන්‍යතාවය බවට පත් වී ඇත. ඔවුන්ගේ ශරීරයේ පවතින ආබාධිත තත්ත්වය යටපත් කර ඔවුන්ට සමාජයෙන් ලැබුණු සමාජ ප්‍රතිචාර පදනම් කරගෙන ඔවුන් රණවිරුවෙක් යන අනන්‍යතාවය ගොඩනගාගෙන ඇත. කෙසේ වෙතත් සමාජ කතිකා සහ සමාජ ප්‍රතිචාරවල සිදු වූ වෙනස්කම් හේතුවෙන් ආබාධිත සෙබළුන් තමන් ගොඩනගා ගෙන සිටි රණවිරුවෙක් යන අනන්‍යතාවය ආබාධිත පුද්ගලයෙකු ලෙසට වෙනස් කර ගෙන ඇත. මෙම අනන්‍යාවල සිදු වන වෙනස් වීම පදනම් වී ඇත්තේ සමාජයෙන් ලැබුණු වෙනස් වූ ප්‍රතිචාර හේතුවෙනි. එබැවින් ආබාධිතභාවය පදනම් කරගෙන ගොඩනගා ගනු ලබන අනන්‍යතාව බාහිර සමාජයේ පවතින කතිකා සහ සමාජ ප්‍රතිචාර මත වෙනස් වීමට ලක් වන්නකි.

ගුණරත්න වයස අවුරුදු 37ක් වන යුද්ධයෙන් වම් පාදය අහිමි වී සිටින ආබාධිත සෙබළෙකි. ඔහුගේ ජීවන වෘත්තාන්ත මගින් වර්තමානයේ ආබාධිත සෙබළුන් සමාජය තුළ අත්විඳින සෘණාත්මක සමාජ ප්‍රතිචාර සහ එමගින් ඔවුන්ගේ අනන්‍යතාව කෙරෙහි ඇතිවන බලපෑම පෙන්නුම් කරනු ලබයි. ගුණරත්නගේ ජීවන වෘත්තාන්තයෙන් උපුටා ගත් කොටසක් පහත සඳහන් කර ඇත.

'යුද්ධ තිබුණ කාලෙත්, යුද්ධය ඉවර වෙලා ගතවුණු මුල් අවුරුදු කිහිපයේ අපිට සමාජයේ මිනිස්සු හොඳට සැලකුවා. ඉස්පිරිතාලෙට ගියත්, කොහේ හරි ආයතනයකට ගියත් අපි ආමි එකේ කිව්වාම අපිට පෝලිම්වල ඉන්න දුන්නේ නෑ. අපේ වැඩ, අවශ්‍යතා රස්තියාදු කරන්නේ නැතිව ඉක්මනින්ම කරලා දුන්නා. කොහේ හරි යනකොට වුණත් අපිව වාහන නතර කරලා දාගෙන ගියා. දැන් අපි ඉස්පිරිතාලෙට ගියත්, ආයතනයකට ගියත්, අපිව කවුරුවත් ගණන් ගන්නේ නෑ. අපි ආමි එකේ කිව්වත්, අපිටත් මිනිස්සු එක්ක පෝලිමේ එන්න කියනවා. අපිට මිනිස්සුන්ගෙන් අහලා, මිනිස්සු කැමතිනම් විතරක් පෝලිම්වල ඉස්සරහට එන්න කියනවා. නැන්නම් මිනිස්සුන්ගෙන් බැණුම් අහන්න බැලූ. ඉස්සර නම් අපිට මිනිස්සුන්ගෙන් අහන්න කියලා කියන්නේ නෑ. අපිට මූලිකත්වය දෙනවා. මං කඩකැල්ලක් හදලා ඒකට කරන්ට් එක ගන්න සැහෙන දවසක් එක එක තැන්වලට යන්න වුණා. මාව සැහෙන්න රස්තියාදු

> කෙරෙව්වා. මං ආමි එකේ වැඩ කළේ කිව්වත් මාව ගණන් ගත්තේ නෑ කවුරුත්. දැන් අපි නිකම්ම නිකං ආබාධිතයන් විතරයි' (ගුණරත්න 2014/05/27).

ගුණරත්නගේ ඉහත ජීවන වෘත්තාන්තය මගින් පෙන්වන්නේ විශේෂයෙන්ම රාජ්‍ය ආයතනවල සිදු වී ඇති ප්‍රතිචාරවල වෙනස් වීමයි. රාජ්‍ය ආයතනවල යුද්ධය පැවති සමයේ සහ පශ්චාත් යුද සමයේ යම් කාලයක් යනතුරු දේශපාලන බලාධිකාරිය විසින් යුද්ධය, සෙබළුන් සහ ආබාධිත සෙබළුන් පිළිබඳව දක්වන ලද ප්‍රතිචාරවල බලපෑම මත ආබාධිත සෙබළුන් වෙත විශේෂ සැලකීමක් දක්වා තිබේ. කෙසේ වෙතත් කාලය ගත වීමත් සමඟ දේශපාලන බලාධිකාරියේ සිදු වූ වෙනස්කම් හේතුවෙන් රාජ්‍ය ආයතනවලින් ආබාධිත සෙබළුන් වෙත දක්වන ප්‍රතිචාර ද වෙනස් වී ඇත. ආබාධිත සෙබළුන්ව විශේෂ පුද්ගලයන් ලෙස නොසලකන අතර, ඔවුන්ව ද සාමාන්‍ය පුද්ගලයන් ලෙස සලකන තත්ත්වයකට පත් වී ඇත. මෙලෙස සිදු වී ඇති සමාජ පරිවර්තන මගින් ආබාධිත සෙබළුන් අතර සෘණාත්මක ආකල්පයක් ගොඩනැගී ඇත. ඔවුන් තවදුරටත් තමන් සමාජය තුළ විශේෂ ගෞරවණීය පුද්ගලයෙකු ලෙස නොසිතන අතර, තමන් ආබාධිත පුද්ගලයෙකු යන අනන්‍යතාවය ප්‍රබලව ස්ථාපනය කර ගෙන ඇත. Joanne M. Kaufman සහ Cathryn Johnson (2004: 827-828) ට අනුව සමාජය තුළ ධනාත්මක ඇගයීම් ලබන පුද්ගලයන් ධනාත්මක අනන්‍යතාවක් ගොඩනගා ගන්නා අතර, සෘණාත්මක ඇගයීම් ලබන පුද්ගලයන් සෘණාත්මක අනන්‍යතාවක් ගොඩනගා ගනු ලබයි. ආබාධිත සෙබළුන්ට මෙම අදහස යොදාගත හැකි නමුත්, සමාජයෙන් ඔවුන් ලැබූ ධනාත්මක සහ සෘණාත්මක ඇගයීම් මගින් එක් පුද්ගලයෙකු තුළ සිදුවන අනන්‍යතාවයන්ගේ වෙනස් වීම් පිළිබඳව ද විශේෂයෙන් සලකා බැලීම සිදු කළ යුතුය. ආබාධිත සෙබළුන් එක් කලෙක ධනාත්මක අනන්‍යතාවකුත්, තවත් කලෙක සෘණාත්මක අනන්‍යතාවකුත් ගොඩනගා ගෙන ඇත.

ඇතැම් ආබාධිත සෙබළුන්ගේ සමාජයේ ආබාධිතභාවය මත පදනම් වූ අනන්‍යතාව ප්‍රබලව ඔවුන්ගේ ජීවිතවල තහවුරු වන ආකාරයේ සෘණාත්මක සමාජ ප්‍රතිචාරවලට ලක් වී ඇත. සමන්ත වයස අවුරුදු 35ක් වන දකුණු පාදය සහ දකුණු අත අහිමිව සිටින ආබාධිත සෙබළෙකි. සමන්ත දක්වන ආකාරයට පශ්චාත් යුද සමයේ සමාජය තුළ ඔහුට සෘණාත්මක ආකාරයට සැලකීමක් සිදු කර ඇත. සමන්තගේ ජීවන වෘත්තාන්තයෙන් උපුටා ගත් කොටසක් පහත සඳහන් කර ඇත.

> 'දැන් මිනිස්සු උදේට මාව දකින්නවත් කැමති නෑ. මාව දකින එක අසුබ දෙයක් වගේ සමහර අය හිතන්නේ. මාව මූණට මූණ දැක්කත් අහක බලාගෙන යනවා. මම බොරු කකුළත් දාගෙන, කිහිලිකරුවලින් කොහොම හරි ඇවිදගෙන එනකොට, සමහර මිනිස්සු මාව ඉස්සරහට දකින්න කැමති නෑ. දවසක් අපේ ගෙවල් ළඟ ළමයෙක් පළවෙනි දවසේ ඉස්කෝලේ එක්කගෙන යන්න ගෙදරින් එළියට එනකොට, ඒ ළමයාගේ අම්මා මාව දැකලා ඒගොල්ලන්ගේ ගෙදරින් එළියට එන්නේ නැතිව හිටියා මං යනකම්. මට තේරුණා මාව මේ ඉස්සරහට හම්බවෙන හින්දා තමයි මේ එන්නේ නැතිව නතර වුණේ කියලා. මං කොහොම හරි ඉක්මනින්ම ඒ ගෙදර පහු කරලා ගියා. මං දැන් ගොඩක් වෙලාවට ළමයි ඉස්කෝලේ යන වෙලාවට, මිනිස්සු වැඩට යන වේලාවට පාරට යන්නේ නෑ. මොකද මිනිස්සු කැමති නෑ මං උදේට පාරට යනවාට. අපේ නෝනාට ගමේ සමහර අය කියලා තිබුණා මාව උදෙන්ම කොහේවත් යවන්නේ නැතිව ගෙදරට වෙලා තියාගන්න කියලා. යන දිහාවක දවල් වෙලා යන්න කියලා තිබුණා. දැන් මං මේ ගමේ අසුබ ලකුණක් වෙලා තියෙන්න. යුද්දේ තිබුණ දවස්වල නම් එහෙම නෑ. මිනිස්සු සෑහෙන්න මාත් එක්ක කථා බස් කරා. සෑහෙන්න ගරු කරා. උදේට වුණත් මං කොහේ හරි යනකොට මිනිස්සු දැක්කොත්, කථා කරනවා. වාහනවල යන අය දාගෙන යනවා. දැන් කවුරුවත් මං දිහා බලන්නේ නෑ' (සමන්ත 2015/12/18).

සමන්තගේ ඉහත ජීවන අත්දැකීම් මගින් පෙනී යන්නේ සමන්තව තවදුරටත් රණවිරුවෙක්, සමාජයට සේවය කළ විශේෂ පුද්ගලයෙකු සහ ගෞරවණීය පුද්ගලයෙකු ලෙස නොසලකන බවයි. සමන්ත යුද්ධය පැවති සමයේ සහ පශ්චාත් යුද සමයේ අත්විඳි ධනාත්මක සමාජ ප්‍රතිචාර ක්‍රමානුකූලව අඩු වී ගොස් ඇත. දැන් ඔහුට සෘණාත්මක සමාජ ප්‍රතිචාර ලැබෙන අතර, ඔහුව සමාජයේ සාමාන්‍ය පුද්ගලයෙකු ලෙසට ද නොසලකයි. මෙලෙස අත්විඳින සමාජ ප්‍රතිචාර හේතුවෙන් සමන්ත දැන් ඔහුගේ ආබාධිතභාවය පදනම් කරගෙන අනන්‍යතාවය ගොඩනගාගෙන ඇත. අර්වින් ගොෆ්මන් (1963) ට අනුව ආබාධිත පුද්ගලයන් ශරීරයේ පවතින විකෘතිභාවය හේතුවෙන් සමාජ අවමානයට ලක් වේ. Rob Kitchin (2010: 343) ට අනුව සමාජයෙන් බහිෂ්කරණයට සහ ආන්තීකරණයට ලක් වීම ආබාධිත පුද්ගලයන්ගේ ජීවිතයේ එක් කොටසක් බවට පත් වී ඇත. Kitchin ගේ මෙම අදහසේ යම් වලංගුභාවයක් පවතින නමුත්, ආබාධිත සෙබළුන් පිළිබඳව මෙම අදහස යොදාගැනීමේ දී සමාජයේ පවතින සමාජ කතිකා සහ සමාජ ප්‍රතිචාරවල සිදු වන වෙනස්කම් පිළිබඳව ද අවධානය යොමු කිරීම කළ යුතුය. මෙහි දී හුදෙක් භෞතික ශරීරයේ පවතින විහීනතා පිළිබඳව පමණක් සැලකීම ප්‍රමාණවත් නොවන අතර, සමාජය තුළ ආබාධිත පුද්ගලයන්ට දක්වන සමාජ ප්‍රතිචාරවල වෙනස්වීම් පිළිබඳව ද අවධානය යොමු කළ යුතුය. එහි දී එක් සමාජ සන්දර්භයක ධනාත්මක සමාජ ප්‍රතිචාරත්, තවත් සමාජ සන්දර්භයක සෘණාත්මක සමාජ ප්‍රතිචාරත් ගොඩනැගෙන අතර, එමගින් ආබාධිත සෙබළුන්ගේ අනන්‍යතාව ද වෙනස් කිරීමට ලක් වේ.

**නිගමනය**

මෙම ලිපිය මගින් උත්සාහ කරනු ලැබුවේ ආබාධිත සෙබළුන්ගේ අනන්‍යතාවය ගොඩනැගීම සහ වෙනස්වීම සිදු වන ආකාරය පිළිබඳව විශ්ලේෂණය කිරීමයි. ඉහත දැක්වූ කරුණු අනුව සඳහන් කළ හැකි මූලික නිගමනය වන්නේ සමාජ කතිකා යම් කිසි සුවිශේෂී වූ ඓතිහාසික කාල පරිච්ඡේදයක පවතින සමාජ, ආර්ථික, දේශපාලනික, ආගමික සහ අධ්‍යාපනික සාධක මත රඳා පවතින අතර, මෙම සාධකවල වෙනස්වීමත් සමඟ සමාජ කතිකාවල ද වෙනස් වීම සිදු වේ. මෙලෙස සමාජ කතිකාවල සිදු වන වෙනස් වීම මගින් පුද්ගලන්ගේ සමාජ අන්තර්ක්‍රියාවල වෙනස්කම් ඇති කිරීම සිදු වේ. සමාජ අන්තර්ක්‍රියා වෙනස් වීම මගින් සමාජ ප්‍රතිචාර ද වෙනස් වේ. සමාජ ප්‍රතිචාර පදනම් කරගෙන ආබාධිත සෙබළුන් තමන්ගේ අනන්‍යතාවය පිළිබඳව ගොඩනගාගෙන ඇති අදහස් ද වෙනස් කර ගනු ලැබේ. එබැවින් ආබාධිත සෙබළුන්ගේ අනන්‍යතාව ගොඩනැගීම පිළිබඳව සිදු කරනු ලබන සාකච්ඡා හුදෙක් භෞතික ශරීරයේ සිදුවන වෙනස්කම් පිළිබඳ පමණක් අවධානය යොමු කිරීම ප්‍රමාණවත් නොවන අතර, සමාජයේ පවතින සමාජ කතිකා සහ එම කතිකාවෙන් සිදුවන වෙනස් වීම් සහ එමගින් ජනිත කරවන සමාජ අන්තර්ක්‍රියා සහ සමාජ ප්‍රතිචාර පිළිබඳව ද අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. එබැවින් ආබාධිත සෙබළුන්ගේ අනන්‍යතාවය ස්ථිතික නොවන අතර, එය පුළුල් සමාජයේ සිදුවන සමාජ කතිකාවල බලපෑම අනුව ගතිකත්වයට ලක් වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


Anderson, S and K. Whitfield. 2013. 'Social Identity and Stroke: They don't make me feel like, there's something wrong with me', *Scandinavian Journal of Caring Sciences,* Vol. 27. pp. 820-830.

Barnes, C and G. Mercer. 2005. 'Disability, Work and Welfare: Challenging the Social Exclusion of Disabled People', *Work, Employment and Society,* Vol. 19. No. 3. pp. 527-545.

Bunning, K and G. Steel. 2006. 'Self-concept in Young Adults with a Learning Disability from the Jewish Community', *British Journal of Learning Disabilities,* Vol. 35. pp. 43-49.

Campbell, F. K. 2008. 'Refusing Able(ness): A Preliminary Conversation about Ableism', *A Journal of Media and Culture,* Vol. 11. No. 3. http://journal.media-culture.org.au/index.php/mcjournal/article/viewArticle/46(Last accessed on 01 March 2015).

Chakravarti, U. 2013. 'Burden of Caring: Families of the Disabled in Urban India', *Disability Studies in India: Global Discourses. Local Realities.* Renu Addlakha (Eds). London: Routledge Taylor and Francis Group.

Chen, C and B. Shu. 2012. 'The Process of Perceiving Stigmatization: Perspectives from Taiwanese Young People with Intellectual Disability', *Journal of Applied Research in Intellectual Disabilities,* Vol. 25. pp. 240-251.

Clapton, J and J. Fitzgerald. 2014. 'The History of Disability: A History of 'Otherness': How Disable People have been Marginalized through the Ages and Their Present Struggle for their Human Rights', *New Renaissance Magazine: Renaissance Universal.* http://www.ru.org/human-rights/the-hisoty-of-disability-a-history-of-otherness.html (Last accessed on 14 October 2014).

Dalal, A. K. 2002. 'Disability Rehabilitation in a Traditional Indian Society', *Asia Pacific Disability Rehabilitation Journal,* Vol. 13. No. 2. pp. 17-26.

Foucault, M. 1972. *The Archaeology of Knowledge and the Discourse on Language.* (Trans. By A. M. S. Smith). New York: Pantheon Books.

Giddens, A. 2009. *Sociology.* 6thEdt.Cambridge: Polity Press.

Gisburg, F and R. Rapp. 2013. 'Disablity Worlds', *Annual Review of Anthropology,* Vol. 43. pp. 53-68.

Hussain, Y. 2005. 'South Asian Disabled Women: Negotiating Identities'. *The Sociological Review.* Oxford: Blackwell Publishing Ltd.

Jenkins, R. 2008. *Social Identity.* 3rdEdt. London: Roultdege Taylor & Francis Group.

Kitchin, R. 2010. ‘Out of Place’ ‘Knowing One’s Place’: Space, Power and Exclusion of Disabled People’, *Disability and Society,* Vol. 13. No. 3. pp. 343-356.

Kaufman, F and C. Johson. 2004. ‘Stigmatized Individuals and the Process of Identity’, *The Sociological Quarterly,* Vol. 45. No. 4. pp. 807-833.

Oliver, M. 1996. ‘Defining Impairment and Disability: Issues at Stake’. *Exploring the Divide.* C. Barnes & G. Mercer (Eds). Leeds: The Disability Press.

Perera, S. 2011. ‘The Construction of Masculinity and Bravery in War: The Case of Sri Lanka’, *Asian Leadership Fellow Programme 2010 Report: Rethinking Global Challenges Asian Intellectuals in Dialogue.* Tokyo: International House of Japan & Japan Foundation.

Scott, J and C. Marshall. 2009. *Oxford Dictionary of Sociology.* 3rdEdt. New York: Oxford University Press.

Sherry, M. 2006. ‘Identity’, *Encyclopaedia of Disability.* Vol. 5. London: Sage Publication.

World Health Organization. 2014. http://www.who.int/topics/disabilities/en (Last accessed on 20 October 2014).

# සමාජ විග්‍රහ

**විමර්ශිත සංග්‍රහය**

**REFEREED JOURNAL**

**පළමු කාණ්ඩය, නවවන වෙළුම - 2022**

**ISSN 2362-0978 (print ISSN)**

**ISSN 2756-925X (e-ISSN)**


ලිපි අංක 03

## ශ්‍රී ලාංකේය මහජන අවකාශයේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ කතිකාව නිර්මාණය වීම කෙරෙහි ජනමාධ්‍යයේ භූමිකාව : සමාජ විද්‍යාත්මක කියවීමක්


කේ.කේ.එච් පවිත්‍රා[5]

https://orcid.org/0000-0003-3390-3495


---


***ප්‍රධාන සංස්කාරක***

ප්‍රේමකුමාර ද සිල්වා

***සහය සංස්කාරක***

හිරුනි කළුආරච්චි

***සංස්කාරක උපදේශක මණ්ඩලය***

එස්.ටී.හෙට්ටිගේ (සම්මානිත මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
කාලිංග ටියුඩර් සිල්වා (සම්මානිත මහාචාර්ය) පේරාදෙණිය විශ්වවිද්‍යාලය
කේ.කරුණාතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) කැලණි විශ්වවිද්‍යාලය
සරත් අමරසිංහ (සම්මානිත මහාචාර්ය) රුහුණ විශ්වවිද්‍යාලය
යසාංජලී ජයතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
චන්ද්‍රසිරි නිරිඇල්ල (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
සුභාංගි හේරත් (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
නිශාර ප්‍රනාන්දු (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
ෆර්සානා හනීෆා (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
ඉරේෂා ලක්ෂ්මන් (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය

***භාෂා සංස්කරණය***

නාලක ජයසේන

***පරිසැලසුම් නිර්මාණය***

ප්‍රභාත් ගලගමගේ

හිරුනි කළුආරච්චි


---

[5] සහය කථිකාචාර්ය : සමාජ විද්‍යා අධ්‍යයනාංශය, ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ විද්‍යාව (ගෞරව) කොළඹ විශ්වවිද්‍යාලය, ශාස්ත්‍රපති උපාධි අපේක්ෂක (සමාජ විද්‍යාව) කොළඹ විශ්වවිද්‍යාලය

# සමාජ විග්‍රහ

**විමර්ශිත සංග්‍රහය**
**REFEREED JOURNAL**
**පළමු කාණ්ඩය, නවවන වෙළුම - 2022**
**ISSN 2756-925X (e-ISSN)**
**ISSN 2362-0978 (print ISSN)**

This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License.

දැනුම වෙත ප්‍රවේශ වීමේ සීමා අතික්‍රමණය සඳහා ලොව බොහෝ ශාස්ත්‍රාලයීය ප්‍රකාශන සම්ප්‍රදායික ප්‍රකාශන අයිතිය පිළිබඳ නෛතික ආකෘතියෙන් විකල්ප ආකෘතියක් වන පොදු නිර්මාණ බලපත්‍ර ක්‍රමයට සංක්‍රමණය වී / වෙමින් ඇත. මේ අනුව විවාරාත්මක දැනුමට විවෘත ප්‍රවේශයක් ලබා දීමේ අරමුණින් "සමාජ විග්‍රහ" විමර්ශිත සංග්‍රහය, නිකුත් වන්නේ ඉහත පොදු නිර්මාණ බලපත්‍රය යටතේය.

## ලිපි විමර්ශක මණ්ඩලය

*මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*
*මහාචාර්ය ෆර්සානා හනීෆා, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*
*මහාචාර්ය එම්.ටී.එම් මහීස්, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*
*මහාචාර්ය සමන්ත හේරත්, සන්නිවේදන සහ නිර්මාණාත්මක කලා අධ්‍යනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය*
*කථිකාචාර්ය චමත්කා පද්මසිරි කාරියවසම්, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*
*කථිකාචාර්ය ක්‍රිෂාන් සිරිවර්ධන, සන්නිවේදන සහ නිර්මාණාත්මක කලා අධ්‍යනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය*

## ප්‍රකාශනය

සමාජ විද්‍යා අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ-03
දුරකථනය/ෆැක්ස්: 011-2500452
විද්‍යුත් තැපැල: samajaviggraha@soc.cmb.ac.lk
වෙබ් අඩවිය: https://arts.cmb.ac.lk/sociology/

**සාරසංක්ෂේපය**

ප්‍රාග්ඓතිහාසික සමාජ ක්‍රමයේ සිට නූතන සංකීර්ණ සමාජ ක්‍රමය දක්වා විකාසනය වූ සමාජ සංස්ථා ඔස්සේ සමාජගත පුද්ගලයාගේ විවිධාකාර වූ අපේක්ෂා සහ අවශ්‍යතා සපුරා ගැනීම අරමුණු කෙරිණි. එවැනි සමාජ සංස්ථා අතරින් දේශපාලන සංස්ථාවට හිමිවනුයේ සුවිශේෂ ස්ථානයකි. එහිදී ගතික සමාජ ප්‍රපංචයක් වන දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදය යනු සුවිශේෂ භූමිකාවක් නිරූපණය කරනු ලබන සංකල්පයක් වශයෙන් පෙන්වා දිය හැකිය. ප්‍රජාතන්ත්‍රවාදය, මාධ්‍ය සහ මහජන අවකාශය අතර පවතින සබඳතාව, කලින් කලට විවිධ ශාස්ත්‍රඥයින්ගේ විග්‍රහයට ලක් වූ තේමාවක් වශයෙන් හඳුනාගත හැකිය. කාලානුරූපව විවිධ වෙනස්කම්වලට ලක් වන මහජන අවකාශය පිළිබඳ මෙන්ම, එම වෙනස්කම් හරහා ප්‍රජාතන්ත්‍රවාදී කතිකාවලට බලපෑමට ලක්වන ආකාරය පිළිබඳවත් පසුගිය දශක ගණනාවක් පුරාම සාකච්ඡාවට ලක් වී තිබේ. ඒ අනුව මහජන අවකාශය ඔස්සේ දේශපාලන අධිකාරවල ක්‍රියාකාරීත්වයට විවිධාකාර බලපෑම් එල්ල වන ආකාරයක් දක්නට ලැබෙන අතර, අනෙක් අතට දේශපාලන අධිකාරියේ ස්වකීය දේශපාලන අභිමතාර්ථ සාධනය කර ගැනීම සඳහා මහජන අවකාශය භාවිත කරනු ලබයි. මෙම මහජන අවකාශය සහ දේශපාලන අධිකාරය අතර සම්බන්ධීකරණය ඇති කරනු ලබන ප්‍රධානම කාරකයක් වශයෙන් මාධ්‍යයේ කාර්යභාරය මෙහිදී බෙහෙවින් වැදගත් වේ. විශේෂයෙන්ම පශ්චාත් නූතන සමාජය විශ්ලේෂණයේදී, නිදහස් ප්‍රජාතන්ත්‍රවාදය (Liberal Democracy), සිවිල් සමාජය (Civil Society) සහ සමාජ වෙනස්වීම (Social Change) පිළිබඳ කතිකාවලදී මහජන අවකාශය පිළිබඳ න්‍යාය බහුල වශයෙන් සමාජ විද්‍යාඥයින්ගේ අවධානයට ලක්ව ඇත. මේ සඳහා පුරෝගාමී දායකත්වය සපයන ලද්දේ ජර්මන් ජාතික නව මාක්ස්වාදී චින්තකයෙකු වන ජුර්ගන් හබමාස් (Jurgen Habermas) විසින්ය. හබමාස් මාධ්‍ය සහ ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් අදහස් දැක්වීමේදී න්‍යායයක් වශයෙන් භාවිත කළ මහජන අවකාශය (The Public Sphere) පිළිබඳ න්‍යාය ඔස්සේ, වත්මන් ශ්‍රී ලාංකික සමාජයෙහි ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ කතිකාවේදී ජනමාධ්‍යයේ භූමිකාව පිළිබඳ සමාජවිද්‍යාත්මක කියවීමක් මෙම ලිපිය හරහා සිදු කෙරේ. විශේෂයෙන්ම හබමාස් විසින් සිය "The Structural Transformation of the Public Sphere" කෘතියෙන් ඉදිරිපත් කරනු ලබන න්‍යායාත්මක සාකච්ඡාවෙහි අන්තර්ගත වන දේශපාලන සහභාගිත්වය පිළිබඳ තර්කය අනුව යමින් වත්මන් ශ්‍රී ලාංකික සමාජයේ මෙය ප්‍රායෝගීකරණය වී ඇති ආකාරය මෙහිලා අවධානයට නතු කෙරේ. මෙම ක්‍රියාවලියේ ජනමාධ්‍යයේ කාර්යභාරය කුමක්ද යන පර්යේෂණ ගැටලුව මත පදනම්ව මෙම පර්යේෂණය ක්‍රියාත්මක කෙරුණු අතර, එහිලා උක්ත මාතෘකාව හා සමපාත වන්නා වූ සාහිත්‍යය විෂයෙහි අවධානය යොමු කරමින් විග්‍රහය සිදු කරන ලදී.

*මුඛ්‍ය පද: දේශපාලන සහභාගිත්වය , ජනමාධ්‍ය, ප්‍රජාතන්ත්‍රවාදය, මහජන අවකාශය, සිවිල් සමාජය, සමාජ වෙනස්වීම,*

## හැඳින්වීම

කාලානුරූපව වෙනස් වන රාජ්‍යයෙහි කාර්යභාරය පිළිබඳ විවිධ බුද්ධිමතුන් බහුවිධ දෘෂ්ටිකෝණ මඟින් කරුණු දක්වා තිබේ. ඒ අනුව ඔවුන් පෙන්වා දෙන්නේ ස්වාධිපත්‍යය සහිත සෑම රාජ්‍යයකම, ප්‍රජාතන්ත්‍රවාදය සහ නීතියේ ආධිපත්‍යය පැවතීම යන කාරණා මූලික ලක්ෂණ වශයෙන් පැවතිය යුතු බවයි. මූලික වශයෙන්ම දේශපාලන න්‍යායවේදීන්ගේ විවාදයට බඳුන්ව ඇති ''ප්‍රජාතන්ත්‍රවාදය'' නමැති සංකල්පය කාලය සහ අවකාශය අතර කෘත්‍යාත්මක වෙනස්කම් සහිතව දෝලනය වන්නක් වශයෙන් හඳුනා ගත හැකිය. එම නිසාම ''ප්‍රජාතන්ත්‍රවාදය'' යන සංකල්පය සකස් වීමේදී සහ එහි අර්ථ විවරණය කිරීමේදී, ඒ හා සම්බන්ධිත තත්කාලීන දේශපාලන ක්ෂේත්‍රය තුළින් සුවිශාල බලපෑමක් එල්ල වන බව විද්‍යමාන වේ. ඒ අනුව ශ්‍රී ලාංකික සමාජයේ ''ප්‍රජාතන්ත්‍රවාදය'' යන සංකල්පය අර්ථ විවරණය වීමේදී තත්කාලීන දේශපාලන ක්ෂේත්‍රය සහ ඒ හා සම්බන්ධිත අනෙකුත් ක්ෂේත්‍ර තුළින් විශාල බලපෑමක් එල්ල වන ආකාරයක් හඳුනාගත හැකිය.

ඓතිහාසික වශයෙන් විමසා බැලීමේදී ශ්‍රී ලාංකික දේශපාලන ක්ෂේත්‍රය විවිධ සමාජයීය, ආර්ථික, ආගමික සහ ප්‍රාදේශීය සාධක සමඟ බැඳී පවතින ආකාරයක් හඳුනාගත හැකි අතර, එය නව සමාජ ප්‍රවාහ හා පැරණි සමාජ බලවේග මඟින් බලපෑමට ලක් වෙමින් ලාංකික මහජන අවකාශය කෙරෙහි ඇති කරන බලපෑම කුමන ස්වරූපයක් ගනීද යන්න අවධානයට ලක් කල යුතුම සංසිද්ධියක් වේ. ශ්‍රී ලාංකේය දේශපාලන ක්ෂේත්‍රයට ප්‍රබල බලපෑමක් එල්ල කරන්නක් වශයෙන්, යටත්විජිත යුගයෙන් ඇරඹී නූතනය දක්වාම විවිධ වෙනස්කම්වලට භාජනය වෙමින් විකාසනය වන ''ශ්‍රී ලාංකේය සුබසාධක රාජ්‍යය'' සංකල්පය හඳුනාගත හැකිය. මුල්කාලීන යටත්විජිතවල ආර්ථික ප්‍රතිලාභ නැංවීම සඳහා ඇති කළ සුබසාධක ක්‍රියාමාර්ග නිදහසෙන් පසුව දේශීය පාලක පක්ෂවල මූලික ප්‍රතිපත්ති බවට පරිවර්තනය වීමක් දැකිය හැකි අතර නිදහස් අධ්‍යාපනය, සෞඛ්‍යය, ප්‍රවාහනය මුල් කොටගත් ප්‍රතිලාභ රැසක් ඒ ඔස්සේ පුරවැසියන් සතු විණ. නමුත් විවෘත ආර්ථික ප්‍රතිසංස්කරණ මඟින් පුද්ගලවාදය හා තරඟකාරීත්වය ගොඩනැඟීමත් සමඟ අභියෝගයට ලක් වූ ලාංකේය සුබසාධක කාර්ය නූතනය වන විට නව මුහුණුවරක් ගෙන ඇති බැව් පෙනේ.

විශේෂයෙන්ම යටත්විජිතවාදය සමඟ ඇති වූ නව සමාජ වෙනස්කම් මෙන්ම, දේශපාලනික ප්‍රතිසංස්කරණ හමුවේ ධනවාදය ශ්‍රී ලංකාව තුළද තම බලාධිපත්‍යය පැතිරවීම සිදු කළ අතර, එහිදී මහජන අවකාශය වෙතට බලපෑම් කිරීමේ ප්‍රධාන කාරකය වශයෙන් උපයෝගි කර ගන්නා ලද්දේ ජනමාධ්‍යයයි. ජන මාධ්‍ය නූතන සමාජ පද්ධති අතර පවතින සම්බන්ධකය වශයෙන් ක්‍රියා කරනු ලබයි. ලොව සෑම සමාජයකම ජනමාධ්‍යවල ස්වභාවය සහ ක්‍රියාකාරීත්වය ඒකරූපික නොවන අතර එක් එක් සමාජවල පවතින ආර්ථික, දේශපාලන සහ අනෙකුත් සමාජ සාධක මත එය විචලනය වේ. එම හේතුව නිසා ජනමාධ්‍යය රටක ජනතාවගේ දේශපාලන දිශානති තීරණය කිරීම පිණිසද විවිධාකාරයෙන් භාවිත වේ.

ඒ අනුව මහජන අවකාශය වෙත බලපෑම් කිරීම සඳහා දේශපාලන ප්‍රවාහය විසින් ජනමාධ්‍ය යොදා ගන්නා ආකාරය අධ්‍යයනය කිරීමේ මෙම පර්යේෂණය සඳහා උපයුක්ත කරගත් පර්යේෂණ ගැටලුව වන්නේ ශ්‍රී ලාංකික මහජන අවකාශයේ දේශපාලනික මතවාද හුවමාරු කිරීමේ කාරකයක් වශයෙන් ජනමාධ්‍යයේ භූමිකාව කෙබඳු ආකාර වන්නේද? යන්නයි. එහිලා, මෙහි ප්‍රධාන අරමුණ වන්නේ, ශ්‍රී ලාංකික මහජන අවකාශයේ දේශපාලනික මතවාද හුවමාරු කිරීමේ කාරකයක් වශයෙන් ජනමාධ්‍යයේ භූමිකාව විග්‍රහ කිරීමයි. ඒ හා සමගාමීව ගොඩනඟාගත් පර්යේෂණ උපඅරමුණු පහත පරිදි වේ.

- ශ්‍රී ලාංකික ජන සමාජයේ දේශපාලන සහභාගිත්ව ක්‍රියාවලියේදී මාධ්‍යයේ භූමිකාව විශ්ලේෂණය කිරීම.

- ශ්‍රී ලාංකික මහජන අවකාශයේ මහජන මත නිර්මාණය කිරීම සඳහා මාධ්‍ය මඟින් ඇති කරන බලපෑම විග්‍රහ කිරීම.
- වත්මන් ශ්‍රී ලාංකික සමාජ ප්‍රවාහයේ පවතින මහජන අවකාශයේ ස්වභාවය විග්‍රහ කිරීම සඳහා හබමාස්ගේ මහජන අවකාශය පිළිබඳ අදහස් කොතරම් දුරට ප්‍රයෝජනවත් වන්නේදැයි හඳුනා ගැනීම.

**ක්‍රමවේදය**

ද්විතීයික දත්ත මත පදනම්ව මෙම පර්යේෂණය දියත් කරන ලදී. ඒ අනුව ශාස්ත්‍රීය ග්‍රන්ථ, ලිපි, පරිවර්තන මෙන්ම පළ කළ සහ පළ නොකරන ලද ශාස්ත්‍රීය නිබන්ධවල ද්විතීයික මූලාශ්‍රයවල ලේඛනගත දත්ත මේ සඳහා උපයුක්ත කරගන්නා ලදී.


**මහජන අවකාශය යනු,**

මාධ්‍ය, ප්‍රජාතන්ත්‍රවාදය සහ මහජන අවකාශය අතර සබඳතාව පසුගිය දශක කිහිපය පුරා විවිධ ශාස්ත්‍රඥයින්ගේ විග්‍රහයට භාජනය වී තිබේ. මේ සඳහා පුරෝගාමී දායකත්වය සපයන ලද්දේ නව මාක්ස්වාදී චින්තකයෙකු වන ජර්මන් ජාතික ජුර්ගන් හබමාස් විසිනි. මහජන අවකාශය පිළිබඳ සාකච්ඡාවේදී හබමාස් අවධානය යොමු කළ ප්‍රධාන සංකල්ප දෙකක් වශයෙන් පෞද්ගලික අවකාශය සහ රාජ්‍ය ආධිපත්‍යය අවකාශය හඳුනාගත හැකිය. පෞද්ගලික අවකාශය යනු පුරවැසියාගේ සාමාන්‍ය ජීවිතයේදී ඔහුට හිමි වන ස්වාධීනත්වය ලෙසත්, රාජ්‍ය විසින් බලාධිකාරය ක්‍රියාත්මක කරන අවකාශය රාජ්‍ය ආධිපත්‍ය අවකාශය ලෙසත් පෙන්වා දිය හැකිය (Habermas,1989). ඒ අනුව මහජන අවකාශය පෞද්ගලික අවකාශය සහ සමාජ අවකාශය අතර සම්බන්ධීකරණය කිරීමේ කාර්යයෙහි නිරත වේ. එනම්, පෞද්ගලික අවකාශයේ ගොඩනැගෙන මහජන අවශ්‍යතා රාජ්‍යයේ දේශපාලනික තීරණයක් හෝ ක්‍රියාකාරකමක් බවට පත්වන්නේ මහජන අවකාශයේ ගොඩනැගෙන සාකච්ඡා සහ අදහස් හුවමාරුව මඟිනි. එනම් පුද්ගලයින් තම සාකච්ඡා හා සන්නිවේදනය මඟින් පොදු එකඟතාවක් ගොඩනගාගන්නේ මහජන අවකාශය තුළය (Habermas,1989:30).

ඉහත සඳහන් කළ පරිදිම මහජන අවකාශය පිළිබඳ හබමාස්ගේ සාකච්ඡාවේදි පෞද්ගලික අවකාශය සහ රාජ්‍ය ආධිපත්‍යය අවකාශය යන සංකල්ප ද්විත්වය බෙහෙවින් වැදගත් වේ. හබමාස් විසින් පෞද්ගලික අවකාශය සහ රාජ්‍ය ආධිපත්‍යය අවකාශය අතර අන්තර්සම්බන්ධීකරණය සිදු කරනු ලබන අවකාශයක් වශයෙන්, මහජන අවකාශය න්‍යායාත්මකව ස්ථාපිත කරනු ලබයි. මෙහිදී හබමාස් පෞද්ගලික අවකාශය වශයෙන් හඳුන්වනු ලබන්නේ පුරවැසියාගේ සමාජ ජීවිතයේ ඔහුට හිමිව ඇති ස්වාධීනත්වය හා තම අභිමතය පරිදි ක්‍රියාකිරීමට ඉඩප්‍රස්තාව හිමි වන අවකාශයයි. එහිදී රජයේ හෝ වෙනත් බාහිර අධිකාරියක බලපෑමෙන් තොරව පුද්ගලයාට සිය සමාජ ජීවිතයේ යම් යම් කාරණා සම්බන්ධයෙන් තීරණ ගැනීමට ඇති අවකාශය විග්‍රහ කිරීමට උත්සාහගෙන තිබේ. මෙහිදී හබමාස් විසින් පවුල සහ නිවස පෞද්ගලික අවකාශය ක්‍රියාත්මක වන ස්ථානයන්ට උදාහරණ වශයෙන් පෙන්වා දෙනු ලබයි. මෙහිදී පුද්ගලයින්ට තම පවුලේ අභිවෘද්ධිය වෙනුවෙන් කිසිදු බලපෑමකින් තොරව තීරණ ගැනීම සඳහා හිමි වන නිදහස ප්‍රධාන වේ. පවුලේ නිෂ්පාදන ක්‍රියාවලිය, පරිභෝජනය, භාණ්ඩ හුවමාරුව, සමාජ සම්බන්ධතා ආදී සමාජ ජීවිතයේ විවිධ පැතිකඩ පිළිබඳ තීරණ ගනු ලබන්නේ පෞද්ගලිකවය (Habermas,1989:30). ඒ අනුව පෞද්ගලික අවකාශය යනු සිවිල් සමාජයේ ඉතාම කුඩා ඒකකය වශයෙන් හඳුන්වා දිය හැකිය.

රාජ්‍ය අවකාශය යනු රාජ්‍ය විසින් තම බලාධිකාරය ක්‍රියාත්මක කරවන අවකාශයයි. පොලීසිය සහ පාලක පන්තිය වැනි කණ්ඩායම් රාජ්‍ය අවකාශ ආධිපත්‍යයේ තීරණාත්මක රැගුම්කරුවන් වන අතර, එම කණ්ඩායම් මගින් රාජ්‍ය සතු බලය ක්‍රියාත්මක කරනු ලබයි. නමුත් මෙහිදී සඳහන් කළ යුතු වැදගත් කරුණක් වන්නේ රාජ්‍ය ආධිපත්‍යය අවකාශය යනු රාජ්‍යයම නොවන බවයි. මෙහිදී රාජ්‍ය ආධිපත්‍යය අවකාශය යන සංකල්පය හරහා හබමාස් හැඳින්වීමට උත්සාහ කර ඇත්තේ රාජ්‍ය බලය හිමි පන්තිය බව හඳුනා ගැනීම වඩාත් උචිතය (Habermas, 1989:30). ඒ අනුව පෞද්ගලික අවකාශය සහ රාජ්‍ය ආධිපත්‍යය අවකාශය අතර සම්බන්ධීකරණ කාර්යය ඉටු කරනු ලබන්නේ මහජන අවකාශය මගින් බව පැහැදිලි වේ. මෙහිදී පෞද්ගලික අවකාශයේ ගොඩනැගෙන මහජන අවශ්‍යතා සියල්ල, මහජන අවකාශයේ ගොඩනැගෙන සාකච්ඡා හා අදහස් හුවමාරුව මගින්, දේශපාලනික තීරණයක් හෝ ක්‍රියාකාරකමක් බවට පත්වීම සිදු වන බව පැහැදිලිවම හඳුනාගත හැකිය. එනම්, පුද්ගලයින් තමන්ගේ පෞද්ගලික මට්ටමේ ගැටලු, අවශ්‍යතා ආදිය පිළිබඳව පොදු එකඟතා ගොඩ නගා ගන්නේ මහජන අවකාශයේ බව හඳුනා ගත හැකිය. අවසානයේ එම පොදු එකඟතා මහජන මතයක් බවට පුළුල්ව වර්ධනය වී පවතින රජයේ දේශපාලන ආධිපත්‍යය වෙත ගමන් කිරීමෙන් අනතුරුව ඊට ප්‍රතිචාර වශයෙන් දේශපාලන තීරණ හෝ ක්‍රියාකාරකම් රාජ්‍ය ආධිපත්‍යය අවකාශය තුළින් නිකුත් වේ (Habermas,1989:30). පෞද්ගලික අවකාශය, රාජ්‍ය ආධිපත්‍යය අවකාශය සහ මහජන අවකාශය යන අවකාශත්‍රිත්වය අතර පවතින අන්තර්සබඳතාවය පහත රූප සටහන මගින් මැනැවින් අවබෝධ කර ගත හැකිය.

රූපසටහන 3.1




(මූලාශ්‍රයඃ හඳරාගම සහ රත්නායක, **2014**)

ඉහත රූප සටහන මගින් පැහැදිලිවම දක්වන ආකාරයට මහජන අවකාශයේ කාර්යභාරය සරලවම දැක්වුවහොත්, ඒ හරහා සිදුවන්නේ පෞද්ගලික අවකාශය සහ රාජ්‍ය ආධිපත්‍යය අවකාශය අතර සම්බන්ධීකරණ කාර්යභාරය වේ. ඒ අනුව ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහය තුළ රාජ්‍යයේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට මහජනතාව සම්බන්ධ කර ගැනීමේදී මහජන අවකාශය හරහා ඉටු වන සම්බන්ධීකරණ කාර්යභාරය ඉතාමත් වැදගත් බව පෙන්වා දිය හැකිය.

**දේශපාලන සහභාගිත්වය, ප්‍රජාතන්ත්‍රවාදය සහ ජනමාධ්‍යයේ භූමිකාව**

දේශපාලන විග්‍රහවල දී මහජන අවකාශය පිළිබඳ න්‍යායාත්මක හැදෑරීම් ආරම්භ වන්නේ දේශපාලන සහභාගිත්වය පිළිබඳ සාකච්ඡාවත සමඟය. දේශපාලන චින්තකයින් පිළිගන්නා ආකාරයට නූතන

ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රියාවලියේ යහපැවැත්ම සඳහා ප්‍රජා සහභාගිත්වය අත්‍යවශ්‍ය අංගයක් වේ. දේශපාලන සහභාගිත්වය යනු හුදු ඡන්දය ප්‍රකාශ කිරීම පමණක් නොවේ. රාජ්‍යයේ පුරවැසියෙකු වශයෙන් මහජන මතය නිර්මාණය කිරීමට, පාර්ශ්වකරුවෙකු වශයෙන් තීරණ ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධ වීමට සහ බලපෑම් කණ්ඩායමක් වශයෙන් ක්‍රියා කිරීම වැනි අංග දේශපාලන සහභාගිත්වය මඟින් නිර්වචනය කෙරේ. ඒ අනුව දේශපාලන සහභාගිත්වය ඍජු හෝ වක්‍ර ක්‍රියාවලියක් විය හැකිය. සැමුවෙල් පී.හන්ටින්ග්ටන් (Samuel .P Huntington) සහ ජේ. එම්. නෙල්සන් (J. M. Nelson) (1976) "No Easy Choice : Political Participation in Developing Countries" යන කෘතියේ පෙන්වා දෙන ආකාරයට,

> *"දේශපාලන සහභාගීත්වය යනු ආණ්ඩුවේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට බලපෑම් කිරීම සඳහා පුරවැසියන් විසින් සැලසුම් කර ක්‍රියාවට නගනු ලබන පෞද්ගලික ක්‍රියාකාරකම් වේ. (Huntington& Nelson, 1976 : 3).*

ආණ්ඩුවේ තීරණ ගැනීම සහ ක්‍රියාවට නැංවීම සඳහා ස්ථාපිත කර තිබෙන ආයතන පද්ධතියට, එනම් පෙර සඳහන් කළ රාජ්‍ය ආධිපත්‍යය අවකාශය වෙත ඍජුව හෝ වක්‍රව බලපෑම් කිරීමේ අරමුණ ඇතිව දේශපාලන පක්ෂ, සිවිල් සංවිධාන ආදියට සම්බන්ධ වී ක්‍රියාකිරීම තුළින් පුද්ගලයින් දේශපාලන සහභාගීත්වය අත්කර ගන්නා බව ඉහත නිර්වචනය තුළින් ගම්‍යමාන වේ. එහිදී පුද්ගලයින් තම පෞද්ගලික අවකාශයේ සිට රාජ්‍ය අධිපත්‍යය අවකාශය වෙත තමන්ගේ දේශපාලන සහභාගීත්වය සිදු කරනු ලබන්නේ මහජන අවකාශය හරහා බව පෙන්වා දිය හැකිය.

කෙසේ වෙතත්, රාජ්‍ය ආධිපත්‍යය අවකාශය වෙත බලපෑම් කිරීමෙන් දේශපාලන සහභාගීත්වය පෙන්නුම් කිරීම ලිබරල් ප්‍රජාතන්ත්‍රීය දේශපාලන ක්‍රම වෙතින් දක්නට ලැබෙන දේශපාලන සහභාගීත්වයේ ප්‍රමුඛ ස්වරූපයක් බව පෙන්වා දිය හැකිය. ලිබරල් ප්‍රජාතන්ත්‍රීය දේශපාලන ක්‍රම මඟින් දක්නට ලැබෙන දේශපාලන සහභාගීත්වය ප්‍රකාශ වන ආකාර තුනක් මූලික වශයෙන් හඳුනාගත හැකිය.

- සිය දේශපාලන අදහස් උදහස් ප්‍රකාශ කිරීම සඳහාත් ඒවා අන්‍යයන්ට සන්නිවේදනය කිරීම සඳහාත් පොදු ක්ෂේත්‍රයට සම්බන්ධ වී දේශපාලනයෙහි නිරත වීම. (මැතිවරණවලදී ඡන්ද අපේක්ෂකයෙක් වශයෙන් ඉදිරිපත් වීම, මැතිවරණ හෝ ජනමත විමසුම්වලදී ඡන්දය ප්‍රකාශ කිරීම, ප්‍රසිද්ධ රැස්වීම්වලට සහභාගී වීම සහ පෙළපාලිවලට සම්බන්ධ වීම පෙන්වා දිය හැකිය.)
- ආණ්ඩුවේ ප්‍රතිපත්ති සම්පාදකයින් හෝ විධායකයේ සාමාජිකයින් වෙත සිය ඉල්ලීම් ඍජුව සන්නිවේදනය කිරීම, ලිපි යැවීම සහ පෙත්සම් ඉදිරිපත් කිරීම මෙහිදී පෙන්වා දිය හැකිය. ශ්‍රී ලංකාවේ වාර්ගික අරගලය පැවති යුගයේ "ජාතික සාම මණ්ඩලය" , "සර්වෝදය ශ්‍රමදාන සංගමය" ඇතුළු සිවිල් සංවිධාන කිහිපයක් එකතුව යුද ගැටුම් නවතා සාමයට පිවිසෙන ලෙස ඉල්ලමින් ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණියටත්, එල්.ටී.ටී.ඊ. නායක වේලුපිල්ලේ ප්‍රභාකරන් වෙතත් තැපැල් පත් යැවීම මේ හා සමානකමක් දරන දේශපාලන සහභාගීත්වයක් පෙන්නුම් කරන ක්‍රියාකාරකමක් වශයෙන් පෙන්වා දිය හැකිය.
- ව්‍යවස්ථාදායකය හෝ විධායකය සඳහා පුද්ගලයින් තෝරාපත්කර ගැනීමේ ක්‍රියාවලියට සහභාගී වීම, මැතිවරණ ප්‍රචාරණයට සහභාගී වීම, ජනමත නායකයින් වශයෙන් ක්‍රියා කිරීම, දේශපාලන මත සන්නිවේදකයින් වශයෙන් ක්‍රියාකිරීම නිදර්ශන ලෙෂ ඉදිරිපත් කළ හැකිය (හඳරාගම, 2013).

සංවිධානාත්මක දේශපාලන ක්‍රමයක් තුළ සක්‍රිය දේශපාලන ජීවියෙකු වශයෙන් දේශපාලන ක්‍රියාකාරිත්වයක් සාක්ෂාත් කර ගැනීමට පුරවැසියා සතු ඉඩ ප්‍රස්තාව දේශපාලන සහභාගීත්වය යනුවෙන් සරලවම හැඳින්විය හැකි බව මේ අනුව පෙන්වා දිය හැකිය. මෙහිදී පුරවැසියන් විවිධ අයුරින් සිය දේශපාලන

සහභාගීත්වය පෙන්නුම් කරන අතර, දේශපාලන චින්තකයින් පිළිගන්නා ආකාරයට නූතන ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රියාවලියේ යහපැවැත්ම සඳහා ප්‍රජා සහභාගිත්වය අත්‍යවශ්‍ය අංගයක් වේ. එහිදී ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අදහස විමසීමේදී පෙනී යන්නේ, ප්‍රජාතන්ත්‍රවාදය යනු බහුතරයේ කැමැත්ත වන විට එමඟින් ඇතැම් අවස්ථාවලදී සුළුතරය නොසලකා හරින ලද බවයි. තොකුවිල්ගේ (Tocqueville) මතයට අනුව ප්‍රජාතන්ත්‍රවාදය බිහි වීම මඟින් අසමානත්වය පිළිබඳ ගැටලුව සඳහා විසඳුමක් ලැබුණද නිදහස පිළිබඳ ගැටලුව සම්පූර්ණයෙන් විසඳී නොමැත. එයට හේතුව ලෙස තොකුවිල් දුටුවේ බහුතරය සතු සුළුතරය නිහඬ කිරීමේ බලයයි. බහුතරයේ මතයට අවනත වීම හැර අන් විකල්පයක් එයට එකඟ නොවන සුළුතරයට නොතිබුණි. ඔහු එය හැඳින්වූයේ ප්‍රජාතාන්ත්‍රික සර්වබලධාරී පාලනය සහ බහුතරයේ ප්‍රජා පීඩක පාලනය ලෙසය (උයන්ගොඩ, 2011). ප්‍රජාතන්ත්‍රවාදය යනු මිනිසුන් සඳහා මිනිසුන් විසින් මිනිසුන්ගේ හිමිකම සහිත පාලනයක් වුවද වර්තමානය වන විට ඒ තුළ සමස්ත මානව වර්ගයා යන තේමාව වෙනුවට ජනවාර්ගිකත්වය, ආගමිකත්වය, කුලය, සමාජ පන්තිය ආදී විවිධ තේමා ආදේශ වී තිබෙන ආකාරයක් හඳුනාගත හැකිය. එම නිසාම වර්තමානය වන විට නිදහස් සහ සාධාරණ මැතිවරණ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම, මහජන මතය, මාධ්‍ය නිදහස යනාදී ප්‍රජාතාන්ත්‍රික ලක්ෂණ, මානව වර්ගයා යන තේමාව පසෙකලා ජනවාර්ගිකත්වය ආදී තේමා මත පදනම් වී ඇති ආකාරයක් සමකාලීන සමාජය අධ්‍යයනය කිරීමේදී හඳුනාගත හැකිය. මෙම ක්‍රියාවලියේ ජනමාධ්‍යය නූතන සමාජ අතර පවතින සම්බන්ධකය වශයෙන් ක්‍රියා කරමින් පුද්ගල දේශපාලන සහභාගීත්වය වර්ධනය කිරීමේ උපකරණයක් වශයෙන් ක්‍රියාකරන බව පෙන්වා දිය හැකිය.

විශේෂයෙන්ම දේශපාලන සහභාගිත්ව ක්‍රියාවලියේ දී මාධ්‍යයේ භූමිකාව ඉතාමත් වැදගත් වේ. දේශපාලනයේ පුරවැසි සහභාගිත්වය පුළුල්ව සිදු වන්නේ මාධ්‍ය මඟින් වීම ඊට හේතුවයි. දේශපාලන සහභාගිත්වය මඟින් අපේක්ෂා කරන්නේ පාලකයින් තෝරා ගැනීම, පාලකයින් ඉවත් කිරීම, මහජන අවශ්‍යතා පාලන තන්ත්‍රයට දැනුම් දීම, බලපෑම් කිරීම, මහජන මත නිර්මාණය කිරීම සහ පාලන තන්ත්‍රයට අනුග්‍රාහකත්වය දැක්වීම හෝ විරෝධතාව ප්‍රකාශ කිරීමයි (Almond, 1992). ජන මාධ්‍ය රටක ජනතාවගේ දේශපාලන දිශානතීන් තීරණය කිරීම පිණිසද විවිධාකාරයෙන් භාවිතය. ඔස්ටින්රෙනී (Austin Ranney) සඳහන් කරන්නේ ජන සන්නිවේදනය හරහා සියලුම ජාතීන් විශේෂයෙන්ම මාධ්‍ය හරහා මූලික දිශානතීන් සහ මහජන මතය හැඩගැස්වීමේදී ප්‍රමුඛ භූමිකාවක් රඟදක්වනු ලබන බවයි (Agrawal, 1989 : 200). ලූසියන් පායිගේ (Lucian Pye) නිරීක්ෂණවලට අනුව ජන මාධ්‍ය හරහා සිදුවන සමාජානුයෝජනය පවත්නා හොඳම කෙටිකාල පරිච්ඡේද ශිල්ප ක්‍රමය වන අතර එය නවීකරණයේදී ඉතා තීරණාත්මකය (Agrawal, 1989 : 200). එහිදී සමකාලීන සමාජය තුළ සමාජානුයෝජනකාරකයක් වශයෙන් ජනමාධ්‍යයේ ක්‍රියාකාරිත්වය කෙබඳුදැයි හඳුනා ගැනීම බෙහෙවින් වැදගත් වේ.

20 වන සියවසේ ගොඩනැඟුණ සුබසාධක රාජ්‍ය ධනවාදයේ මහජන මතය සෑම විටම දේශපාලනික, ආර්ථික සහ මාධ්‍ය ප්‍රභූන්ගේ පාලනයට ලක් වන්නකි. ඒ අනුව ජනමාධ්‍ය දේශපාලන හස්තයේ සහ ලිබරල් ධනවාදයේ රීතීවලින් පාලනය වන රාජ්‍ය පාලනය සඳහා පවතින සංවිධිත ජාලයක් වශයෙන් වර්ධනය විය. ජනමාධ්‍ය රාජ්‍ය පාලන විධික්‍රමයක් වශයෙන් ගොඩනැඟීම සමඟ මෙතෙක් රාජ්‍ය සහ සිවිල් සමාජය අතර වෙනස මකා දමමින් රාජ්‍යය පෞද්ගලික අවකාශය හා දෛනික ජීවිතය තුළ වඩාත් මූලික භූමිකාවක් රඟ දක්වන්නට පටන් ගත්තේය. බූර්ෂුවා මහජන අවකාශය බිඳ වැටීමත් සමඟම පුරවැසියෝ මාධ්‍ය පධීත පාරිභෝගිකයින්ගේ තත්ත්වයට ඇද වැටුණහ (Habermas, 1964 : 54). ඒ අනුව වර්තමාන මහජන අවකාශයේ ප්‍රජාතන්ත්‍රවාදී කතිකාවේ පුද්ගල දේශපාලන සහභාගීත්වය ඇති කිරීමේ ප්‍රබල මෙවලමක් වශයෙන් ජනමාධ්‍ය පෙන්වා දිය හැකි බව මෙමඟින් හඳුනාගත හැකිය.

**සොයා ගැනීම් සහ සාකච්ඡාව**

සමකාලීන ශ්‍රී ලාංකික සමාජයෙහි ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ කතිකාවේදී, ජර්මන් ජාතික චින්තකයෙකු වන ජුර්ගන් හබමාස් විසින් මහජන අවකාශය පිළිබඳ ඉදිරිපත් කළ අදහස බොහෝ දුරට උපයුක්ත කරගත හැකි වූවකි. නව මාක්ස්වාදී චින්තකයෙකු වශයෙන් හඳුනාගත හැකි හබමාස් විසින් මාධ්‍ය සහ ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් සිදු කළ විග්‍රහයන් පසුකාලීනව සමාජවිද්‍යාව, දේශපාලනවිද්‍යාව, දර්ශනය සහ ජනමාධ්‍ය අධ්‍යයන යන විෂය ක්ෂේත්‍ර තුළ බහුලව සාකච්ඡාවට ලක් වන න්‍යායාත්මක රාමුවක් නිර්මාණය කර තිබේ. විශේෂයෙන්ම පශ්චාත් නූතන සමාජය විශ්ලේෂණය කිරීමේදී, නිදහස් ප්‍රජාතන්ත්‍රවාදය, ජනමාධ්‍යයේ නිදහස, සිවිල් සමාජය සහ පුද්ගල දේශපාලන සහභාගීත්වය පිළිබඳ කතිකාවලදී මහජන අවකාශය පිළිබඳ හබමාස්ගේ න්‍යාය බහුල වශයෙන් සමාජවිද්‍යාඥයින්ගේ අවධානයට ලක් වේ. හබමාස් තම විග්‍රහයේදී මූලික වශයෙන් අවධානය යොමුකර තිබෙන්නේ 19 සහ 20 වන සියවසේ තදින් ව්‍යාප්ත වන ලිබරල් ධනවාදී වෙළෙඳ පොළ ක්‍රමයෙන් ගොඩනැගෙන නව සමාජ සංස්ථා පිළිබඳව නව අර්ථකථනයක් ඉදිරිපත් කිරීම සඳහා වේ. එහිදී ලිබරල් ධනවාදයේ බලපෑම නිසා ගොඩනැගෙන නූතන පරිභෝජනවාදී සමාජයේ සියලුම සමාජ ඒකක ලාභය පසුපස හඹා යෑම කෙරෙහි හබමාස් තම අවධානය යොමුකර තිබේ. ඒ අනුව පරිභෝජනවාදයේ නව ආචාරධර්ම ඔස්සේ සියලුම සමාජ ඒකක පරිවර්තන යුගයක් කරා එළඹ සිටින ආකාරය හබමාස් තම විග්‍රහයට නතු කරගෙන තිබේ. එම තත්ත්වය කේන්ද්‍ර කරගෙන පශ්චාත් නූතනවාදී සමාජ ගතික වටහා ගැනීම සඳහා නිර්මාණය කළ විවේචනාත්මක න්‍යායයක් වශයෙන් හබමාස්ගේ මහජන අවකාශය පිළිබඳ න්‍යාය පෙන්වා දිය හැකිය. මෙහිදී හබමාස් විසින් මාක්ස්වාදී සමාජ න්‍යාය පදනම් කර ගනිමින්, තාක්ෂණය විසින් වෙළාගන්නා ලද බහුවිධ නිෂ්පාදන මාදිලි විසින් හසුරවනු ලබන සමාජ ක්‍රමය විවේචනාත්මක විග්‍රහයකට ලක් කර තිබේ. ඒ අනුව, සමකාලීන ශ්‍රී ලාංකික සමාජයේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ කතිකාවේදී ජනමාධ්‍යයේ භූමිකාව කුමක්ද යන්න පිළිබඳවත්, වර්තමාන සමාජ වෙනස්කම් සමඟ මෙම මහජන අවකාශය වෙනස්වීමට ලක්ව ඇති ආකාරයත් පිළිබඳ න්‍යායාත්මක විශ්ලේෂණයක් සැපයීමට මෙහිදී මූලික වශයෙන් උත්සාහ කර තිබේ.

හබමාස් විසින් 1962 දී රචනා කරන ලද The Structural Transformation of the Public Sphere : An Inquiry into a Category of Bourgeois Society නම් කෘතියෙහි මහජන අවකාශය පිළිබඳ න්‍යායාත්මක අදහස් අන්තර්ගත වේ. දේශපාලනික සහභාගීත්වය වනාහි ප්‍රජාතාන්ත්‍රික සමාජයක හරය වේ. එමෙන්ම පුද්ගල ස්වයං වර්ධනයේ අත්‍යවශ්‍ය අංගයක්ද වේ යන මතවාද සමඟ හබමාස් විසින් ප්‍රජාතන්ත්‍රවාදය වෙත දැක්වූ දැඩි අවධානය මෙම කෘතියේ විශ්ලේෂණය හා බැඳී පවතී. හබමාස් තම අධ්‍යයනය මගින් මහජන අවකාශයේ නැගීම ප්‍රධාන අවස්ථා දෙකක් ඔස්සේ සාකච්ඡා කර තිබේ.

- ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයේ ඓතිහාසික අවධියේදී (16, 17, 18 වන සියවස්) දැකිය හැකිවූ රදළ මහජන අවකාශය
- 19 වන සියවසේ කාර්මික විප්ලවයෙන් පසු නිර්මාණය වූ මාධ්‍යයේ සහ ධනවාදී ප්‍රභූන්ගේ පාලනයට ලක්වූ නූතන සමාජයේ මහජන අවකාශයේ වර්ධනය (හඳරාගම සහ රත්නායක, 2014 : 214-215).

ඉහත කෘතිය මගින් හබමාස් උත්සාහ ගෙන ඇත්තේ බූර්ෂුවා හෙවත් රදළ මහජන අවකාශයක සිට රාජ්‍ය ධනවාදය සහ පරිභෝජන ක්‍රමය විසින් හසුරුවනු ලබන වර්තමාන මහජන අවකාශයක් දක්වා මහජන අවකාශයේ සිදු වූ ව්‍යුහාත්මක වෙනස්වීම් පිළිබඳව විස්තරයක් ඉදිරිපත් කිරීම සඳහාය. ඒ අනුව මෙම සාකච්ඡාව ඔස්සේ උත්සාහ දරා ඇත්තේ, මෙම ව්‍යුහාත්මක පරිවර්තනය පිළිබඳව හබමාස් දැක්වූ අදහස් හා එම න්‍යායාත්මක අදහස් මත පදනම්ව නූතන සන්නිවේදන මාධ්‍යවල වර්ධනයත් සමඟ මහජන අවකාශයේ

සිදුව ඇති නව පරිවර්තන පිළිබඳවත්, එම පරිවර්තන නූතන ශ්‍රී ලාංකේය රාජ්‍යයේ ප්‍රජාතන්ත්‍රවාදයේ යහපැවැත්මට කොතෙක් දුරට දායකවන්නේද යන්නත් පිළිබඳවය.

මෙහිදී හබමාස් තම අධ්‍යයනය ඔස්සේ දක්වන ලද ආකාරයට මහජන අවකාශයේ නැගීම ප්‍රධාන අවධීන් දෙකක් ඔස්සේවිග්‍රහ කළ හැකි අතර, එහි පළමු අවධිය රදළ මහජන අවකාශය වශයෙන් ඔහු පෙන්වා දී තිබේ. මෙහිදී හබමාස් තම විග්‍රහය මගින් පෙන්නුම් කරන්නේ ඉතිහාසයේ සෑම වකවානුවකදීම සමාජයේ එක්තරා පන්තියක් විසින් මහජන අවකාශය පාලනය කරනු ලබන බවයි. එනම් බූර්ෂුවා හෙවත් පාලක පාන්තිකයින් විසිනි. ඓතිහාසිකව මහජන අවකාශය සකස් වූ සෑම වකවානුවකදීම මෙකී පාලක පන්තියේ බලාධිකාරය ඒ තුළ ක්‍රියාත්මක වී තිබේ. මෙහිදී යුරෝපයේ බුද්ධි ප්‍රබෝධ යුගයේ සිදු වූ සමාජ විපර්යාස ඇසුරින් හබමාස් තම රදළ මහජන අවකාශය පිළිබඳ අදහස් දක්වා තිබේ.

යුරෝපයේ බුද්ධි ප්‍රබෝධ යුගයේ සිදු වූ කාර්මික විප්ලවය සහ විද්‍යාත්මක ගවේෂණවල බලපෑමෙන් වර්ධනය වූ මුද්‍රණ ශිල්පය සහ පුවත්පත් කලාව හේතුවෙන් අවශ්‍යය තොරතුරු නිදහසේ සම්ප්‍රේෂණය විය. මේ නිසාම විවිධ ක්ෂේත්‍ර පදනම් කර ගෙන සාහිත්‍ය නිර්මාණ බිහි වූ අතර ඒ මගින් යුරෝපා සමාජයේ සාක්ෂරතාව වේගයෙන් වර්ධනය විය. මෙම සාක්ෂරතාව හේතුවෙන් බුද්ධිමතුන්, සමාජ විචාරකයින් සහ විවිධ මට්ටම්වල දැනුම පදනම් කරගත් බුර්ෂුවා පන්තියක් නිර්මාණය විය. එම බුර්ෂුවා පන්තිය මහජන අවකාශයේ මහජන මත සකස් කිරීමේදී මූලිකත්වය ගන්නා ලදි. මහජන මතය නිර්මාණය කිරීමේ බලය බුර්ෂුවා පන්තිය සතුව පැවති අතර ඔවුන් නිර්මාණය කළ මහජන මතය පුවත්පත් හරහා වේගයෙන් සමාජයේ ව්‍යාප්ත විය (Habermas, 1964:54). හබමාස් විග්‍රහ කරන ආකාරයට මතු වූ මහජන අවකාශය 18 වන සියවසේ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයේ යහපැවැත්මට මහෝපකාරී වී තිබේ. ඒ සඳහා ප්‍රමුඛ හේතුව වන්නේ රාජ්‍යයේ දේශපාලනික ක්‍රියාවලිය සම්බන්ධයෙන් සංවාද, සාකච්ඡා හා විවේචන ගොඩනගන මෙන්ම මහජන අවශ්‍යතා රාජ්‍ය යන්ත්‍රණය වෙත යොමු කරන අවකාශය වශයෙන් මහජන අවකාශය ක්‍රියාත්මක වීමයි.

ශ්‍රී ලාංකික දේශපාලන ඉතිහාසය අධ්‍යයනය කිරීමේදී හබමාස් මහජන අවකාශය පිළිබඳව දක්වන අදහස් තහවුරු කෙරෙන අවස්ථා රාශියක් හඳුනාගත හැකිය. මන්දයත් ශ්‍රී ලාංකික දේශපාලන ක්ෂේත්‍රයේ විවිධ විපර්යාස සඳහා මෙන්ම, පාලක පක්ෂවල බලය අහිමිවීම, බලය රහිත පිරිස් බලයට පත්කිරීම ආදී සියල්ල සඳහා මෙම මහජන අවකාශය ප්‍රබල ලෙෂ බලපෑම් කර තිබෙන ආකාරයක් දක්නට ලැබෙන බැවිනි. ඒ සඳහා උදාහරණ රාශියක් ශ්‍රී ලාංකේය දේශපාලන ක්ෂේත්‍රය තුළින් පෙන්වා දිය හැකිය.

ශ්‍රී ලාංකික දේශපාලන ක්ෂේත්‍රයේ සිදු වීම් අධ්‍යයනය කිරීමේදී මහජන අවකාශය ක්‍රියාත්මක වන ආකාරය මෙන්ම පාලක පන්තිය විසින් එම මහජන අවකාශය පාලනය කරන ආකාරයද හඳුනා ගත හැකිය. ශ්‍රී ලාංකික සමාජයේ මැතිවරණ ක්‍රියාවලිය තුළ සිදුවීම් කිහිපයක් මේ සඳහා උදාහරණ වශයෙන් පෙන්වා දිය හැකිය. මෙරටට සර්වජන ඡන්ද බලය 1928 ඩොනමෝර් කොමිසමේ නිර්දේශ මත 1931 දී හිමිවීමත් සමඟ ශ්‍රී ලාංකීය බෞද්ධ භික්ෂුවගේ දේශපාලන සබඳතා ක්‍රමයෙන් වර්ධනය වීම හරහා මහජන අවකාශය වෙත සිදුකළ බලපෑම මේ සඳහා සුදුසුම උදාහරණයක් වශයෙන් පෙන්වා දිය හැකිය. මෙම අවධියේ පැවති රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණයන්ට භික්ෂුව ඉදිරිපත් නොවුවද, ඔවුන් වක්‍රාකාරයෙන් මැතිවරණ දේශපාලනය හා සම්බන්ධ වී තිබෙන ආකාරය දක්නට ලැබේ. 1931 රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණ කාල සීමාවේ බෞද්ධ භික්ෂූන් වක්‍රාකාරයෙන් මැතිවරණ දේශපාලනය හා සම්බන්ධ වී තිබේ. 1931 රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණයට ඉදිරිපත් වූ බොහෝ අපේක්ෂකයින් ඉංග්‍රීසි සංස්කෘතිය තුළ හැදී වැඩුණු, ඉංග්‍රීසි කථා කරන පොදුජනයාගෙන් දුරස්ථ වූ ප්‍රභූ පිරිසක් වූහ. නමුත් මොවුන් බලයට පත් වීම සඳහා බහුතර සාමාන්‍ය ජනතාවගේ ඡන්දය ලබා ගැනීම අත්‍යවශ්‍ය කරුණක් විය. එම කාර්යයේදී ඔවුන් සාමාන්‍ය ජනතාවට ළඟාවීම සඳහා අතරමැදියෙකු ලෙස භික්ෂුව භාවිත කරන ලදි. මෙහිදී ප්‍රදේශයේ විහාරස්ථානයේ භික්ෂුවට තිබූ

ගෞරවය මත, භික්ෂුව සමග සබඳතා පැවැත්වූ ප්‍රභූ අපේක්ෂකයන්ට ජනතාව සිය ඡන්දය ලබාදෙන ලදි (අයිවන්, 2007). මහජන අවකාශය පිළිබඳ තම විග්‍රහයේ හබමාස් පෙන්වා දෙන පරිදි බූර්ෂ්වා පන්තිය විසින් තම අදහස් මහජනතාව අතර පැතිරවීමටත්, මහජන මතය බූර්ෂුවා පන්තියට අවශ්‍ය ලෙස නිර්මාණය කිරීමටත්, මහජන අවකාශය උපයෝගී කරගෙන තිබෙන ආකාරය මෙම උදාහරණය තුළ පැහැදිලිවම හඳුනා ගත හැකිය.

එමෙන්ම ශ්‍රී ලාංකික දේශපාලන ක්ෂේත්‍රය අධ්‍යයනය කිරීමේදී භික්ෂු දේශපාලනය ලාංකික මහජන අවකාශයට බලපෑම් කළ අවස්ථා රාශියක් හඳුනාගත හැකිය. ලාංකික සමාජයෙහි භික්ෂු දේශපාලනයේ ස්වරූපය සමාජ ගතික සමගින් විවිධාකාර වෙනස්කම්වලට ලක් වූ අතර, එය කාලීන සමාජ අවශ්‍යතා පදනම් කරගනිමින් සමාජ ගැටලු සඳහා විසඳුමක් ලෙස සාර්ව තමයේ තම බලාධිකාරය පතුරුවන ආකාරයක් වර්තමානය වන විට දක්නට ලැබේ. නමුත් භික්ෂු දේශපාලනය තුළින් මහජන අවකාශය හරහා පතුරවන මෙම බලාධිකාරය ඇතැම් අවස්ථාවලදී සාර්ව තලයේ දේශපාලනයේ ගැටලු රූසකට මඟ පාදන්නක් වී තිබෙන බව භික්ෂු දේශපාලනයේ විකාසනය අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වෙයි. ඉහත සාකච්ඡා කළ පරිදි මේ සඳහා අවශ්‍ය පදනම සපයන ලද්දේ යටත්විජිත යුගය සහ පශ්චාත්යටත්විජිත යුගයේ ශ්‍රී ලාංකීය මහජන අවකාශය තුළ වර්ධනය වූ ජනවාර්ගිකත්වය මත පදනම් වූ ආකල්ප බව පැවසීම සාධාරණය.

යටත්විජිත යුගයේ බ්‍රිතාන්‍යයන් ගෙන ගිය බෙදා පාලනය කිරීමේ ප්‍රතිපත්තියේ මූලික අරමුණ වූයේ තමන්ට එරෙහිව ශ්‍රී ලාංකිකයින් නැඟී සිටීම වැළැක්වීම සඳහා පියවර ගැනීමයි. එනම් ආගමික සහ ජනවාර්ගික කණ්ඩායම් අතර අවිශ්වාසය වර්ධනය කිරීමේ අරමුණින් බ්‍රිතාන්‍යයන් විසින් එක් කණ්ඩායමකට නොමැති විශේෂ වරප්‍රසාද තවත් කණ්ඩායමකට ලබාදෙන ලදි. ඒ අනුව 1833 සිට 1947 දක්වා හඳුන්වාදෙන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ඔස්සේ සුළු ජාතීන්ට සුළු ජාතිකත්වය පිළිබඳ හැඟීම්ද මහජාතියට මහජාතිකත්වය පිළිබඳ හැඟීමද වර්ධනය වන ආකාරයට ප්‍රතිසංස්කරණ ඇති කරවමින් මහජන අවකාශයේ පෙරළියක් ඇති කරන ලදි. මෙම පෙරළිය හරහා ප්‍රජාතන්ත්‍රවාදය යනු බහුතරයේ මතය බවට පත් කරමින් සුළුතරය පීඩනයට ලක්කිරීමට මහජන අවකාශය උපයෝගී කරගෙන තිබෙන ආකාරයක් පැහැදිලිවම දක්නට ලැබේ. එහිදී හබමාස් පෙන්වා දෙන පරිදි මහජන අවකාශයේ තම මතවාද පැතිරවීමට පාලක පන්තිය ක්‍රියාත්මක වී ඇති ආකාරය පැහැදිලිවම හඳුනාගත හැකිය. ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඔස්සේ සුළු ජාතික රැකවරණය සඳහා බව ඍජුවම පෙන්වා දෙමින් යම් යම් ක්‍රියාමාර්ග හඳුන්වා දීමේ ප්‍රවණතාවක් වර්ධනය වී ඇති අතර, ඒවා හරහා මහජාතිය වන සිංහල බෞද්ධයින් තුළ අනෙකුත් සුළු ජන කණ්ඩායම් කෙරෙහි අවිශ්වාසයක් වර්ධනය කළ අතර අනෙක් අතට සුළු ජාතික කණ්ඩායම් තුළ මහජාතික සමාජ ප්‍රවාහයෙන් ආරක්ෂා විය යුතු යැයි හැඟීමක් ජනිත කරවන ලදි. මෙම සුළු ජාතික හැඟීම තව තවත් වර්ධනය කරවමින් යටත්විජිත නායකත්වය විසින් දේශීය සිංහල බෞද්ධ නායකත්වය වෙතට සමාජ, ආර්ථික, දේශපාලනික බලතල පැවරීම මහජාතිය කෙරෙහි සුළු ජාතික අවිශ්වාසය තවදුරටත් ස්ථාපිත කරන ලදි. මේ ආකාරයට ජනවාර්ගික කණ්ඩායම් අතර අවිශ්වාසය වර්ධනය වීම නිසා ශ්‍රී ලාංකික ප්‍රජාව වශයෙන් ඒකාබද්ධව අධිරාජ්‍යවාදී පාලනයට එරෙහිව නැඟී සිටි බෞද්ධ, හින්දු සහ ඉස්ලාම් නායකත්වය පසුකාලීනව ආගම, භාෂාව වැනි පටු සාධක තම දේශපාලන අරමුණු බවට පත්කර ගනිමින් ඔවුනොවුන් අතර බල අරගලයක නිරත වීම ආරම්භ වීම සඳහාද මහජන අවකාශය තුළ ඇති වූ විවිධ කතිකා මූලික වී තිබෙන බවට ලාංකික දේශපාලන ඉතිහාසය සාක්ෂි දරයි. තම දේශපාලන අභිලාෂ ඉටු කර ගැනීම සඳහා ජනවාර්ගික කණ්ඩායම් ගෙන ගිය ක්‍රියාකලාපය පසුකාලීනව සිංහල බෞද්ධ භික්ෂුව දේශපාලන වේදිකාව වෙත ගෙන ඒම දක්වාම වර්ධනය විය.

භික්ෂු දේශපාලනය ලාංකික මහජන අවකාශයේ මහත් ආන්දෝලනයට තුඩුදුන් අවස්ථාවක් ලෙස, 1946 ජනවාරි මාසයේ පැවති දේශපාලන රැස්වීම්වලදී ඩී. එස්. සේනානායක මහතා විසින් භික්ෂූන්

වහන්සේලා දේශපාලනයේ නිරත වීම විවේචනය කිරීමට එරෙහිව ප්‍රසිද්ධියේ පිළිතුරු ලබා දෙමින් වල්පොළ රාහුල හිමියන් විසින් සිදු කරන ලද පහත ප්‍රකාශය පෙන්වා දිය හැකිය.

> *"භික්ෂු සංඝයා කැමති නම්, ඛුද්ධානුඛුද්ධක විනය ශික්ෂා පද වෙනස් කර ගැනීමට බුදුරජාණන් වහන්සේගෙන් අවසර ලැබී තිබේ. එසේ නමුත් මේ දක්වා කිසිදු අවස්ථාවක ථෙරවාදී භික්ෂූන් විසින් විනය ශික්ෂාපද වෙනස් කළ බවක්, ඉතිහාසයෙන් ඔප්පු නොවේ. නමුත් බුද්ධකාලයෙහි පැවති ආර්ථික, සාමාජික සහ දේශපාලන තත්ත්වයට වඩා අද තත්ත්වය වෙනස් වී තිබෙන බවත්, එහෙයින් එකල පැවති භික්ෂු ජීවිතයට වඩා අද භික්ෂු ජීවිතය වෙනස් වී තිබෙන බවත් පිළිගත යුතුය. අධ්‍යාපන, සමාජයීය, අමද්‍යප කටයුතු සහ සහනදායක කටයුතුවලට මූලිකවම සම්බන්ධ වෙමින් අදත් භික්ෂූන් වහන්සේ දැන හෝ නොදැන දේශපාලන කටයුතුවල යෙදී සිටිති. භික්ෂූන් දේශපාලන කටයුතුවල යෙදීම වරදකැයි අපි නොපිළිගනිමු" (අයිවන්, 2007: 178-179).*

අතීතයේ විවිධාකාර ලෙෂ භික්ෂුව දේශපාලනයට සම්බන්ධ වුවත් රාහුල හිමියන්ගේ ඉහත ප්‍රකාශය ඇතුළත් විද්‍යාලංකාර ප්‍රකාශනයට පෙර කිසිදු ප්‍රකාශනයකින් භික්ෂුව දේශපාලනයේ නිරත වීම පිළිගත්තේ හෝ සාධාරණීකරණය කළේ නැත. මේ නිසාම මෙම ප්‍රකාශය ශ්‍රී ලාංකේය මහජන අවකාශය තුළ මහත් ආන්දෝලනයක් ඇති කළ අතර, මෙම ප්‍රකාශය මෙන්ම එය සම්මත කර ගැනීමට මුල් වූ දේශපාලන භික්ෂූන්ද, මහනායක හිමිවරු ඇතුළු භික්ෂූන් රැසකගේද, එකල පුවත්පත් සහ දේශපාලනඥයින් අතින්ද දැඩි විවේචනයට ලක් වී තිබේ. මේ අනුව ශ්‍රී ලාංකේය මහජන අවකාශය තුළ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ කතිකාවේදී, එකල පැවති ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් පුවත්පත්වල කාර්යභාරය හරහා ජනමාධ්‍යයේ භූමිකාව මැනවින් හඳුනා ගත හැකිය.

ශ්‍රී ලාංකික දේශපාලන ක්ෂේත්‍රයේ ඉතිහාසය තුළ ඇති වූ විපර්යාසය අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වන කරුණක් වන්නේ මෙම දේශපාලන ක්‍රියාකාරකම් මහජන අවකාශය වෙත ඍජුවම බලපෑම් කර තිබෙන අතර, මහජන අවකාශය තුළින්ද එම දේශපාලන ක්‍රියාකාරකම් සඳහා ධනාත්මක මෙන්ම ඍණාත්මක බලපෑම්ද එල්ල වී ඇති බවයි. තවදුරටත් මෙම තත්ත්වය විශ්ලේෂණය කිරීමේදී හබමාස් දක්වන අදහස් නැවතත් විමසා බැලීම බෙහෙවින් වැදගත් වේ. මෙහිදී හබමාස් බුද්ධි ප්‍රබෝධය සහ ඇමරිකානු හා ප්‍රංශ විප්ලව සමයේ උපත ලද ලිබරල් මහජන අවකාශයක සිට නූතන යුගයේ දැකිය හැකි (සුබසාධක රාජ්‍ය ධනවාදය) මාධ්‍යවල ආධිපත්‍යයට ලක් වූ මහජන අවකාශයක් වෙතට සිදු වූ සංක්‍රාන්තිය විස්තර කර තිබේ. සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් සහ සුබසාධක රාජ්‍යයක් වශයෙන් ගත් කල ශ්‍රී ලංකාවේ පවතින සමකාලීන මහජන අවකාශයද හබමාස් පෙන්වා දෙන පරිදි මාධ්‍යයේ ආධිපත්‍යයට නතු වී ඇති ආකාරය පැහැදිලිවම හඳුනාගත හැකිය.

ශ්‍රී ලාංකික දේශපාලන ක්ෂේත්‍රය සහ සුබසාධන සේවා පිළිබඳව අවධානය යොමු කිරීමේදී වඩාත් වැදගත් අවධිය ලෙස යටත්විජිත පාලනයෙන් නිදහස් වූ අවධිය පෙන්වා දිය හැකිය. එනම් නිදහසින් පසුව ශ්‍රී ලාංකේය දේශපාලන බලය හිමිකරගත් සෑම දේශපාලන පක්ෂයක්ම සුබසාධනය කෙරෙහි අවධානය යොමු කර ඇති ආකාරය හඳුනාගත හැකිය. නමුත් 1977 විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීමත් සමඟ යම්යම් ප්‍රතිසංස්කරණ ගණනාවක් ක්‍රියාත්මක වීම ලාංකේය සුබසාධකවාදය නව මාවතකට ප්‍රවිෂ්ට වීමට අවශ්‍ය සාධක සපයන ලදි. පෞද්ගලීකරණය මුල් කරගත් ගෝලීය ප්‍රවණතා දේශීය සමාජ ව්‍යුහය තුළට අභ්‍යන්තරීකරණය වීමේ අවසන් ප්‍රතිඵලය වූයේ රාජ්‍ය අංශයට සමගාමී පෞද්ගලික අංශයක්ද රටෙහි වර්ධනය වීමයි. ඒ හරහා නිර්මාණය වූ පෞද්ගලික මාධ්‍ය මෙන්ම රාජ්‍ය මාධ්‍යයද තත්කාලීන ශ්‍රී ලාංකීය මහජන අවකාශය වෙත ප්‍රබල ලෙෂ බලපෑම් එල්ල කරන ආකාරයක් පැහැදිලිවම හඳුනාගත හැකිය.

19 වන සියවසේ ධනවාදයේ වර්ධනයත් සමඟ ලිබරල් මහජන අවකාශයක සිට වර්තමානයේ දැකිය හැකි මාධ්‍යවල ආධිපත්‍යයට නතු වූ මහජන අවකාශයක් බවට මහජන අවකාශය පරිවර්තනය වී තිබේ. 20 වන සියවසේ වර්ධනය වූ පරිභෝජන ධනවාදයේ ප්‍රධාන රැගුම්කරුවන් ලෙෂ රූපවාහිනිය ප්‍රමුඛ මාධ්‍ය පෙන්වා දියහැකිය. පරිභෝජනවාදය තුළ අලෙවි කළ නොහැකි කිසිවක් නොමැති අතර, භාණ්ඩවලට අවශ්‍ය වෙළෙඳපොළ වටිනාකම ලබා දෙමින් අවශ්‍ය මෙන්ම අනවශ්‍ය සියල්ලක්ම පාරිභෝගිකයින් අතට පත් කිරීමේ වෙළෙඳ ප්‍රචාරණයේ යෙදීම රූපවාහිනිය ප්‍රමුඛ වත්මන් මාධ්‍යයේ ප්‍රධානතම කාර්යය බවට පත්ව ඇත. අද වන විට දැවැන්ත සමාගම්වල ග්‍රහණයට නතුව ඇත මහජන අවකාශය පරිභෝජනයට හා නිෂ්ක්‍රියත්වයට සීමා වූ අවකාශයක් බවට පත්ව තිබේ. පුරවැසියා තවදුරටත් මහජන අවකාශයේ හවුල්කරුවෙකුට වඩා පරිභෝජන අවකාශයේ මාධ්‍ය පයිත පරිභෝජනය කරන්නෙක් පමණි (Adorno & Bernstein,1993). ක්‍රමයෙන් වර්ධනය වන ගෝලීය පරිභෝජනවාදී සමාජයේ සන්නිවේදන මාධ්‍යයන්ගේ ප්‍රධානම භූමිකාව වී ඇත්තේ සිය ලාභ අපේක්ෂා සපුරා ගැනීම වෙනුවෙන් පාලක පන්තියේ උවමනා වෙනුවෙන් පෙනී සිටීමයි. සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාවේ පවතින බහුමාධ්‍ය ක්‍රමය හරහා පරිභෝජන ධනවාදය මෙරට මහජන අවකාශයේ ස්ථාපිත කිරීමට දරන උත්සාහයන් අතිශයින්ම සාර්ථක වෙමින් පවතින බව දක්නට ලැබේ. රාජ්‍ය මාධ්‍ය ඍජුවම මෙම ක්‍රියාවලියට දායක වන අතර, පෞද්ගලික අංශයේ මාධ්‍යද සිය ලාභ අපේක්ෂා තෘප්ත කර ගැනීම වෙනුවෙන් වක්‍ර ආකාරයට පරිභෝජනවාදී සමාජයට අවශ්‍ය මතවාදී දායකත්වය ලබා දෙන බව පැහැදිලිවම පෙන්වා දිය හැකිය. ඒ අනුව ගෝලීය වශයෙන් පවතින විවිධ විෂමතා අභිබවා සියලුම දෙනා සුව පහසු ජීවිත අපේක්ෂා වෙනුවෙන් පරිභෝජනවාදී වෙළෙඳපොළ කොටස්කරුවන් බවට පත් කිරීම වර්තමාන ශ්‍රී ලාංකීය ජනමාධ්‍යයේ ප්‍රධානතම කාර්යභාරය බවට පත්ව ඇති බව පැහැදිලිවම හඳුනාගත හැකිය.

ඉහත දක්වන ලද අදහස්වලට අනුව පෙන්වා දිය හැක්කේ, ශ්‍රී ලාංකික සමාජයේ පවතින ජනවාර්ගිකත්වය, කුලය, සමාජ පන්තිය යනාදී සමාජ ස්තරායන ලක්ෂණ ක්‍රමක්‍රමයෙන් යටපත් වෙමින් සියලුම සමාජ ස්තර ධනවාදී නිෂ්පාදන හා පරිභෝජන ක්‍රමයට අන්තර්ග්‍රහණය වෙමින් පවතින බවයි. ඒ අනුව ලාංකීය ජනමාධ්‍ය, ප්‍රජාතන්ත්‍රවාදය සහ සහභාගිත්ව දේශපාලනය යථාර්ථයක් කිරීමට අවශ්‍ය මහජන අවකාශයක් නිර්මාණය කිරීමේ භූමිකාවෙන් ක්‍රමක්‍රමයෙන් ඉවත් වෙමින් පාලක පන්තියේ දෘෂ්ටි සාධනය වෙනුවෙන් පමණක් පෙනී සිටින තත්ත්වයට පත්ව ඇති බව හඳුනාගත හැකිය. එහිදී සිවිල් සමාජයේ උවමනා රාජ්‍ය වෙත සන්නිවේදනය කිරීම සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියට මහජනතාව සහභාගී කරවීම යන මහජන අවකාශයේ මූලික කාර්යභාරය ඉන් ඉවත් වෙමින් පවතී. ඒ වෙනුවට වෙළෙඳපොළ බලවේග විසින් ලාංකීය මහජන අවකාශය අතික්‍රමණය කර ඇති අතර, මෙවැනි තත්ත්වයක් තුළ ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලනය යථාර්ථවත් කිරීම අතිශයින්ම අසීරු කාර්යයක් බව සනාථ වේ.

**නිගමනය**

ගෝලීයකරණය හා සන්නිවේදන තාක්ෂණයේ වර්ධනයත් සමඟ නූතන සමාජ මහජන අවකාශය ව්‍යුහාත්මකව නව මුහුණුවරකට පරිවර්තනය වී තිබේ. එම නිසාම 20 වන සියවසේ නූතන මහජන අවකාශය නිර්මාණය වීමේදී විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය විසින් ඉටු කරනු ලද කාර්යභාරයට සමගාමීව අන්තර්ජාලය පදනම් කරගත් සමාජ මාධ්‍ය කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කරන බව අවිවාදයෙන්ම පිළිගත හැකි සත්‍යයකි. මෙම සමාජ මාධ්‍ය හුදු තොරතුරු සන්නිවේදනය පමණක් නොව දේශපාලන මතවාද ව්‍යාප්ත කිරීමේ ප්‍රබල මාධ්‍යයක් වශයෙන් ශ්‍රී ලාංකික සමාජයේ පමණක් නොව සමස්ත ලෝකය පුරාම තම බලාධිපත්‍ය පතුරුවා තිබේ.

Herbert Marcuse (1991), One Dimensional Man: Studies in the Ideology of Advanced Industrial Society කෘතියෙන් පෙන්වා දෙන පරිදි පවත්නා කාර්මික ධනවාදී නිෂ්පාදන හා පරිභෝජන ක්‍රමයට සියලු සමාජ ස්තර ගතිකත්වයන් ඉවත දමා අන්තර්ග්‍රහණය වන බවත් මෙම කාර්යය පිටුපස සිටින්නේ මාධ්‍ය බවත් මේ අනුව පැහැදිලි වේ. Marcuse ට අනුව නූතන පරිභෝජන සමාජ ක්‍රමය විසින් නිර්මාණය කරන්නේ ඒකමානීය මිනිසෙකි. එම තත්ත්වය ශ්‍රී ලාංකේය සමාජයට ආදේශ කර බැලීමේදී ඒ බව මැනැවින් තහවුරු වේ. එනම් මාධ්‍ය හරහා පෙන්වා දෙන පරිභෝජන රටාවලට දැඩිව නැඹුරු වූ දේශපාලන සවිඥාණිකත්වය රහිත පුද්ගල පිරිස් තත්කාලීන ශ්‍රී ලාංකේය මහජන අවකාශය හසුරුවන බව පැහැදිලිවම හඳුනාගත හැකිය. මෙහිදී ශ්‍රී ලංකාවේ මාධ්‍ය විසින් පාලක පන්තියේ දෘෂ්ටිවාද බෙදා හැරීම වෙනුවෙන් පෙනී සිටින බව තහවුරු වේ. ඒ අනුව තත්කාලීන ලාංකීය මාධ්‍ය ක්ෂේත්‍රය, ප්‍රජාතන්ත්‍රවාදය සහ සහභාගීත්ව දේශපාලනය යථාර්ථයක් කිරීමට අවශ්‍යය මහජන අවකාශයක් නිර්මාණය කිරීමේ භූමිකාවෙන් ඉවත් වී ඇති ආකාරයක් හඳුනා ගත හැකිය.

සමකාලීන අධිතාක්ෂණික බලපෑම තුළ ශ්‍රී ලාංකික මහජන අවකාශය විශාල වශයෙන් ව්‍යුහාත්මක පරිවර්තනයකට ලක්ව තිබෙන ආකාරයක් හඳුනාගත හැකිය. ගෝලීයකරණය සහ සන්නිවේදන තාක්ෂණයේ වර්ධනයත් සමඟ මහජන අවකාශය සුවිශාල පෙරළියකට ලක්ව තිබෙන අතර එය නව මුහුණුවරකටද පරිවර්තනය වී තිබේ. නූතන මහජන අවකාශය නිර්මාණය වීමේදී විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මෙන්ම අන්තර්ජාලය පදනම් කරගත් සමාජ මාධ්‍යයද කැපී පෙනෙන කාර්යයක් ඉටු කරනු ලබයි. අන්තර්ජාලයේ නැගීම විසින් ප්‍රජාතන්ත්‍රවාදය සහ සහභාගීත්වය ව්‍යාප්ත කරමින් දේශපාලන මැදිහත්වීම සඳහා නව මහජන අවකාශයක් නිර්මාණය කර තිබේ. මෙහිදී පරිගණක තිරය හරහා නව මහජන අවකාශයක් නිර්මාණය කරමින් තොරතුරු විසරණය කිරීම සිදු වේ. මේ නිසා සමකාලීන මහජන අවකාශයේ පවතින ගතික අධ්‍යයනය කිරීමට හබමාස්ගේ මහජන අවකාශය පිළිබඳ මතවාදය නැවත නිර්වචනය කළ යුතු බව නිගමනය කළ හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


අයිවන්, වික්ටර්. 2007. පන්සලේ විප්ලවය : බෞද්ධ පුනරුදය ගංගොඩවිල සෝම හිමි දක්වා. කොළඹ: රාවය ප්‍රකාශකයෝ.

උයන්ගොඩ, ජයදේව. 2011. ඔක්කොම රජවරු ඔක්කොම වැසියෝ රාජ්‍යය පිළිබඳ දේශපාලන න්‍යාය සහ භාවිතය. කොළඹ: සමාජවිද්‍යාඥයින්ගේ සංගමය.

හඳරාගම, සමන් සහ රත්නායක. සුසන්ත. 2011. *දේශපාලන සමාජවිද්‍යාව II.* බත්තරමුල්ල: සමීර ප්‍රකාශන.

හඳරාගම, සමන්. 2013. *දේශපාලන සමාජ විද්‍යාව I.* බත්තරමුල්ල: සමීර ප්‍රකාශන.

Adorno, T. W. & Bernstein, 1993. *The Cultural Industry: Selected Essays on Mass Culture.* J.M ed. London: Routhdge.

Agarwal, R. C. 1989. Political Theory : Principles of Political Science. New Delhi: S. Chand & Co.Ltd.

Almond, G., 1992. *The Blackwell Encyclopeadia of Political Science.* Vernon Bogdanor ed. Oxford: IJF U.K.

Castells, M., 1996. *The Rise of the Network Society.* Oxford: Blackwell.

Habermas, J., 1964. The Public Sphere. *An Encyclopedia Article,* pp. 49-55.

Habermas, J., 1989. *The Structural Transformation of the Public Sphere: An Inquiry into a category of Bourgeois Society.* Cambridge Massachusetts : The MIT Press.

Huntington, S. P. & Nelson, J. M. 1976. No Easy Choice: Political Participation in Developing Countries. Cambridge : Harvard University Press.

# සමාජ විග්‍රහ

**විමර්ශිත සංග්‍රහය**

**REFEREED JOURNAL**

**පළමු කාණ්ඩය, නවවන වෙළුම - 2022**

**ISSN 2362-0978 (print ISSN)**

**ISSN 2756-925X (e-ISSN)**

ලිපි අංක 04


## විවාහය සහ කුල ක්‍රමය; දික්වැල්ල ප්‍රදේශයේ තෝරා ගත් නෙලුම්වැව ග්‍රාමය ඇසුරෙන් අධ්‍යයනයක්


ඩී.ජී.සී.එච්.යාපා[6]

https://orcid.org/0009-0007-5909-4872



***ප්‍රධාන සංස්කාරක***

ප්‍රේමකුමාර ද සිල්වා

***සහය සංස්කාරක***

හිරුනි කළුආරච්චි

***සංස්කාරක උපදේශක මණ්ඩලය***

එස්.ටී.හෙට්ටිගේ (සම්මානිත මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
කාලිංග ටියුඩර් සිල්වා (සම්මානිත මහාචාර්ය) පේරාදෙණිය විශ්වවිද්‍යාලය
කේ.කරුණාතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) කැලණිය විශ්වවිද්‍යාලය
සරත් අමරසිංහ (සම්මානිත මහාචාර්ය) රුහුණ විශ්වවිද්‍යාලය
යසාංජලී ජයතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
චන්ද්‍රසිරි නිරිඇල්ල (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
සුභාංගි හේරත් (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
නිශාර ප්‍රනාන්දු (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
ෆර්සානා හනීෆා (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
ඉරේෂා ලක්ෂ්මන් (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය

***භාෂා සංස්කරණය***

නාලක ජයසේන

***පරිසැලසුම් නිර්මාණය***

ප්‍රභාත් ගලගමගේ

හිරුනි කළුආරච්චි



[6] මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාද් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

# සමාජ විග්‍රහ

විමර්ශිත සංග්‍රහය
**REFEREED JOURNAL**
පළමු කාණ්ඩය, නවවන වෙළුම - 2022
ISSN 2756-925X (e-ISSN)
ISSN 2362-0978 (print ISSN)

This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License.

දැනුම වෙත ප්‍රවේශ වීමේ සීමා අතික්‍රමණය සඳහා ලොව බොහෝ ශාස්ත්‍රාලයීය ප්‍රකාශන සම්ප්‍රදායික ප්‍රකාශන අයිතිය පිළිබඳ නෛතික ආකෘතියෙන් විකල්ප ආකෘතියක් වන පොදු නිර්මාණ බලපත්‍ර ක්‍රමයට සංක්‍රමණය වී / වෙමින් ඇත. මේ අනුව විචාරාත්මක දැනුමට විවෘත ප්‍රවේශයක් ලබා දීමේ අරමුණින් "සමාජ විග්‍රහ" විමර්ශිත සංග්‍රහය, නිකුත් වන්නේ ඉහත පොදු නිර්මාණ බලපත්‍රය යටතේය.

## ලිපි විමර්ශක මණ්ඩලය

*මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*
*මහාචාර්ය ෆර්සානා හනීෆා, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*
*මහාචාර්ය එම්.ටී.එම් මහීස්, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*
*මහාචාර්ය සමන්ත හේරත්, සන්නිවේදන සහ නිර්මාණාත්මක කලා අධ්‍යනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය*
*කථිකාචාර්ය චමත්කා පද්මසිරි කාරියවසම්, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*
*කථිකාචාර්ය ක්‍රිෂාන් සිරිවර්ධන, සන්නිවේදන සහ නිර්මාණාත්මක කලා අධ්‍යනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය*

## ප්‍රකාශනය

සමාජ විද්‍යා අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ-03
දුරකථනය/ෆැක්ස්: 011-2500452
විද්‍යුත් තැපැල: samajaviggraha@soc.cmb.ac.lk
වෙබ් අඩවිය: https://arts.cmb.ac.lk/sociology/

**සාරසංක්ෂේපය**


දකුණු ආසියාතික කලාපයේ වැදගත් හැඟවුමක් වශයෙන් සැලකෙන කුලය යන්නට උගතුන් අතර නිශ්චිත නිර්වචනයක් නොවීමෙන් එහි වන සංකීර්ණතාව විශද වේ. ඒ අනුව සංක්‍රමණික ගෝත්‍රික ක්‍රියාකාරිත්වය හා උතුරු, දකුණු ඉන්දියානු බලපෑම මත ලංකාවට ආගමනය වූවා යැයි සැලකෙන කුලය, පසුකාලීනව ලාංකීය සමාජ දේශපාලනයට අනුරූපව නිර්මාණය වූ බව මානව විද්‍යාඥ මතය විය. එහෙයින් වඩා විධිමත්ව කුල පදනම වැඩවසම් සමාජ ක්‍රමය ඔස්සේ මහනුවර යුගයේ දී වර්ධනය වන්නට වූ අතර විවිධ සමාජ සංස්ථා කෙරෙහි දැඩි බලපෑම් එල්ල කරන්නට සමත් විය. ඒ අනුව කැපී පෙනෙන්නක් බවට පත් වූ විවාහ සංස්ථාව, කුලයෙහි බලපෑම අද්‍යතනය වන විට ද සැලකිය යුතු ලෙස හඳුනා ගැනීම මත සුවිශේෂ විය. එහෙයින් ක්‍රි.පූ 06 වැනි සියවසේ ඉපැරණිම විවාහ මංගල්‍යයක තොරතුරු සමකුල පාර්ශ්ව හා විවාහ වීමෙන් හඳුනා ගත හැකි විය (චන්ද්‍රසිරි හිමි,2006). මේ අනුව බලන කල විවාහය යනු පවුල් ක්‍රමයක ආරම්භක අවස්ථාව ලෙස සැලකිය හැකි වූ අතර ඊට බලපෑම් කරනු ලබන කුලය ඒකමිතික නොවුව ද විවාහය තුළ ඒකමිතික ලක්ෂණ දැරීමට තරම් ප්‍රබල විය. ඒ අනුව අධ්‍යයනයෙහි ගැටලුව වූයේ, නගරයට සාපේක්ෂව තෝරා ගත් නෙලුම්මැව ග්‍රාමයේ තාක්ෂණය, අධ්‍යාපනය, රැකියාව, උගත් බව ආදියෙන් යුත් තරුණ විවාහ අපේක්ෂිත පිරිස් හට කුලය යන්න තවදුරටත් විවාහයේ දී සැලකිය යුතු සාධකයක්ව පවත්නේ ඇයි ද යන්නයි. මේ අනුව අධ්‍යයනයේ අරමුණ වූයේ, ග්‍රාමය තුළ වන විවාහයන්හි දී කුලය යන්න ප්‍රමුඛ සාධකයක්ව පැවතීමට හේතුව කුමක් ද යන්න විමර්ශනය කිරීමයි. ඒ අනුව පශ්චාත් ප්‍රත්‍යක්ෂමූල ක්‍රමවේදය ඔස්සේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත ඇතුළත් මිශ්‍ර අධ්‍යයන විධි ක්‍රමය තුළින් අහඹු නියැදියෙහි වන ලොතරැයි ක්‍රමය භාවිත කරමින් විවාහ අපේක්ෂිත ස්ත්‍රීන් 15 ක් සහ පුරුෂයින් 15 ක් වශයෙන් සමස්ත 30 දෙනෙකු තෝරා ගැනීම සිදු කෙරිණ. සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලි ඔස්සේ අවශ්‍ය දත්ත ලබා ගන්නා ලද අතර අධ්‍යයනය අවසානයේ හඳුනා ගත හැකි වූයේ, යෝජිත විවාහ සහ ස්වකැමැත්තෙන් වන විවාහ සඳහා කුලය යන්න (100%) බලපෑම් කරනු ලබන ප්‍රධාන සාධකය වූ බවයි. ඊට හේතු පාදක ලෙස සිය දෙමාපියන්/භාරකරුවන්/ඥාතීන් ගෞරවය මුසු දෘෂ්ටියකින් කුලය දෙස බැලීමත් අවිඥානිකවම තෙවැනි පරම්පරාව ඒ කෙරෙහි යොමු වීමත් හඳුනාගත හැකි විය. ඒ අනුව සමස්තයක් ලෙස සැලකීමේ දී අද්‍යතනය වන විට තාක්ෂණය, අධ්‍යාපනය ගම තුළ සැලකිය යුතු වර්ධනයක්ව පැවතිය ද, විවාහය යන්නෙහි දී කුලය තවදුරටත් බලපෑම් සහගත සාධකයක්ව පවතින බව අනාවරණය කර ගත හැකි විය.



*මුඛ්‍ය පදඃ කුලය, , ගෞරවය , පාරම්පරිකත්වය, වැඩවසම් ක්‍රමය, විවාහය*

**හැඳින්වීම**

සමාජයක් යනු සංකීර්ණ ජන සබඳතා හා ආයතනික රටාවලින් ගැවසී ගත් සාර්ව ඒකකයකි. ඒ අනුව යම් යම් සමාජ ක්‍රියා සහ ප්‍රතිඵල ලෙසින් ගොඩ නැගී ඇති සංකලනයක් වන සමාජය, ක්‍රියා හා සබඳතාවල එක්තරා පෙළ ගැස්මක් ස්ඵුට කරනු ලබයි. උස් පහත් ස්වරූපයෙන් දැකිය හැකි වන මෙම ස්තරායනය සමාජයේ එක් අංශයකින් කුලය ලෙස පිළිඹිබු කිරීමට සමත් අතර ඒ නිසාම දකුණු ආසියාතික කලාපය තුළ ඊටම ආවේණික වූ සුවිශේෂත්වයක් දැරීමට තරම් ප්‍රබල සාධකයක්ව ඇත. ඒ අනුව කුලය පුද්ගලයාගේ සමාජ තත්වය, සමාජ වටිනාකම ආදී සබඳතා හැඩ ගැස්වීමෙහිලා තීරණාත්මක බලපෑමක් සිදු කරන අතර ඒ ඔස්සේ කුලයෙහි සුවිශේෂත්වය නිර්මාණය වන්නට වූ බව කේ. ටී. සිල්වා දක්වා ඇත. ඔහු දක්වන ආකාරයට කුලය යනු, මුළුමනින්ම සමාජ නිර්මිතයක් වන අතර විශ්වීය සංසිද්ධියක් නොවේ. එහෙයින් කුලය යනු දකුණු ආසියාතික සමාජ ක්‍රමය හා බැඳි සමාජ නිර්මිතයකි (කේ.ටී.සිල්වා,2005,22). A.L.Kroeber දක්වන ආකාරයට එය වූ කලී දැඩි වූ ද, උග්‍ර වූ ද ජන්මයෙන් නියම කරන ලද්දාවූ ද පුද්ගල චංචලතාවයට අවකාශ නොදෙන්නා වූ ද ආයතනයකි (අමරසේකර,1996).

ඒ අනුව කුලය හා බැඳි විවාහ සංස්ථාව පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ලාංකීය ලිඛිත ඉතිහාසය තුළ ඉපැරණිම විවාහ මංගල්‍යයක තොරතුරු ක්‍රි.පූ 06 වැනි සියවසින් වාර්තා වේ. මුල්කාලීන ලාංකීය සමාජ ක්‍රමය තුළ, සුදුසු සමකුල කුමරියක ලැබිය යුතු ලෙස එහි දී දක්වා ඇත (චන්ද්‍රසිරි හිමි,2006). පසුකාලීනව ක්‍රමක්‍රමයෙන් වර්ධනය වූ කුල සාධකය අනුරාධපුර යුගය අගභාගය වන විට වංශය හා සමාන අර්ථයෙන් සම දෑ (සම ජාති), සමකුල ලෙස පෙනී සිට ඇත (ශ්‍රී ලංකාවේ ඉතිහාසය,2000). එහෙයින් අතීතයේ සිහසුන හිමි වීම හා දේපළ උරුමයේ දී ජන්මය පිළිබඳව විමසිලිමත් වීම විවාහයක ඉතා වැදගත් කරුණක් වූ බව සඳහන් කළ හැකිය (මුණසිංහ,1998:118). විශේෂයෙන්ම මෙහි දී විවාහයේ කෘත්‍යාත්මක අවශ්‍යතාවක් ලෙස පාලන සම්බන්ධතා අතර ඇති සම්බන්ධතා වඩාත් ශක්තිමත් කිරීම ප්‍රධාන අරමුණක්ව සලකා ඇති බව පෙනේ (මේධානන්ද හිමි,2003:424). එහෙයින් සමකුල නොවන ස්ත්‍රියක් විවාහ කරගැනීම හේතුවෙන් රාජ්‍යත්වය පවා අහිමිව ගිය ලිඛිත ඉතිහාසයක් සාලිය අශෝකමාලා පුවතෙන් දැකිය හැකි වේ. හේරත් දක්වන ආකාරයට පැරණි සිංහල සමාජ සංවිධානයේ විවාහ සම්බන්ධතා තීරණය කිරීම සහ ඒ තුළින් තීරණය වන්නා වූ ඥාතීත්වයේ සීමාව කුලයේ සීමාව දක්වාත්, කුලයේ සීමාව ඥාතීත්වයේ සීමාව දක්වාත් ව්‍යාප්ත වී ඇත. තවදුරටත් මෙන්ඩිස් දක්වන ආකාරයට කුලය, සිය කණ්ඩායම්වලට පිටස්තර විවාහ සඳහා ඉඩ නොතබමින් එකී ව්‍යුහය එක්ව රඳවා ගත් ව්‍යවස්ථාවක් වේ (Mendis,1940;85). මේ අනුව මෙරට විවාහයට බලපෑ කුල ක්‍රමය පිළිබඳව සාකච්ඡා කිරීමේ දී ඒ ඒ කුලවලට අයත් වූවන් තම තමන් ගේ යහපතටත්, අභිරුචියටත් පාඩු වුව ද පවුලේ හෙව කුල පැවැත්මේ යහපත වෙනුවෙන් විවාහය තුළින් එකී සම්බන්ධතා ආරක්ෂා කර ගත් බව පැහැදිලිය. සම කුලවලින් විවාහ කර ගැනීම කුලය විසින්ම පවත්වාගෙන ගිය එක්තරා අලිඛිත නීතියක් වූවා සේම තත්කාලීන සමාජයක් පවත්වාගෙන යාම සඳහා ද එය මූලික වී ඇති බව ද මෙහි දී විද්‍යමාන කෙරේ.

ඒ අනුව ලාංකීය සමාජ සන්දර්භය තුළ දැකිය හැකි ප්‍රධාන විවාහ ක්‍රම ද්විත්වයක් වූ අතර දීග විවාහය සහ බින්න විවාහය එකී ක්‍රම ද්විත්වය විය. දීග විවාහය යනු, ස්ත්‍රිය සිය පියාගේ නිවසෙන් පිටව ස්වාමි පුරුෂයා සහ ඔහුගේ නෑදෑයන් සමග පදිංචියට යාම විය. බින්න යනු පාලි, සංස්කෘත භාෂාවලින් බිඳී ආ පිය පරපුරේ සාම්ප්‍රදායික විවාහ කැඩී යාම හෙවත් මනාලයා විසින් මනාලියගේ නිවසේ පදිංචි වීම විය. ඒ අනුව ඇවැස්ස විවාහය හා බහු විවාහ ක්‍රම සාම්ප්‍රදායික විවාහ ක්‍රම අතර දැකිය හැකිවුව ද ඒවා ද මහනුවර යුගයේ දී (බහු පුරුෂ සහ බහු ස්ත්‍රී) සිදුව ඇත්තේ බින්න හා දීග යන ක්‍රම ද්විත්වය තුළින් බව පැහැදිලිවේ. එහෙයින් මුල් කාලීන ශ්‍රී ලාංකේය විවාහ සංස්ථාව සමාජ සංස්ථාවකට සාපේක්ෂව පොදු යහපත සඳහාවන සංස්ථාවක් වූ බව කිව හැකිවේ. මේ අනුව දිවෙන ප්‍රධාන විවාහ ක්‍රමයක් වූ යෝජිත විවාහ තුළ මගුල් කපුවකු ලවා

දෙමාපිය හෝ භාරකරු කැමැත්ත යටතේස්ත්‍රියට හෝ පුරුෂයකුට සහකරුවකු හෝ සහකාරියක තෝරා දීම අපේක්ෂා කෙරිණ. නක්ෂත්‍රයට අනුව මෙහිදී බොහෝ දේ සිදුවූ අතර කුලය යන්න එහි මුඛ්‍ය සාධකයක් විය.

මේ අනුව වේද සාහිත්‍යයට අනුව පුද්ගල ජීවිතයේ පරමාර්ථ සතරක් වූ අතර ධර්ම සම්පත්තිය, අර්ථ සම්පත්තිය, කාම සම්පත්තිය, මෝක්ෂ සම්පත්තිය එකී පරමාර්ථ සතර විය. එහෙයින් මනුෂ්‍යයකුගේ ජීවිතය සාර්ථකත්වයට පත්වන්නේ විවාහයෙන් යැයි සමාජීය වශයෙන් විශ්වාස කරන්නක් විය. ඍග් වේදයට අනුව එය දෙවියන් උදෙසා යාග කිරීම සහ ප්‍රජාව උදෙසා පුතුන් ඇති කිරීම විය. ඒ අනුව සාර්ථක ජීවිතයකට විවාහය අත්‍යවශ්‍ය වන්නේ ද කාන්තාව යනු ජීවිතයක අර්ධයක් බව ද, පුරුෂයෙක් කාන්තාවක් ආවාහ කර ගන්නා තුරු සම්පූර්ණ අයකු නොවන බව ද දක්වනු ලැබිණ. එහෙයින් බලන කල අවිවාහකයා සමාජයට වැඩදායක අයෙකු ලෙස නොසැලකුණ බව ද පෙනේ. මේ අනුව විවාහය යනු සමාජ කෘත්‍යයක් සිදු කරන, සමාජ පැවැත්මට නැතහොත් ප්‍රගමනයට හේතුකාරකයක් වන ප්‍රපංචයක් බව පැහැදලි වේ (සංජීව සහ සිරිවර්ධන,2018:2). මනු නීතියේ සඳහන් වන ආකාරයට එය (භාර්යාවක් සරණ පාවා ගැනීම වූ කලී) ප්‍රජා සංවර්ධනයට ද හේතු වේ.

මේ අනුව විවාහය හා බැඳි සාම්ප්‍රදායික සංකල්පයක් වශයෙන් සැලකෙන කුල ක්‍රමය නූතන සමාජ සන්දර්භයේ වෙනස් ආකාරවලින් පෙනී සිටීම දැකිය හැකි වේ. දකුණු ආසියාතික කලාපයේ වැදගත් හැඟවුමක් වශයෙන් සැලකෙන කුලය cast ලෙස ඉංග්‍රීසි භාෂාවට 1565 දී එක්වීමත් සමග පුද්ගලයාට කුලය යන්න ජන්මයෙන් හිමි වූවක් බව පෙන්වා දී තිබේ. ඒ අනුව කුල ක්‍රමය තුළ කුලීනයන් හා කුලහීනයන් ලෙස දෙකොටසක් වූ බව දක්වා ඇත. රැල්ෆ් පීරිස් සහ බ්‍රයිස් රයන් දක්වන ආකාරයට ශ්‍රී ලාංකේය මානව වංශ විද්‍යාත්මකව සහ ඓතිහාසික සාක්ෂි අනුව කුල ක්‍රමය වැඩවසම් සමාජ ආයතනයක් විය. යාල්මාන් සහ හෝකාර්ට් දක්වන ආකාරයට කුලය මනෝ මූලික සාධක මත නිර්ණය වන්නක් විය. ලීච් වැනි විද්වතකු දක්වන ආකාරයට එය ශ්‍රම විභජනනයක් විය. ඒ අනුව පැහැදිලි වන්නේ කුලය සම්බන්ධයෙන් නිශ්චිත නිර්වචනයක් උගතුන් අතර නොමැති අතර මානව විද්‍යාඥයින් විසින් එය ඉන්දියාවට විශේෂ වූ සමාජ ක්‍රමයක් ලෙස හඳුන්වා දී ඇති බවය. නමුත් ඊට පරස්පරව යමින් සමාජීය විද්‍යාඥයින් විසින් කුලය යන්න දැඩි සමාජ ස්තරායන ක්‍රමයක් වශයෙන් හඳුන්වා දී ඇති අතර එම්.යූ.ද සිල්වා දක්වන ආකාරයට එය, සංක්‍රමණික ගෝත්‍රවල ක්‍රියාකාරිත්වය සහ දකුණු ඉන්දියානු බලපෑම මත ක්‍රමයෙන් ලාංකීය සමාජයේ මුල්බැස ගත්තක් විය (ද.සිල්වා,1998:76). තවදුරටත් මෙම ද්විත්ව අදහස් දැක්වීමට නොඑකඟ වෙමින් බොහෝ මානව විද්‍යාඥයන් විසින් කුලය යන්න, සම්භාව්‍ය හින්දු වර්ණ ක්‍රම මූලික වශයෙන් සමාජයක් වූ සිංහල සමාජයේ ආයතනගතව පැවති බවට සාක්ෂි විරල බවත්, සිංහල කුල ක්‍රමය ඇතැම් උතුරු හා දකුණු ඉන්දියානු බලපෑම් සහිතව, ලංකාවේ සමාජ දේශපාලන පසුතලයට අනුරූප ලෙස ස්වාධීනව වර්ධනය වූ බවත් පෙන්වා දී තිබේ (ද.සිල්වා,1998.147). එහෙයින් පසුකාලීනව රැල්ෆ් පීරිස් දක්වන ආකාරයට කුල පදනම වඩාත් විධිමත් අයුරින් වැඩවසම් සමාජ ක්‍රමයක්වූ මහනුවර යුගයේ දී දක්නට ලැබිණ (පීරිස්,2001). ඒ අනුව දැක්විය හැකි වන්නේ කුල ක්‍රමයේ ආරම්භක වකවානු නිශ්චිත නොවන අතර කුල ක්‍රමය පිළිබඳව පවතින වාර්තාගතවීම් ලාංකීය ඉතිහාසයේ දුර්ලභ වීම මේ සඳහා ප්‍රබල සාක්ෂි නොවීමට හේතු වන බවයි. එහෙයින් මෑතකාලීන ඉතිහාසය නියෝජනය කරමින් ජන වංශය, නීති නිඝණ්ඩුව වැනි ලිඛිත මූලාශ්‍රය අතීත කුල ක්‍රමයෙහි පදනම නොදක්වන නිසා එය තවත් අසීරු කටයුත්තක් වී ඇත. මේ අනුව සිංහල සමාජ කුල ක්‍රමය පිළිබඳ සැලකීමේදී සාමාන්‍ය වශයෙන් කුල 15 ක් පමණ දැකිය හැකි වූ බව ද, ඒ අතර කුඩා හා අප්‍රසිද්ධ කුල විවිධ ප්‍රදේශවල තිබිය හැකි බව ද අමරසේකර (1996), අයිවන් (1999), Jiggins (1979), නීති නිඝණ්ඩුව (1999), පීරිස් (2005), Robert (1982), සුභාෂිණී (2002) දක්වා ඇත. ඒ අනුව, එක් එක් කුලය සහ කුලයට පාරම්පරිකව හිමි වෘත්තිය පිළිබඳ පහත වගුවෙන් පැහැදිලි කර ගත හැකිවේ.

| අනුපිළිවෙල | කුලයේ නම | | පාරම්පරික වෘත්තිය |
|---|---|---|---|
| 01 | ගොවිගම | රදළ | ඉඩම් හිමි ප්‍රභූන් |
| | | ගොවි | ගොවිතැන |
| | පට්ටි | | ගවපාලනය |
| 02 | බරාව | | මසුන් මැරීම |
| 03 | සලාගම | | කුරුඳු තැලීම |
| 04 | ˚රාව | | රා මැදීම |
| 05 | හුණු | | අලු හුණු කර්මාන්තය |
| 06 | ආචාරි/ගල්ලදු/නවනන්දන | | ලෝකුරු වැඩ |
| 07 | හේන/රදා | | රෙදි ඇපිල්ලීම |
| 08 | වහුම්පුර/හකුරු | | හකුරු සෑදීම |
| 09 | කුඹල්/බඩහැල | | වළං සෑදීම |
| 10 | දුර | වෙල්ලදුර/බෝධි | ශ්‍රී මහා බෝධිය රැක ගැනීම |
| | | පන්නදුර | ඇත්ගොව්වන් |
| 11 | නැකැති/බෙරවා | | නක්ෂත්‍ර/නැටුම් වැඩ |
| 12 | බත්ගම/පදු | | සේවකයෝ/බර උසුලන්නෝ |
| 13 | ගහල | | මළ බෙර ගැසීම |
| 14 | කින්නර | | පැදුරු විවීම/ හණ කර්මාන්තය |
| 15 | රොඩී/හුලවාලි | | හිඟමන/කොහු ඉදල් සෑදීම |

මූලාශ්‍රය: (සිල්වා,කේ.ටී.2005:26)

මේ අනුව පුද්ගලයාගේ උපත සහ මරණය අතර ජීවිතයේ වැදගත්ම සිදුවීම ලෙස විවාහය සලකනු ලැබූ අතර වැඩිහිටි බවට පත්වීම සලකුණු කෙරෙන්නක් බවට ද විවාහය පත් විය. සමාජ විද්‍යාව පිළිබඳ සංක්ෂිප්ත ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයට(The Concise Oxford Dictionary of Sociology,1994) අනුව විවාහය, යම්කිසි අයිතිවාසිකම් සහ වගකීම් ඉටු කරන වැඩිහිටි පිරිමි සහ ගැහැනු අතර සිදුවන නීත්‍යානුකූලව පිළිගත් සම්බන්ධයක් විය. ඇන්තනී ගිඩ්න්ස් (Anthony Giddens,2002) ට අනුව එය, සමාජීයව පිළිගත් සම්බන්ධතා, යම්කිසි අයිතිවාසිකම් සහ වගකීම් ඉටු කරන වැඩිහිටි පිරිමි සහ ගැහැනු අතර සිදුවන පිළිගත් ලිංගික සම්බන්ධතා සහිත ඒකකයක් විය. ඒ අනුව විවාහය යනු මිනිස් සමාජයේ පදනම ලෙස දැකිය හැකි වූ අතර සමාජීය සැකැස්ම හැඩගස්වනු ලබන්නක් ලෙස ද දැක්විය හැකිය. ඒ අනුව ස්ත්‍රියක් හා පුරුෂයෙක් හට ජීවවිද්‍යාත්මක, මනෝවිද්‍යාත්මක, සමාජීය, ආචාරධාර්මික හා ආධ්‍යාත්මික මට්ටමේ දී පෞරුෂ සංවර්ධනය, ආදරය, විරුද්ධ ලිංගිකයන් මුණ ගැසීම ආදී විවිධ අවශ්‍යතා ඉටු කර ගත හැකි විවාහය හැර වෙනත් සංස්ථාවක්/ආයතනයක් මානව සමාජයේ හඳුනාගත නොහැකි බව විද්‍යමාන කරුණකි. එහෙයින් මානව

සංහතියේ ඉපැරණිතම සංස්ථාව ලෙස විවාහය හඳුන්වා දිය හැක්කේ ජාතියක හෝ සංස්කෘතික කණ්ඩායමක (Cultural Group) සම්ප්‍රදායක (Tradition) පරමාදර්ශ (Ideals) එමගින් ප්‍රතිමූර්තිමත් කරන බැවිනි (Karunanayake,2000;13).මේ අනුව බලන කල විවාහය යනු විශ්වීය සමාජ සංස්ථා අතරින් එකක් වන අතර එය මිනිසාගේ ලිංගික ජීවිතය පාලනය කිරීමට විධිමත්ව ගොඩනැංවුණ සංස්ථාවකි. ඒ අනුව විවාහයක සංස්කෘතියට අදාළ චාරිත්‍ර වාරිත්‍ර සහ එකී සමාජයේ පිළිගත් නෛතික රාමුවට යටත්ව කටයුතු සිදු කරනු ලැබීම හඳුනා ගත හැකිය. මානව විද්‍යාඥයකු වන ජී.පී මර්ඩොක්ට අනුව, විවාහය යනු, සමලිංගික නොවන පුද්ගලයන් දෙදෙනෙකු අතර පවත්නා සාපේක්ෂ ලෙස ස්ථිර ලිංගික සම්බන්ධතාවයක් මෙන්ම ආර්ථික වශයෙන් ශ්‍රම විභජනනයක් ද අනුගමනය කිරීමකි. බී.මැලිනොවුස්කි දක්වන ආකාරයට එය දරුවන් උත්පාදනය හා නඩත්තු කිරීම පිළිබඳ ගිවිසුමකි. මේ අනුව විවාහය පිළිබඳව ඒකමතික නිර්වචනයක් නොවීම මත එය ද කුලය හා සාපේක්ෂව සංකීර්ණ සංකල්පයක් බව හඳුනා ගැනීමට ලැබේ (කුමාර,2013).

**නෙලුම්වැව ග්‍රාමය තුළ කුල සාධකය හා විවාහය**

මේ අනුව ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික විවාහය පිළිබඳ සලකා බැලීමේ දී එය පවුල හා කුලය අතර අන්‍යෝන්‍ය සබඳතාවක් පවත්නා බව පෙනේ. එහි දී සාම්ප්‍රදායික පවුල් ව්‍යූහයේ පුද්ගලයාගේ විවාහය යනු එක් ස්ත්‍රියක් එක් පුරුෂයෙක් එක් කිරීමේ ක්‍රියාවලික් නොව එක් සමූහයක් තවත් සමූහයකට එක් කිරීමේ ක්‍රියාවලියක් විය. එහෙයින් නූතන තරුණ පරපුරෙහි සහකරුවා හෝ සහකාරිය තමන් විසින් ස්වාධීනව තෝරාගැනීම ජනප්‍රියව පැවතිය ද එය ජයතුංග දක්වන ආකාරයට, "පිළියෙළ කරන ලද හා යෝජිත විවාහයන්හි දී මෙන් මෙවැනි විවාහයන්හි දී කුලය, පන්තිය, පරම්පරාව, යන සාධක කෙරෙහි සැලකිල්ලක් නොදක්වන්නේ යැයි සමාජීය පිළිගැනීමක් පැවතුණ ද කුලය හා පන්තිය යන සාධක කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වන බව පෙනේ (ජයතුංග,2005:73). ඒ අනුව සංකීර්ණ නගරයේ නෛතික ගිවිසුමට ප්‍රධාන තැනක් දෙමින් විවාහ සංස්ථාව තුළ කටයුතු කිරීමේ ප්‍රවණතාවක් දක්නට ලැබුණ ද ග්‍රාම්‍ය සමාජවල චාරිත්‍ර වාරිත්‍ර සහ සංස්කෘතික කටයුතුවලට මුල්තැන දෙමින් කටයුතු කිරීමේ විවාහ සංස්ථාවක් දැකිය හැකි විය. ඊට හේතුව ග්‍රාමීය සමාජ ක්‍රමයෙහි ඥාතීත්වය හා බැඳුණු ගෞරවය අතිනත ගැනීමයි. මේ අනුව ග්‍රාමීය සමාජයේ බොහොමයක් දුරට යෝජිත විවාහ දක්නට ලැබුණු අතර මනාල හා මනාලියගේ පාර්ශවයේ දෙමාපියන්, ඥාතීන් හෝ භාරකරුවන් විසින් සිය කැමැත්ත පරිදි සහකරු හෝ සහකාරිය තෝරා දීම සිදු කෙරිණ. විශේෂයෙන්ම ප්‍රේම සබඳතා මගින් විවාහ සහකරු සහකාරිය තෝරා ගැනීම නූතන ගම තුළ දක්නට ලැබුණ ද, විවාහ අපේක්ෂිත තරුණිය හෝ තරුණයා කුලය යන්නට මදක් හෝ සැලකිල්ලක් දැක්විය යුතු බව එහි දී අදහස් විය. එනම් ඊට හේතු වූයේ ද, කුලය ධුරාවලියක් දරන ලද්දක් බැවින් කුලයට පටහැණි වීම සිය පරම්පරාව තුළින් නෙරපූවකු ලෙස අදහස් කරන්නක් වූ බැවිනි. එනම් එය වූ කලී, මහා සමාජයේ පිළිගත් කුලවලින් පරිබාහිර වීම ප්‍රතික්ෂේප කළ යුතු තත්වයක් වූ හෙයිනි. ඒ අනුව මෙකී තත්වය සැලකිය යුතු සියල්ලක්ම පාහේ අධ්‍යයනයට බඳුන් කරන ලද නෙලුම්මැව ග්‍රාමයේ දක්නට ලැබුණු අතර තාක්ෂණය, අධ්‍යාපනය යනාදියෙන් සපිරි තරුණ විවාහපේක්ෂිත පිරිස් කෙතරම් දුරට ස්වාධීනව කටයුතු කළ ද විවාහයේ දී කුලය යන්න වැඩිහිටි, දෙමාපිය, ඥාතී යන අය විසින් හැඟවුම් කරන ලද කරුණක් වූ බව හඳුනා ගැනීම සුවිශේෂී විය.

**පර්යේෂණ ක්‍රමවේදය**

පර්යේෂණ අධ්‍යයනය සඳහා පශ්චාත් ප්‍රත්‍යක්ෂමූල ක්‍රමවේදය යොදා ගන්නා ලද අතර ඊට හේතු පාදක වූයේ විවාහය තුළ කුල සාධකයෙහි බලපෑම සංවේදීත්වය හැඟවුම් කරන සාධකයක් වූ හෙයිනි. එහෙයින් දෘශ්‍යමානව නොපවතින කුලමය කාරණා සහභාගීත්ව නිරීක්ෂණය හරහා ලබා ගත් අතර ගුණාත්මක මෙන්ම ප්‍රමාණාත්මක දත්ත ඇතුළත් මිශ්‍ර අධ්‍යයන විධි ක්‍රමයක් භාවිත කරන ලදී. එහි දී ප්‍රාථමික දත්ත ඔස්සේ

විවාහයේ දී බලපානු ලබන කුලමය කාරණා අනාවරණය කර ගන්නා ලදී. ද්වීතීයික දත්ත මගින් ග්‍රාමයේ ප්‍රජා ලක්ෂණ, ග්‍රාමීය ප්‍රජා කටයුතු, අවිවාහක පිරිස් සහ ඔවුනගේ රැකියාව,අධ්‍යාපන මට්ටම හඳුනා ගන්නා ලද අතර අහඹු නියැදිය යටතේ අධ්‍යනයට අවශ්‍ය ප්‍රතිචාරකයින් තෝරා ගනු ලැබිණ. එහි දී නෙලුම්වැව ග්‍රාමයේ විවාහාපේක්ෂිත පවුල් 50 ක් අතුරින් විවාහාපේක්ෂිත තරුණ පිරිස් 30 දෙනෙකු ස්ත්‍රීන් 15 ක් සහ පුරුෂයින් 15 ක් වශයෙන් ලොතරැයි ක්‍රමයට අනුව අධ්‍යනයට බඳුන් කිරීම සිදු කෙරිණ. විශේෂයෙන්ම මෙහි දී අහඹු නියැදිය යන්න, ග්‍රාමයේ විවාහාපේක්ෂිත තරුණ පිරිස සාධාරණ ලෙස නියෝජනය වීම සහ අධ්‍යයනයේ සැලකිය යුතු සෑම දත්තයක්ම අඩංගු කර ගැනීම අත්‍යාවශය වීම මත තෝරා ගැණිණ. ඒ අනුව සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලි ඔස්සේ  අධ්‍යනයට අවශ්‍ය දත්ත රැස් කර ගන්නා ලද අතර පර්යේෂණයේ හඳුනාගත හැකි බලවත් දුෂ්කරතාවක් වූයේ, ග්‍රාමීය ප්‍රජාව සැලකිය යුතු මට්ටමකින් බාහිර ප්‍රජාව වෙත නැඹුරු නොවීම හා සංවේදී කාරණාවන් බාහිර පිරිස් වෙත මුදාලීමට වන අකැමැත්තයි. මේ අනුව අධ්‍යයනයේ ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා තුළින් ලද දත්ත ඔස්සේ SPSS මෘදුකාංගය යටතේ විස්තරාත්මක සහ විශ්ලේෂණාත්මක ක්‍රමවේදය භාවිත කරමින් අර්ථකථනය කිරීමට යොදා ගත් අතර සංඛ්‍යාත්මක විශ්ලේෂණය සරල සංඛ්‍යානමය විධික්‍රම මගින් ප්‍රස්තාර භාවිත කොට ප්‍රවණතා සහ විචල්‍යතා ලෙසින් හඳුනා ගැනීම සිදු කෙරිණි.

**පර්යේෂණ සොයා ගැනීම්**

නෙලුම්මැව ග්‍රාමයේ හඳුනා ගත හැකි ප්‍රධාන කුලය ගොවිගම වූ අතර සලාගම අනෙක් කුලය විය. ඒ අනුව ග්‍රාමයේ ප්‍රමුඛ වශයෙන් දැක ගත හැකි විවාහ ක්‍රමය වූයේ දීග විවාහ ක්‍රමයයි. මෙහි දී ඇවැස්ස විවාහ ක්‍රමයක් දක්නට නොලැබුණු අතර බින්න විවාහ ඉතා සීමිත ප්‍රමාණයක්(පවුල් 02ක් පමණක්) විය. ඒ අනුව ග්‍රාමය තුළ යෝජිත විවාහ ක්‍රමයක් සඳහා හෝ ස්ව කැමැත්තෙන් වන විවාහයක් සඳහා දෙමාපිය කැමැත්ත ප්‍රබල සාධකයක් වූ බව හඳුනා ගත හැකි විය. විශේෂයෙන්ම මෙහි දී දෙමාපිය කැමැත්ත නොලැබුණ විට ඥාතීන්ගේ කැමැත්ත ප්‍රබල සාධකයක් විය. ඒ අනුව අනෙක් විවාහ ක්‍රමවලට සාපේක්ෂව යෝජිත විවාහයක දී දෙමාපියන් විසින් කාන්තාවගේ සහ පුරුෂයාගේ සිත් ගැළපීම වෙනුවෙන් වූ ධනය, රූපය, ගේදොර වැඩ කටයුතුවල දක්ෂතාව, රැකියාවට සාපේක්ෂව කුලය යන්න ප්‍රධාන සාධකයක්ව ඉස්මතු කරනු ලැබීය. එහෙයින්, යෝජිත විවාහයක් සඳහා කැඳවාලනු ලබන මගුල් කපු මහතකුට ගොවිගම කුලයේ දෙමාපියෙක් ප්‍රකාශ කර සිටිනුයේ, "අපේ ජාතියෙ කෙනෙක් වෙන්න ඕනෑ කපු මහත්තය. අඩු ජාතියෙ කෙනෙක් නම් බෑ" යනුවෙනි.

එමෙන්ම, "අඩු ජාතියෙ මිනිස්සු අඳුන ගන්න හරි ලේසියි. ඒ මිනිස්සු ළඟ ගොවිගම මිනිස්සුන්ට වැඩිය කුලෑටි බව තියනවා" යනුවෙනි.


මේ අනුව නෙලුම්මැව ග්‍රාමයේ දක්නට ලැබුණු ලක්ෂණයක් වූයේ විවාහ අපේක්ෂිත පිරිස් අන්තර්ජන්‍ය හෙවත් සම කුලවල විවාහයන්ට පෙළඹී සිටීමයි. එහි දී නව ඥාති පරපුරක් තම පරම්පරාවට ඒකරාශී වීම මත උසස් කුලයක තැනැත්තෙකු පහළ කුලයක සාමාජිකයෙකු විවාහ කර ගැනීම සිය සමස්ත වර්ග පරම්පරාව සඳහාම ගෙනෙනු ලබන අපකීර්තියක් බව වැඩිහිටි ප්‍රජාව විසින් සලකන ලදී. ඊට හේතු වූයේ ග්‍රාමය තුළ තවදුරටත් තෙවැනි පරම්පරාවට සාපේක්ෂව වැඩිහිටි පරම්පරාවෙහි අදහස් පිළිගැනීමය. එහෙයින් එක් කුලයක් තවත් එක් කුලයක් ආන්තීකරණයට ලක් වීම හඳුනාගත හැකි විය. ප්‍රේම සම්බන්ධතා මත අන්තර් හා බහිර්ජන්‍ය විවාහ සිදු වුව ද ඒවා සැළකිය යුතු ලෙස සමකුලම විය. එනම් මෙහි දී නෙලුම්වැව ග්‍රාමය ගත් කල කුලය සහ කුල විඥානය මත බෙදී පවතින ප්‍රංශයේ ලුවී දුමොන් දැක්වූ ආකාරයට, (අ) ධුරාවලිය (ආ) ශ්‍රම බෙදීම (ඇ) සම කුල ආශ්‍රිතව වන විවාහය යන්නට අර්ථයක් ලැබෙනුයේ එම සමාජය තුළ පමණක් ක්‍රියාත්මක වුවහොත් පමණක් බව ස්ඵුට කරමිනි. යාල්මන් දක්වන ආකාරයට විවාහය මගින් වන

ආගන්තුකයන් හඳුනා ගැනීම නව ශක්තිමත් ඥාති සම්බන්ධයක් ඇති කිරීමට හේතු වන, දුර්වල ඥාති සම්බන්ධතා වළක්වාලන සමකුල අතර වන විවාහ උත්සව කිසියම් නිල ස්වභාවයක් ද ගන්නා බව ප්‍රත්‍යක්ෂ කරමිනි (Yalman 1967:167-172). මෙහි දී දැකිය හැකි වූයේ, නිවස හෙවත් ගෙදර යනු තමන් අයත් ලේ ඥාති කණ්ඩායම මූර්තිමත් කරනු ලබන පියාගේ නිල නාමය පවත්වාගෙන යනු ලබන්නක් ලෙසය. විශේෂයෙන් යාල්මන් විසින් ඉදිරිපත් කරන ලද කුලය, ඥාතීත්වය විවාහය යන තීසිසය අනුව විවාහයේ දී කුලය තමන් සතු තත්වය ආරක්ෂා කිරීමක් වන බව මෙහි දී අනාවරණය කර ගත හැකි විය.

ඒ අනුව තවදුරටත් සාකච්ඡා කළ යුතු මුඛ්‍ය ලක්ෂණයක් වූයේ, කුලය සමග ආර්ථික සාධකය යන්න ගළපා ගනිමින් කුලය කෙරෙහි ගෞරවය මුසු දෘෂ්ටියකින් බැලීමට නෙලුම්මැව ග්‍රාමයේ තෙවන පරම්පරාව අවධානය යොමු කොට තිබීමය. එනම් එය වූ කලී තෝරා ගැනීමට අපේක්ෂිත සහකරුවා හෝ සහකාරිය දෙස හෙළනු ලබන දෘෂ්ටිය වීමයි. උදාහරණයක් ලෙස සැලකීමේ දී, ගොවිගම කුලයෙහි අයෙකු නියෝජනය වීම මත ගැටලුවක් ඇති නොවුව ද, සලාගම හෝ කරාව කුලය නියෝජනය කරන අයෙකු වීම මත කුරුඳු තැලීම,මසුන් මැරීම සිදු කරන්නේය යන ප්‍රධාන හෙජමොනික ධාරාවේ සිටිමින් පරිකල්පනය කිරීමට පෙළඹී තිබීමය. එනම් සහකරුවා හෝ සහකාරිය කෙතරම් දුරට අධ්‍යාපනය, මූල්‍ය වටිනාකම් ලබා ගත් අයකු වුව ද එය විවාහය සඳහා මූලික සුදුසුකමක් නොවීය. එහි දී මා විසින් දක්වන අදහස ඊ.ආර්.ලීච් විසින් ද what should we mean by cast යන පර්යේෂණ ලිපිය ඔස්සේ පෙන්වා දී තිබේ. මෙහි දී ඔහු සිය ලිපියෙන් අවධාරණය කරනු ලබන්නේ කුලය වනාහි ශ්‍රම විභජන පද්ධතියක් මෙන්ම එකී ප්‍රජා කණ්ඩායමට ආවේණික දෙයක් ද වන බවයි. එහෙයින් එය ආර්ථික පදනමක් මත ක්‍රියාත්මක වන මුළු මහත් සමාජයේ ක්‍රියාකාරිත්වය හා චල්‍යතාව සමග බැඳී පවතින්නක් බවයි. ඒ අනුව නෙලුම්වැව ග්‍රාමයේ ගොවිගම කුලයක සාමාජිකත්වය ලබා ගැනීමේ අවස්ථාව කරාව හෝ සලාගම කුලයක සහකරුවකුට හෝ සහකාරියකට මග හැරේ. එමෙන්ම තවත් නිදසුනක් ගෙන හැර දැක්වීමේ දී නෙලුම්මැව ග්‍රාමයට ආසන්න අකුරුබැබිල ග්‍රාමය සලකනු ලබන්නේ බෙරවා කුලය සිටින අඩු කුල ජනතාවක් වාසය කරන ප්‍රදේශයක් ලෙසිනි. එහි කිසි දිනක දී එකී ප්‍රජාව හා නෙලුම්වැව ප්‍රජාව අතර විවාහ කටයුත්තක් හෝ විවාහාපේක්ෂිත කටයුත්තක් සඳහා එක් වී නොමැත. විශේෂයෙන්ම මෙහි දී දෙමාපියන්ට විවාහයක් තුළින් දරුවනට නෛතික මවක පියකු ලැබීම, ස්ත්‍රියගේ ලිංගික ඒකාධිකාරය පුරුෂයාටත් පුරුෂයාගේ ලිංගික ඒකාධිකාරය ස්ත්‍රියටත් හිමි වීම, පුරුෂයාගේ ගෘහස්ථ හා ශ්‍රම සේවාවල ඒකාධිකාරය පුරුෂයාටත්, ස්ත්‍රියගේ ගෘහස්ථ හා අනෙකුත් ශ්‍රම සේවාවල ඒකාධිකාරය පුරුෂයාටත් ලැබීම, පුරුෂයාට අයත් දේපළ ස්ත්‍රියටත් ස්ත්‍රියට අයත් දේපළ පුරුෂයාටත්, ඥාතීන් අතර නව ඥාතීත්ව බන්ධනයක් ගොඩ නැගීම කුලය හරහා සිදු වන බව ද අදහස් කරනු ලැබීය. ඒ නිසා ස්වකීය පාරම්පරික පෙළපත් නාමය හා ආමන්ත්‍රණය යන්න තීව්‍ර ලක්ෂණයක් කර ගනු ලැබූ මෙකී ප්‍රජාව දෙමාපියන් විසින් හෝ ස්ව කැමැත්තෙන් වන විවාහ සඳහා මහා සමාජයේ බලපෑම මත සම කුල පිරිස් තෝරා ගැනීමට පෙළඹී ඇති ආකාරය හඳුනා ගත හැකි විය. ඒ අනුව අවසානයේ විවාහ සංස්ථාව සඳහා කුල සාධකයෙහි බලපෑම මෙකී විවාහාපේක්ෂිත ජනතාව තුළ ගෞරවය කේන්ද්‍ර කර ගත් සංකල්පයක් ලෙස ද හඳුනාගත හැකි විය.


**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

2003 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කරන ලද ඇමෙරිකා එක්සත් ජනපදයේ වාර්තාවකට අනුව ලෝකයේ ජනගහනයෙන් 89% ක්ම වයස අවුරුදු 49 ට පෙර විවාහ වූවෝ විය. ඒ අනුව මෙම අධ්‍යයනය දියත් කරන ලද නෙලුම්මැව ග්‍රාමයේ විවාහ අපේක්ෂිත පිරිස්හි වයස් කාණ්ඩ පහත පරිදි අනාවරණය කර ගත හැකි විය.





ප්‍රස්තාරඃ අංක 01

අධ්‍යයනයේ දී අනාවරණිත තොරතුරු අනුව හඳුනා ගත හැකිවූයේ ඔවුන් වයස අවුරුදු 26 ත් 33 ත් අතර විවාහ වීමට අපේක්ෂා කරන තරුණ පිරිස් වූ බවයි. විශේෂයෙන්ම ඔවුන්ගේ විවාහ අපේක්ෂිත ක්‍රමය වූයේ, ස්ත්‍රීන් දීග විවාහ ක්‍රමයටත් පුරුෂයින් බින්න විවාහ ක්‍රමයෙන් තොරවත් මනාලයාගේ නිවසට කැඳවාගෙන ඒමත්ය. ඒ අනුව ප්‍රශ්නාවලිය මගින් මතු කරන ලද ඉතා සංවේදී ප්‍රශ්නයක් වූයේ ඔබ විසින් විවාහය තුළ කුලය යන්න සලකනු ලබන්නේ ද යන්නයි. එහි දී විවාහාපේක්ෂිත ස්ත්‍රීන් 15 ක් සහ පුරුෂයින් 15 දෙනා යන කාණ්ඩ ද්විත්වය සැලකීමේ දී,





ප්‍රස්තාරඃ අංක 02

ස්ත්‍රීන් සහ පුරුෂයින් සැලකිය යුතු ප්‍රමාණයක් විවාහය සඳහා කුලය යන්න පිළිගනු ලබන බවට අදහස් දැක්වූහ. එමෙන්ම එහි දී ඔවුන් ප්‍රකාශ කරන ලද අන්දමට කුල සාධකය යන්න වඩාත් ඉස්මතු කරනු ලැබූයේ ඔවුන් ගේ දෙමාපියන් විසිනි. ඒ අනුව සමස්තයක් ලෙස සැලකීමේ දී, එය පහත පරිදි විය.




ප්‍රස්තාරඃ අංක 03

ඒ අනුව ඔවුන් කුලය පිළිබඳ දරන්නා වූ මතය සැලකිය යුතු ලෙස බාහිර පිරිස් වෙතින් ලබා ගත්තකි. එහි දී ඔවුන් සම කුල හා සම කුල නොවන විවාහ තෝරා ගෙන ඇති අතර එය පහත පරිදි දැක්විය හැකි විය.




ප්‍රස්තාරː අංක 04

මේ අනුව අධ්‍යනයේ ප්‍රතිඵල විස්තරාත්මකව සාකච්ඡා කිරීමේ දී,

01. කුලය යන්න විවාහය සඳහා අත්‍යාවශ්‍ය සාධයක් ලෙස බාහිර පිරිස් වෙතින් කරනු ලබන උත්තේජනය.

ඒ අනුව සැලකිය යුතු සමස්ත ප්‍රතිචාරකයින් 30 දෙනාගෙන් 90% ක්ම පාහේ දක්වන ලද්දේ විවාහය තුළ කුලය පිළිබඳ සාධකය දෙමාපියන්, වැඩිහිටියන්, ඥාතීන් ඇතුළු පිරිස් වෙතින් වන දැනුවත් කිරීම් හරහා ලැබුණු බවයි. විශේෂයෙන්ම ඔවුන් සමකුල නොවන විවාහයන්ගෙන් උද්ගත වන ගැටලු පිළිබඳව සිය අත්දැකීම් තරුණ විවාහාපේක්ෂිත පිරිස් සඳහා දක්වා ඇති අතර ඉන් පරිබාහිරව කටයුතු කිරීම මත සිය කුලයෙන් ප්‍රතික්ෂේපිත තත්වයකට පත් වන බව අවධාරණය කර ඇත. එහෙයින් ඔවුන් සිය වැඩිහිටි පිරිස්හි මග පෙන්වීම මත කුලය යන්නෙහි දී සමකුල විවාහ තෝරා ගනිමින් සමස්ත මහා සම්ප්‍රදායේ පිළිගැනීමට ලක්වන බව හඳුනා ගත හැකි විය.

02.වැඩිහිටි පිරිස විසින් කුල සාධකය යන්න පවත්වා ගැනීම.

මේ අනුව හඳුනාගත හැකි තවත් ලක්ෂණයක් වූයේ වැඩිහිටි පිරිස විසින් සිය තෙවැනි පරම්පරාව සඳහා කුලයෙහි හැඟවුම් කාරණා එලෙස පවත්වා ගෙන යන බවය. විශේෂයෙන්ම නෙලුම්මැව ග්‍රාමයේ විවාහය වැනි සැලකිය යුතු අවස්ථාවල දී වැඩිහිටි පරම්පරාවේ දායකත්වය අතිමහත් වූ අතර තෙවැනි පරම්පරාවේ දායකත්වය එහි දී සැලකිය යුතු ලෙස අලංකරණ හා සංවිධාන කටයුතුවලට පමණක් සීමා විය. එහෙයින් වැඩිහිටි මතය අනුව, සිය කුලයට ගැළපෙන අයෙකු තෝරා ගැනීම, එකී තෝරා ගැනීම මත විවාහ ජීවිතය සාර්ථකව ගෙන යාමට හැකි බව, සම කුල වීම තුළ බාහිර සමාජයේ වන ගැරහුම්වලින් මිදිය හැකි බව සහ අවසානයේ සියලු දෙනා විසින් විවාහය පිළිගන්නා බව විවාහාපේක්ෂිත පිරිස් වෙත ඒත්තු ගැන්වීමට කටයුතු කිරීම හඳුනාගත හැකි විය. ඒ අනුව විවාහයේ වැඩිහිටි පරම්පරාව යනු කුල සාධකයෙහි බලපෑම තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යන්නන් ලෙස ද දැකිය හැකි විය. උදාහරණයක් ලෙස නෙලුම්මැව ග්‍රාමයේ වැඩිහිටි ස්ත්‍රීන්ට සාපේක්ෂව පුරුෂයන් ඍජු ගති ගුණ දක්වනු ලැබූ හෙයින් කුලය යන්න වෙනස් කළ නොහැකි සාධකයක් ද විය.

"අඩු ජාතියෙ අයට දෙන්න අපි ළමයි හදල නෑ"


"කොහොම උණත් අවසාන තීන්දුව අපේ කුලයෙ ගැටයෙක් හරි ගැටිස්සියක් හරි තමයි"

"ගොවිගම කුලය කියන්නෙ බෙහොම ඉහළ කුලයක්. ඉතිං ඒ වගේ කුලයකට පෑහෙන්නෙ නැතුව මොන කසාද ද?

මේ අනුව දැකිය හැකි වූයේ විවාහාපේක්ෂිත තරුණයාගේ හෝ තරුණියගේ ස්ව කැමැත්ත කුමක් වුව ද වැඩිහිටි කැමැත්ත මත වන කුල සාධකය කෙරෙහි විවාහය තීරණය වන බවය.

03. අධ්‍යාපනය, හා ඒ ඔස්සේ වන රැකියාව කුමක් වුව ද විවාහයෙහිලා කුලය යන්න මුඛ්‍ය සාධකය වීම.

නෙලුම්මැව ග්‍රාමයේ විවාහ අපේක්ෂිත තරුණ පිරිස්හි සැලකිය යුතු අධ්‍යාපන මට්ටමක් සහ රැකියා තත්වයක් දැකිය හැකි විය. එහි දී විශේෂයෙන්ම සැලකිය යුතු පිරිසක් ප්‍රාථමික අධ්‍යාපනය පමණක්ම නොහදාරා තිබූ අතර ද්විතීයික අධ්‍යාපනය හදාරනු ලැබූ කිහිප දෙනෙකු තෘතීයික අධ්‍යාපන අවස්ථා ද හිමි කරගෙන ඇති බව හඳුනාගත හැකි විය. එහි දී ස්ත්‍රී පුරුෂ වශයෙන් සමස්තයක් ලෙස සැලකීමේ දී, ද්විතීයික අධ්‍යාපන ලද පිරිස් බහුල වූ තත්වයක් දැකිය හැකි විය.




ප්‍රස්තාර අංකඃ 06

ඒ අනුව වන රැකියා තත්වවල දී පෞද්ගලික රැකියා බහුල වූ (80%) අතර රජයේ රැකියා (20%) සෙසු රැකියා තත්ත්ව යටතේ දැකිය හැකි විය. එමෙන්ම සමහර පුරුෂයන් පෞද්ගලික අංශයේ විධායක තීන්දු තීරණ ගනු ලබන අය විය. නමුත් දැකිය හැකි වූයේ විවාහය යන කාරණාව තුළ ඔවුන් යෝජිත හෝ ස්ව කැමැත්ත සඳහා වන විවාහ ක්‍රමයක දී කුලය පිළිබඳ දැක්විය හැකි බලපෑම ඉතා අල්ප වූ බවත් වැඩිහිටි ප්‍රජාවගේ අදහස්වලට ඇහුම්කන් දීම හා පිළිගැනීම සිදු වූ බවත්ය.

මේ අනුව සමස්ත ප්‍රතිඵල සාකච්ඡා කිරීමේ දී,

04. විවාහය යනු ගම තුළ කුල පද්ධතියේ අභිමානය කේන්ද්‍රීය කරගත් සංස්ථාවක් වීම

ඒ අනුව අධ්‍යාපනය, රැකියාව, සමාජීය කැපී පෙනීම තරුණ විවාහාපේක්ෂිත පිරිස් තුළ දක්නට ලැබුණ ද දෙමාපිය වැඩිහිටි සමාජානුයෝජනය මත කුලය යන්න තවදුරටත් වලංගු සාධකයක්ව ඇති බව පෙනී යන ලදී. එහි දී තම පරපුර ඉදිරියට ගෙන යාම, පෙළපත් නාමය ඉදිරියට ගෙන යාම කුලය හරහා තීන්දු වන බව ඔවුන් විසින් දක්වන ලද අතර "අපේ ජාතියෙ කෙනෙක්" යන පදය තුළින් ඔවුන් තවත් අයෙකු සහ කුලයක් යටපත් කිරීමට උත්සහ ගත් බව දැකිය හැකිවේ. එහි දී වැඩිහිටි පරම්පරාව විසින් ලබා දෙනු ලබන කුලමය සාධකයෙහි දැක්ම තෙවන පරම්පරාව තුළ ද චක්‍රයක්ව ක්‍රියාත්මක වූ අතර එය තවදුරටත් අනාගත තත්ත්වවල දී ගම තුළ බැහැර කළ නොහැකි සාධකයක්ව පවතින බැව් අනුමාන කළ හැකි විය. ඒ අනුව නෙලුම්වැව ග්‍රාමයේ විවාහය යන්නෙහි දී කුල සාධකය දෙමාපිය, වැඩිහිටි පිරිස් වෙතින් ගෞරවණීය පදයක් ලෙස

සැලකීම මත තවදුරටත් බලපෑම් කරනු ලබන සහ බලපෑම් කළ හැකි සාධකයක් ව පවතින බව හඳුනා ගත හැකි විය.

මේ අනුව බලන කල දකුණු ඉන්දියාවෙහි බලපෑම මත නිර්මාණය වූ කුල ලක්ෂණ ලාංකීය කුල ක්‍රමයේ දෘශමානමාන බවින් සීමා සහිත වුව ද, එහි දක්නට ලැබෙන අන්තර්විවාහය, පාරම්පරික සාමාජිකත්වය (වෙනත් කුලයකට මාරුවීමේ ප්‍රායෝගික නොහැකියාව), සමාජ ධුරාවලිය ඒ ආකාරයෙන්ම සැලකිය යුතු ග්‍රාමීය සන්දර්භය තුළ ද දක්නට ලැබීම සුවිශේෂී වේ. විශේෂයෙන්ම දකුණු ඉන්දියාවෙහි මෙන් ආගමික මූල මත කුලය යන්න ගොඩ නොනැගුව ද ලාංකීය කුල ක්‍රමයෙහි ධුරාවලිය හෙවත් ශ්‍රම විභජනය මත ගොඩ නැගීම මත එය විවාහය වැනි කරුණක දී අතිශය වැදගත් වී ඇති බැව් මෙම අධ්‍යයනය මගින් දැකිය හැකිය.

**නිගමනය**

සමස්ත පර්යේෂණය අවසානයේ එළඹිය හැකි නිගමනය වූයේ, කුලය යනු ආරෝපිත තත්වයක් බවත්, එය ග්‍රාමීය විවාහ සංස්ථාවට එළඹීමේ දී ගෞරවයෙන් සැලකීම මත තීරණාත්මක සාධකයක් වූ බවත්ය. එහෙයින් අධ්‍යයනය මගින් ඉදිරිපත් කළ හැකි යෝජනා ලෙස,

01. කුලය සම්බන්ධයෙන් පර්යේෂණ කරන්නෙකු හට ග්‍රාමීය විවාහ සංස්ථාවේ කුල බලපෑම යන්න තවදුරටත් වෙනස් දෘෂ්ටිකෝණයකින් අධ්‍යයනය කළ හැකිය. උදාහරණයක් ලෙස මෙම ග්‍රාමයේ කුලය යන්න ගෞරවණීයත්වයෙන් යුතු සංකල්පයක් ලෙස සලකනු ලැබූ අතර වෙනත් ග්‍රාමවල ඊට සාපේක්ෂව වෙනත් අරමුණු සඳහා කුලය යන්න ක්‍රියාත්මක විය හැකිය.

02. සම්මුඛ සාකච්ඡා ඔස්සේ ලද ප්‍රතිචාරක දත්ත අනුව සමස්ත ප්‍රතිචාරකයින් 30 දෙනාගෙන් සමකුල සඳහා 26 දෙනෙකු ද, සමකුල නොවන 01ක් අයෙකුද, අදහසක් නොමැත යන්නෙහි 03 දෙනෙකුද විය. ඒ අනුව මෙහි දී අදහසක් නොමැත යන්න ඉදිරිපත් කරන ලද ප්‍රතිචාරකයින් කෙරෙන් වඩා වැදගත් හැඟවුමක් දක්නට ලැබුණු අතර, නිරීක්ෂිත කරුණු අනුව හඳුනාගත හැකිවූයේ දෙමාපිය හා ස්ව තීරණ මත ඔවුන් දෝලනය වනු ඇති බවය. එහෙයින් එම තත්ත්ව ඔස්සේ කුලය පිළිබඳවන නිශේධනීය හැඟීම් සාධනීය මට්ටමක් කරා ගෙන ඒමට එකී පිරිසට හැකියාව ඇත. එබැවින් සමාජයක් තුළ නිර්මාණය කළ යුත්තේ සහ ඇති කළ යුත්තේ එවැනි පිරිස්ය. මන්ද යත් බොහෝ පැරණි නිශේධනීය ආකල්ප, තත්වය කුලය හා බැඳී පවතින අතර එකී තත්ව බැහැර කිරීම මිස පිළිගැනීම අවශ්‍ය නොවන හෙයිනි.

03. ග්‍රාමීය ප්‍රජාවගේ ආකල්ප සංවර්ධනය කිරීම සහ ආකල්ප සංවර්ධනය සඳහා උත්තේජනයක් ලබා දීම.

මෙහි දී හඳුනාගත හැකි ආකාරයට කුලය යන්න විවාහය තුළ උද්දීපනය කිරීම දෙමාපිය,වැඩිහිටි,භාරකාර පිරිස් අතින් සිදු වූ දෙයකි. එහෙයින් තෙවැනි පරම්පරාවෙහි අදහස් නොවැදගත් සාධකයක් ද විය. නමුත් තෙවැනි පරම්පරාවෙහි වන අධ්‍යාපනය, දැනුම ආදිය මත වූ දැක්ම මත ආකල්පමය වශයෙන් දෙවැනි පරම්පරාව වූ තීන්දු තීරණ ගන්නා වැඩිහිටි පරම්පරාව වෙනස් කිරීමට හැකි වූයේ නම් විවාහය යන්නෙහි දී කුලයෙහි වන නිශේධනීය තත්ව අවම කිරීමට ඉන් හැකියාව ලැබේ. ඒ අනුව මහා සමාජයේ තෙවැනි පරම්පරාව විසින් කිසියම් බුද්ධිමය පිබිදීමක් ඇති කළ යුතු වේ. එකී පිබිදීමෙන් ලත් ප්‍රතිඵල වැඩිහිටි පරම්පරාව වෙත සිය ආකල්ප වෙනස් කර ගැනීමට මෙන්ම එකී ආකල්ප වෙනස් කිරීම මත වඩාත් යහපත් ප්‍රතිඵල ඇති විය හැකි බැව් ඒත්තු ගැන්විය හැක්කක් විය යුතු වේ. ඒ අනුව මෙම අධ්‍යයනය හරහා වන අවසාන නිගමනය වන්නේ, කුලය රහිත (Casteless) සමාජයක් ලෙස සැලකීම මෙන්ම කුලය යන්න නොසලකමින් සිය ජීවිතයේ ප්‍රධාන තීන්දු තීරණ බුද්ධිමත්ව ගැනීමට අවශ්‍ය මනෝමූලික හා භෞතික පරිසරයක් නිර්මාණය කර ගැනීමට තෙවැනි පරම්පරාවට හැකියාව තිබිය යුතු බවයි.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


අමරසේකර, දයා.(2004).*සමාජ විද්‍යාව සිද්ධාන්ත සහ විධික්‍රම*,වරකාපොළ:ආරිය ප්‍රකාශකයෝ

අමරසේකර, දයා,(2000).*සමාජ විද්‍යාවේ මූලික සංකල්ප*,වරකාපොළ:ආරිය ප්‍රකාශකයෝ

අමරසේකර,දයා.(1996). *සමකාලීන ශ්‍රී ලංකා සමාජය,සමාජ විද්‍යාත්මක විමසුමක්*, දිවුලපිටිය: සරස්වතී ප්‍රකාශන

චන්ද්‍රසිරි, ලියනේගම හිමි.(2006).*හෙළ සිරිතයි-විවාහයයි*,ගම්පහ:දීපණ මුද්‍රණාලය

කුමාරි, එරන්දිකා, හර්ෂණී.(2020).*කුල ක්‍රමය පිළිබඳ හැඳින්වීමක්*,පේරාදෙණිය:පේරාදෙණිය විශ්වවිද්‍යාලය

කුමාර, හේමන්ත.(2013).*සමාජ විද්‍යාව මූලික සංකල්ප න්‍යාය හා ක්‍රමවේදය*,කාළඹ:විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය

ගුණසිංහ, නිව්ටන්.(2011).තෝරා ගත් ලිපි 1,කොළඹ 05:සමාජ විද්‍යාඥයින්ගේ සංගමය

ජයතුංග, නදීරා.(2005).*විවාහය පිළිබඳ සමාජ විද්‍යාත්මක විමසුමක්*,ජා ඇල:සමන්ති පොත් ප්‍රකාශන

දිසානායක, උබේසේකර.(2003).*නුවර කලාවියේ පුරාණ ගම*,සමාජ සමීක්ෂා තෙවන කලාපය

පීරිස්, රැල්ෆ්.(2001).*සිංහල සමාජ සංවිධානය*,බොරලැස්ගමුව:විසිදුණු ප්‍රකාශකයෝ,

පෙරේරා, බී.ටෙනිසන්.(2002).*සමාජ විද්‍යාව*,මහරගම:තරංජී ප්‍රකාශන

මුණසිංහ, ඉන්ද්‍රාණී.(1998).*පැරණි ලක්දිව කාන්තාව*,කර්තෘ ප්‍රකාශන

මේධානන්ද, එල්ලාවල හිමි.(2003).*පාචීනපස්ස උත්තරපස්ස,නැගෙනහිර පළාත් සහ උතුරු පළාතේ සිංහල බෞද්ධ උරුමය*,කොළඹ:දයාවංශ ජයකොඩි ප්‍රකාශන

රත්නපාල, නන්දසේන(1986).*සමාජ විද්‍යාවේ මූලධර්ම*,කොළඹ:ලේක් හවුස් ඉන්වෙස්ට්මන්ට් සමාගම

විජයතුංග, හරිස්චන්ද්‍ර සංස්කරණය.(1998).*නීති නිඝණ්ඩුව*,කොළඹ:එස්.ගොඩගේ සහ සහෝදරයෝ

සංජීව, ඒ.එච්.අයි සහ සිරිවර්ධන, චමිලා.(2018).*ශ්‍රී ලංකාවේ පූර්ව යටත් විජිත සමයේ සිට විවාහ සංස්ථාවෙහි සිදුවූ විවිධ වෙනස්කම්*,_____

සිල්වා, කාලිංග, ටියුඩර්.(2005).*කුලය,පන්තිය සහ ලංකාවේ සමාජ ගැටුම්*,බොරලැස්ගමුව:විසිදුණු ප්‍රකාශකයෝ,

සිල්වා, එම්.යූ.ද.(1998).*ශ්‍රී ලංකාවේ කුල වැඩවසම් ක්‍රමය*,නාවල:කර්තෘ ප්‍රකාශන

සිල්වා,කාලිංග,ටියුඩර්.(1997).*කුලය,පන්තිය සහ වෙනස්වන ලංකා සමාජය*,කොළඹ:එස්.ගොඩගේ සහ සහෝදරයෝ

Devindra, Ratnakar.(2014).The study of Caste, Marriage and family system in India,India:Gulbarga University

Jayawardena, Kumari.(2001).*Nobodies to Somebodies – The Rise of the Colonial Bourgeoisie in Sri Lanka*,New Delhi: Leftword books

Jiggins, Janice.(1979).*Cast and Family in the Politics of the Sinhala 1947-1976*,Colombo:K.V.G.De Silva and Sons Colombo Ltd

Karunanayake, Nandana.(2000).*Changing patterns of Marriage in Sri Lanka*, Nugegoda; The Institute for professional Development

Mendis, G.C.(1940).*Early History of Ceylon,* Calcutta:Y.M.C.A.Publishing House

Tambiah,S.J.(1965).‘Kinship: Fact and Fiction in Relation to the Kandyan Sinhalease,’Journal of the Royal Anthropological Institute, Vol.95

Yalman, Nur.(1971).Under the Bo Tree:Kinship and Marriage in the Interior of Ceylon, USA:University of California Press

# සමාජ විග්‍රහ

විමර්ශිත සංග්‍රහය
REFEREED JOURNAL
පළමු කාණ්ඩය, නවවන වෙළුම - 2022
ISSN 2362-0978 (print ISSN)
ISSN 2756-925X (e-ISSN)

ලිපි අංක 05

## මහාචාර්ය එස්. ජේ තම්බයියා (1929-2013) සමග පැවති සාකච්ඡාවක්.

**මරිසා පෙයිරානෝ**

**පරිවර්තනය**
එල්. කේ. බමුණු ආරච්චි[7]
https://orcid.org/0000-0003-3314-3844
ආර්. එම්. ආර්. එස්. රාජපක්ෂ[8]
https://orcid.org/0000-0002-2665-3056

*ප්‍රධාන සංස්කාරක*
ප්‍රේමකුමාර ද සිල්වා
*සහය සංස්කාරක*
හිරුනි කළුආරච්චි

*සංස්කාරක උපදේශක මණ්ඩලය*

එස්.ටී.හෙට්ටිගේ (සම්මානිත මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
කාලිංග ටියුඩර් සිල්වා (සම්මානිත මහාචාර්ය) පේරාදෙණිය විශ්වවිද්‍යාලය
කේ.කරුණාතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) කැලණිය විශ්වවිද්‍යාලය
සරත් අමරසිංහ (සම්මානිත මහාචාර්ය) රුහුණ විශ්වවිද්‍යාලය
යසාංජලී ජයතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
චන්ද්‍රසිරි නිරිඇල්ල (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
සුභාංගි හේරත් (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
නිශාර ප්‍රනාන්දු (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
ෆර්සානා හනීෆා (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
ඉරේෂා ලක්ෂ්මන් (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
*භාෂා සංස්කරණය*
නාලක ජයසේන
*පරිසැලසුම් නිර්මාණය*
ප්‍රභාත් ගලගමගේ
හිරුනි කළුආරච්චි

[7] බී. ඒ. (කොළඹ), සහකාර කථිකාචාර්ය, සමාජවිද්‍යා අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය.
[8] බී. ඒ. (කොළඹ), සහකාර කථිකාචාර්ය, සමාජවිද්‍යා අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

# සමාජ විග්‍රහ

**විමර්ශිත සංග්‍රහය**
**REFEREED JOURNAL**
**පළමු කාණ්ඩය, නවවන වෙළුම - 2022**
**ISSN 2756-925X (e-ISSN)**
**ISSN 2362-0978 (print ISSN)**

This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License.

දැනුම වෙත ප්‍රවේශ වීමේ සීමා අතික්‍රමණය සඳහා ලොව බොහෝ ශාස්ත්‍රාලයීය ප්‍රකාශන සම්ප්‍රදායික ප්‍රකාශන අයිතිය පිළිබඳ නෛතික ආකෘතියෙන් විකල්ප ආකෘතියක් වන පොදු නිර්මාණ බලපත්‍ර ක්‍රමයට සංක්‍රමණය වී / වෙමින් ඇත. මේ අනුව විචාරාත්මක දැනුමට විවෘත ප්‍රවේශයක් ලබා දීමේ අරමුණින් "සමාජ විග්‍රහ" විමර්ශිත සංග්‍රහය, නිකුත් වන්නේ ඉහත පොදු නිර්මාණ බලපත්‍රය යටතේය.

## ලිපි විමර්ශක මණ්ඩලය

*මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*මහාචාර්ය ෆර්සානා හනීෆා, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*මහාචාර්ය එම්.ටී.එම් මහීස්, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*මහාචාර්ය සමන්ත හේරත්, සන්නිවේදන සහ නිර්මාණාත්මක කලා අධ්‍යනංශය, කොළඹ විශ්වවිද්‍යාලය*

*කථිකාචාර්ය චමත්කා පද්මසිරි කාරියවසම්, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*කථිකාචාර්ය ක්‍රිෂාන් සිරිවර්ධන, සන්නිවේදන සහ නිර්මාණාත්මක කලා අධ්‍යනංශය, කොළඹ විශ්වවිද්‍යාලය*

## ප්‍රකාශනය

සමාජ විද්‍යා අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ-03
දුරකථනය/ෆැක්ස්: 011-2500452
විද්‍යුත් තැපැල: samajaviggraha@soc.cmb.ac.lk
වෙබ් අඩවිය: https://arts.cmb.ac.lk/sociology/

**අවිච්ඡින්නතාව, අනුකලනය සහ සීමා ප්‍රසාරණය**[9]

ස්ටැන්ලි ජේ. තම්බයියා හාවඩ් විශ්වවිද්‍යාලයේ මානව විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙකි. ලංකා විශ්වවිද්‍යාලයෙන් සිය ප්‍රථම උපාධිය ලබාගන්නා ඔහු වර්ෂ 1954 දී කෝනෙල් විශ්වවිද්‍යාලයෙන් සිය දර්ශනසූරී උපාධිය ලබාගත්තේය. වර්ෂ 1960 සිට 1963 දක්වා කාලයේ යුනෙස්කෝ සංවිධානයේ තාක්ෂණික සහායක විශේෂඥයෙකු වශයෙන් තායිලන්තය වෙනුවෙන් සේවය ලබා දුන් ඔහු අනතුරුව කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයට සම්බන්ධ වී වසර දහයක් වැනි කාලයක් එහි ඉගැන්වීම් කටයුතු සිදු කළේය. එම කාලයේ දී ම ඔහු කින්ග්ස් කොලීජිය සම්බන්ධ කටයුතු ද කළේය. වර්ෂ 1973 දී චිකාගෝ විශ්වවිද්‍යාලයට ද මහාචාර්යවරයෙක් වශයෙන් සම්බන්ධවන ඔහු වර්ෂ 1976 දී හාවඩ් විශ්වවිද්‍යාලයට ද සම්බන්ධ වී කටයුතු කර තිබේ.

වර්ෂ 1956-59 කාලයේ තම්බයියා ශ්‍රී ලංකාවේ ක්ෂේත්‍ර අධ්‍යයන ආරම්භ කළේය. 1960 වර්ෂයේ සිට ඔහු සිය අධ්‍යයන තායිලන්තය සම්බන්ධයෙන් කේන්ද්‍රගත කළේය. තායිලන්තය සම්බන්ධයෙන් ඔහු නිබන්ධන තුනක් ලියා පළ කොට තිබේ. නැවතත් 1983 වර්ෂයේ සිට ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඔහු උනන්දුවක් දැක්වීමට පටන් ගනී. මතු දැක්වෙන ග්‍රන්ථ සම්බන්ධයෙන් ඔහු සිය කර්තෘත්වය දරයි. Buddhism and the Spirit Cults in Northeast Thailand (1970), World Conqueror and World Renouncer.A study of Religion and Polity in Thailand against a Historical Background (1976), The Buddhist Saints of the Forest and the Cult of Amulets. A study in Charisma, Hagiography, Sectarianism and Millenial Buddhism (1984), Culture, Thought and Social Action (1985), Sri Lanka: Ethnic Fratricide and the Dismantling of Democracy (1986), Magic, Science, Religion and the Scope of Rationality (1990), Buddhism Betrayed? Religion, Politics and Violence in Sri Lanka (1992). ඔහුගේ මෑතකාලීන ම ග්‍රන්ථය වන Leveling Crowds. Ethnonationalist Conflicts and Collective Violence in South Asia යන ග්‍රන්ථය 1996 දී ප්‍රකාශයට පත් විය.

තම්බයියා ආසියානු අධ්‍යයන පිළිබඳ සංගමයේ සභාපති වශයෙන් කටයුතු කර තිබේ (1989-1990). එමෙන්ම ඔහු විද්‍යාව පිළිබඳව වන ජාතික ඇකඩමියේ සාමාජිකයෙක් ද විය (1994). එමෙන්ම ජාත්‍යන්තර අර්බුද මැඩපැවැත්වීම සම්බන්ධයෙන් වන ජාතික පර්යේෂණ කවුන්සිලයේ කමිටු සාමාජිකයෙකු ද විය (1995).

මෙහි ඉදිරිපත් කර ඇති සංවාදය සිදු වූයේ තම්බයියා බ්‍රසීලයට සිදු කළ සංචාරයෙන් අනතුරුව ඔහු යළි පැමිණ 1996 වර්ෂයේ නොවැම්බර් 26 දින දී ය. මෙම සංවාදය හාවර්ඩ් විශ්වවිද්‍යාලයේ විලියම් ජේම්ස් ශාලාවේ දී සිදු විය. බ්‍රසීලයේ දී තම්බයියා විසින් සිදු කරන ලද දේශනයේ පෘතුගීසි පරිවර්තනය Mana, vol. 3 (2): 199-219, 1997. හි ඇතුළත් ව තිබේ.

---

[9] Tambiah, S. (1997). *SÉRIE ANTROPOLOGIA 230 Continuity, integration and expanding horizons*. http://marizapeirano.com.br/entrevistas/stanley_tambiah.pdf යන ලිපියේ පරිවර්තනයක්.

**Tambiah:**

මාගේ අලුත් ම ග්‍රන්ථයේ වර්තමානයේ දේශපාලනය ගොඩනැගීමේ එක් ක්‍රමයක් වශයෙන් සාමූහික ප්‍රචණ්ඩත්වයේ වර්ධනයට අදාළව සාකච්ඡා සිදු කරනවා. මෙම ගැටලු සම්බන්ධයෙන් වන වසර ගණනාවක මාගේ අදහස් මෙහි ඉදිරිපත් කර තිබෙනවා.

**Mariza Peirano:**

මම රොබට් බොරොෆ්ස්කි විසින් සංස්කරණය කරන ලද ග්‍රන්ථයට ඔබ ලියූ බුද්ධිමය මූල (Intellectual Roots) ලිපිය කියවමින් සිටියා. එහි දී මට පැහැදිලි වූ කරුණක් වන්නේ ඔබ ගිය බොහෝ ස්ථානවල දී ඔබ නිරන්තරයෙන් වැදගත් බුද්ධිමය සංවාද සහ අදහස් හුවමාරු කර ගැනීම් සිදු කළා, නමුත් ඔබ හාවඩ් විශ්වවිද්‍යාලයට සම්බන්ධ වූ විට එම සංවාද, සාකච්ඡා සහ අදහස් හුවමාරු කර ගැනීම් අතුරුදහන් වුණා.

**Tambiah:**

මම වර්ෂ 1976 හාවඩ් විශ්වවිද්‍යාලයට පැමිණි විට මගේ මනසේ බල පවත්වමින් තිබුණු යම් නිශ්චිත ගැටලු කිහිපයක් පැවතුණා. මම කාලයක් තිස්සේ විවිධ බුද්ධිමය බලපෑම් උරාගෙන තිබුණා. නමුත් දැන් මම මට ම ආවේණික වූ ස්වාධීන පර්යාලෝකයක් සංස්ලේෂණය කරගන්නට සූදානම්. නමුත්, ඒක නෙමෙයි... ඔබට මතක ද මම යම් කාලයකට ඉහත දී සාදෘශ්‍ය සහ අනන්‍යතා සම්බන්ධතා (analogy and identity relations) සම්බන්ධයෙන් මා විසින් ලියන ලද රචනාවක් ඔබට පෙන්නුවා. එය මගේ පැරණි අධ්‍යයන තේමාවක දිගුවක් වශයෙන් හඳුන්වා දෙන්න පුළුවන්. දැන් එය මුද්‍රණයේ පවතිනවා. නමුත් තවමත් එහි මුද්‍රණ කටයුතු අවසන් වී නැහැ.

**සම්මුඛ සාකච්ඡාව**

**Mariza Peirano:**

මට ඔබගෙන් ඇසිය යුතු එක් ප්‍රධාන ප්‍රශ්නයක් තියෙනවා. එය මම මෙලෙසින් පෙළගස්වන්නම්. ඔබ ඔබව මානව විද්‍යාඥයෙකු වශයෙන් හඳුනාගත්තේ කවදා ද?

**Tambiah:**

කෝනේල් විශ්වවිද්‍යාලයෙන් මාගේ දර්ශනපති උපාධිය සම්පූර්ණ කරන විට මම සමාජ විද්‍යාව, මානව විද්‍යාව, සහ සමාජ මනෝවිද්‍යාව යන විෂය සංකලනයන් හදාරමින් සිටියා. එම අවධිය දෙවන ලෝක යුද්ධය අවසන් වූ කාලයයි. එම අවධියේ දී බොහෝ දෙපාර්තමේන්තු යට කී විෂය සංකලනය කරමින් ඉගැන්වීම් කටයුතු ආරම්භ කළා. මගේ දර්ශනපති උපාධිය මා සම්පූර්ණ කළ වකවානුව වන විට මම මාව සමාජ විද්‍යාඥයෙක් වශයෙන් හඳුනාගෙන තිබුණා. කෝනෙල් විශ්වවිද්‍යාලයේ මාගේ ප්‍රධානතම ගුරුවරයා වූ රොබින් විලියම්ස් සමාජ විද්‍යාඥයෙකු වුණා. ඔහු ටැල්කොට් පාසන්ස්ගේ ශිෂ්‍යයෙක්. ඒ වගේම රොබට් මර්ට්න්ව ළඟින්ම ඇසුරු කළ කෙනෙක්. නමුත් මගේ උනන්දුව ගොඩක් ම පැවතුණේ මානවවිද්‍යාවට. මම මානවවිද්‍යාව සම්බන්ධයෙන් එවකටත් සැලකිය යුතු මට්ටමින් අධ්‍යයනයන් සිදු කර තිබුණා. මගේ උපාධි නිබන්ධය සමාජ විද්‍යාත්මක සහ මානව විද්‍යාත්මක මාන ද්විත්වය ඔස්සේම සිදු කළ ශ්‍රී ලංකාව පිළිබඳ අධ්‍යයනයක්.

**Mariza Peirano:**

ඔබගේ උපාධි නිබන්ධය වූයේ කුමක් ද?

**Tambiah:**

මාගේ නිබන්ධය කිසිම දිනෙක ප්‍රකාශයට පත් වූයේ නෑ. මගේ නිබන්ධය ආරම්භ වූයේ සමාජ විද්‍යාඥයෙකු වූ බ්‍රයිස් රයන්ගේ මග පෙන්වීම යටතේ. ඔහු දෙවන ලෝක යුද්ධය අවසානයේ දී මම ලංකා විශ්වවිද්‍යාලයට ඇතුළත් වන විට ශ්‍රී ලංකාවට පැමිණියා. බ්‍රයිස් රයන් ලංකා විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව පිහිටවීමේ අරමුණෙන් ලංකාවට ආරාධනා කරනු ලැබූ ඇමරිකානු ජාතිකයෙක්. ඔහුගේ පැමිණීමත් සමග ලංකා විශ්වවිද්‍යාලයේ පළමු වරට සමාජ විද්‍යාව සහ මානව විද්‍යාව ඉගැන්වීම ආරම්භ වෙනවා. මම උපාධි අපේක්ෂකයෙක් වශයෙන් ආර්ථික විද්‍යාව එවකට හදාරමින් සිටියා. නමුත් මම සමාජවිද්‍යාවයි මූලික වශයෙන් හදාරමින් සිටියේ. බ්‍රයිස් රයන් හාවර්ඩ් විශ්වවිද්‍යාලයෙන් පැමිණි අයෙක්. එමෙන්ම ඔහු ටැල්කොට් පාසන්ස්ගේ ශිෂ්‍යයෙක් වගේ ම රොබට් මර්ටින්ගේ සමකාලීනයෙක් ද වුණා. මම බ්‍රයිස් රයන්ගේ බලපෑම මත ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ක්ෂේත්‍ර අධ්‍යයන සිදු කළා. එමෙන්ම මෙම අවදියේ දී මම රොබට් රෙඩ්ෆීල්ඩ්ගේ ගැමි-නාගරික සන්තතිය (folk-urbun continuum) පිළිබඳ සැලකිය යුතු මට්ටමක උනන්දුවක් දැක්වූවා. රොබට් රෙඩ්ෆීල්ඩ් පසුකාලීනව දකුණු ඉන්දියානු ශිෂ්ටාචාර පිළිබඳවත් යම් උනන්දුවක් දැක්වූවා. මගේ උපාධිය නිබන්ධය ප්‍රජා කණ්ඩායම් ත්‍රිත්වයක් මත පදනම් වූවක්. මේ ප්‍රජා කණ්ඩායම් ත්‍රිත්වය නම් වශයෙන් සඳහන් කළොත් එක් ප්‍රජා කණ්ඩායමක් කොළඹ අගනුවර ප්‍රදේශයට ආසන්නව ස්ථානගත වූ ප්‍රජාවක් වුණා. අනෙක් ප්‍රජා කණ්ඩායම උඩරට ප්‍රදේශයේ තේ වතු ආශ්‍රිතව ජීවත් වූ ප්‍රජාවක්. අවසාන ප්‍රජා කණ්ඩායම ගැමි ජනපදීකරණය යටතේ ඉඩම් ලබාගත් ප්‍රදේශවල ජීවත් වූ කණ්ඩායමක්. ප්‍රජා කණ්ඩායම් අධ්‍යයනය කිරීමේ දී ප්‍රශ්නාවලි ක්‍රමය මෙන්ම සහභාගිත්ව නිරීක්ෂණ යන ක්‍රම යොදා ගත්තා. මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ මෙම ප්‍රජා කණ්ඩායම් ත්‍රිත්වයම රොබට් රෙඩ්ෆීල්ඩ් හඳුනාගත් ගැමි-නාගරික සන්තතිය තුළ ස්ථානගත වන ආකාරය හඳුනා ගැනීම සහ මෙම ප්‍රජා කණ්ඩායම් ත්‍රිත්වය තුළ කොපමණ දුරකට රෙඩ්ෆීල්ඩ්ගේ අභ්‍යුපගමන දැකිය හැකි ද යන්න තේරුම් ගැනීම. මෙම අධ්‍යයනය කිසිම දිනෙක ප්‍රකාශයට පත් නොවූවත් මෙම අධ්‍යයනය සම්බන්ධයෙන් මා හා බ්‍රයිස් රයන් දෙදෙනා ම එකතුව ලියන ලද ලිපියක් ඇමෙරිකානු සමාජ විද්‍යාඥයන්ගේ සඟරාවේ පළ වී තිබෙනවා.

මම මානව විද්‍යාඥයෙක් බවට පත්වූයේ කවදා ද? මට මතක් කරන්න පුළුවන් ඒ දෛවෝපගත වර්ෂය 1955 හෝ 1956 කියලා. එවකට මම කෝනෙල් විශ්වවිද්‍යාලයේ සිට ශ්‍රී ලංකාවට පැමිණි අලුතයි. එම දිනවල මම යම් ක්ෂේත්‍ර අධ්‍යයන කිහිපයක් පටන් ගත්තා. ආර්ථික විද්‍යාඥයෙකු වූ එන්. කේ. සර්කාර්ගේ සහයෝගය ද ඇතිව අපි උඩරට ප්‍රදේශයේ ආර්ථික සාධකවල බලපෑම පිළිබඳව යම් අධ්‍යයනයක් සිදු කළා. එහි දී ඉඩම් භුක්තිය, ස්වාමි සහ අඳගොවි සම්බන්ධතා, ඉඩම් භුක්තියේ රටා වැනි කාරණා කෙරෙහි අවධානය යොමු කළා. සර්කාර් සමග සිදු කළ මෙම අධ්‍යයනයට මම මගේම ක්ෂේත්‍ර අධ්‍යයන ද සම්බන්ධ කරගනිමින් එම ප්‍රදේශයේ ඥාතීත්ව ව්‍යුහය සහ සංවිධානය පිළිබඳව සාම්ප්‍රදායික මානව විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කිරීම ආරම්භ කළා. එම කාල වකවානුවේ දී තමයි මට එඩ්මන් ලීච් මුණගැසෙන්නේ. ලීච් එවකට 1954 දී ඔහුගේ පුල්එළිය පිළිබඳ අධ්‍යයනය අවසන් කොට තිබුණා. මේ වන විට මමත් මගේ පළමු ඥාතීත්ව මානවවංශලේඛය සම්පූර්ණ කර තිබුණා. එමෙන්ම ඥාතීත්වය සහ ඉඩම් භුක්තිය සම්බන්ධයෙන් යම් පර්යේෂණ පත්‍රිකා ප්‍රමාණයක් ද ලියා අවසන් කොට තිබුණා. මගේ පළමු පර්යේෂණ පත්‍රිකාව එඩ්මන්ඩ් ලීච්ගේ අනුග්‍රාහකත්වය යටතේ ප්‍රකාශයට පත් කරන්නට මට හැකි වුණා. එය The structure of kinship and its relationship to land possession and residence ලෙසින් හැඳින්වූවා. එමෙන්ම මා විසින් මීට සමගාමීව ම

සිදු කරන ලද සමීක්ෂණය The Disintergrating Village; Report of a Socio-economic Survey ලෙසින් හැඳින්වූවා. එය 1957 දී ප්‍රකාශයට පත්වුණා.

නමුත් ලීච් මෙකී සමීක්ෂණයට කැමැත්තක් දැක්වූයේ නැහැ. ඔහු ප්‍රකාශ කළා 'තම්බයියා යනු ප්‍රතිභාපූර්ණ මානව විද්‍යාඥයෙක් බව'. ලීච් සමීක්ෂණ දත්ත මත පදනම්ව සිදු කරන ප්‍රමාණාත්මක අධ්‍යයනවලට අකැමැත්තක් පළකළා. නමුත් ඔහු සතුව මා විසින් ලියා පළකළ The structure of kinship and its relationship to land possession and residence ලිපිය පැවතියා. ඔහු එයට කැමැත්තක් දැක්වූවා. ඔහු නැවත කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයට පැමිණි විට ඔහු මට සඳහන් කළේ මම එම ලිපිය *JRAI*හි ප්‍රකාශයට පත් කළ යුතු බවයි. එම අවධිය වන විට මා තේරුම් ගෙන සිටියා මා තුළ මානව විද්‍යාව සම්බන්ධයෙන් සුවිශේෂී උනන්දුවක් පවතින බව. මිනිසුන් සමග සහභාගි නිරීක්ෂණ සිදු කිරීමට, මිනිසුන් සමග සංවාද පැවැත්වීමට, වත්පිළිවෙත් අධ්‍යයනය කිරීමට, විවිධ සන්දර්භ තුළ සිදු වන ක්‍රියාකාරකම් අධ්‍යයනය කිරීමට මා තුළ සුවිසල් උනන්දුවක් පැවතුණා. එවන් අධ්‍යයන සමීක්ෂණ තුළින් සිදු කළ නොහැකියි. මේ ආකාරයෙන් මා තුළ පවත්නා සැඟවුණු උනන්දුව සහ ආශාව ලීච් මතුකර දුන්නා.

**Mariza Peirano:**

එහෙනම් අපිට කියන්න පුළුවන් ද ලීච් ඔබව සුජාත මානව විද්‍යාඥයෙකු බවට පත් කළා කියලා?

**Tambiah:**

මම එය එලෙසින්ම ප්‍රකාශ කරන්නේ නැහැ. මොකද ලීච් කියන්නේ මට ආගන්තුකයෙක්. මට ඔහුව පළමු වරට මුණගැහෙන්නේ වර්ෂ 1956 එක්තරා සන්ධ්‍යාවක ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයට පැමිණි විට. අපි එකිනෙකා සමග කථා කළා. එමෙන්ම මම ඔහුට මගේ මෑතකාලීන ලිවීම් පිළිබඳව සඳහන් කළා. ඔහුට මම ඒවා පෙන්නුවා. අනතුරුව ඔහු මගේ සමීක්ෂණය පිළිබඳ යම් විවේචනයක් ඉදිරිපත් කළා. නමුත් ඔහු මගේ පර්යේෂණ පත්‍රිකාවට අනුග්‍රහය ලබාදුන්නා. ඉන් අනතුරුව මට තායිලන්තයට පිටත්ව යන්න සිදු වුණා. මම 1960 දී තායිලන්තයට පිටත්ව යාමට පෙර 1957 දී ගණනාත් ඔබේසේකර පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මානවවිද්‍යා දෙපාර්තමේන්තුවට සම්බන්ධ වුණා. ගනනාත් ඔබේසේකර වොෂින්ටන් විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලැබූ අයෙක්. එමෙන්ම ඔහු මැල්ෆර්ඩ් ස්පයිරෝ  යටතේ මනෝවිශ්ලේෂණ න්‍යාය ගැඹුරින් අධ්‍යයනය කර තිබුණා. ඔහුගේ පර්යාලෝකය මාගේ පර්යාලෝකයෙන් සහමුලින් ම වෙනස්. ඔහු ලංකාවට පැමිණෙන විට මම පේරාදෙණි විශ්වවිද්‍යාලයේ වැඩකරමින් සිටියා. අපි තීරණය කළා අපි දෙදෙනා සමග එකට එකතු වී මානව විද්‍යාත්මක පර්යේෂණයක් සිදු කරන්න. ඒ අනුව අපි නුවර ප්‍රදේශයේ මාතලේ දිස්ත්‍රික්කයේ පාතදුම්බර යන ග්‍රාමය තෝරාගත්තා. මේ මානව විද්‍යාත්මක අධ්‍යයනය මාගේ ප්‍රථම මානව විද්‍යාත්මක අධ්‍යයනය ලෙස හඳුන්වා දෙන්න පුළුවන්. එම අධ්‍යයනය සඳහා ඔබේසේකරත් මමත් අප එවකට පුහුණු කරමින් සිටි ශිෂ්‍යයන් කිහිප දෙනෙකුත් සම්බන්ධ වුණා. අපි එම ගම්මානයේ කාලයක් ජීවත් වුණා. ජීවත් වෙමින් ක්ෂේත්‍ර අධ්‍යයන සිදු කළා. නමුත් අපට ඉතාමත් අවම මූල්‍ය පහසුකම් තමයි තිබුණේ. මට සඳහන් කරන්න පුළුවන් එම අවස්ථාව තමා මාව ස්ථිරවම මානව විද්‍යාඥයෙකු බවට පත් කළේ කියා.

**Mariza Peirano:**

ඔබේසේකර නිරන්තරයෙන්ම ඔහුව මානව විද්‍යාඥයෙකු වශයෙන් හඳුන්වා දුන්නා ද?

**Tambiah:**

ඔව්, මනෝවිශ්ලේෂණාත්මක මානව විද්‍යාඥයෙක් වශයෙන්. ඒ වගේම ඔහු ඉතාමත්ම වෙනස් පර්යාලෝක කෙරෙහි ලොකු උනන්දුවක් දැක්වූ අයෙක්. නමුත් අපි දෙදෙනා ම එකට එකතු වී වැඩ කළා. අපි දෙදෙනා එවකට ශ්‍රී ලංකාවේ පැවති බහුපුරුෂ සේවනය සම්බන්ධයෙන් පර්යේෂණ පත්‍රිකාවක් ලියා පළ කළා. එය දීර්ඝ ලිපියක්. 1956 දී මම එවකට ශ්‍රී ලංකාවේ පළමු බහුකාර්ය ජල ව්‍යාපෘතිය වූ ගල්ඔය ව්‍යාපෘතිය ආශ්‍රිතව ජනාවාස ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් අධ්‍යයනය සිදු කළා. මම මගේ ශිෂ්‍යයන් සමග එහි ගොස් ඒ සම්බන්ධයෙන් පර්යේෂණ පත්‍රිකාවක් පවා ලියා පළ කළා. එම අවදියේ දී තමයි 1956 ලංකාවේ පළමු වාර්ගික අරගලය සිදුවුණේ. ඒ දිනවල අදාළ සිදුවීම පිළිබඳව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමාව දැනුවත් කරමින් මම දීර්ඝ වාර්තාවක් ලිව්වා. එම වාර්තාව මගේ අලුත් ම ග්‍රන්ථය වන Levelling Crowds හි ඇතුළත් කර තිබෙනවා. එහි 4 වන පරිච්ඡේදය වන 'නිදහසෙන් පසු ශ්‍රී ලංකාවේ වාර්ගික ගැටුම් දෙකක්' යන පරිච්ඡේදය තුළ ඔබට එය හඳුනා ගන්නට පුළුවන්. මම තවදුරටත් කථාව කරගෙන යන්න ද?

**Mariza Peirano:**

ඔව් කරුණාකරලා.

**Tambiah:**

මම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ කටයුතු සිදුකරමින් සිටින විට සිඩ්නි විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය පිළිබඳ මහාචාර්යවරයෙකු මෙන්ම මාගේ මිතුරෙකු ද වූ මහාචාර්ය හියු පිලිප් 1959 දී මා හට ලිපියකින් සඳහන් කළේ ඔහුව තායිලන්ත ආණ්ඩුව සහ යුනෙස්කෝ සංවිධානය එක්ව අනුග්‍රාහකත්වය සපයන පර්යේෂණ ආයතනයක අධ්‍යක්ෂ තනතුරට පත්කරනු ලැබූ බව යි. එමෙන්ම ඔහුට එම පර්යේෂණ ආයතනයේ මානව විද්‍යාඥයා වශයෙන් මාව සම්බන්ධ කරගැනීමට අවශ්‍යව තිබුණා. ඔහු සඳහන් කළ පරිදි තායිලන්ත ආණ්ඩුව එවකට සමස්ත තායිලන්තයට ම ප්‍රාථමික අධ්‍යාපනය හඳුන්වාදීමේ වැඩසටහනක් ආරම්භ කිරීමට සූදානම් වෙමින් සිටියා. මේ සම්බන්ධයෙන් ග්‍රාමීය ප්‍රදේශවල පසුබිම් තොරතුරු ඒකරාශී කරගැනීමට ඔවුන්ට අවශ්‍යව තිබුණා. ඒ අනුව තායිලන්තයට අවශ්‍ය කරන්නේ කවරාකාර විෂය නිර්දේශයක් ද යන්න තීරණය කිරීමට මානව විද්‍යාත්මක තොරතුරු ලබාගැනීම ඔවුන්ගේ අරමුණ වුණා. ඒ අනුව තමයි මම තායිලන්තයට යන්නට තීරණය කරන්නේ. මට තායිලන්තයට යන්නට ලැබුණු ආරාධනාව තවදුරටත් මෙලෙසින් විස්තර කරන්නම්.

මම කෝනෙල් විශ්වවිද්‍යාලයට පැමිණෙන්නේ වර්ෂ 1952 දී. ඇමරිකානු ශිෂ්‍යත්වයක් වන ෆුල්බ්‍රයිට් ශිෂ්‍යත්වය ලබාගත් ප්‍රථම කණ්ඩායමේ සමාජිකයෙක් වීමට මටත් හැකියාව ලැබුණා. මාත් සමගම ෆුල්බ්‍රයිට් ශිෂ්‍යත්වය ලබාගෙන ඕස්ට්‍රේලියාවෙන් පැමිණි ශිෂ්‍යයා වූයේ හියු පිලිප්. එමෙන්ම ලෝකයේ තවත් රටවල් ගණනාවකින් ෆුල්බ්‍රයිට් ශිෂ්‍යත්වය ලබා පැමිණි ශිෂ්‍යයන් රාශියක් අපත් සමග සිටියා. අපව පළමුවෙන්ම නම්නීකරණ වැඩසටහනකට යොමු කරනු ලැබුවා. එම නම්නීකරණ වැඩසටහනෙන් අරමුණු කළේ අපව ඇමෙරිකානු සංස්කෘතියට හඳුන්වාදීම යි. එම වැඩසටහන පැවැත්වූයේ බෙනින්ග්ටන් කොලීජියේ. මට පළමුවෙන්ම හියු පිලිප් මුණගැසෙන්නේ ඉහත කී බෙනින්ටන් කොලීජියේ දී. අපි හොඳ මිතුරන් බවට පත්වුණා. ඉන් අනතුරුව ඔහු හාවඩ් විශ්වවිද්‍යාලයට පැමිණියා. මම කෝනෙල් විශ්වවිද්‍යාලයට පැමිණියා. හියු පිලිප් ඕල්පෝට් නම් සමාජ මානව විද්‍යාඥයා සමග වැඩ කළා. අප හොඳ මිතුරන් බවට පත්වුණා. අප එකිනෙකා හමුවුණා. අපගේ කණ්ඩායමට තවත් එක් සාමාජිකයෙක් අයත් වුණා. ඔහු නෝර්වීජියානු සමාජ විද්‍යාඥයෙකු වූ රෙයිඩර් හාවී. ඔහු කෝනෙල් විශ්වවිද්‍යාලයට සම්බන්ධව සිටියා. අපගේ මිතුරුකම වඩාත් ශක්තිමත් බවට පත්වුණා. උපාධියෙන් අනතුරුව හියු පිලිප් ඕස්ට්‍රේලියාවට ගොස් රාජකාරි ආරම්භ කළා. ඔහු මට වඩා වයසින් වැඩිමල්.

ඕස්ට්‍රේලියාවේ සිටින අතරතුර දී තමයි ඔහුට තායිලන්තයේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ තනතුර ලබාගැනීමට ආරාධනා කරන්නේ. එහිදී ඔහු පළමුවෙන්ම සිතුවේ 'මට මානව විද්‍යාඥයෙක් අවශ්‍යයි. ඒ වෙනුවෙන් මම තම්බිට ආරාධනා කරනවා' කියලා.ඒ ආකාරයට යි මගේ තායිලන්ත ගමන සංවිධානය වෙන්නේ.

මට ලංකාවේ සංවර්ධන කටයුතු පිළිබඳව එතරම් ලොකු පැහැදීමක් තිබුණේ නෑ. මක්නිසාද එවකට ලංකාවේ ආරම්භ වෙමින් පැවති වාර්ගික අර්බුද නිසා. දෙමළ සිංහල ගැටලුව මේ අවධිය වන විට උග්‍රවෙමින් පැවතුණා. මම එහි ආරම්භය 1956 දී දුටුවා. මම මීට පෙර අවස්ථාවක සඳහන් කළ පරිදි ගල්ඔය අරගලයේ දී මම ඊට මැදිවුණා. එමෙන්ම 1958, 1960 යන වර්ෂයන් දෙකෙහි දී ද ගැටුම් ඇති වුණා. සිංහල බහුතරය දෙමළ සුළුතරය සම්බන්ධයෙන් අනුගමනය කළේ ප්‍රචණ්ඩත්වය යි. මෙම කාලයේ දී ම භාෂා ප්‍රශ්නයත් ලංකාවේ දේශපාලනයේ කොටසක් බවට පත්වුණා. බ්‍රිතාන්‍ය පාලන අවධියේ රාජ්‍ය පරිපාලනයේ භාෂාව වශයෙන් පිළිගැනුණේ ඉංග්‍රීසි භාෂාව යි. උගතුන්ගේ භාෂාව බවට පත්ව තිබුණේ ඉංග්‍රීසිය යි. කෙනෙක්ට ජාත්‍යන්තරයට යාමට අවශ්‍ය නම් ඔහුට ඉංග්‍රීසි භාෂාව සම්බන්ධයෙන් ප්‍රවීණත්වය ඇති කර ගැනීමට සිදු වුණා.

**Mariza Peirano:**

ඔබ ඉංග්‍රීසි කථා කිරීමට පටන් ගත්තේ කවදා සිට ද?

**Tambiah:**

ඉතාමත්ම කුඩා කාලයේ සිට. මොකද මම අධ්‍යාපනය ලැබූ පාසලේ මුල සිට ම ඉංග්‍රීසි භාෂාවෙන් අධ්‍යාපනය ලබා දුන්නා. ඒ වගේම මාගේ මව්බස වන දමිළ බස දෙවන භාෂාවක් වශයෙනුත් ඉගැන්නුවා. එවකට ලංකාවේ පැවති බොහොමයක් ප්‍රභූ පාසල්වල මූලික අධ්‍යාපනය ලබාදුන්නේ ඉංග්‍රීසි භාෂාවෙන්. ඒ ඔස්සේ එම පාසල් හොඳ සිවිල් සේවකයන්, වෘත්තිකයන් රටට දායාද කළා. ඔවුන් රටේ බලපෑම් සහගත ස්තරයක් බවට පත්වුණා. නමුත් නිදහසෙන් පසු ශ්‍රී ලංකාව තුළ විශේෂයෙන්ම සිංහල බහුතරය තුළ ජාතිකත්වය සම්බන්ධයෙන් සුවිසල් පිබිදීමක් ඇති වුණා. ඔවුන් තමන්ගේ අනන්‍යතාවට පුනර්ජීවනයක් ලබාදීම, සංස්කෘතිය යළි ස්ථාපනය කිරීම, ආගමික ප්‍රබෝධය යළි ස්ථාපනය කිරීම යන කාරණා කෙරෙහි අවධානය යොමුකරන්නට පටන් ගත්තා. මේ සියලු ම කාරණා පශ්චාත් නිදහස් ශ්‍රී ලංකාවේ දේශපාලනික ගැටලු වශයෙන් අපට හඳුනාගන්නට පුළුවන්. ශ්‍රී ලංකාව 1948 දී නිදහස ලබනවා. දැන් ශ්‍රී ලංකාවේ පරිපාලනය සම්බන්ධයෙන් සුවිසල් බලපෑමක් කරන ගැටලුවක් බවට භාෂා ප්‍රශ්නය පත්ව තිබෙනවා. ආරම්භයේ දී පැවති සටන් පාඨය වූයේ 'අපි මව් භාෂා දෙක ම තබාගමු' යන්න යි. නමුත් ටික කලකට පසු සිංහල බෞද්ධ බහුතරය සිංහල භාෂාව පමණක් රාජ්‍ය භාෂාව බවට පත් විය යුතු බවට අවධාරණය කරන්නට පටන් ගත්තා. එම අවස්ථාවේ දී තමයි දමිළ ජාතිකයන්ට තමන් සිංහල බහුතරය අතින් වෙනස් කොට සැලකීම්වලට ලක් වන බවට පළමුවරට වඩාත් තදින් අත්දකින්නට ලැබුණේ. මේ අවධියේ දී ම දමිළ ජනතාව සිය නිජබිම් ලෙසින් හඳුන්වා ගන්නා ප්‍රදේශවල සිංහල ජනපද ව්‍යාප්ත කිරීමකුත් ආරම්භ වුණා. 1959 වන විට ශ්‍රී ලංකාවේ සියලු ම විශ්වවිද්‍යාලවල ඉගැන්වීම් කටයුතු සිංහල භාෂාවෙන් සිදුකරන බවට ආණ්ඩුව තීරණයක් ගෙනාවා. එම තීරණය ව්‍යවස්ථාදායකය තුළ සම්මත වුණා. ඒ අනුව මට තේරුම් ගිය කාරණාව වූයේ ඉදිරියේ දී විශ්වවිද්‍යාල තුළ ඉගැන්වීම් කටයුතු මට සිංහල භාෂාවෙන් කිරීමට සිදුවන බව යි. නමුත් මා එයට එවකටත් සූදානම්ව සිටියේ නැහැ.

**Mariza Peirano:**

ඔබ සිංහල කථාකරනවා ද?

**Tambiah:**

මම සිංහල භාෂාව ප්‍රගුණකර නැහැ. මට ඒ සම්බන්ධයෙන් ලොකු උගත්කමක් නැහැ. වෘත්තීයමය වශයෙන් සිංහල භාෂාවෙන් මානව විද්‍යාව ඉගැන්වීම ආරම්භ කිරීම මාගේ සියලු ශක්තීන් දහනය කරන්නක් ලෙස මම දකිනවා. එම පියවර ගැනීමට මා කැමති වුවත් මට හැඟෙන දේ වන්නේ මාව ජාත්‍යන්තර දැනුම් පද්ධතියෙන් කපා දැමීමට මෙම තීරණය හේතු විය හැකි බව යි.

**Mariza Peirano:**

සිංහල භාෂාවෙන් මානව විද්‍යාව උගන්වන්න පුලුවන් ද?

**Tambiah:**

බටහිර භාෂාවලින් ලියැවී ඇති පොත් සිංහල සහ දමිළ යන භාෂාවන්වලට ප්‍රශස්ත මට්ටමින් පරිවර්තනය කිරීම මදක් අපහසු යි. ස්වදේශික භාෂාවලින් ඉගෙන ගත් ශිෂ්‍යයන්ගෙන් බහුතරය විශ්ව දැනුම සම්බන්ධයෙන් දුර්වල යි. ඔවුන්ට ලැබී ඇති අධ්‍යාපනය ඉතාමත්ම පටු අධ්‍යාපනයක්. ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම් ඉතාමත්ම පහළයි. මා ඉගෙන ගත් ලංකා විශ්වවිද්‍යාලය (පසුව පේරාදෙණි විශ්වවිද්‍යාලය) එවකට ඉහළ අධ්‍යාපන මට්ටමක් සහිත විශ්වවිද්‍යාලයක් වුණා. එය ලන්ඩන් විශ්වවිද්‍යාලයට අනුබද්ධව පැවතුණා. විභාග කටයුතු පවත්වනු ලැබුවේ ලන්ඩන් විශ්වවිද්‍යාලයේ බාහිර පරීක්ෂකවරුන් විසින්. ගණනාථ ඔබේසේකර, මම සහ තවත් උගතුන් ගණනාවක් ලංකා විශ්වවිද්‍යාලයෙන් පළමු උපාධිය ලබාගත්තා. කිසිවෙකුටත් බටහිරට ගොස් ඉංග්‍රීසි බසින් පශ්චාද් උපාධි හැදෑරීම කිසිදු ආකාරයක ගැටළුවක් වූයේ නෑ. මගේ ක්ෂේත්‍රයේ පමණක් නොවෙයි, ආර්ථික, දේශපාලන, ශුද්ධ විද්‍යා, ඉතිහාසය, සාහිත්‍ය යනාදී සෑම ක්ෂේත්‍රයක ම ඉංග්‍රීසි භාෂාවෙන් මුල් උපාධිය ලබාගත් විද්වතුන් කැපී පෙනෙන දක්ෂතා දැක්වූවා. එනිසා මට තේරුම් ගිය කාරණාව වූයේ රටේ දේශපාලන තීන්දු තීරණ සමග මා විසින් ගත යුතු හොඳ ම තීරණය රට හැරයාම බව යි. ඒ මොහොතේ දී තමයි මට තායිලන්තයට පැමිණෙන ලෙස ආරාධනාව ලැබෙන්නේ. ඒ අනුව 1960 දී මම තායිලන්තය බලා පිටත් වෙනවා.

**Mariza Peirano:**

ඔබ තායිලන්තයේ ආගම අධ්‍යයනය කරන්නට තීරණය කරන්නේ ඇයි? මේ තීරණය ඔබ තුළ පැවති මානවවිද්‍යාත්මක අධ්‍යයනයන් කෙරෙහි වූ උනන්දුව නිසා ඇති වූවක් ද? එසේ නැතිනම් ඔබගේ ම කුතුහලය නිසා ඇති වූවක් ද?

**Tambiah:**

ඇත්තෙන්ම තායිලන්තයේ දී මම ආගම පමණක් නෙමෙයි අධ්‍යයනය කළේ. මම ග්‍රාමීය ජීවිතයේ විවිධ පැතිකඩ ඇතුළත් වන පරිදි ක්ෂේත්‍ර අධ්‍යයන සංවිධානය කළා. මම ඥාතිත්වය, සමාජ සංවිධානය, කෘෂි ආර්ථිකය, ඉඩම් භුක්තිය, සහ යාතුකර්ම වැනි පැතිකඩ සම්බන්ධයෙන් තොරතුරු එකතු කළා. තවදුරටත් බොහෝ තායිලන්ත ගම්මානවල ආරාම සංකීර්ණ දක්නට ලැබුණු නිසා මම ආරාම, භික්ෂූන් වහන්සේලා, සහ මිනිසුන් අතර පැවති අන්තර්සම්බන්ධතාවත් අධ්‍යයනය කරන්න පෙළඹුණා. ඇත්තෙන්ම 1960-63 අතර කාලයේ දී මම තායිලන්තයේ ප්‍රජා කණ්ඩායම් තුනක් අධ්‍යයනය කළා. එක් ප්‍රජා කණ්ඩායමක් තායිලන්තයේ

බැංකොක් අගනුවර සිට කිලෝමීටර සීයක් පමණ ඈතින් පිහිටි තායිලන්තයේ මධ්‍යම නිම්නයේ ජීවත් වූ ප්‍රජාවක්. අනෙක් ප්‍රජාව ඊසානදිග තායිලන්තයේ ජීවත් වූ ප්‍රජාවක්. අවසාන ප්‍රජා කණ්ඩායම වූයේ උතුරුදිග තායිලන්තයේ ජීවත් වූ කණ්ඩායමක්. බොහෝ අවස්ථාවල මානව විද්‍යාත්මක අධ්‍යයනයන් සිදුකරන අය අදාළ ක්ෂේත්‍රයේ එක් පැතිකඩක් පමණක් අධ්‍යයනය කරන්න පෙළඹෙනවා. නමුත් මම මගේ පළමු අධ්‍යයනය වන තායිලන්තයේ මධ්‍යම නිම්නයේ ගම්මානය සම්බන්ධයෙන් සිදු කළ අධ්‍යයනය ග්‍රාමීය ජීවිතයේ විවිධ පැතිකඩ ඔස්සේ අධ්‍යයනය කළා. එම ගම්මානයේ ආර්ථිකය, ඥාතීත්ව ව්‍යුහය, පවුල් ජීවිතය, යාතුකර්ම සහ තවත් ගොඩක් දේවල් ඒ අධ්‍යයනය තුළ ඇතුළත් වෙලා තියෙනවා. තවමත් ඒ නිබන්ධය මා සතුව පවතිනවා. ඒ නිබන්ධය කිසිදිනෙක මුද්‍රණයට පත්වුණේ නෑ. එය කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ මුද්‍රණාලය විසින් ප්‍රකාශයට පත්කරන්නට භාරගනු ලැබුවා. වර්ෂ 1963 දී මම තායිලන්තයේ ඊසාන දිග ගම්මානය සම්බන්ධ කරගෙන මාගේ දෙවන නිබන්ධය ලිවීම ආරම්භ කළා

**Mariza Peirano:**

ඒ Buddhism and the Spirit Cult ද?

**Tambiah:**

Buddhism and the Spirit Cult in Northeast Thailand. මම මගේ දෙවන නිබන්ධය ඊසාන දිග තායි ගම්මානයේ යාතුකර්ම සහ ආගම පිළිබඳ අළලා රචනා කළා. මම කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ සිටින කාලය අතරතුර දී ලීච්ගේ ව්‍යුහාත්මක කෘත්‍යවාදය වැනි අදහස්වලට නැඹුරු වූවා. එම අවධියේ දී ව්‍යුහවාදය මතින් ව්‍යුහාත්මක කෘත්‍යවාදය නැගී එමින් තිබුණා. මේ ව්‍යුහාත්මක කෘත්‍යවාදී පර්යාලෝකය මට සුවිශාල බලපෑමක් එල්ල කළා. එබැවින් කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ මා සිටින කාලය අතරතුර දී තමයි මම Buddhism and the Spirit Cults in Northeast Thailand යන ග්‍රන්ථය ලියන්නේ. එම නිබන්ධය මා උසස් අධ්‍යයනයන් සඳහා වන කේන්ද්‍රයට සම්බන්ධ වූ අවස්ථාවේ දී සම්පූර්ණයෙන් ම ලියා අවසන් කරනවා.

**Mariza Peirano:**

මධ්‍යම තායිලන්තයේ ගම්මානය අළලා ඔබ විසින් ලියනු ලැබූ නිබන්ධයට සිදුවූයේ කුමක් ද?

**Tambiah:**

මධ්‍යම තායි ගම්මානය අළලා ලියූ නිබන්ධය වෙනම ක්‍රමවේදයක් ඔස්සේ රචනා කරපු නිබන්ධයක්. එකී නිබන්ධයේ ප්‍රතිඵල විදිහට බෝඩියෝගේ උපක්‍රමීය වරණ සහ භාවිතය (strategic choices and practices) බලාපොරොත්තු වුණා. තායි සමාජ සංවිධානය හරිම නම්‍යශීලීයි. (උදාහරණයක් ලෙස විවාහයක් සිදුකරගැනීමේ විවිධ ක්‍රම පවතිනවා) මට අවශ්‍ය වුණා තායි සමාජ සංවිධානයේ පවත්නා වාචික ප්‍රතිමානයන් යනු මොනවා ද යන්න පළමුව සඳහන් කරන්නට සහ ඒවා භාවිත වන්නේ කවරාකාරයෙන් ද යන්න දෙවනුව සඳහන් කරන්න. කවදාහරි මම එම නිබන්ධයත් ප්‍රකාශයට පත් කරාවි. කොහොම නමුත් ඊසාන දිග තායිලන්ත ගම්මානය සම්බන්ධයෙන් මා විසින් ලියනු ලැබූ නිබන්ධය පළමු නිබන්ධයට වඩා සහමුලින්ම වෙනස් අධ්‍යයනයක්. තායි ගම්මාන ත්‍රිත්වය සම්බන්ධයෙන්ම සුවිශාල තොරතුරු ප්‍රමාණයක් මම එකතු කළා. විශේෂයෙන්ම මෙම ගම්මාන ත්‍රිත්වයේ ම ද්වීපාර්ශ්වීය ඥාතීත්ව ව්‍යුහ පිළිබඳව මම අධ්‍යයනය කළා. නමුත් ඒවා පිළිබඳව ලියා තබන්නට මට ප්‍රමාණවත් තරම් කාලයක් පැවතියේ නෑ. ඒ මම අනෙකුත් දේවල් අධ්‍යයනය කරන්න යොමු වුණ නිසා.

**Mariza Peirano:**

ඉතින් ඔබ අනෙකුත් දේවල් අධ්‍යයනය කරන්න යොමු වුණා. ඔබ කොහොමද මේ සන්තතීන් දකින්නේ? එක් දෙයක් තවත් දෙයක් නිර්මාණය කරමින් අඛණ්ඩව ගමන් කරනවා?

**Tambiah:**

සන්තතියක් සහ විස්තාරණයක් පවතිනවා. මම ආගම අධ්‍යයනය කරන්නට පටන්ගත්තේ කොහොමද කියලා ඔබ විමසූ අවස්ථාවේ දී මට ඔබට එක් දෙයක් පවසන්නට අමතක උණා. මම ලංකාව හැරදා ආ අවස්ථාවේ දී ලංකාවේ සුළු ජාතිකයෙකු වශයෙන් මා අවබෝධ කරගත් එක් දෙයක් වූයේ බුද්ධාගම යනු කුමක් ද? යටත්විජිතවාදයට ප්‍රතිචාරයක් ලෙස බෞද්ධ පුනර්ජීවනය හඳුනාගන්නේ කෙසේ ද? සහ පශ්චාත් නිදහස් ශ්‍රී ලංකාවේ බෞද්ධ ජාතිකවාදය හඳුනාගන්නේ කෙසේ ද? යන කාරණා කෙරෙහි අවධානය යොමු කළ යුතු බව යි. ශ්‍රී ලංකාව තුළ දී මාව පරාරෝපණයට ලක් කළ කාරණා වූයේ ඉහත කී ගැටලු යි. ලංකාවේ දී මට සම්පූර්ණයෙන්ම බුදුදහම සහ එහි දේශපාලන ප්‍රකාශනය අධ්‍යයනය කරන්නට බැරි වුවත් එය මට තායිලන්තයේ දී සිදු කරන්නට හැකියාවක් ලැබුණා. Buddhism and the Spirit Cults in Northeast Thailand ග්‍රන්ථයේ දී මම උත්සාහ කරන්නේ ජනප්‍රිය ආගමක් වශයෙන් තායි ගම්මාන තුළ බුදුදහම කටයුතු කරන්නේ කවරාකාරයෙන් ද යන්න අවබෝධ කරගැනීම. මම බොහෝ අවස්ථාවල බුදු දහමේ යාතුකර්ම සහ එහි දේශපාලන ප්‍රකාශනය අධ්‍යයනය කරන්නට උත්සාහ කරන නිසා එම කාරණා අධ්‍යයනය කරන්නට තායිලන්තය ඉතාමත්ම හොඳ ක්ෂේත්‍ර භූමියක් බව මට හැඟී ගියා. Buddhism and the Spirit Cults in Northeast Thailand ග්‍රන්ථය තුළ දී තායි ගම්මානය මම මහා දේහයේ ක්ෂුද්‍ර සෛලයක් (village as a microcosm of the macrocosm) ලෙසින් හඳුනා ගත්තා. තායි ගම්මානය තුළින් සමස්ත තායි ශිෂ්ටාචාරය පිළිබඳව ම දළ අවබෝධයක් ලබාගන්නට හැකියාව තියෙනවා. මම වඩාත් ම උනන්දු වූයේ ශිෂ්ටාචාරයක් ගොඩනැගීමේ බලවේගයක් වශයෙන් බුදුදහම තායි ගම්මානයට සිදු කළ බලපෑම හඳුනාගැනීමටත් ගැමි ජීවිතයත් සමඟ බුදුදහම එකට ගෙතුණු ආකාරය සහ තායි ගම්මානයේ උත්සව දින දර්ශනයට බුදු දහම සිදු කළ බලපෑම හඳුනාගැනීමටත්. නමුත් බුදුදහම ආගමක් වශයෙන් සමාජය සහ එහි දේශපාලනය සමඟ බැඳී පවත්නා බව මා අවබෝධ කරගත්තා. එම කාරණාව අවබෝධ කරගැනීම සම්බන්ධයෙන් මාගේ ක්ෂේත්‍ර අධ්‍යයනවල විෂය පථය තවදුරටත් පුළුල් කළ යුතු බව මට හැඟී ගියා. එහි ප්‍රතිඵලයක් ලෙසින් තමයි World Conqueror and World Renouncer ග්‍රන්ථය මා ලිවීම ආරම්භ කරන්නේ. එම ග්‍රන්ථය තුළ තායිලන්තයේ බුදුදහම ජාතික තලය තුළ සිදු කරන සාමූහික ප්‍රකාශනය අධ්‍යයනය කොට තිබෙනවා.

ඉහත අධ්‍යයනය සිදුකරන විට මට ඉතිහාසය සහ මානව විද්‍යාව යන විෂයයන් ද්විත්වය සමඟ ම සම්බන්ධවීමට සිදු වුණා. අතීතයේ දී ආරාමීය පර්යාය තුළ බුදුදහම ආගමක් වශයෙන් රටේ රාජ්‍යත්වයට සහ දේශපාලනයට සම්බන්ධ වූයේ කවරාකාරයෙන් ද යන කාරණාව අධ්‍යයනය කිරීමේ දී මට ඉතිහාසය වෙත පියමැනීමට සිදුවුණා. විශ්වීය රජෙක් පිළිබඳව වන බෞද්ධ සංකල්පය අග්නිදිග ආසියානු රටවල්වල රාජ්‍යත්වය ගොඩනැගීමේ දී තීරණාත්මක වුණා. මෙම ඓතිහාසික සන්දිස්ථානය ඔස්සේ මම තායිලන්තයට පැමිණියා. තායිලන්තයේ බුදුදහම සහ දේශපාලනයේ ඉතිහාසය පිළිබඳව දළ සැකැස්මක් සකස්කරගත්තා. මාගේ අධ්‍යයනයේ දී මට පෙනී ගිය කාරණාව වූයේ ආරාමීය චල්‍යතාව ඔස්සේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා ග්‍රාමීය ප්‍රදේශවල සිට බැංකොක් අගනුවර දක්වා සංක්‍රමණය වීම ආරම්භ කොට තිබූ බව යි.

ඉහත අධ්‍යයනයේ දී මම තායි භික්ෂූන් වහන්සේලා රාජ්‍යයේ දේශපාලන සහ ආගමික කේන්ද්‍රස්ථානයන් වෙත ගමන් ගත් මාර්ගය සියුම්ව අධ්‍යයනය කරන්නට පටන්ගත්තා. එමෙන්ම ආරාමීය දේශපාලනය සහ තායි භික්ෂූන් වහන්සේලා අතර පවත්නා අන්තර්සම්බන්ධතාව සිතියම් ගතකිරීමටත් පටන්ගත්තා. මෙහි දී මා විසින්

Galactic polity යන නමින් හඳුන්වා දුන් සංකල්පය පැන නැගුණා. Galactic polity යන සංකල්පයෙන් අදහස් කරන්නේ පූර්ව යටත්විජිත අවධියේ පැවති දේශපාලන සම්ප්‍රදාය යි. එමෙන්ම 19 වන සියවසෙන් පසු මෙම Galactic polityයන සංකල්පය Radial polity යන තත්ත්වයට වෙනස් වූ ආකාරයත් මෙම අධ්‍යයනය තුළ මා සැකෙවින් ඉදිරිපත් කර තිබෙනවා. තායි භික්ෂූන් වහන්සේලා පිළිබඳව අධ්‍යයනය කරන විට පැහැදිලිව ම ඔවුන් රාජ්‍යත්වය, රාජ්‍ය දේශපාලනය මෙන්ම රාජ්‍ය දේශපාලන ව්‍යුහය සමඟ බැඳී ඇති ආකාරය මට පෙනී ගියා. මෙහ දී තායි භික්ෂු සම්ප්‍රදාය තුළ තවත් එක් භික්ෂු ශාඛාවක් පවතින බව මට පෙනුණා. ඒ ආරණ්‍යවාසී භික්ෂූන් වහන්සේලා. ඔවුන් භාවනානුයෝගී සම්ප්‍රදායට කැප වූ පිරිසක්. ඔවුන් රාජ්‍යයේ දේශපාලනයේ පර්යන්තයට බාහිරව බොහෝ අවස්ථාවල රැඳුණා. ඔවුන්ට පැවතියේ වෙනම විමුක්ති මාර්ගයක්. භාවනාව ඔස්සේ අධිමානසික බලවේග පිළිබඳ ප්‍රවීණත්වයක් ලබාගන්නට ඔවුන් උත්සාහ කළා. ඔවුන් රාජ්‍යයේ විධිමත් බල කේන්ද්‍රස්ථානයන්ගෙන් ඈත්ව වාසය කළා.

**Mariza Peirano:**

ආරණ්‍යවාසී භික්ෂූන් වහන්සේලා?

**Tambiah:**

තායිලන්තයේ ආරණ්‍යවාසී භික්ෂූන් වහන්සේලා සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමට පෙර සාන්තුවරයන්ගේ චරිතාපදාන සංකල්පය පිළිබඳව මා උනන්දු වුණා. කැරිස්මාව පිළිබඳව වූ මාගේ වෙබරියානු උනන්දුව නැවත වරක් මෙහි දී අවධානයට ලක්වුණා. මෙම අධ්‍යයනයේ දී  වෙබර් කිසිදා අධ්‍යයනය නොකළ දෙයක් පිළිබඳව මා අවධානය යොමු කළා. එනම් සුර වැනි වස්තු කෙරෙහි කැරිස්මාව ආරෝපණය කළ හැක්කේ කෙසේ ද යන්නයි. එමෙන්ම ආගමික හා දේශපාලන ජීවිතයේ දී එම සුරවල පවත්නා වැදගත්කම පිළිබඳව ද මා විසින් අධ්‍යයනය කළා. එමෙන්ම මෙම ග්‍රන්ථය තුළ දී මම සුර සංස්කෘතිය කෙරෙහි යම් අතපෙවීමක් සිදු කළා. සුර නිෂ්පාදනය කරන්නේ කෙසේ ද? භික්ෂූන් වහන්සේලා සිය කැරිස්මාව සුරවලට ආරෝපණය කරන්නේ කෙසේ ද? මෙම සුර හරහා භික්ෂූන් වහන්සේලා සහ ගිහි අනුග්‍රාහකයන් එකිනෙකාට සම්බන්ධ වන්නේ කෙසේ ද? ආර්ථික දේශපාලන සහ ඓතිහාසික ක්‍රියාවලිවල දී මෙම සුර පාවිච්චි කරනු ලැබුවේ සහ මෙහෙයවනු ලැබුවේ කෙසේ ද? වැනි කාරණා මම අධ්‍යයනය කළා'

**Mariza Peirano:**

ආ ඒ කියන්නේ, මානව විද්‍යාඥයෙක් විසින් කරනු ලබන වෙබරියානු ව්‍යාපෘතියක්?

**Tambiah:**

ඔව්, මම වෙබරියානු න්‍යාය සම්බන්ධ කිරීමට යම් උත්සාහයක් ගත්තා.

**Mariza Peirano:**

එක් අතකින් ඔබතුමා තායිලන්තය ගැන ලියද්දී අනෙක් අතින් Culture, Thought, and Social Action යන ග්‍රන්ථය වෙනුවෙන් ලිපි ලියමින් සිටියා. එතකොට ඔබගේ අධ්‍යයනය මගින් ආනුභාවික සහ න්‍යායාත්මක යන දෙපැත්ත ම ආවරණය වෙලා තියෙනවා. ඒක වෙනස් ම විදිහක් ද?

**Tambiah:**

මෙම බොහොමයක් ලිපි ඔස්සේ මම අවධානය යොමු කළේ මා විශාල උනන්දුවක් දක්වන වර්ගීකරණ න්‍යාය පිළිබඳව. එහි දී විශේෂයෙන්ම මම අවධානය යොමු කළේ Leach ට සහ Levi Strauss ට. Animals are Good to Think and Good to Prohibit යන ලිපිය ලිවීම සඳහා ඔවුන්ගේ න්‍යාය මා හට මනා පෙළඹවීමක් ඇති කළා. Leach ඔහුගේ Animal Categories and Verbal Abuse යන ලිපියේ පිටපතක් මට දුන්නා. ඇත්තටම එම ලිපිය තමයි මගේ ම ලිපියක් වුණ Animals are good to think and good to prohibit යන ලිපිය ලියන්න පෙළඹවීමක් ඇති කළේ.

**Mariza Peirano:**

The Magical Power of Words ලිව්වෙත් ඒ කාලයේ ම ද?

**Tambiah:**

මම කේම්බ්‍රිජ්වල දී මැලිනොව්ස්කිව නැවත වරක් සමීපව කියෙව්වා. ලීච් ඔහුගේ ශිෂ්‍යයන්ට එල්ල කළ බලපෑම් අතර මැලිනොව්ස්කිව යළි කියවන ලෙස කළ බලපෑම ප්‍රබල වුණා. ඒ අතරතුරදී ලීච් ඔහු විසින්ම මැලිනොව්ස්කි පිළිබඳ යම් යම් අධ්‍යයනයන් සිදු කළා. මෙන්න මේ විදියට තමයි මම මැලිනොව්ස්කිගේ මානවවංශලේඛය පිළිබඳව උනන්දුවක් දක්වන්නට පටන් ගත්තේ. මේ අවදියේ ම ෆ්‍රේසරියානු සංස්පර්ශක සහ අනුවේගී මායා (contagious and sympathetic magic) පිළිබඳ විස්තර කරන ජේකබ්සන්ගේ රචනාව අප කියවමින් සිටියා. මගේ උනන්දුව අභිචාර කෙරෙහි වූ නිසා මම මැලිනොව්ස්කිව සමීප වශයෙන් අධ්‍යයනය කරන්නට පටන් ගත්තා. එහි ප්‍රතිඵලයක් ලෙස තමයි The Magical Power of Words බිහි වන්නේ. ආර්ථික විද්‍යාව පිළිබඳ ලන්ඩන් පාසල මැලිනොව්ස්කි අනුස්මරණ දේශනය පැවැත්වීම සඳහා මට ආරාධනා කළා. එම අවස්ථාවේ දී මම තීරණය කරනවා මැලිනොව්ස්කිගේ ට්‍රෝබියානු මායා සම්බන්ධ ලියවිලි මම යළි විශ්ලේෂණය කිරීම ආරම්භ කළ යුතුයි කියලා.

**Mariza Peirano:**

එතකොට අභිචාර සම්බන්ධයෙන් Radcliffe Brown දේශනය

**Tambiah:**

එය මම කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය තුළ ඉගෙනගන්නා අතරතුර දී සිදුවුණා. නමුත් මම එය අවසන් කරන්නේ 1974 වර්ෂයේ දී පමණ චිකාගෝ විශ්වවිද්‍යාලයේ සිටින අතරතුර දී.

**Mariza Peirano:**

ඔබ ඔබගේ ලිපි න්‍යායාත්මකයි කියලා හිතනව ද? ඒ වගේම තායිලන්තය සම්බන්ධයෙන් කළ නිබන්ධය වඩාත් මානවවිද්‍යාත්මකයි කියලා හිතනවා ද?

**Tambiah:**

නෑ. තායිලන්තය සම්බන්ධයෙන් කළ නිබන්ධය මානවවිද්‍යාත්මකයි වගේම න්‍යායාත්මකයි.

**Mariza Peirano:**

ඇයි පැති දෙකක් ?

**Tambiah:**

ඒවා සහජයෙන් ම එකිනෙකට බැඳී පවතිනවා. Buddhism and the Spirit Cult ග්‍රන්ථය දැනටමත් ඔබ දන්නා පරිදි අභිචාර සහ විශ්ව විද්‍යාව (rituals and cosmology) පිළිබඳව පැහැදිලි කිරීමක්. ඒ වගේම අභිචාර සහ විශ්ව විද්‍යාව කොහොමද එකිනෙකට සම්බන්ධ වෙන්නේ කියලත් මෙම ග්‍රන්ථයෙන් පැහැදිලි කරනවා. එම ග්‍රන්ථයෙන් මම උනන්දුවක් දැක් වූ තවත් එක කරුණක් වූයේ මිථ්‍යාව සහ මිනිස් ක්‍රියාකාරකම් කොහොම ද එකිනෙකට අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ වන්නේ කියන කාරණාව පිළිබඳව. මේ සියලු දයලෙක්තික අන්තර්සම්බන්ධතාවන් මානවවංශලේඛයක් ලෙසින් ඉදිරිපත් කරන්න මට පුළුවන් වුණා. මිනිසුන් මගේ පොත් මානවවංශලේඛයක් ලෙසින් කියවන්න පුළුවන්. නමුත් ගොඩක් මිනිසුන් මගේ කෘති තේරුම් ගන්නේ මානවවිද්‍යාත්මක කෘතිවලට වඩා න්‍යායාත්මක කෘති විදිහට. අන්න ඒ ගැටලුව තමයි ඔබත් විමසුවේ. මගේ බොහෝ නිබන්ධවල මැක්ස් වෙබර්, මාෂල් මවුස්, ඩර්කයිම්, මැලිනොවුස්කි, ඉවන්ස් ප්‍රිට්චාඩ්, ලෙවි ස්ට්‍රවුස් වැනි ලේඛකයන්ගේ න්‍යායාත්මක සාකච්ඡාවන් අන්තර්ගත වුණා.

**Mariza Peirano:**

ඔබ හිතනවා ද මානව විද්‍යාඥයන් පවා ඔබගේ ලේඛන න්‍යායාත්මක ලේඛන විදිහට දකිනවා කියලා?

**Tambiah:**

ඔව්, මගේ ලිපි න්‍යායාත්මක වශයෙන් ෂලකන්න පුලුවන්. මොකද බොහෝ අවස්ථාවල ඒවා මගින් ආමන්ත්‍රණය කරන්නේ යම් ආකාරයක ආගමානුකූල ගැටලු. උදාහරණයක් හැටියට කියනවා නම් The Magical Power of Words කියන ග්‍රන්ථය බහුවිධ මාධ්‍ය, මිථ්‍යා සහ අභිචාර අතර පවත්නා අන්තර්සම්බන්ධතාව, තොරතුරු න්‍යාය, රූපකමය සම්බන්ධතා යන කාරණා සම්බන්ධයෙන් මැලිනොව්ස්කිව යළි කියවීමට ගත් උත්සාහයක්. මම මෙහි දී සඳහන් කරන්න ම ඕනේ Lewis Henry Morgan ගේ දේශනයක් වන Magic, Science, Religion, and the Scope of Rationality (1990) යන දේශනය පාදක කරගෙන මා විසින් ලියන ලද ග්‍රන්ථය න්‍යායාත්මක ග්‍රන්ථයක් බව. එම ග්‍රන්ථය Culture, Thought, and Social Action යන ග්‍රන්ථයෙන් ඉදිරිපත් කර තිබෙන තේමා තවදුරටත් ඉදිරියට ගෙන යාමක්.

**Mariza Peirano:**

මේක හරිම රසවත්, මොකද කියනවනම් ශාස්ත්‍රීය ග්‍රන්ථ පරිශීලනය කරන විවිධ වේදිකාවල පවත්නා ගැටලු මෙම ග්‍රන්ථය අවධාරණය කරනවා.

**Tambiah:**

ඔව් මම හිතනවා ගොඩක් වෙලාවට මිනිස්සු කියවන්නෙ ඉතාමත් සීමිත නිබන්ධ ප්‍රමාණයක්. මගේම වෘත්තියෙහි නියැළෙන බහුතරයක් කරන්නෙත් ඒ දේමයි. බොහෝ දෙනා තමන්ගේ උනන්දු විෂය පථයෙන් පරිබාහිරව පවත්නා දේවල් කියවීමට වැඩි උනන්දුවක් දක්වන්නෙ නෑ. මා පිළිබඳව සඳහන් කළොත් මම අග්නිදිග ආසියානු කලාපය සහ දකුණු ආසියානු කලාපය පිළිබඳ ලියැවී ඇති පොත්පත් කියවීමට වැඩි

උනන්දුවක් දැක්වූවත් ඇමර්සන්, පැපුවා නිව්ගිනියා, චීනය, සහ ජපානය වැනි ප්‍රදේශ පිළිබඳ ලියවී ඇති ලිපි කියවීමට වැඩි උනන්දුවක් දක්වන්නෙ නැහැ. නමුත් ශාස්ත්‍රීය වශයෙන් උසස් යැයි මට නිර්දේශ ලබාදුන් අයගේ ලිපි ලේඛන මම කියවනවා. අප්පදොරේ විසින් ලියන ලද The Social Life of Things යන ග්‍රන්ථයේ හැඳින්වීම කියවන විට පාඨකයන් දන්නෙ නැහැ මා විසිනුත් එම තේමාවට ම සමගාමීව යන අධ්‍යයන සිදුකරනු ලබලා තියෙනවා කියලා. ඉතින් මට අවසාන වශයෙන් කියන්න පුළුවන් දේ තමයි බහුතරයක් දෙනා පර්යේෂණ පත්‍රිකා කියවීමට උනන්දුවක් දැක්වූවත් දීර්ඝ නිබන්ධ කියවීමට උත්සාහයක් දරන්නේ නෑ කියන දේ.

**Mariza Peirano:**

එතකොට ඔබගේ Buddhism and the Spirit Cults in Northeast Thailand ග්‍රන්ථයේ එන මිථ්‍යාව සහ අභිචාර පිළිබඳ සාකච්ඡාව ගැන මොනවද කියන්නේ ?

**Tambiah:**

මෙම ග්‍රන්ථය ගොඩක් දෙනා මිථ්‍යාව සහ අභිචාර පිළිබඳ අධ්‍යයන සම්බන්ධයෙන් සැලකිය යුතු න්‍යායාත්මක අදාළත්වයක් සහිත ග්‍රන්ථයක් ලෙස සලකන්නේ නෑ. නමුත් මම එම ග්‍රන්ථය න්‍යායාත්මක ලේඛනයක් වශයෙන් ලිව්වා නම්, අග්නිදිග ආසියානු කලාපය පිළිබඳ උනන්දුවක් දක්වන උගතුන්ට අමතරව අනෙක් ශාස්ත්‍රඥයන් ද ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන්නට තිබුණා. කොහොම නමුත් ඉහත ග්‍රන්ථයේ එන මිථ්‍යාව සහ අභිචාර  පිළිබඳ සාකච්ඡාව The Legend and Cult of Upagupta යන කෘතිය රචනා කළ එමෙන්ම ආගම පිළිබඳ අධ්‍යයනය කරන ශාස්ත්‍රඥයෙකු වූ ජෝන් ස්ට්‍රෝන්ගේ ද සැලකිල්ලට ලක් වෙලා තිබුණා.

**Mariza Peirano:**

හොඳයි, ඔබ අභිචාර සහ මිථ්‍යාව සම්බන්ධයෙන් යම් න්‍යායාත්මක රචනාවකුත් ලිවිය යුතුයි කියලා හිතනවා ද?

**Tambiah:**

ඔව් නමුත් ඔබ දන්නවා ජීවිතය හරිම කෙටියි. හැමදේට ම කාලයක් නෑ.

**Mariza Peirano:**

එහෙනම් අපි නැවතත් යමු අභිචාර දෙසට. ඔබ ඔබගේ එක පර්යේෂණ පත්‍රිකාවක අභිචාර සම්බන්ධයෙන් ලියූ සටහනක් මම ජේකබ්සන් aphasia පිළිබඳව කළ අධ්‍යයනය සමගත්, ලෙවී ස්ට්‍රාවුස් තෝටමායනය පිළිබඳව කළ අධ්‍යයනය සමගත්, ෆ්‍රොයිඩ් සිහින පිළිබඳව කළ අධ්‍යයනය සමගත් සංසන්දනය කළා.

**Tambiah:**

ඔබගේ මේ ප්‍රකාශය ම මට සුවිශාල වර්ණනාවක්. ස්තූතියි.

**Mariza Peirano:**

සාමාන්‍යයෙන් මම දකින දෙයක් තමයි අපි සාම්ප්‍රදායිකව ලේබල් කරන යම් ප්‍රපංචයක් ඔබ ප□මුව අරගන්නවා. ඊළඟට ඔබ පෙන්වා දෙනවා ඒ ප්‍රපංචය වෙනත් ඕනෑ ම ස්ථානයක පවතින්න පුළුවන් කොහොම ද කියලා. මෙහි අවසාන ප්‍රතිඵලය වන්නේ ආනුභවික වස්තුවක් එහෙමත් නැතිනම් වස්තු පන්තියක් විශ්ලේෂණාත්මක යොමුවක් බවට පත්වෙන එක. ඔබ අභිචාර සම්බන්ධයෙනුත් සිදු කළේ මෙන්න මෙයයි කියලා මම විශ්වාස කරනවා.

**Tambiah:**

මම කේම්බ්‍රිජ්වල සිටින අවධියේ දී මට අහම්බෙන් ඔස්ටින්ව අධ්‍යයනය කරන්නට ලැබුණා. මී ළඟට මම ඔස්ටින් පිළිබඳ වූ මාගේ තේරුම් ගැනීම Form and Meaning of Magical Acts යන ග්‍රන්ථය රචනා කිරීමේදී සම්බන්ධ කළා. මම හිතන ආකාරයට එය මා තුළ සිදු වූ පෞද්ගලික වර්ධනයක්. ලීච් මෙම ප්‍රවණතාවට කිසිසේත්ම කැමැත්තක් දැක්වූයේ නැහැ.එවකට ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ වර්ධනය වෙමින් පැවති ප්‍රාථමික භාෂා දර්ශනය (ordinary language philosophy) කෙරෙහි ඔහු වඩා උනන්දුවක් දැක්වූවා. මේ අතින් බලන විට ඔහු ඉතාම යල්පැනපු කෙනෙක්. මම හිතනවා ඔක්ස්ෆර්ඩ් දර්ශනයට පහර දීමේ ඔහුගේ උත්සාහයේ දී ඔහු ගැල්නෝ සමග එකඟ වූවා කියලා. ඔස්ටින්ගේ සංදර්ශනාත්මක උච්චාරණය (performative utterances) පිළිබඳ අදහස සම්බන්ධයෙන් මට යම් තහවුරු වීමක් තිබුණා. මට ආඩම්බරයෙන් කියන්න පුළුවන් ඔස්ටීන්ගේ සංදර්ශනාත්මක උච්චාරණය පිළිබඳ අදහස පළමුවෙන්ම භාවිත කරන්න උත්සාහ කළේ මම කියලා. අභිචාර පිළිබඳ අධ්‍යයනයේ දී මම එය සිදුකරනවා. මට ඔස්ටීන් සමග සම්බන්ධ වෙන්න ලැබුණේ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ මම ගතකරපු අවසාන භාගයේ දී.

**Mariza Peirano:**

ඔබ ඔබගේ වරප්‍රසාදිත සම්භාෂකයන් ලෙස සලකන්නේ කවුරුන්ද?

**Tambiah:**

මට කිහිප දෙනෙක්ව ම මතක් කරන්න පුළුවන්. මුලින් ම මැක්ස් වෙබර්, ඩර්කයිම් සහ මාක්ස් යම් ප්‍රමාණයකට. අනතුරුව මැලිනොව්ස්කි සහ ඉවන්ස් ප්‍රිට්චාර්ඩ්. මාගේ Forms and Meaning of Magical Acts යන ග්‍රන්ථය ඉවන්ස්ප්‍රිට්චාර්ඩ් Zande ගෝත්‍රිකයන්ගේ අභිචාර ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සිදු කළ අධ්‍යයනයට ප්‍රතිතර්කයක් වශයෙන් ඉදිරිපත් කරන ලද්දක්. මීළඟට මම වර්ගීකරණ න්‍යාය සම්බන්ධයෙන් ලෙවි ස්ට්‍රවුස් සහ එඩ්මන් ලීච්ට උනන්දුවක් දැක්වූවා. මාගේ සම්භාෂකයන්ගේ ලැයිස්තුව අවශ්‍ය නම් ඔස්ටීන්, පියර්ස්, ෆූකෝ, බෝඩියෝ, බක්ටින් දක්වා ම කියන්න පුළුවන්.

**Mariza Peirano:**

මාෂල් මවුස් සහ ඔහුගේ කාර්යක්ෂමතා අදහස (notion of efficacy) පිළිබඳව ඔබ මොනවද හිතන්නේ ?

**Tambiah:**

ඔබ අදහස් කරන්නේ මාෂල් මවුස් මායාකර්ම සම්බන්ධයෙන් ඉදිරිපත්කරන ලද දේවල් ද? ඔව් ඇත්තටම, ඔහු මායාකර්ම, ත්‍යාග, සහ බිලි පූජා සම්බන්ධයෙන් ලියූ ලිපි අපේ මානව විද්‍යාත්මක සම්භාව්‍ය උරුමයේ කොටස් හැටියට සලකන්න පුළුවන්. ඒ වගේ ම ඒවා මගහැරිය නොහැකි කොටස්.

**Mariza Peirano:**

ඔබ පියර්ස් ගැන උනන්දුවක් දක්වන්න පටන් ගත්තේ කෙදින ද?

**Tambiah:**

මම චිකාගෝවලට පැමිණි අවස්ථාවේ දී තමයි මුලින් ම පියර්ස් ගැන උනන්දුවක් දක්වන්නට පටන් ගත්තේ. එවකට එහි සිටි මයික් සිල්වෙස්ටීන් වැනි අයත් පියර්සියානු සංඥාර්ථ පිළිබඳව උනන්දුවක් දැක්වූවා. පියර්ස් පිළිබඳව වූ මාගේ තේරුම් ගැනීම මම චිකාගෝ විශ්වවිද්‍යාලය තුළ සිටින කාලය අතරතුර දී තවත් පැහැදිලි වුණා. ඒ අනුව මම A Performative Approach to Ritual ලිපිය ලිවීමට පටන් ගත්විට මම මට ම කියාගත්තා මෙය විවිධ පර්යාලෝක එකට අනුකලනය කරන්නට මට ලැබුණු හොඳ අවස්ථාවක් කියලා. ඒ වගේම මෙම ලිපිය වික්ටර් ටර්නර් පිළිබඳව පවත්නා යම් සැඟවුණු විවේචනත් ඇතුළත් කරනවා. මට හිතෙනවා වැන් ගැනප්ගේ නිර්මාණයක් වූ වික්ටර් ටර්නර් සාර්ථකව වර්ධනය කළ අභිචාර පිළිබද ත්‍රෛපාර්ශ්වික ව්‍යුහය (tripartite structure of ritual) අභිචාරවල පවත්නා ගතික සහ පුනරාවර්තීය ලක්ෂණයන් සම්පූර්ණයෙන් තේරුම් ගන්නට ප්‍රමාණවත් මදි කියලා. මට සැබැවින් ම අවශ්‍ය වූයේ වික්ටර් ටර්නර් කියූ දෙයට වෙනස් යමක් ඉදිරිපත් කරන්න. මට හිතෙනවා ව්‍යුහාත්මක වාග්විද්‍යාව, සමාජ වාග්විද්‍යාව වැනි විෂය පථ සහ චොම්ස්කි, පියර්ස්, ලැන්ගර් වැනි පුද්ගලයන් සම්බන්ධයෙන් මා විසින් සිදුකරනු ලැබූ ගැඹුරු අධ්‍යයන් ඔවුන්ව සංස්ලේෂණය කළ හැක්කේ කෙසේ ද? සහ ඔවුන්ව ස්ථානගත කළ හැක්කේ කෙසේ ද? යන ප්‍රශ්නය මා තුළ උත්පාදනය කරන්නට සමත් වුණා කියලා.

**Mariza Peirano:**

ඔබ ජෝන් කෙලීගේ අභිචාර සහ ඉතිහාසය පිළිබඳව වන ලිපිය කියවා තිබෙනවා ද? එම ලිපිය තුළ කෙලී ඔබව වෙබරියානුවෙක් වශයෙන් හඳුන්වා දී තිබෙනවා.

**Tambiah:**

ඔහු මට යම් කොටසක් එව්වා. ඔහු හාවඩ් විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයෙක්. එවකට ඔහු ඔහුගේ ගෞරව උපාධිය මැක්ස් වෙබර් පිළිබඳව ලියමින් හිටියා. මමත් ඔහුගේ උපදේශකවරුන්ගෙන් එක් අයෙක් වුණා. ඔහු වෙබර් පිළිබඳව කියවමින් සිටි අතරතුර දී මම වෙබර්පිළිබඳව පාඨමාලාවක් උගන්වමින් සිටියා. ඒ වගේම මම තායිලන්තය පිළිබඳව වන මාගේ යම්යම් ලිපිවල වෙබර්ව උපුටා දැක්වූවා. කෙලී මාව වෙබරියානුවෙක් වශයෙන් ලේබල් කිරීම යම් තාක් දුරකට නිවැරදියි. ඒ අර්ථයෙන් බලන විට වෙබර් කියන්නේ මගේ සුවිශේෂිත අනෙකා (significant other). ඇත්ත වශයෙන්ම මම කෙලීට නිර්දේශ කළා ඔහුගේ ශාස්ත්‍රීය උනන්දුව තවදුරටත් වර්ධනය කරගන්න ඔහු චිකාගෝ විශ්වවිද්‍යාලයට යා යුතුයි කියලා.

**Mariza Peirano:**

ඔබ ද්විත්ව ප්‍රතිපක්ෂ විසඳීම් (dissolving dichotomies) සම්බන්ධයෙන් දක්වන උනන්දුවට මම ගොඩක් කැමතියි.

**Tambiah:**

හොඳයි, මම හරියට ම දන්නේ නෑ මම ද්විත්ව ප්‍රතිපක්ෂ විසඳීම නියමාකාරයෙන් ඉෂ්ට කරගත්තා ද කියලා. මට කියන්න පුළුවන් ඒ ද්විත්ව ප්‍රතිපක්ෂ මාව අභියෝගයට ලක් කළා කියලා. මම ගැටලුවලට ප්‍රවේශ වන ආකාරය සම්බන්ධයෙන් මට ම ආවේණික වූ එළඹුමක් තියෙනවා. මගේ එළඹුම තමයි අනෙක් අය වෙන්කරන්න උත්සාහ කරන සංරචක දයලෙක්තිකමය වශයෙන් එකට එකතු කිරීම. ඒ වගේම මම විශ්වාස කරන දෙයක් තමයි යමෙකුට යම් සම්ප්‍රදායක් අතික්‍රමණය කරන්නට අවශ්‍ය නම් ඔහු පළමුව එම සම්ප්‍රදාය තුළ වැඩ කළ යුතුයි කියන කාරණාව . ගොඩක් මිනිස්සු කියනවා, "මම කියන්නේ අලුත් ම දෙයක්", "මේක හරිම විප්ලවකාරී අදහසක්", "මෙම අදහස් මගින් අතීතය මුලිනුපුටා දමනවා" වැනි ප්‍රකාශ. නමුත් එවැනි ප්‍රකාශ මට නම් එතරම් නිවැරදි බවත් හැඟෙන්නේ නැහැ. මම මෙන්න මේ වගේ අදහසක් ඉදිරිපත් කරන්න කැමතියි. මම කැමතියි කොහොම ද ඉදිරියට ගමන් කරන්නේ යන්න පිළිබඳ සිතන්න. එමෙන් ම පවත්නා ක්ෂිතිජ විස්තාරණය කරන්න. පවත්නා න්‍යාය විරෝධයන් විසඳන්න. පවත්නා සීමාවන් ආපස්සට තල්ලු කරන්න. මම සාමාන්‍යයෙන් පවත්නා සම්ප්‍රදාය තුළ වැඩ කරනවා. අනෙක් අය නිර්මාණය කළ දේ මත පදනම්වෙලා අලුත් දැනුම ගොඩනගනවා. පවත්නා සංරචකය අහුලාගන්නවා. ඉන් අනතුරුව ඒවා එකිනෙක සමග යළි සම්බන්ධ කරනවා. මම කිසිවිටෙක පවත්නා දැනුම ප්‍රතික්ෂේප කිරීමක් සිදුකරන්නේ නෑ.

**Mariza Peirano:**

ලෙවි ස්ට්‍රවුස් වරක් ප්‍රකාශ කළ සම්පූර්ණයෙන්ම අලුත් දෙයක් කරමින් සිටියා කියලා.

**Tambiah:**

ඔබ දැනටමත් හොඳින් දන්නා පරිදි යම් විෂයක් සම්බන්ධයෙන් අලුත් දැනුම ගොඩනැගීමේ දී අපිට කරන්න පුළුවන් දෙයක් තමයි අපිට අදාළ නොවන වෙනත් ම ක්ෂේත්‍රයකින් යම් පර්යාලෝකයක් හෝ අදහසක් ලබාගෙන එය අපේ අධ්‍යයන ක්ෂේත්‍රයට ආදේශ කිරීම. එමගින් අපිට අලුත් විභවතා විවෘත කරගන්නට පුළුවන්. ඒ ක්‍රමවේදය ඔස්සේ තමයි ජීව විද්‍යාව, භෞතික විද්‍යාව වැනි දෘඩ විද්‍යාවන් ක්‍රියාත්මක වෙන්නේ. අපේ වෘත්තිය ක්‍රියාත්මක වෙන්නෙත් ඒ ආකාරයට ම තමයි. ලෙවි ස්ට්‍රවිස් ක්‍රියාත්මක වුණෙත් ඒ ක්‍රමවේදය ඔස්සේ. ඔහු සිය පුරාණෝක්ති පිළිබඳ අධ්‍යයනයේ දී ෆර්ඩිනැන්ඩ් සෝසියර් සහ ජේකබ්සන්ගේ වාග්විද්‍යාත්මක න්‍යාය් උපයෝගී කරගත්තා.

ඔබ මගෙන් ඇහුවා මම මගේ ආගම, අභිචාර, සහ දේශපාලනය පිළිබඳව වන අධ්‍යාන තවමත් සිදු කරගෙන යනවාද කියලා. මගේ අවසන් ග්‍රන්ථයේ අවධානයට යොමු කරලා තියෙන්නේ දේශපාලනය සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳව. වර්ග-ජාතිවාදී අරගලවල (ethno-nationalist conflicts) දී දේශපාලනය ගොඩනැගීමේ එක් ක්‍රමවේදයක් වශයෙන් සාමූහික ප්‍රචණ්ඩත්වය දියත් කරන්නේ කෙසේ ද යන කාරණාව මෙම ග්‍රන්ථය තුළ සාකච්ඡා කරලා තිබෙනවා. මගේ පොත කියවන විට ඔබ තේරුම් ගනීවි සංදර්ශනාත්මක අභිචාර සම්බන්ධයෙන් වූ මාගේ අදහස් නූතන දේශපාලනයේ දී සාමූහික ප්‍රචණ්ඩත්වය වෙනුවෙන් යොදා ගැනෙන්නේ කොහොම ද කියලා. බ්‍රසීලයේ ANPOCS සමුළුවේ දී මා විසින් සිදුකරනු ලැබූ දේශනය ඉහත සඳහන් කළ මාගේ ග්‍රන්ථයෙහි යම් කොටස් පිළිබඳව ඉදිරිපත් කළ සාරාංශයක්. එම ග්‍රන්ථය තුළ මා විසින්

මූලික වශයෙන්ම අවධානය යොමු කළේ අපගේ කාල වකවානුව තුළ වර්ග-ජාතිවාදී දේශපාලනය සහ සාමූහික ප්‍රචණ්ඩත්වය මුලිනුපුටා දමන්නේ කෙසේ ද කියන කාරණාව.

**Mariza Peirano:**

ඔබට අලුත් සම්භාෂකයන් හමුවූවා ද?

**Tambiah:**

ඇත්තෙන් ම. මගේ ග්‍රන්ථය අවසානයේ දී මම නැවත වරක් ඩර්කයිම්ව සහ ලේ බෝන්ව කියවන්නට පටන්ගත්තා. නමුත් මට විවිධ උගතුන් සමග සංවාද තිබුණා. සදාචාර ආර්ථිකය (moral economy) පිළිබඳ අදහස් ඉදිරිපත් කළ ඊ.පී. තොම්ප්සන්, ප්‍රචණ්ඩත්වයේ වතාවත් යන ග්‍රන්ථය රචනා කළ නටාලි ඩේවිස්, ඒ වගේ ම ජොර්ජ් රූඩ්, ජිත්. සී. ස්කොට්, සහ නූතන ඉන්දියානු ඉතිහාසඥයන් ගේ පරිපීඩිත ගුරුකුලය සමගත් මට සංවාද තිබුණා.

**Mariza Peirano:**

ඉතිං නැවතත් ඩර්කයිම්?

**Tambiah:**

ඩර්කයිම් විසින් ලියන ලද the elementary forms of religious life යන ග්‍රන්ථයේ බොහෝ දෙනෙකු විසින් හඳුනාගැනීමට අසමත් වන යම් දෙයක් තිබෙනවා. එම ග්‍රන්ථයේ අවසාන භාගයේ දී ඩර්කයිම් සඳහන් කරනවා තෝටමායන අභිචාරවලට පුද්ගලයන් සාමූහික වශයෙන් සහභාගි වීම තුළින් එම පුද්ගලයන් ආගමික බලවේගය පිළිබඳ අත්දැකීම් අත්විඳින බව. පාඨකයන් මේ පිළිබඳව දන්නවා වුවත් ඔවුන් ඒ පිළිබඳව වැඩිදුර සිතා බැලීමට යන්නෙ නෑ. ඩර්කයිම් යනු ලේ බෝන්ගේ ආභාසය ඍජුව ම ලබපු කෙනෙක්. ලේ බෝන්ට ප්‍රංශ විප්ලවය සම්බන්ධයෙන් යම් එකඟ නොවීම් පැවතුණා. නමුත් ඔහු ප්‍රංශ විප්ලවයේ දී ඊට ඒකරාශී වූ ජන සමූහය පෙන්නුම් කළ රටා හඳුනා ගත්තා. ඩර්කයිම් ද ලේ බෝන්ගේ ජන සමූහය පිළිබඳ අදහස් කෙරෙහි උනන්දුවක් දැක්වූ නමුත් ඔහු එම අදහස් වෙනත් ම මානයකින් තමයි පාවිච්චි කළේ. ලේ බෝන්ට අනුව දේශපාලනික වශයෙන් එකට එකතුවන ජන සමූහ අතාර්කික ප්‍රචණ්ඩත්වයක් නිර්මාණය කරනවා. නමුත් ඩර්කයිම්ට අනුව ජන සමූහයක් එකට එකතු වී සිදු කරන සාමූහික වත්පිළිවෙත් තුළින් ධනාත්මක ආගමික බලවේගයක් නිර්මාණය වෙනවා. ඒ ධනාත්මක ආගමික බලවේගය සමාජය සැමරීමට ලක්කරනවා. මේ ඔස්සේ කල්පනා කරමින් මම ජන සමූහයක් යම් ක්‍රියාවක් සිදු කිරීමේ අරමුණෙන් එකට ඒකරාශී වන විට ඔවුන්ගේ සංවාද සහ සංඥාර්ථ ක්‍රියාවලි ගොඩනැගෙන ආකාරය කෙරෙහි අවධානය යොමු කළා. ඒ ඔස්සේ මෙම සංවාද සහ සංඥාර්ථ ක්‍රියාවලි ඔසසේ පුද්ගලයන් සාමූහික ප්‍රචණ්ඩත්වය විදහා දක්වන ආකාරය කෙරෙහි අවධානය යොමු කළා.

**Mariza Peirano:**

ඒ අනුව මානව විද්‍යාඥයන් පවා ඩර්කයිම්ව අවප්‍රමාණය කළ බවක් ද ඔබ කියන්නේ?

**Tambaiah:**

ඔව්, ඔබේ ප්‍රශ්නය යම්තාක් දුරකට නිවැරදියි. උදාහරණයක් ලෙස ලෙවී ස්ට්‍රවුස් දක්වන්න පුළුවන්. ඔහු උනන්දුවක් දක්වන්නේ ඩර්කයිම්ගේ තෝටමායන සංකල්පය පිළිබඳව පමණයි. ඒ ඔහු වර්ගීකරණ න්‍යාය සම්බන්ධයෙන් ඩර්කයිම්ගේ තෝටමායන සතුන් සහ වස්තූන් පිළිබඳ අධ්‍යයනයන් සිය සාකච්ඡාවට අදාළ කරගන්නට උත්සාහ කළ නිසා. ඩර්කයිම්ගේ තෝටමායනය පිළිබඳ ලෙවී ස්ට්‍රවුස් උනන්දුවක් දැක්වූවත්, මිනිසුන් විසින් සිදුකරනු ලබන තෝටමායන වතාවත් අන්තර්පුද්ගල සම්මිශ්‍රණයක් ඇති කරන්නේ කෙසේ ද යන කාරණාව පිළිබඳ ඩර්කයිම්යානු පැහැදිලි කිරීම කෙරෙහි අවධානයක් යොමු කරන්නේ නෑ. මේ අර්ථයෙන් බලන කල්හි විශාල ජන සමූහයක් මගින් නිපදවෙන සාමූහික ප්‍රචණ්ඩත්වය ආකාර දෙකකින් අධ්‍යයනය කරන්න පුළුවන්.

ප්‍රචණ්ඩත්වය යනු අරමුණු සහගත දේශපාලනයේ කොටසක්. එමෙන්ම අභිලාෂී දේශපාලනඥයන් සහ ඔවුන්ගේ ඒජන්තවරුන් මෙම දේශපාලන ප්‍රචණ්ඩත්වය මෙහෙයවනවා. මීට සමගාමීව ම සාමාන්‍ය ජනතාවගෙන් සැදුම් ලත් උද්ඝෝෂකයන් විනාශකාරී ගිනි තැබීම් සහ මිනිසුන්ට හිරිහැරකිරීම් වැනි ප්‍රචණ්ඩ කටයුතුවල නිරත වෙනවා. මම මෙම පැති දෙක පිළිබඳව ම අවධානය යොමු කළා. එම අරගල අරමුණු සහගත ද? මේවා දිශා ගතවන්නේ කෙසේ ද? ප්‍රචණ්ඩකාරී අරගල ගොඩනැගීම සම්බන්ධයෙන් පොදු සමාජයේ පවත්නා සංස්කෘතික සහ අභිචාරී විශ්වාස බලපානවා ද? වැනි කාරණා මාගේ අධ්‍යයනයට යොමු වුණා.

**Mariza Peirano:**

අපි මාතෘකාව වෙනස් කරමු ද? පාපන්දු ක්‍රීඩාවක් නැරඹීමට ඔබ කවදා හෝ බ්‍රසීලයට ආපසු යා යුතුයි ?

**Tambiah:**

ඔබ දන්නවා මට රියෝහි පාපන්දු ක්‍රීඩාවක් දැකීමට අවශ්‍ය වූයේ ඇයි ද කියලා. මම බයිරන් ගුඩ් සමඟ ඇමරිකානු පාපන්දු තරග නැරඹීමට යනවා. මම වෙනත් හේතූන් නිසාත් ක්‍රීඩාව ගැන උනන්දු වෙනවා, නමුත් මම ක්‍රීඩාව කෙරෙහි උනන්දු වෙන්නේ එය සමූහ සංසිද්ධියක් සහ එහි තිබෙන විශාල නරඹන්නන්ගේ සහභාගීත්වය යන දෑ නිසා. එහි දී ක්‍රීඩාංගනයේ සිටින නරඹන්නන්ගේ ඔල්වරසන් හඬ ඉතා අපූරුයි. ඔවුන් රිද්මයානුකූලව නැගී සිටිමින්, ඔල්වරසන් දෙමින් ඉතා උද්යෝගයෙන් පසු වෙනවා. එහි දී කණ්ඩායමේ ආධාරකරුවන්, ප්‍රතිවිරුද්ධ කණ්ඩායමට නින්දා අපහාස කරමින්, ඔවුන්ට ශාප කරමින්, ක්‍රීඩා සටනට ආසන්න සටනක් පවත්වනවා. එහි දී භාෂා භාවිතය පවා ඉතා දැඩි ස්වභාවයක් උසුලනවා. මේ සඳහා සහභාගිවන්නේ කවුද? එහි දී කම්කරු පන්තිය, මධ්‍යම පන්තිය, වෘත්තිකයන්, තරුණ සහ මහලු අය, පිරිමි සහ ගැහැනු යන සියලු දෙනාම මෙම මහා සංස්කෘතියේ බලගැන්වීමට භෞතික වශයෙන් එකට එකතු වෙනවා.

**Mariza Peirano:**

ඔබ තායිලන්තයේ වැඩ කිරීමෙන් පසු පර්යේෂණ කටයුතු සඳහා ශ්‍රී ලංකාවට පැමිණීම ගැන කතා කරමු.

**Tambiah:**

Ethnic Fratricide and the Dismantling of Democracy කෘතියේ අවසාන කොටසේ අප කථා නොකළ මගේ චරිතාපදානයේ කොටසක් අඩංගු වෙනවා. ඒක බලන්න. එය මගේ නැවත පැමිණීම පැහැදිලි කිරීමට උත්සාහ කරනවා.

1983 දී ඇති වූ කෝලාහල ඉතා බිහිසුණුයි. විශේෂයෙන් ම කොළඹ නගරයේ පමණක් නෙවෙයි දිවයිනේ අනෙකුත් ප්‍රදේශවලත් දේපොළ විනාශ කිරීම්, ගිනි තැබීම්, සහ දෙමළ සුළුතරය ඉලක්ක කරගනිමින් අරමුණු සහගතව විනාශ සිදු වෙමින් තිබුණා. ශ්‍රී ලංකාව තුළ එවැනි පරිමාණයේ කිසිවක් මීට පෙර සිදු වෙලා තිබුණේ නෑ. 1956 සිට වරින් වර කැරලි ඇති වුණත්, ඒවා කුඩා වුණත්, මෙවර එය ඇත්තෙන් ම මහා පිපිරුමක් වුණා. මම ඒ කාලේ සිටියේ ලංකාවෙන් පිට. නමුත් ඒ ගැන ඇසූ විට එය මට මහත් වේදනාවක් ඇති කළා වගේ ම යම් ආකාරයක කම්පනයක් ඇති කළා. ඇත්තට ම මම ඒ වින්දිත සුළුතර ප්‍රජාවේ සාමාජිකයෙක්. එමෙන්ම කොළඹ ප්‍රදේශයේ වැඩිපුරම පීඩාවට පත්වූයේ මධ්‍යම පාන්තික, ස්ථාවර ප්‍රභූ පවුල්වල සාමාජිකයන් සහ ව්‍යාපාරිකයන් යන අය යි. මෙවැනි දෙයක් ඔවුන්ට සිදු වේවි කියලා ඔවුන් කිසි විටෙක සිතුවේ නෑ. එය එක්තරා ආකාරයක ජන සංහාරයක් සහ යම් ජනගහනයකට හානියක් කිරීමට අරමුණු කරගත් ඍජු උත්සාහයක් වුණා. රාජ්‍යයේ ඇතැම් දේශපාලනඥයන් සහ ඒජන්තවරුන් ද මෙම විනාශ කිරීමේ කාර්යයට සම්බන්ධ වූ අතර, කැරලිකරුවන් සමඟ හවුල් වුණා. මම ශ්‍රී ලංකාව හැර ගියත්, මම ශ්‍රී ලාංකිකයෙක් යන පිළිගැනීම හැමවිට ම දරා සිටියා. මගේ පෞරුෂයේ ප්‍රබල අංගයක් වන්නේ මම දෙමළ සම්භවයක් ඇති අයෙකු වීමයි. නමුත් මෙම සිදු වීම නිසා ශ්‍රී ලාංකිකයෙකු ලෙස මගේ අනන්‍යතාවයෙන් අඩක් බිඳී ගියා. ඒ සම්බන්ධයෙන් මගේ ආඛ්‍යානය Ethnic Fratricide යන ග්‍රන්ථයෙහි ලියා ඇති අතර මාගේ මානසික පීඩනයෙන් මිදීමට, එම ඛේදවාචකය පිළිබඳ යම් හැඟීමක් ඇති කරගැනීමට මෙන් ම එම කාලවනවානුව පිළිබඳ මාගේ පෞද්ගලික දැක්ම ප්‍රකාශනයට මෙම ග්‍රන්ථය ලිවුවා.

**Mariza Peirano:**

ඔබට ලංකාවේ ඥාතීන් ඉන්නවා ද?

**Tambiah:**

වෛද්‍යවරයෙකු වන වැඩිමහල් සොහොයුරෙකු කොළඹ ප්‍රදේශයේ පදිංචිව ඉන්නවා. ඔහුගේ නිවසට ප්‍රහාරයක් එල්ල වූ නමුත් කිසිවෙකුටත් තුවාල සිදුවුණේ නෑ. මගේ පවුලේ අනෙක් අයට කොළඹ දී තුවාල වෙලා නැහැ. එක් සහෝදරියක් ජීවත් වූයේ සිංහල සහ දෙමළ සංයුතියෙන් යුත් තදාසන්න ජනාවාසයක. වාසනාවකට වගේ සිංහල අයෙකුගේ ගෙදරක් ආසන්නයේ තිබුණ නිසා මගේ සහෝදරියගේ නිවස බේරුණා.

නමුත් මගේ සහෝදරියට ඇගේ නිවස තාවකාලිකව ඉවත් කිරීමට සිදුවුණා. ඇගේ දියණිය සහ මිණිබිරිය සමඟ එක්ව සරණාගත කඳවුරක ආරක්ෂාව පතා තිබුණා. නිවාස ගිනිබත් කළ, ව්‍යාපාර විනාශ කළ, දහස් ගණනින් අවතැන් වූ දෙමළ ජනතාව බොහෝ අය එහි සිටියා.

මම Ethnic Fratricide and the Dismantling of Democracy යන්න ලිවීමට ආරම්භ කළේ එම ප්‍රචණ්ඩත්වයේ ආරම්භය සහ ගමන් මග පරීක්ෂා කිරීම සඳහා. Buddhism Betrayed? යනු එම මාතෘකාවේම දිගුවක්. මිනිස්සු මගෙන් දිගින් දිගටම ඇහුවා බුදුදහම අවිහිංසාව වෙනුවෙන් පෙනී සිටිනවා නම් ශ්‍රී ලංකාවේ

බෞද්ධයන් ප්‍රචණ්ඩත්වයේ යෙදෙන්නේ ඇයි ද? කියලා. දේශපාලනීකරණය වූ බුදු දහමේ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ සහ බෞද්ධ නායකයන්ගේ සහභාගිත්වය පැහැදිලි කිරීමට උත්සාහ කිරීම සඳහා මම දෙවන පොත ලිවීමට පටන් ගත්තේ ඒ නිසා. එය ශ්‍රී ලංකාවේ බහුතර සිංහල ජනයාට හිතකර පොතක් නෙවෙයි. එය ශ්‍රී ලංකාවේ තහනම් කළා. ඇත්ත වශයෙන්ම බොහෝ දෙනෙක් එය යම් ආකාරයකින් අගති සහිත ලේඛනයක් ලෙස සැළකුවා. නමුත් සමකාලීන දේශපාලනය ගැන අදහස් දැක්වීමට අවශ්‍ය නම් එය වළක්වන්න බෑ. යමෙක්ගේ අදහස් විවේචන සහ ප්‍රශංසා දෙකට ම විවෘත වෙනවා. මං හිතන්නේ බුදුන් වහන්සේට සහ බුදු දහමට එරෙහි ප්‍රහාරයක් ලෙස එය හුවා දක්වමින් පොත තහනම් කරන ලෙස කෑගසන ප්‍රමුඛ ක්‍රියාකාරික භික්ෂූන් වහන්සේලා සහ ප්‍රමුඛ ක්‍රියාකාරික බුද්ධිමතුන් පිරිසක් සිටිනවා. එය බුදුන් වහන්සේට හෝ බුද්ධාගමට එල්ලකරන ප්‍රහාරයක් නෙවෙයි. එය ශ්‍රී ලංකාවේ බුද්ධාගම ඓතිහාසිකව දිගහැරුණු ආකාරය නිරූපණය කිරීමට මම ගත්ත උත්සාහයක්. ඔවුන් එල්.ටී.ටී.ඊ සංවිධානයේ ඒජන්තයෙක් කියලා මට චෝදනා කළා. මම පළමුවෙන් ම පසුතැවෙන දේ ඒක. මට චෝදනා කරන බොහෝ දෙනා පොත කියවලාවත් නෑ. එම තත්ත්වය ඇත්තට ම ශ්‍රී ලංකාවේ නව ෆැසිස්ට් ප්‍රවණතා සහිත ප්‍රාදේශීය දක්ෂිණාංශික දේශපාලනයේ ප්‍රකාශනයක් වුණා.

**Mariza Peirano:**

Leveling Crowds යන ඔබතුමාගේ අවසාන ග්‍රන්ථය ඉහත ග්‍රන්ථයේ ම දිගුවක් ද?

**Tambiah:**

දිගුවක් පමණක් නෙවෙයි. එහි දී ඉන්දියාවේ, පකිස්ථානයේ, සහ ශ්‍රී ලංකාවේ සිදුවන ජනවාර්ගික ගැටුම් වටා ඇති ගැටලු සහ වෙනස්කම් විමර්ශනය කළා. ජනවාර්ගික දේශපාලනය සිංහල බෞද්ධ ජාතිකවාදයට හෝ දෙමළ ජාතිකවාදයට ආවේණික යැයි මා නොකියන බව ශ්‍රී ලාංකිකයන් තේරුම් ගනු ඇතැයි මම බලාපොරොත්තු වෙනවා. මම උත්සාහ කළේ වර්ගවාදී ගැටුම් වඩාත් සාමාන්‍ය වචනවලින් ඉදිරිපත් කිරීමට සහ වාර්ගික ව්‍යාපාර යනු කුමක් ද? සහ ඒවා වර්ධනය වන්නේ කුමන ආකාරයේ දේශපාලනයක් තුළ ද? යන්න පැහැදිලි කිරීමට. බහුතර සහ සුළුතර සබඳතා වර්ධනය වන සහ එකට කැටිවන යම් යම් මාර්ග තියෙනවා. එහි දී ඔබ සුළුතරයක් අතර සිටින බව ඔබට හැඟෙනවා නම් ඔබ අවාසනාවන්තයි.

**Mariza Peirano:**

ප්‍රධාන ධාරාවෙන් පිටත මානව විද්‍යාඥයෙකු වීම වටිනවා ද?

**Tambiah:**

මම එහෙම හිතනවා, මොකද කිව්වොත් නිසැකව ම ඉන්දියාවේ පරිපීඩිත ගුරුකුලයේ ඉතිහාසඥයන්ගේ අදහස් මෙන් ම සමහර මානව විද්‍යාඥයන් ගේ ලේඛනවල ඇතුළත්වන අදහස් ද මෙහිදි වැදගත්. එහි දී නිසැකවම ප්‍රමුඛත්වයට අභියෝග කරන ආකාරයෙන් යටත්විජිතවාදය සහ පශ්චාත් යටත්විජිත වර්ධනයන් පිළිබඳ ලිවීම සිදු වෙලා තියනවා. එක්තරා ආකාරයකට එය යටත්විජිතවාදී සහ පෙරදිගවාදී ඉදිරි දර්ශනයක්. ඔවුන් බ්‍රිතාන්‍ය යටත්විජිතයක් වූ ඉන්දියාවේ සිදු වූ සිදුවීම් කියවන්නට උත්සාහ කරන්නේ යටත්විජිත ඉතිහාසයේ නිල බ්‍රිතාන්‍ය අනුවාදයට තරඟ කරන පරිපීඩිත න්‍යාය පත්‍රයට අනුව.

**Mariza Peirano:**

ඔවුන් ග්‍රාම්ස්චිගේ බලපෑමට ලක්වෙලා තියෙනවා ද?

**Tambiah:**

ඔව්. ග්‍රාම්ස්චි සහ සමහරවිට ෆූකෝගේ සදාචාරාත්මක ආර්ථිකය (the moral economy) යන නිබන්ධය මගින් බලපෑමට ලක්වෙලා තියෙනවා. ඇත්ත වශයෙන් ම මගේ පොතේ [Leveling Crowds] ඔවුන්ගේ ලේඛනවල බුද්ධිමය පැතිකඩ පෙන්නුම් කරනවා. 18 වැනි ශතවර්ෂයේ එංගලන්තයේ කැරලිවල සදාචාර ආර්ථිකය පිළිබඳ ඊ.පී තොම්සන්ගේ මූලික රචනාව සහ ජිම් ස්කොට් විසින් ලියන ලද Asia in The Moral Economy of the Peasants(1976) වැනි ලේඛන මාගේ ග්‍රන්ථයේ ඇතුළත් වෙනවා. සමහර ඉතිහාසඥයන් යටත් විජිතවාදය යටතේ සිදු වූ ඇතැම් ගොවි ව්‍යාපාර නීත්‍යානුකූල ප්‍රතිරෝධයක් ලෙසින් පෙන්වා දී තිබෙනවා. එය නිල සාහිත්‍යයේ දක්වා ඇති අර්ථකථනය නෙවෙයි.

**Mariza Peirano:**

බ්‍රසීලයට ඔබ සිදු කළ සංචාරයෙන් පසු අපගේ තත්ත්ව පිළිබඳ ඔබට වඩා හොඳින් අවබෝධ වූ බව ඔබ සඳහන් කළා.

**Tambiah:**

බ්‍රසීලයට යම් යම් සිත්ගන්නා සුවිශේෂතා ඇති බව පේනවා. එක් දෘෂ්ටි කෝණයකින්, එය ත්‍රිකෝණාකාර සම්බන්ධතාවයක කොටසක්. එක් අතකින් බ්‍රසීලය එක්සත් ජනපදයට සම්බන්ධයක් ඇති අතර, අනෙක් පසින් යුරෝපයට ද සම්බන්ධතාවයක් පවතිනවා. ලතින් ඇමරිකාව ද වෙනත් රටවලින් වෙනස්. මන්ද යත් එම රටෙහි මූලික වශයෙන් පෘතුගීසි කතා කරන නිසාත් එහි සාහිත්‍යයෙන් විශාල ප්‍රමාණයක් පෘතුගීසි භාෂාවෙන් වීමත් එම රටේ දේශීය බුද්ධිමතුන් අමතන භාෂාව ද පෘතුගීසි භාෂාව වීමත් යන කාරණා නිසා. ඒක මට ඉතා විශේෂ තත්ත්වයක්.

**Mariza Peirano:**

ඒක තමයි ලස්සනම කොටස..

**Tambiah:**

ඉතින්, තායිලන්තයේ සිද්ධිය ගමු. 60 දශකයේ මුල් භාගයේ මා එහි යන විට එහි සිටියේ ඉංග්‍රීසි සහ අනෙකුත් යුරෝපීය භාෂා දන්නා ඉතා සුළු පිරිසක් විතරයි. 1960 සහ 70 ගණන්වල සිට වැඩි වැඩියෙන් විද්වතුන් විශාල සංඛ්‍යාවක් උසස් අධ්‍යාපනය සඳහා පිටරට යවන ලද අතර ගුරු පුහුණු සහ විශ්වවිද්‍යාල වැඩසටහන් තායිලන්තයේ ම පැවැත්වුණා. දැන් තායිලන්තයේ විශ්වවිද්‍යාලවල තරමක් විශාල සහ වර්ධනය වන ස්වාධීන බුද්ධිමතුන් පිරිසක් ඉන්නවා.එහි බටහිර මූලාශ්‍රය සහ දැනුම පිළිබඳ පූර්ණ අවබෝධයක් ඇති මහාචාර්යවරුන් ඉන්නවා වගේ ම ඔවුන්ගේ ම උපකල්පිත විචාර සාහිත්‍යයකුත් තිබෙනවා. ඇත්ත වශයෙන්ම ප්‍රතිරෝධය පිළිබඳ සංකල්පය පිළිගත් බටහිර විද්වතුන් ද ඉන්නවා. ඊනියා ප්‍රජාතන්ත්‍රවාදයට සංක්‍රමණය වීම බ්‍රසීලයේ මෙන්ම තායිලන්තයේ ද අඛණ්ඩව පැවති ගැටලුවක්. තායිලන්තයේ ඒකාධිපතිවාදය හොඳින් මුල් බැස ඇති අතර, පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදයට සංක්‍රමණය වීමේ උත්සාහයක් පවතින අතර, ශිෂ්‍ය ව්‍යාපාරය, ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාර සහ නැගිටීම් ඒකාධිපති බලයට එරෙහි ප්‍රතිරෝධයේ ආකාරය ලෙස පෙන්වා දෙන්න පුළුවන්. විශේෂයෙන් ම දහනවවන සියවසේ දේශපාලන නැගිටීම් සම්බන්ධයෙන් ගත් කළ තායිලන්තය පිළිබඳ ඕතඩොක්ස් මාස්ටර් ආඛ්‍යානය වන්නේ එය 19 වැනි සියවසේ සිට නවීකරණය වූ චක්‍රීය රාජාණ්ඩුවක් බවයි. උතුරේ, ඊසානදිග හා දකුණේ ජනගහනයේ විවිධ කොටස් සන්නද්ධ හමුදා විසින් බලහත්කාරයෙන්

ඒකාබද්ධ කරන ලද නිසා ජාතික රාජ්‍ය ව්‍යාපෘතිය හරියට ම සුමටව සිදු වුණේ නෑ. නමුත් අද වන විට නව බුද්ධිමතුන්, ඉතිහාසඥයන් සහ සමාජ විද්‍යාඥයන් මෙම මධ්‍යගත ක්‍රියාවලියට දේශීය ජනතාවගේ ප්‍රතිචාර සහ ප්‍රතිරෝධ නිරූපණය කරන්න උත්සහ කරනවා.

**Mariza Peirano:**

ඔබ තායිලන්තයේ ඔබේම අධ්‍යයනයන් ඇගයීමට ලක්කරන්නේ කෙසේ ද?

**Tambiah:**

World Conqueror and World Renouncer (1976) යනු තායිලන්තයේ ජනසතු කිරීම සහ ජාතිය සෑදීමේ ක්‍රියාවලි පිළිබඳ ආඛ්‍යානයක් වන අතර, එය 1973 ශිෂ්‍ය කැරැල්ල ඇතිවීමට පෙර හැත්තෑව දශකයේ මුල් භාගය දක්වා වූ වර්ධනය විස්තර කරනවා. මෑත දේශපාලන සිදු වීම් සමඟ තායි බුද්ධිමතුන් ගේ ඍජු බලපෑමක් එයට එල්ලවුණා. එහි දී මට ‘galactic polity’ සිට ‘radial polity’ වෙත සංක්‍රමණය වීමට උනන්දුවක් ඇති වී තිබෙනවා. මගේ දෙවන ග්‍රන්ථයෙහි බෞද්ධ භික්ෂූන් වහන්සේලා මෙන් ම සුර වන්දනාව සහ එය දේශපාලන ක්‍රියාවලි සමඟ අන්තර්ක්‍රියාකරන ආකාරය පිළිබඳ කථා කරනවා. 80 දශකයේ අග සහ අනූව දශකයේ සිදුවීම්වලට අදාළව මම තායිලන්තය පිළිබඳ කිසිදු වැදගත් කෘතියක් රචනා කර නැහැ. නමුත් මම බැංකොක් හි තිබෙන 5 wats (පන්සල සංකීර්ණ) පිළිබඳ 80 ගණන්වල අධ්‍යයනයක් ආරම්භ කළා. ඒ වගේ ම ක්ලෝන්ග් ටෝයි නම් බැංකොක්හි විශාලතම අනවසර පදිංචිය පිළිබඳ අධ්‍යයනය තවමත් මා අවසන් කර නැහැ.

මම ක්ලෝන්ග් ටෝයිහි ස්ථාපිත වූ ජීවන ආකෘති ලේඛනගත කිරීමට පටන් ගත්තා. එහි දී එහි වැසියන් කෙරෙහි රාජ්‍ය සහ නගර බලධාරීන්ගේ ආකල්පය වූයේ ඔවුන් අපරාධකරුවන්, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සහ ගණිකාවන් කියන අදහස. එම පදනම මාගේ අධ්‍යයනය තුළ මම නොසලකා හැරියා. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු කම්කරුවන්. ඉදිකිරීම් කර්මාන්තයේ හෝ වරායේ ප්‍රවාහන කටයුතුවල නියැළී සිටින අය වුණා. විශේෂයෙන් ම කාන්තාවෝ ආහාර ඇසුරුම් ආදියෙහි නියැළී සිටිනවා. වෙනත් වචනවලින් කිවහොත්, මෙම පුද්ගලයින් බැංකොක් ආර්ථිකයට සහභාගී වන්නේ අර්ධ-පුහුණු සහ පුහුණු කම්කරුවන් ලෙස. මගේ අභිප්‍රාය වන්නේ මෙම සාධනීය ලක්ෂණ විස්තර කිරීමත්, කටුක නාගරික පරිසරයක් තුළ ඔවුන් මුහුණ දෙන පැවැත්මේ ගැටලු සහ කර්තව්‍ය සමඟ කටයුතු කරන ආකාරය සහ ඒවා අඛණ්ඩව කරගෙන යන ආකාරය මෙන්ම සමාජ භාවිතය සහ චාරිත්‍ර වාරිත්‍ර සහ අනෙකුත් සමාජ ප්‍රාග්ධනය පරිවර්තනය කිරීම පිළිබඳව විමර්ශනය කිරීම. එම ප්‍රජාව පැමිණියේ පිටිසර ප්‍රදේශවලින්. ඔවුන්ගේ සමාජ ජීවිතවල රසවත් පැති කිහිපයක් මම දැනටමත් සොයාගෙන තිබෙනවා. ඉන් එකක් තමයි, තරුණ කල්ලිවල සාමාජිකයන්ට අනතුරුවලින් ශාරීරික ආරක්ෂාව සඳහා සහ ප්‍රතිවාදී කල්ලි අතර සටන්වල දී සිදු වන තුවාලවලින් ආරක්ෂා වීමට ශරීර පච්ච කොටා ගැනීමේ වැදගත්කම. සෑම කල්ලියකටම එම කණ්ඩායමේ පච්ච නිර්මාණකරුවා විසින් කරන ආවේණික පච්ච මෝස්තරයක් තිබෙනවා. පච්ච මෝස්තරකරුවා අදාළ පච්චය ශරීරයෙහි කැටයම් කිරීමේ දී චාරිත්‍රානුකූලව යම් ආරක්ෂාවක් අදාළ පුද්ගලයාට ආරෝපණය කරනවා (මෙම සංස්කෘතිය මා මීට පෙර වෙනත් සන්දර්භයක් තුළ විස්තර කළ සුර සංස්කෘතියේ ප්‍රභේදයක්).

මෙහි තවත් සිත්ගන්නා ක්‍රියාකාරකමක් වන්නේ මුඩුක්කු ප්‍රදේශයේ තායි බොක්සිං පාසල් සමෘද්ධිමත් වී තිබීම. තායි බොක්සිං ජාතික ක්‍රීඩාවක් වන අතර බොක්සිං ක්‍රීඩකයන්ගෙන් බහුතරයක් මුඩුක්කුවලින් බිහිවෙනවා. තාරුණ්‍යයට මේ ආකාරයේ මළල ක්‍රීඩා දස්කම් දැක්වීම තුළින් කීර්තිය හා මුදල් කරා යන මාර්ගයක් හදලා දෙනවා. එවැනි වෘත්තීන් ඇත්ත වශයෙන් ම කෙටි කාලීනයි. නමුත් බොක්සිං ක්‍රීඩාව සිදුවන

ස්ථානය ඔට්ටු ඇල්ලීමට සහ සූදුවට දැඩිව ඇබ්බැහි වූ කේන්ද්‍රස්ථානයක් ද වෙනවා. එය දරිද්‍රතා අවකාශයේ සාර්ථකව වාසනාව උරගා බැලීමක්. ගිල්බර්ටෝ වෙල්හෝ ඔහු නාගරික මානව විද්‍යාවේ කොපමණ වැඩකර ඇත්දැයි මට පැවසුවා. හොඳයි, බැංකොක්හි විශාලතම අනවසර පදිංචි කිරීම පිළිබඳ අධ්‍යයනය සම්පූර්ණ කළහොත්, එම ක්ෂේත්‍රයටත් මගේ දායකත්වයක් තිබෙනවා. කෙසේ වෙතත්, මම සම්පූර්ණ කර ඇති නමුත් තවමත් මා ලියා නොමැති තවත් අධ්‍යයනයක් තිබෙනවා. ඒ තමයි බැංකොක්හි විවිධ ප්‍රදේශවල පිහිටා ඇති පන්සල් සංකීර්ණ පිළිබඳ අධ්‍යයනය.

**Mariza Peirano:**

වට්(*Wat*)සහ ස්තූප අතර වෙනසක් තිබේ ද?

**Tambiah:**

තායිලන්තයේ වට්(*Wat*) යන වචනය බෞද්ධ විහාර හා ආරාම සංකීර්ණයක් හැඳින්වීමට යොදා ගන්නවා. ස්තූප (pagoda) යන වචනය බොහෝ තට්ටු සහිත කුළුණක් හඳුන්වන්න යොදා ගන්නවා. එය තායි වචනයක් නොවේ.) එක වට් (*Wat*) එකක් ධනවත්, මධ්‍යම හා ඉහළ මධ්‍යම පාන්තික කොටසක පිහිටා ඇති අතර දෙවැන්න තදාසන්න වැඩ කරන සහ පහළ මධ්‍යම පන්තියක පිහිටා තිබෙනවා. තුන්වැන්න ක්ලෝන්ග් ටෝයි මුඩුක්කු අද්දර ද, ප්‍රධාන රාජ්‍ය පරිපාලන කාර්තුවේ හතරවන කොටස සහ බැංකොක්හි වාණිජ චයිනාටවුන්හි පස්වන කොටස ද වශයෙන් පිහිටා තිබෙනවා. සෑම වට් (*Wat*) එකක්ම බැංකොක්හි නාගරික ජනගහනයේ විවිධ කොටස් වෙනුවෙන් නිර්මාණය වී තිබෙන අතර ඔවුන්ව නගරයේ ආගමික හා සමාජීය ජීවිතයට විවෘත කරවන බහු කවුළු ලෙස ක්‍රියාත්මක වෙනවා. ඇත්ත වශයෙන්ම බැංකොක්හි නාගරික වට් (*Wat*) ගැන මගේ උනන්දුව ආරම්භ වූයේ මම World Conquerorand World Renouncer පිළිබඳ අධ්‍යයනය කරමින් සිටිය දී. බැංකොක් අගනගරයේ නාගරික ජීවිතය පිළිබඳ මෙම අධ්‍යයනයන් විශාල පැල්පත් ජනාවාස, විවිධ වට් (*Wat*) පන්සල් සංකීර්ණ, දේශීය ජීවන රටා පිළිබඳ ජනවාර්ගික අධ්‍යයන වන නමුත් ඒවා ගෝලීයවාදයේ විශාල ප්‍රශ්නයට සම්බන්ධ වන අතර ඒවා ගෝලීය බලපෑම්වලට සහ අන්තර්ක්‍රියාකාරිත්වයේ සුවිශේෂ ප්‍රතිඵලවලට දායක වන දේශීය ජීවන ආකෘති ද වෙනවා.

**Mariza Peirano:**

ඔබ විශ්වීය ප්‍රවණතා සහ ස්වදේශීය ජීවන ස්වරූප තේරුම් ගැනීමට මානව විද්‍යාත්මක එළඹුම් පාවිච්චි කිරීමට එකඟ ද?

**Tambiah:**

මම සිතනවා විශ්වීය ප්‍රවණතාවන් ස්වදේශීය ජීවන ස්වරූප ඔස්සේ ප්‍රකාශනය වන ආකාරය තේරුම් ගැනීමේදීත් ඒ ස්වදේශීය ජීවන ස්වරූප සිය අරමුණු ඉටුකර ගැනීමේ දී යළි විශ්වීය ප්‍රවණතා ඇඳා ගන්නා ආකාරය තේරුම් ගැනීමේ දී ත් මානව විද්‍යාත්මක විධික්‍රම යොදා ගැනීම වඩාත් සුදුසුයි කියලා. මට පෙනෙන ආකාරයට පාරජාතික ක්‍රියාවලිවලට දක්වන බහුතරයක් වූ ඊනියා පශ්චාත් නූතන ප්‍රතිචාර මානව විද්‍යාත්මක වශයෙන් මතුපිට තලයකයි පසුවන්නේ. බොහෝ අවස්ථාවල එම ප්‍රතිචාර ස්වදේශීය මට්ටම්වල ක්‍රියාත්මක වන ජීවන ස්වරූප පැහැදිලිව හඳුනා ගන්නට සමත් වන්නේ නෑ. ඒ නිසා මගේ අවසාන ග්‍රන්ථයට මම 'ආඛ්‍යානය පිළිබඳව වන මතය','බහුත්වවාදී හඬ' වැනි පශ්චාත් නූතන අවධාරණය කිරීම් ඇතුළත් කළා. ඒ

වගේ ම මම මගේ අවසාන ග්‍රන්ථය ලිවීමේ දී මානව විද්‍යාඥයින්ට පමණක් නොවෙයි සුවිශාල පාඨක ප්‍රජාවකට කියවිය හැකි පරිදි ඉතා ම ඍජු සහ සරළ භාෂාවක් භාවිත කළා. පශ්චාත් නූතනවාදී ගද්‍ය ආඛ්‍යානවල අසමත්වීම්වලින් එක් අසමත් වීමකට හේතුවක් වන්නේ එම ගද්‍ය ආඛ්‍යාන තුළ ඉතා දුරවබෝධ භාෂාවක් සහ වාග් මාලාවක් භාවිත කිරීමයි. එබැවින් අපේ අරමුණ විය යුත්තේ ගද්‍ය ආඛ්‍යාන රචනා කිරිමේ දී සන්නිවේදනයේ ප්‍රධාන අරමුණ වන සුපැහැදිලි සන්නිවේදනය යටපත් නොවන අන්දමේ සුපැහැදිලි භාෂාවක් භාවිත කිරීමයි.

**Mariza Peirano:**

ඇමරිකානු මානව විද්‍යාඥයන් මානව විද්‍යාව කියන විෂය සිය නිවසට රැගෙන ආ විට මානව විද්‍යාව යන විෂය අතුරුදහන් වුණා කියන කාරණාව යම් තාක් දුරකට විකාරරූපීයි. අඩුම තරමේ අද වන විට මානව විද්‍යාව වෙනුවෙන් පෙනී සිටීමට සංස්කෘතික අධ්‍යයනය යන විෂයට හැකියාව ලැබී තිබෙනවා.

**Tambiah:**

කර්තෘ බලය සහ වාස්තවිකත්වය (Readership and Objectivity), මානව විද්‍යාඥයා සහ ස්වදේශීය අනෙකා (indigenous ‘other’) අතර පවත්නා අසමමිතික බල සම්බන්ධතාව, මානව විද්‍යාඥයා සහ දත්තදායකයන් අතර පවත්නා සම්මුතික තේරුම්ගැනීම වැනි කාරණා සම්බන්ධයෙන් මතු කරන පශ්චාත්නූතනවාදී ප්‍රශ්න කිරීම් මානව විද්‍යාත්මක ලිවීම් ඇමරිකා එක්සත් ජනපදය තුළ අස්ථාවර තත්ත්වයකට පත්කරලා තිබෙනවා. මාගේ දැක්මට අනුව මානව විද්‍යාඥයන් මෙම අවධාරණය කිරීම් සැලකිල්ලට ගත යුතුයි. මෙම විවේචන භාරගත යුතුයි. ඉන් අනතුරුව යළිත් නිර්මාණශීලී ලෙස මානව විද්‍යාත්මක ක්ෂේත්‍ර අධ්‍යයනයන් සිදුකොට ලිවීම සිදු කළ යුතුයි. මානව විද්‍යාව විෂයයක් වශයෙන් අවප්‍රමාණය කිරීම අපෙන් විය හැකි අතපසු වීමක් වෙන්න පුළුවන්. මානව විද්‍යාත්මක ලිවීම්වල දී අප උත්සාහ කළ යුත්තේ ආක්‍රමණික පිටස්තරයෙකු වශයෙන් අනෙකුත් සමාජ අධ්‍යයනය කරනවාට වඩා එම සමාජ ක්‍රමවලට ආවේණික ජීවන ස්වරූප සහ ඔවුන්ගේ දැනුම පවත්නා ආකාරයෙන් තේරුම් ගන්නා එළඹුමක් අනුගමනය කිරීමයි. මානව විද්‍යාව පරිහරණය කිරීමේ සහේතුකත්වය සහ සාධාරණීකරණය මෙයයි.

**Mariza Peirano:**

ස්තුතියි තම්බි.

මෙම ලිපිය සිංහල භාෂාවට පරිවර්තනය කිරීම උදෙසා අපහට අවස්ථාව ලබා දුන් කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ විශ්‍රාමික මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා හට අපගේ හෘදයාගම ස්තුතිය පිරිනමමු.

# සමාජ විග්‍රහ

**විමර්ශිත සංග්‍රහය**

**REFEREED JOURNAL**

**පළමු කාණ්ඩය, නවවන වෙළුම - 2022**

**ISSN 2362-0978 (print ISSN)**

**ISSN 2756-925X (e-ISSN)**

ලිපි අංක 06

## මහාචාර්ය ගනනාත් ඔබේසේකර (1930-) පිළිබඳ පෞද්ගලික සටහනක්

ප්‍රේමකුමාර ද සිල්වා[10]

https://orcid.org/0000-0003-2646-5554

---

***ප්‍රධාන සංස්කාරක***

ප්‍රේමකුමාර ද සිල්වා

***සහය සංස්කාරක***

හිරුනි කළුආරච්චි

***සංස්කාරක උපදේශක මණ්ඩලය***

එස්.ටී.හෙට්ටිගේ (සම්මානිත මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
කාලිංග ටියුඩර් සිල්වා (සම්මානිත මහාචාර්ය) පේරාදෙණිය විශ්වවිද්‍යාලය
කේ.කරුණාතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) කැලණිය විශ්වවිද්‍යාලය
සරත් අමරසිංහ (සම්මානිත මහාචාර්ය) රුහුණ විශ්වවිද්‍යාලය
යසාංජලී ජයතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
චන්ද්‍රසිරි නිරිඇල්ල (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
සුභාංගි හේරත් (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
නිශාර ප්‍රනාන්දු (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
ෆර්සානා හනීෆා (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
ඉරේෂා ලක්ෂ්මන් (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය

***භාෂා සංස්කරණය***

නාලක ජයසේන

***පරිසැලසුම් නිර්මාණය***

ප්‍රභාත් ගලගමගේ

හිරුනි කළුආරච්චි

---

[10] බී.ඒ. (කොළඹ) එම්.ඒ. (කොළඹ) එම්.එස්.සී. (එඩින්බරෝ) පී.එච්.ඩී (එඩින්බරෝ) ජ්‍යෙෂ්ඨ මූලාසන මහාචාර්ය, සමාජ විද්‍යා දෙපාර්තුමේන්තුව, ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය

# සමාජ විග්‍රහ

**විමර්ශිත සංග්‍රහය**
**REFEREED JOURNAL**
**පළමු කාණ්ඩය, නවවන වෙළුම - 2022**
**ISSN 2756-925X (e-ISSN)**
**ISSN 2362-0978 (print ISSN)**

This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License.

දැනුම වෙත ප්‍රවේශ වීමේ සීමා අතික්‍රමණය සඳහා ලොව බොහෝ ශාස්ත්‍රාලයීය ප්‍රකාශන සම්ප්‍රදායික ප්‍රකාශන අයිතිය පිළිබඳ නෛතික ආකෘතියෙන් විකල්ප ආකෘතියක් වන පොදු නිර්මාණ බලපත්‍ර ක්‍රමයට සංක්‍රමණය වී / වෙමින් ඇත. මේ අනුව විවාරාත්මක දැනුමට විවෘත ප්‍රවේශයක් ලබා දීමේ අරමුණින් "සමාජ විග්‍රහ" විමර්ශිත සංග්‍රහය, නිකුත් වන්නේ ඉහත පොදු නිර්මාණ බලපත්‍රය යටතේය.

## ලිපි විමර්ශක මණ්ඩලය

*මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*
*මහාචාර්ය ෆර්සානා හනීෆා, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*
*මහාචාර්ය එම්.ටී.එම් මහීස්, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*
*මහාචාර්ය සමන්ත හේරත්, සන්නිවේදන සහ නිර්මාණාත්මක කලා අධ්‍යනංශය, කොළඹ විශ්වවිද්‍යාලය*
*කථිකාචාර්ය චමත්කා පද්මසිරි කාරියවසම්, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*
*කථිකාචාර්ය ක්‍රිෂාන් සිරිවර්ධන, සන්නිවේදන සහ නිර්මාණාත්මක කලා අධ්‍යනංශය, කොළඹ විශ්වවිද්‍යාලය*

## ප්‍රකාශනය

සමාජ විද්‍යා අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ-03
දූරකථනය/ෆැක්ස්: 011-2500452
විද්‍යුත් තැපෑල: samajaviggraha@soc.cmb.ac.lk
වෙබ් අඩවිය: https://arts.cmb.ac.lk/sociology/

**මහාචාර්ය ගනනාත් ඔබේසේකර (1930-) පිළිබඳ පෞද්ගලික සටහනක්**

2023 පෙබරවාරි 02 දා සිය 93 වන වියට පා තැබූ ජාත්‍යන්තර සම්භාවනාවට පාත්‍ර වූ දැනට ලෝකයේ ජීවත්වන ප්‍රමුඛ පෙළේ මානව විද්‍යාඥයන් අතර ඉහළින්ම සිටින කෘතහස්ත පුද්ගලයෙකු වන මහාචාර්ය ගනනාත් ඔබේසේකරට නිදුක් නීරෝගී චිර ජීවනය ප්‍රාර්ථනා කරමින් ඔහු පිළිබඳ කෙටි පෞද්ගලික සටහනක් තැබීමට කැමැත්තෙමි.

ඔබේසේකරගේ ශාස්ත්‍රීය ලිපි ලේඛන අපට මුල් වරට සමාජවිද්‍යා ශිෂ්‍යයන් ලෙස හඳුන්වාදීමේ ගෞරවය ආචාර්ය නිව්ටන් ගුණසිංහයන්ට හිමි වේ. ඒ 1980 දශකයේ මුල් භාගයේ දී අපගේ පළමු වසරේ දේශනවල පටන්ය. මගේ මතකයේ හැටියට ඒ සිදු කළේ අනගාරික ධර්මපාලතුමා හා පත්තිනි ඇදහිල්ල පිළිබඳ ඔබේසේකරගේ ශාස්ත්‍රීය ලියකියවිලි අපහට හඳුන්වා දීම මගින්ය. එතැන් සිට ඔහුගේ ශාස්ත්‍රීය ලෝකය තුළ සැරිසැරීමට ප්‍රබල රුචිකත්වයක් අපට ඇති විය. 1990 දශකයේ මුල් භාගයේ සිට පශ්චාද් උපාධි අපේක්ෂකයෙකු ලෙස ඔබේසේකරගේ අධ්‍යයන වඩ වඩාත් පරිශීලනය කිරීමට මා පෙළඹුණා පමණක් නොව සමාජවිද්‍යාව තුළ සුවිශේෂ විෂය ක්ෂේත්‍රයක් වන ආගම පිළිබඳ සමාජවිද්‍යාව හැදෑරීම කෙරෙහි මා පොළඹවන ලද්දේත් ඔහුගේ ආගම පිළිබඳ ශාස්ත්‍රීය ලිපි ලේඛන බව සඳහන් කරන්නේ ඔහුට ගෞරවයක් හැටියටය. මේ ප්‍රතාපවත් 'සමාජ චින්තකයා' මුල් වරට හමුවීමේ භාග්‍යය හිමි වූයේ මා පශ්චාද් උපාධිධාරියකු ලෙස පර්යේෂණ කටයුතු ආරම්භ කළ මුල් වකවානුවේ දී ආචාර්ය සසංක පෙරේරාගේ සම්බන්ධය මතය. ඒ මාගේ පර්යේෂණ ව්‍යාපෘතිය වන ''ගෝලීයකරණය හා යාතුකර්මවල විපර්යාසය බලි යාග'' යන මැයෙන් (Globalization and Transformation of Planetary Rituals in Southern Sri Lank ) දකුණු පළාතේ බෙන්තර ප්‍රදේශයට අදාළව පැවැත්වෙන පර්යේෂණය සඳහා උපදෙස් ලබා ගැනීමට මම ඔහුගේ බම්බලපිටියේ පිහිටි නිවසට ගිය අවස්ථාවකදීය. සාකච්ඡාව ආරම්භ වී සුළු මොහොතකින් ඔහු පෙරළා මගෙන් ප්‍රශ්න කළේ ''ප්‍රේමකුමාර දැන් බලි තිබෙනවාද?'' යනුවෙනි. පෙරළා මා පිළිතුරු සැපයූයේ ''ඇත්තටම මගේ පර්යේෂණ ගැටලුවත් එයම බව'' පවසමිනි. විශේෂයෙන්ම ඔහු හා රිචඩ් ගොම්බ්‍රිජ් සමග එක් වී පළ කරන ලද "Buddhism Transformed" (1988) කෘතිය තුළද බලි යාතුකර්මය මෙන්ම පොදු සාම්ප්‍රදායික යාතුකර්ම අභාවයට යන්නේය යන අදහස ප්‍රබලව ඉදිරිපත් කොට ඇත. එය ඔහු විසින් රචනා කරන ලද අග්‍රගණ්‍ය පර්යේෂණ කෘතියක් වන "The Cult of Goddess Pattini" (1984) තුළද අවධාරණය කොට ඇත. තරුණ පර්යේෂකයකු ලෙස මෙම ස්ථාවරය ආනුභවික පර්යේෂණ හරහා සොයා බැලීමේ රුචිය හා කුතුහලය මා තුළ මෙම සාකච්ඡාවෙන් පසුව වඩා වර්ධනය වූ බව සඳහන් කළ යුතුය. විශේෂයෙන්ම බෙන්තර මීගම ප්‍රදේශය ඔහු කුඩා කල සිටම සැරිසැරූ සංස්කෘතික කලාපයකි. මාගේ පර්යේෂණ කටයුතු සඳහා එවකට සිටි ඇදුරු පරම්පරා සමග ඇසුරු කිරීමේදී මහාචාර්ය ඔබේසේකර පිළිබඳ ඔවුන් ඉහළින්ම කථා කළ බව මට හොඳින් මතකය. දකුණ, බස්නාහිර හා සබරගමුව යන සංස්කෘතික කලාපවල ඔහුගේ මුල්කාලීන පර්යේෂණ ඔස්සේ ගොඩනගා ඇති සමාජ-මානව විද්‍යාත්මක සාහිත්‍යය අතිප්‍රබල මෙන්ම අප වැනි මානව විද්‍යා පර්යේෂකයන්ට ඒවායේ නව මාන සොයා ගැනීමට ප්‍රබල අත්වැලක් ද සපයයි.

බෙන්තර සංස්කෘතික කලාපය මත පදනම් වී මා සිදු කළ ශාස්ත්‍රපති උපාධිය සඳහා කරන ලද පර්යේෂණ නිබන්ධයේ එක් පරීක්ෂකවරයකු වූයේ ද මහාචාර්ය ඔබේසේකරය. මෙම පර්යේෂණ නිබන්ධනය ඔහු විසින් ඉහළින් වර්ණනා කළා පමණක් නොව එය ප්‍රකාශයට පත් කළ යුතු බවටද නිර්දේශ ඉදිරිපත් කොට තිබිණි. එකල මෙම නිබන්ධය ග්‍රන්ථයක් ලෙස පළ කිරීමට එතුමා විසින් මා දිරිමත් කළා පමණක් නොව ඊට ප්‍රබල පෙරවදනක් සැපයීමෙන් අප වැනි තරුණ පර්යේෂකයන් දිරිමත් කිරීමට කටයුතු කිරීමද ඉතා අගය කළ යුතුය. ශාස්ත්‍රපති උපාධියෙන් පසුව ආචාර්ය උපාධිය සඳහා අනිවාර්යයෙන්ම විදේශගත විය යුතු බව ඔහුගේ අදහස විය. එපමණක් නොව ඔහු සේවය කරමින් සිටි ඇමරිකාවේ ප්‍රින්ස්ටන් විශ්වවිද්‍යාලයට

අයදුම්පතක් දමන මෙන්ද මා හට උපදෙස් එතුමා පැවසීය. ඒ අනුව මා ප්‍රින්ස්ටන් විශ්වවිද්‍යාලයට පමණක් නොව මහාචාර්ය ජොනතන් ස්පෙන්සර්ගේ ඉල්ලීම මත එඩින්බරෝ විශ්වවිද්‍යාලයටද අයදුම් පතක් යැව්වෙමි. මෙම අයදුම් පත් දෙකටම ඉහළම මට්ටමේ රෙකමදාරු වාර්තා ඔබේසේකරයන් විසින් සපයා ඇති බව මට පසුව ආරංචි විය. එහි ප්‍රතිඵලයක් ලෙස එඩින්බරෝ විශ්වවිද්‍යාලයට ශිෂ්‍යත්වයක් සමග ආචාර්ය උපාධිය හැදෑරීමේ අවස්ථාව මා වෙත විවර කර දීමට කටයුතු කළ මහාචාර්ය ඔබේසේකරට මාගේ ගෞරව ප්‍රණාමය පුද කිරීමට කැමැත්තෙමි. මෙහිදී මහාචාර්ය සිරි හෙට්ටිගේ විසින් දක්වන ලද දායකත්වයද අගය කරමි. මාගේ ශාස්ත්‍රීය ජීවිතය තුළ යමක් අත්පත් කරගෙන ඇත්තේ නම් එහි ගෞරවයෙන් කොටසක් මහාචාර්ය ගනනාත් ඔබේසේකරටද හිමි විය යුතු බව අනතිමානීව සඳහන් කළ යුතුමය.

මා ආචාර්ය උපාධිය නිම කොට පැමිණි වහාම ඔහුගේ මනස්කාන්ත පරිසරයක පිහිටි නුවර නිවසේදී ආචාර්ය උපාධි නිබන්ධයේ පිටපතක් සමග හමු වූ විට මෙම නිබන්ධය ජාත්‍යන්තර ප්‍රකාශකයකු හරහා ඉක්මනින් පළ කළ යුතු බව ඔහුගේ අදහස විය. මා ශ්‍රී පාදස්ථානය අළලා රචනා කරන ලද මානව වංශවේද හා ඓතිහාසික මූලාශ්‍රය පදනම් කරගත් එම නිබන්ධයට වසර 17ක් ගත වී ඇතත් මහාචාර්යවරයාගේ ඉල්ලීම මට ඉටු කළ නොහැකි වීම පිළිබඳව කනගාටු වන අතර එම ඉල්ලීම හැකි ඉක්මනින් ඉටු කිරීමට කටයුතු කරමින් සිටින බවද සඳහන් කරමි.

මහාචාර්ය ඔබේසේකර ජාත්‍යන්තර සම්භාවනාවට පාත්‍ර වන අවස්ථාවකට සම්බන්ධ වීමට ලැබීම මා ලද භාග්‍යයක් ලෙස සලකමි. ඒ එක්සත් රාජධානියේ මැන්චෙස්ටර් විශ්වවිද්‍යාලයේදී 2003 වසරේ බ්‍රිතාන්‍ය රාජකීය මානව විද්‍යා සංගමයේ පර්යේෂණ සමුළුවට සමගාමීව මානව විද්‍යා ක්ෂේත්‍රයට අනුපමේය දායකත්වයන් ලබා දුන් අග්‍රගණ්‍ය මානව විද්‍යාඥයන්ට ජීවිතයේ එක් වරක් පමණක් ප්‍රදානය කරනු ලබන Thomas H. Huxley සම්මානය මහාචාර්ය ඔබේසේකරට හිමිවන අවස්ථාවේදී එහි සිටීමය. එම ගෞරවාන්විත සභාවේ ඔහුගේ බිරිඳ වන මහාචාර්ය රංජනී ඔබේසේකර මහත්මියද සිටි බව හොඳින් මතකය. 1900 වර්ෂයේදී ආරම්භ කරන ලද මෙම සම්මානය මීට පෙර යුරෝපීය නොවන මානව විද්‍යාඥයින් දෙදෙනෙකුට පමණක් හිමි වී ඇත. ඒ ශ්‍රී ලාංකිකයෙකු වන මහාචාර්ය එස්.ජේ. තම්බයියා (1997) හා ඉන්දියානු ජාතික මහාචාර්ය එම්.එන්. සිරිනිවාස් (1976) යන දෙදෙනාටය.

ශ්‍රී ලාංකේය සංස්කෘතිය, සමාජය, ඉතිහාසය හා දේශපාලනය පිළිබඳව ඔහු විසින් ගොඩනගා ඇති අතිවිශාල සමාජ-මානව විද්‍යාත්මක පර්යේෂිත දැනුම් සම්භාරය අති ප්‍රබලය. එසේම ඔහුගේ ආභාසය හා ආශීර්වාදය ලබමින් බිහි වූ ශාස්ත්‍රවන්තයෝද බෙහෙවි. අවුරුදු 70කට වඩා දිවයන ඔහුගේ පර්යේෂණ ජීවිතය මේ මොහොත දක්වාම අත්හැර නැති බව අප හොඳින් දන්නා කරුණකි. ඊට කදිම නිදසුනක් ලෙස ඔහු විසින් පළ කර ඇති ග්‍රන්ථ නාමාවලිය දෙස බැලීමම ප්‍රමාණවත් බව සඳහන් කරමි. එමතු නොව ගතින් වියපත් වුවත් තවමත් ග්‍රන්ථකරණයට හා ශාස්ත්‍රීය පර්යේෂණ කෙරේ ඔහු දක්වන කැමැත්ත විස්මිතය. අප වැනි සමාජ-මානව විද්‍යා පර්යේෂකයන්ට හා සෙසු අංකුර පර්යේෂකයන්ට ඔහුගේ ආදර්ශවත් ශාස්ත්‍රීය ජීවිතය ගුරු කොට ගත හැකිය. සමාජීය හා මානව ශාස්ත්‍ර පර්යේෂණ ලෝකය ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ ගරා වැටෙමින් තිබෙන සන්දර්භයක් තුළ මහාචාර්ය ඔබේසේකර වැන්නවුන්ගේ අඩුව අපට දැනෙන කාලය වැඩි ඈතක නොවනු ඇත.

ඔබට චිරං ජයතු! ආවඩා ආයුබෝ වේවා!

සමාජ විද්‍යා අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ - 03
දුරකථනය/ෆැක්ස් : 011-2500452
විද්‍යුත් තැපෑල : samajaviggraha@soc.cmb.ac.lk